

වාර්ෂික වාර්තාව
2023

ලංකා විදුලිබල මණ්ඩලය

අන්තර්ගතය

අපගේ ඉදිරි දැක්ම, අපගේ මෙහෙවර හා සාරධර්ම	2
අපගේ පාරිසරික ප්‍රතිපත්තිය	3
බැලූ බැල්මට	4
අපගේ කාර්ය බලකාය	5
අතීත කාර්ය සාධනයන්	6
ආයතනික තොරතුරු	7
සංවිධාන ව්‍යුහය	8
අනු-ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2023	10
සභාපතිතුමාගේ සමාලෝචනය	12
සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය	14
ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතිය	20
මෙහෙයුම් සමාලෝචනය	
ජනන අංශය	22
සම්ප්‍රේෂණ අංශය	28
බෙදාහැරීමේ අංශ	34
ව්‍යාපෘති අංශය	43
වත්කම් කළමනාකරණ අංශය	48
ආයතනික ක්‍රමෝපාය අංශය	53
මූල්‍ය අවදානම් කළමනාකරණය	57
තාක්ෂණික අවදානම් කළමනාකරණය	58
තිරසරභාවය පිළිබඳ වාර්තාව	60
ආයතනික සමාජ වගකීම් වාර්තාව	64
මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු	66
දස වසරක සාරාංශය	75
අගය එකතු කිරීමේ ප්‍රකාශය	76
ආයතනික පාලනය පිළිබඳ වාර්තාව	77
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ	80
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	82
ලාභ හෝ අලාභ ප්‍රකාශනය	86
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	87
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	88
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	89
සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	90
මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	92
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	93
විගණකාධිපති වාර්තාව (සමූහ මූල්‍ය ප්‍රකාශන)	160
විගණකාධිපති වාර්තාවට පිළිතුරු	175
කෙටි යෙදුම්	224

අපගේ දැක්ම


සසිරිමත් දිවියකට විදුලිය

අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවට කාර්යක්ෂම, සමායෝජිත සහ සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කර පවත්වාගෙන යාම.

අපගේ සාරධර්ම

- ගුණාත්මක බව
- ජාතියට සේවා සැලසීම
- කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව
- කැපවීම
- ගුරුක්ෂිත බව
- වෘත්තීය නිපුණතාව
- තිරසාර බව



අපගේ පාරිසරික ප්‍රතිපත්තිය

ලංකා විදුලිබල මණ්ඩලය විහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටුකරන්නේ ස්වභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මඟින් මහජනතාව, පාරිභෝගිකයන්, අධිකාරීන්, සේවයකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුකලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.

බැලූ බැල්මට

3,403 කි.මී.
සම්ප්‍රේෂණ මාර්ග

200,119 කි.මී.
බෙදාහැරීමේ මාර්ග

40.92 රු./කි.වො.පැ.
ඒකකයකට
සාමාන්‍ය පිරිවැය

42.86 රු./කි.වො.පැ.
ඒකකයකට
විකුණුම් මිල

606,627 රු. මිලියන
ආදායම

548,294 රු. මිලියන
අලෙවි පිරිවැය



වහළ මත
සවිකරන සූර්ය
පැනල ධාරිතාව
652 මෙ.වො.

සමස්ත
වත්කම්
1,204,374 රු.
මිලියන



පුනර්ජනනීය
ධාරිතාවය
2,293
මෙ.වො.



දිවයින පුරා
සේවකයන් සංඛ්‍යාව
23,069

සමස්ත
ධාරිතාවය
4,381 මෙ.වො.





ශ්‍රී ලංකා
දිවයින පුරා විහිදී ඇත



සමාරම්භය
1969

7,024,763




විදුලිය සම්බන්ධතා
සංඛ්‍යාව




විදුලිය අලෙවිය
14,153
ගි.වො.පැ.

2023-12-31 දිනට අපගේ කාර්ය බලකාය


කාර්ය බලකාය




සේවා කාණ්ඩයන්




වයස් විග්‍රහය



සේවා විග්‍රහය



සේවා කාණ්ඩ විග්‍රහය



අතීත කාර්ය සාධනයන්









	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
දළ බලශක්ති ජනනය (ගි.වො.පැ.)	12,423	13,154	14,249	14,773	15,985	16,556	16,392	17,378	16,576	16,172
සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනය* (ගි.වො.පැ.)	1,217	1,467	1,160	1,464	1,832	1,761	1,866	2,922	2,937	3,222
උපරිම ඉල්ලුම (මෙ.වො.)	2,152	2,283	2,453	2,523	2,616	2,669	2,717	2,802	2,708	2415
විදුලිය අලෙවිය (ගි.වො.පැ.)	11,063	11,786	12,785	13,431	14,091	14,611	14,286	15,214	14,520	14,153
පාරිභෝගික ගිණුම් (සංඛ්‍යාව)	5,417,532	5,648,132	5,964,194	6,193,131	6,354,281	6,500,641	6,636,266	6,809,528	6,936,735	7,024,763
පද්ධතිමය බලශක්ති හානිය (%)	10.9	10.4	10.3	8.5	8.3	8.2	9.1	8.7	8.8	9.3
ආදායම (රු. මිලියන)	202,645	188,684	206,811	218,450	229,571	242,950	238,911	248,776	308,457	606,627
සාමාන්‍ය විකුණුම් මිල (රු./කි.වො.පැ.) - (අ)	18.50	16.00	16.18	16.26	16.29	16.63	16.72	16.37	21.24	42.86
අලෙවි ලක්ෂ්‍යයේදී සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) - (අ)	20.00	15.07	18.08	20.34	19.12	24.12	21.67	19.42	33.65	40.92
වසර තුළ විදුලියනය කළ නිවාස (සංඛ්‍යාව)	178,300	198,166	277,038	181,627	118,077	108,315	98,829	125,277	94,768	65,306

* - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය - (කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ, පෙවස්කන්ධ හා නාගරික අපද්‍රව්‍ය)
(අ) - තාවකාලික

ආයතනික තොරතුරු

නෛතික ස්වභාවය

ලංකා විදුලිබල මණ්ඩලය යනු 1969 අංක 31, 1979 අංක 29, 1988 අංක 32 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත සහ 2013 අංක 31 දරණ පනත මඟින් සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

සභාපති

එන්. එස්. ඉලංගකෝන් මහතා — 2022-06-13 දින සිට

උප සභාපති

ඩී. කේ. පී. යූ. ගුණතිලක මහතා — 2023-05-10 දින සිට

මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික

එම්. ආර්. වී. ආර්. මීපුර මහතා — 2022-01-11 දින සිට

සාමාජිකයෝ

ආර්. වික්‍රමාරච්චි මහතා	2023-05-02 දින දක්වා
ඩී. පී. එම්. චන්දන මහතා	2023-03-15 දින දක්වා
ආචාර්ය බී. විජයරත්න මහතා	2021-01-07 දින සිට
ජී. පී. එන්. එම්. අබේසේකර මහතා	2021-12-24 දින සිට
ඊ. එස්. ජී. වීදිරිසිංහ මහතා	2023-01-31 දින සිට
මහාචාර්ය පී. බී. ආර්. දිසානායක මහතා	2023-03-23 දින සිට

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

එච්. ආර්. පී. පත්බේරිය මිය

සාමාන්‍යාධිකාරී

ඉංජිනේරු ජී. ඒ. ඩී. ආර්. පී. සෙනෙවිරත්න මහතා	2022-12-19 සිට 2023-09-19 දක්වා
ඉංජිනේරු (ආචාර්ය) නරේන්ද්‍ර ද සිල්වා මහතා	2023-09-20 සිට

ආයතනික කළමනාකරණය

අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)

ඉංජිනේරු ඩී. එන්. නවරත්න මහතා	2023-01-01 සිට 2023-10-10 දක්වා
ඉංජිනේරු එන්. එස්. වෙත්තසිංහ මහතා	2023-10-11 දින සිට රාජකාරී ආවරණය කරයි

අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ - රුහැන් රහිත මෙහෙයුම්)

ඉංජිනේරු කේ. ජී. ආර්. එෆ්. කොමස්ටර් මහතා — 2023-01-01 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ - රුහැන් සහිත මෙහෙයුම්)

ඉංජිනේරු එන්.එස්. වෙත්තසිංහ මහතා — 2023-01-01 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 1)

ඉංජිනේරු එස්. ඒ. ඩී. ඒ. පීරිස් මහතා — 2023-01-01 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 2)

ඉංජිනේරු ටී. ඒ. කේ. ජයසේකර මහත්මිය	2023-07-29 දක්වා
ඉංජිනේරු කේ. ජී. ආර්. එෆ්. කොමස්ටර් මහතා	2023-07-30 දින සිට රාජකාරී ආවරණය කරයි

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 3)

ඉංජිනේරු ජී. ජේ. අලුත්ගේ මහතා	2023-10-26 දක්වා
ඉංජිනේරු ජී. අයි. ඩී. එච්. කේ. රණසිංහ මහතා	2023-10-27 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 4)

ඉංජිනේරු එම්. ටී. පී. ඩී. තන්තිරිමලගේ මහතා — 2023-01-01 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)

ඉංජිනේරු එම්. ජී. ඒ. ගුණතිලක මහතා	2023-01-01 සිට 2023-05-08 දක්වා
ඉංජිනේරු එන්. එස්. වෙත්තසිංහ මහතා	2023-05-09 සිට 2023-05-21 දක්වා රාජකාරී ආවරණය කරයි
ඉංජිනේරු එස්. එච්. දිද්දෙනිය මහත්මිය	2023-05-22 දින සිට

අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)

ඉංජිනේරු කේ. ඒ. කේ. කොලොන්නේ මහතා	2023-01-01 සිට 2023-05-20 දක්වා 2023-10-27 දින සිට රාජකාරී ආවරණය කරයි.
ඉංජිනේරු ජී. අයි. ඩී. එච්. කේ. රණසිංහ මහතා	2023-05-21 සිට 2023-10-26 දක්වා

අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

ඉංජිනේරු සී. ඩී. සතරසිංහ මහත්මිය — 2023-01-01 දින සිට


මුදල් කළමනාකරු

ටී. කේ. ලියනගේ මහතා

මුදල් කළමනාකරු (උපායමාර්ගික කළමනාකරණ සහ තොග සැපයුම් මෙහෙයුම්)

එස්. එන්. ප්‍රනාන්දු මහතා — 2023-11-01 දින සිට

සංවිධාන ව්‍යුහය 2023



නි.සා. (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නි.සා. (ක්‍රියාකාරීය ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නි.සා. (තොරතුරු තාක්ෂණ)
නි.සා. (පර්යේෂණ හා සංවර්ධන)

නි.සා. (ආයතනික හා නියාමන සම්බන්ධතා)
නි.සා. (වත්කම් කළමනාකරණ හා තත්ව නියාමන)
නි.සා. (පාලන හා ආරක්ෂණ)
නි.සා. (සන්නිවේදන)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - උතුර)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණ)

නි.සා. (බලශක්ති අලෙවිකරණ)
නි.සා. (බලශක්තිය මිලදී ගැනීම්)
නි.සා. (පුද්ගලික බලශක්ති සංවර්ධන)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති ප්‍රසම්පාදන හා කාර්යසාධන අධීක්ෂණ)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති සංවර්ධන)
නි.සා. (පද්ධති පාලන)
නි.සා. (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
නි.සා. (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
අ.මු.ක. (සම්ප්‍රේෂණ)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධීසැර නඩත්තු)
නි.සා. (මධ්‍යම පළාත I)
නි.සා. (මධ්‍යම පළාත II)
නි.සා. (නැගෙනහිර පළාත)
නි.සා. (බස්නාහිර පළාත උතුර)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 2)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධීසැර නඩත්තු)
නි.සා. (දකුණු පළාත I)
නි.සා. (දකුණු පළාත II)
නි.සා. (බස්නාහිර පළාත දකුණ I)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 4)

නි.සා. (වත්කම් කළමනාකරණ හා ආයතනික)
නි.සා. (සිවිල් කටයුතු හා ගොඩනැගිලි)
නි.සා. (වෘත්තීමය සෞඛ්‍යය හා ආරක්ෂාව)
නි.සා. (වැඩපල හා උපකාරක සේවා)
නි.සා. (ප්‍රහුණු කිරීම්)
ව්‍යා.අ. (විදුලක්පාය)
අ.මු.ක. (වත්කම් කළමනාකරණ)

අ.මු.ක. (ආයතනික)
අ.මු.ක. (මූලස්ථාන)

නි.සා. (ආයතනික කටයුතු)
නි.සා. (වත්කම් කළමනාකරණ - ජල විදුලි)
නි.සා. (වත්කම් කළමනාකරණ - ජල යාන්ත්‍රික)
නි.සා. (වත්කම් කළමනාකරණ - තාප විදුලි)
නි.සා. (වත්කම් කළමනාකරණ - තාප යාන්ත්‍රික)
නි.සා. (වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු)
නි.සා. (බලශක්ති විකුණුම්)
නි.සා. (ජනන ආරක්ෂණ)
නි.සා. (ලක්ෂපාන සංකීර්ණය),
නි.සා. (මහවැලි සංකීර්ණය)
නි.සා. (තාපබල සංකීර්ණය)
නි.සා. (සමනල සංකීර්ණය)
නි.සා. (ජනන ව්‍යාපෘති)
බ.ක. (ලක්විජය විදුලි බලාගාරය)
අ.මු.ක. (ජනන)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධීසැර නඩත්තු)
නි.සා. (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
නි.සා. (කොළඹ නගර)
නි.සා. (උතුරු මැද පළාත)
නි.සා. (උතුරු පළාත)
නි.සා. (වයඹ පළාත I)
නි.සා. (වයඹ පළාත II)
ව්‍යා.අ. (කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය I)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධීසැර නඩත්තු)
නි.සා. (සබරගමුව පළාත)
නි.සා. (ඌව පළාත)
නි.සා. (බස්නාහිර පළාත දකුණ II)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 3)

නි.සා. (ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ)
නි.සා. (ඉංජිනේරු උපදේශන සේවා)
නි.සා. (සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති)
නි.සා. (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
ව්‍යා.අ. (මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ භානි අවමකරණ ව්‍යාපෘතිය, විදුලි සැපයුමේහි විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 4,5, කාම්පුර් සූර්යබල, හම්බන්තොට Battery Backup)
ව්‍යා.අ. (හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන, උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය, විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 7)
ව්‍යා.අ. (දුව ස්වභාවික වායු ව්‍යාපෘතිය - පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය සංවර්ධනය සහ නැංගුරම් දැමීමේ පද්ධතිය)
ව්‍යා.අ. (මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය)
අ.මු.ක. (ව්‍යාපෘති)

නි.සා. (සම්බන්ධීකරණ)
නි.සා. (පිරිස්)
නි.සා. (ඉංජිනේරු විගණන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රධාන නීති නිලධාරී
කළමනාකරු, විමර්ශන

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අනු ආයතනද සහිතව ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2023





කළමනාකරණ සමාලෝචනය



සභාපතිතුමාගේ සමාලෝචනය

හිතවත් වටිනා පාර්ශ්වකරුවනි,

විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්පත් කරගෙන ඇති ප්‍රශංසනීය ප්‍රගතිය සමාලෝචනය කිරීමට ලැබීම මහත් සතුටකි. පසුගිය වසරවල මෙන්ම, ලංවිම 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත මඟින් නියම කර ඇති 'විදුලි කර්මාන්තය පිළිබඳ සාමාන්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ' වලට අනුකූලව උනන්දුමත් ලෙස කටයුතු කර ඇත.

2023 වසර අවසන් වන විට, මුළු රට පුරාම නිවාස සඳහා විදුලිය සැපයීමට ලංවිම තවදුරටත් සාර්ථකව කටයුතු කර ඇති බව සතුටින් වාර්තා කරමි. වසර තුළදී නව නිවාස 65,306 ක් සඳහා විදුලිය ලබා දී ඇති අතර, එමඟින් තවත් පවුල් රැසකට විශ්වසනීය හා දැරිය හැකි මිලකට විදුලිය භුක්ති විඳීමට හැකියාව ලැබී ඇත. අනෙකුත් පාරිභෝගික කාණ්ඩ එක් කිරීමත් සමඟ, වසර අවසානයේදී මුළු පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව 7,024,763 ක් දක්වා ඉහළ ගොස් ඇත.

අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා විහිදෙන වසරේ පළමු අර්ධය තුළ ජලාශ වලට සිදුවූ අඩු ජල ගලනය හේතුවෙන් ලංවිමට අභියෝගවලට මුහුණ දීමට සිදුවූ අතර, ඒ අනුව සැප්තැම්බර් මාසයේදී ගි.වො.පැ. 278.5 ක සැලකිය යුතු පහළ අගයක් සහිත ජල ගලනය සහිතව ගි.වො.පැ. 1,182.8 ක ජල ධාරිතාවක් වාර්තා විය. කෙසේ වෙතත්, අවසාන කාර්තුවේදී ජල ගලනයේ සැලකිය යුතු ඉහළ යාමක් සිදුවූ අතර, දෙසැම්බර් මාසයේදී උපරිම ගබඩා ධාරිතාව වන ගි.වො.පැ. 1,241.7 දක්වා ඉහළ ගොස් ජලාශ පූර්ණ ධාරිතා මට්ටමට ආසන්න විය. නොවැම්බර් මාසයේදී දෛනිකව සාමාන්‍ය ගි.වො.පැ. 35.4 බැගින් උපරිම මාසික ගලනය ගි.වො.පැ. 1,061.7 ක් වාර්තා විය. වසර අවසානයේදී ජලාශ වැහි ගබඩා ධාරිතාව වන මුළු ධාරිතාවයෙන් 97.6% ක් වූ ගි.වො.පැ. 1,217.5 ක් දක්වා සම්පූර්ණයෙන්ම පාහේ පිරී පැවතිණි. ප්‍රධාන ජල විදුලි බලය මුළු උත්පාදනයෙන් 29.4% ක දායකත්වයක් දැක්වූ නමුත්, මෙය පසුගිය වසරේ ජනනයට සාපේක්ෂව 14.7% ක අඩුවීමකි. ඒ අතර, ලක්විජය ගල් අඟුරු බලාගාරයේ (LVPP) නඩත්තු කටයුතු සම්බන්ධ බිඳවැටීම් හේතුවෙන් උත්පාදිත ඒකක ප්‍රමාණය 10% කින් පහත වැටුණි. ඒ අනුව, උත්පාදන ව්‍යුහය සෘජු උත්පාදන පිරිවැය මඟින් ආධිපත්‍ය දැරූ බැවින් උත්පාදන ස්ථානයේදී ඒකකයක පිරිවැය 2022 වසරේ කි.වෝ. පැයකට රු. 24.65 (නැවත ප්‍රකාශිත) සිට 2023 දී කි.වෝ. පැයකට රු. 29.18 දක්වා ඉහළ නැඟිණි.

2022 වසරේදී රට තුළ පැවති මූල්‍යමය බාධක හේතුවෙන් ලංවිම විසින් සැලසුම් සහගත විදුලි බිඳවැටීම් ක්‍රියාත්මක කරන ලදි. 2023 පෙබරවාරි 15 වන විට මුළු නොසැපයූ බලශක්තිය ගි.වො.පැ. 88.6 ක් විය. මේ සම්බන්ධයෙන් ඇති වූ බාධා පිළිබඳව අපි කණගාටුව පළ කරමු. කෙසේ වෙතත්, ලංවිම අනාගතයේදී මෙවැනි සිදුවීම් වැළැක්වීම සහ අඛණ්ඩ විදුලි සැපයුම සහතික කිරීම සඳහා වැඩිදියුණු කළ මූල්‍ය කළමනාකරණය, වැඩිදියුණු කළ සැලසුම්කරණය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් හවුල්කාරිත්වයන්

> “රු. බිලියන 606.6 ක් දක්වා ආදායම 97% කින් වර්ධනය වූ අතර, එමඟින් එහි වසර 54 ක ඉතිහාසයේ ඉහළම ආදායම සනිටුහන් කෙරිණි. ශුද්ධ ලාභය රු. බිලියන 61.2 ක් දක්වා 121% කින් ඉහළ ගියේය.”

සභාපතිතුමාගේ සමාලෝචනය

වැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

අතිගරු ජනාධිපතිතුමාගේ රජය සතු ආයතනවල ස්වයං තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීමේ දැක්මට අනුකූලව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) අර්ධ වාර්ෂික ගාස්තු සංශෝධන අනුමත කළ අතර, එය ලංවිම හි සැලකිය යුතු මූල්‍ය කාර්යසාධනයකට දායක විය. රු. බිලියන 606.6 ක් දක්වා ආදායම 97% කින් වර්ධනය වූ අතර, එමගින් එහි වසර 54 ක ඉතිහාසයේ ඉහළම ආදායම සනිටුහන් කෙරිණි. ශුද්ධ ලාභය රු. බිලියන 61.2 ක් දක්වා 121% කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, රජය සතු ව්‍යවසායක් ලෙස, ලංවිම උපයන ලද ඕනෑම ලාභයක ප්‍රතිලාභ පාරිභෝගිකයන් වෙත ලබා දීමට කැපවී සිටින අතර, එමගින් ආයතනික තිරසාරත්වය සහතික කරමින් ඉහළ බලශක්ති පිරිවැය සඳහා වන බර සැහැල්ලු කිරීමට කටයුතු කරනු ලබයි.

ගෝලීය වසංගතය සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ අභියෝගවලට මුහුණ දුන්නද, විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා ලංවිම සිය සම්ප්‍රේෂණ ජාලය සාර්ථකව පුළුල් කර ඇත. ආර්ථික අර්බුදය හේතුවෙන් සැපයුම් දාමයේ බාධා සහ විදේශයන්ගෙන් උපකරණ ලබා ගැනීමේ ප්‍රමාද පැවතියදී වුව, රු. බිලියන 28.0 ඉක්මවූ ව්‍යාපෘති කාර්යයන් ප්‍රමාණයක් ඵලදායී ලෙස කළමනාකරණය කර ක්‍රියාත්මක කර ඇත.

ලංවිම පැරණි බිල්පත් පද්ධතිය වැඩිදියුණු කිරීම, වලාකුළු පාදක විද්‍යුත් තැපැල් වේදිකාවකට (Cloud-based email platform) සංක්‍රමණය වීම, ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම සහ සුහුරු මනු විසඳුමක් හඳුන්වාදීම ඇතුළු මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා නවීනතම තාක්ෂණික මුලපිරීම්ද අත්පත් කරගෙන ඇති අතර, එමගින් නවෝත්පාදනය සහ වැඩිදියුණු කරන ලද සේවා සැපයීම සඳහා ඇති කැපවීම පෙන්නුම් කරනු ලබයි.

නූතන පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන වැනි උත්සාහයන් සමඟ පාරිභෝගිකයන් සඳහා උසස් තත්ත්වයේ විදුලි සැපයුමක් සහ සේවාවන් සහතික කිරීම ලංවිම හි ඉහළම ප්‍රමුඛතාවයක් ලෙස පවතී.

අවසාන වශයෙන්, වසර පුරා ලබා දුන් නොසැලෙන සහයෝගය සහ උපකාරය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය සාමාජිකයින්ට සහ ආයතනික කළමනාකරණ කමිටුවට මාගේ හෘදයාංගම කෘතඥතාවය පුද කරමි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර පවතින සුහද සම්බන්ධතාවය ඵලදායී තීරණ ගැනීම සහ ආයතනික ප්‍රගතිය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට උපකාරී වී ඇත.

එන්.එස්. ඉලංගකෝන්
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය





සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන්, 2023 වසරේ ආයතනයේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම වසර තුළ සැලකිය යුතු අභියෝග ඉදිරිපත් වුවද, ලංවිම සඳහා සුවිශේෂී ජයග්‍රහණ ද අත්පත් කරගන්නා ලදි. විශේෂයෙන්, 2016 සිට 2022 දක්වා කාලය තුළ අඛණ්ඩ පාඩු ලැබීමෙන් අනතුරුව 2023 දී ලංවිම රුපියල් බිලියන 61.24 ක ශුද්ධ ලාභයක් වාර්තා කළේය.

2023 වසරේදී, අපගේ සේවාවන්හි ස්ථාවරත්වය සහ වර්ධනය සහතික කිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළෙමු. රට පුරා දින 24x7 පුරා විදුලි සැපයුම සාර්ථකව පවත්වාගෙන යමින්, ජාතික පද්ධතියට සැලකිය යුතු පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසූ අතර පිරිවැය පිළිබිඹු කරන ගාස්තු ව්‍යුහයක් හඳුන්වා දුන්නෙමු. සාර්ථක මූල්‍ය කළමනාකරණ පියවර සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කළ අතර, එමගින් අපගේ ලාභදායීත්වය සහ මූල්‍ය ස්ථාවරත්වය වැඩි දියුණු වී ඇත.

අපගේ විදුලි ජනන වත්කම්වල විශ්වසනීයත්වය සහ ආයු කාලය සහතික කිරීම සඳහා ජනන ධාරිතා වැඩිදියුණු කරමින්, ජනන යෙදවුම සහ නිවාරණ නඩත්තු සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළෙමු. අඩාල වූ ව්‍යාපෘති නැවත ආරම්භ කළ අතර, උසස් බෙදාහැරීම් කළමනාකරණ ව්‍යාපෘති ඇතුළු විවිධාකාර උපායමාර්ගික ව්‍යාපෘති ආරම්භ කළෙමු. ඊට අමතරව, කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කර ඇති ක්‍රියාකාරකම් විමධ්‍යගත කිරීමෙන් අපගේ මෙහෙයුම් ඒකක ප්‍රතිසංස්කරණය කළෙමු. මානව සම්පත් කළමනාකරණය සහ සේවක දුක්ගැනවිලි විසඳීම කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම හරහා වඩාත් උපකාරක හා ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කර ඇත.

වසර පුරාම යහපාලනයේ සහ ආචාරධර්මීය භාවිතයන්හි ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට කැපවී සිටියෙමු. අපගේ ජයග්‍රහණ මගින් අපගේ සේවකයින්ගේ කැපවීම සහ වෙහෙස මහන්සිය, අපගේ පාර්ශ්වකරුවන්ගේ සහාය සහ අපගේ නායකත්වය විසින් සකස් කරන ලද උපායමාර්ගික දිශානතිය සාක්ෂාත් කෙරේ. මෙම උත්සාහයන් අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට පමණක් නොව රටේ වඩාත් තිරසර බලශක්ති අනාගතයකට ද දායක විය.

> “2023 වසරේ සාර්ථකත්වයන් මගින් ලංවිම සේවකයින්ගේ කැපවීම හා වෙහෙස මහන්සිය, එහි නායකත්වයේ උපායමාර්ගික දිශානතිය, සහ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය පිළිබිඹු කෙරේ. සැලකිය යුතු අභියෝගයන් ජය ගැනීමට, මූල්‍ය ස්ථාවරත්වය ඇති කර ගැනීමට, අඛණ්ඩ විදුලි සැපයුමක් පවත්වා ගැනීමට සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ආයතනය සතු හැකියාව එහි අනාගත වර්ධනය සඳහා යහපත් පදනමක් සපයයි.”

2023 වසරේ ආරම්භය

රට මුහුණ දුන් ආර්ථික අභියෝග සහ ලංවිම මුහුණ දුන් දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේදී ආරම්භ කරන ලද පැය තුනක විදුලි බිඳවැටීම් වැඩසටහනක් සමඟින් මෙම වසර ආරම්භ විය. මෙම විදුලි බිඳවැටීම් වැඩසටහන අපගේ පාරිභෝගිකයන්ට සැලකිය යුතු දුෂ්කරතා ඇති කළේය. වසර ආරම්භයේදී ලංවිම හි සහ රටේ දැඩි මූල්‍ය අර්බුදය මධ්‍යයේ අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේ අභියෝග හේතුවෙන් ලංවිමට අවශ්‍ය පාරිභෝගික සේවා සහ සේවා මට්ටම් පවත්වාගෙන යා නොහැකි විය. නව සේවා සම්බන්ධතා ලබා දීම නතර කරන ලද අතර සේවා සම්බන්ධතා 36,000 ක් ලබාදීමේ ප්‍රමාදයක් පැවතුණි.

විදුලි බලාගාර සහ අනෙකුත් උපකරණවල නඩත්තු කටයුතු අඩු කරන ලදී. ලංවිම 2022 වසරේදී රුපියල් බිලියන 298 ක ශුද්ධ මූල්‍ය පාඩුවක් වාර්තා කළේය. ලංවිම තුළ පැවති දැඩි මූල්‍ය අර්බුදය සහ රටේ විදේශ විනිමය සංචිත හිඟවීම හේතුවෙන් ඉන්ධන, ගල් අඟුරු සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා සේවා ප්‍රසම්පාදනය කිරීම බරපතල කාර්යයක් විය. ලෝක වෙළඳපොළේ මිල ගණන් ඉහළ යාම සහ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ගල් අඟුරු, තෙල් සහ අනෙකුත් අත්‍යවශ්‍ය අයිතමවල මිල ඉහළ ගියේය. පුනර්ජනනීය බලශක්ති උත්පාදකයින්, වහළ මත සවිකරන සූර්ය බලශක්ති පැනල නිෂ්පාදකයින් සහ දේශීය සැපයුම්කරුවන් සඳහා ප්‍රමාද වූ ගෙවීම් පිළිවෙලින් රුපියල් බිලියන 36.6 ක් (පොළිය රහිතව), රුපියල් බිලියන 3.7 ක් සහ රුපියල් බිලියන 6.5 ක් විය. භාණ්ඩාගාරය මුහුණ පා තිබූ අභියෝග හේතුවෙන් එයට ලංවිමට සහාය විය නොහැකි වූ අතර දුර්වල ආදායම් උත්පාදනය සහ ණය සේවා කිරීමේ දුෂ්කරතා හේතුවෙන් වාණිජ බැංකු වලින් කාරක ප්‍රාග්ධන ණය ලබා ගැනීම ගැටලුවක් විය.

2023 පෙබරවාරි 15 සිට දින 24x7 පුරා විදුලි සැපයුම ලබාදීම

2023 පෙබරවාරි 15 සිට රට තුළ දින 24x7 පුරා විදුලි සැපයුම ලබා දීමට අපට හැකි විය. අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා දීම සැලකිය යුතු අභියෝගයක් වූ අතර ඒ සඳහා සූක්ෂම සැලසුම් සහ පාර්ශ්වකරුවන්ගේ සහාය අවශ්‍ය විය. ප්‍රශස්ත බලශක්ති මුහුවක් සහිත ජනන යෙදවුම් දර්ශන සංවර්ධනය කිරීම, පිරිවැය-පිළිබිඹු කරන ගාස්තුවක් සුරක්ෂිත කිරීම, අතිරේක ජනන ධාරිතා ලබා ගැනීම, කාලීනව ගල් අඟුරු සහ තෙල් ප්‍රසම්පාදනය කිරීම, නඩත්තු වැඩසටහන් සැලකිලිමත්ව කළමනාකරණය කිරීම, නව පුනර්ජනනීය බලාගාර සඳහා ජාල සම්බන්ධතා කඩිනම් කිරීම සහ සම්ප්‍රේෂණ බාධක ඉවත් කිරීම ප්‍රධාන මූලපිරිම් අතර විය. මාගේ නායකත්වය යටතේ ව්‍යාත්තීය කණ්ඩායමක් 2023 වසර සඳහා ශක්‍ය උත්පාදන යෙදවුම් දර්ශන හඳුනා ගැනීමට සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කළ අතර වඩාත් ශක්‍ය දර්ශනය තීරණය කරන ලදී. මෙය ජනන අයවැය සහ ගාස්තු ගොනු කිරීම සඳහා තොරතුරු සැපයූ අතර 2023 පෙබරවාරි 15 දින විදුලි ගාස්තු ඉහළ නැංවීමකට හේතු පාදක විය.

2023 අප්‍රේල් මාසයේදී, පුළුල් සාකච්ඡා වලින් පසු ලංවිම (~KCCP2~ ලෙස නම් කරන ලද) මෙගාවොට් 163 ක සොපිටිස් සංයුක්ත චක්‍ර බලාගාරය භාර ගත් අතර වහාම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී. ඊට අමතරව, දකුණු පළාතේ විදුලි ස්ථායීතාව වැඩි දියුණු කිරීම සඳහා කොලොන්නාව සහ තුල්හිරිය යන ස්ථාන වල ස්ථාපිත කර තිබූ ඩීසල් ජනක යන්ත්‍ර ස්ථාන මාරු කිරීමෙන් දින 32 ක් තුළ හම්බන්තොට දකුණු ජනනී නමින් මෙගාවොට් 24 ක ඩීසල් බලාගාරයක් ඉදි කරන ලදී. ප්‍රමාද වූ කිලෝවෝල්ට් 220 නව පොල්පිටිය-හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් සාර්ථක ආරවුල් නිරාකරණ ක්‍රියාවලියක් හරහා විසඳා 2023 අගෝස්තු මාසයේදී වැඩ අවසන් කරන ලදී. මෙය දකුණු පළාතට අඛණ්ඩ විදුලි සැපයුමක් සිදු කිරීමේ කාර්යය පහසු කළ අතර සමනල වැව ජලාශයේ ජල කළමනාකරණයටද සහාය විය. ලක්විජය බලාගාරයේ (LVPP) ඒකක 03, කුකුළේ සහ උකුවෙල බලාගාරවල ප්‍රධාන අලුත්වැඩියා ඇතුළුව සැලසුම් කළ බලාගාර නඩත්තු වැඩසටහන් සාර්ථකව නිම කරන ලදී. තෙල් සහ ගල් අඟුරු සැපයුම් අභියෝග විසඳීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ගල් අඟුරු සමාගම සමඟ සම්බන්ධීකරණය වැඩි දියුණු කරන ලදී.

මැයි සිට ජූලි දක්වා අපේක්ෂිත නිරිත දිග මෝසම් වර්ෂාව නොලැබීම හේතුවෙන් ජලාශවල ජල මට්ටම් පහත වැටුණි. මෙම කාලය තුළ තාප විදුලිය ජනනය වැඩි කිරීමෙන් විදුලි ජනන මුහුව කළමනාකරණය කරන ලදී. ACE Power ඇඹිලිපිටිය සහ මාතර බලාගාර වලින් හදිසි අතිරේක විදුලිය ප්‍රසම්පාදනය කරන ලදී. ලක්විජය බලාගාරයේ ඒකක 2 හි බිඳවැටීමක් සහ ඒකක 3 හි දින 100 ක අලුත්වැඩියාවක් තිබියදීත්, 2023 අගෝස්තු මාසයේ වියළි කාලය තුළ රටේ අඛණ්ඩ විදුලි සැපයුම පවත්වාගෙන යන ලදී. සැප්තැම්බර් මැද සිට දෙසැම්බර් දක්වා ලැබුණු අසාමාන්‍ය වර්ෂාපතනය හේතුවෙන් වසර අවසානය වන විට ජලාශ වල ජල ධාරිතාව ගිගාවොට් පැය 1200 ක් ඉක්මවා සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර ඊට සමගාමීව ජල විදුලි ජනනයද වර්ධනය විය.

2023 පෙබරවාරි 15 සිට පිරිවැය පිළිබිඹු කරන ගාස්තුව

2022 වසරේදී ලංවිම රුපියල් බිලියන 298 ක පාඩුවක් වාර්තා කළ අතර 2022 දෙසැම්බර් 31 වන විට ප්‍රධාන ගෙවිය යුතු දෑ රුපියල් බිලියන 524.8 ක් විය. ඊට ප්‍රතිචාර වශයෙන් රජය 2023 ජනවාරි 12 වන දින පිරිවැය පිළිබිඹු කරන විදුලි ගාස්තුවක් නියම කරමින් සහ විදුලි සහනාධාර සඳහා රජයේ මූල්‍ය සහාය අවසන් කරමින් නියෝග නිකුත් කළේය.

මෙයට අනුකූල වීම සඳහා, ලංවිම විසින් පවතින ගාස්තු, ගල් අඟුරු පවතින බව, ජලය ගලා වීමේ විචලනයන්, සැලසුම් කළ බලාගාර බිඳවැටීම්, සම්ප්‍රේෂණ සීමා සහ ඉල්ලුම් පුරෝකථන ආදී සාධක සැලකිල්ලට ගනිමින් විවිධ යෙදවුම් දර්ශන 20 ක් විශ්ලේෂණය කළේය. උසස් අනුකරණ මෘදුකාංග භාවිතයෙන්, ලංවිම විසින් හොඳම දර්ශනය හඳුනාගනිමින් 66.2% ක ගාස්තු වැඩිවීමක් ඉල්ලුම් කරමින් 2023 ජනවාරි 5 වන දින ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කළේය. මහජන හා රජයේ සංසදවලදී පුළුල් ලෙස සාධාරණීකරණය කළ මෙම යෝජනාව 2023 පෙබරවාරි 15 දින අනුමත කරන ලද නව ගාස්තුවකට මග පෑදීය. රජයේ මාර්ගෝපදේශවලට අනුව, ලංවිම 2023 මැයි 15 වන දින 3.15% ක ගාස්තු අඩු කිරීමක් යෝජනා කරමින් දෙවන ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කළේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 14.2% ක ගාස්තු අඩු කිරීමක් අනුමත කළේය. ජූලි-අගෝස්තු වියළි කාලය තුළ ඉහළ ගිය ඉල්ලුම සපුරාලීම සඳහා තාප විදුලිය පුළුල් ලෙස භාවිතා කරන ලදී. නියඟ තත්ත්වයන් පැවතීමත් සමඟ 2023 සැප්තැම්බර් 4 වන දින විශේෂ ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. අනතුරුව රජය ගාස්තු කාලසීමාව කාර්තුමය පදනමකට සකස් කළ අතර 2023 ඔක්තෝබර් 17 වන දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 18% ක ගාස්තු වැඩිවීමක් ලබා දෙන ලදී.

පිරිවැය-ප්‍රතිබිම්බිත ගාස්තු ක්‍රමය මගින් ලං.වි.ම. හි මූල්‍ය ප්‍රතිසාධනය පහසු කරන ලද අතර, එමගින් අමතර ණය ලබා ගැනීමට, ගල්අඟුරු තොග 30 ක් මිලදී ගැනීමට, අවශ්‍ය ද්‍රව ඉන්ධන ප්‍රමාණය ලබා ගැනීමට සහ හිඟ ණය පියවීමට හැකි විය. නඩත්තු කටයුතු සහ අත්‍යවශ්‍ය සේවා සම්බන්ධතා නැවත ආරම්භ කරන ලද අතර හිඟව පැවති සේවා සම්බන්ධතා 36,000 ක් ලබා දීම ආරම්භ කරන ලදී.

ලං.වි.ම. හි වැඩි දියුණු වූ ලාභදායීත්වය සහ මූල්‍ය ස්ථාවරත්වය

2023 වසරේදී, ලං.වි.ම. රු. බිලියන 61.24 ක ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, එය 2016 සිට 2022 දක්වා විඳින ලද අඛණ්ඩ පාඩුවලින් පසු සැලකිය යුතු හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළේය.

වසර ආරම්භයේදී රු. බිලියන 524.8 ක සමුච්චිත ණය ප්‍රමාණයක් පැවතිණි. ප්‍රධාන ණය හිමියන් අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (රු. බිලියන 71.3), පෞද්ගලික විදුලි බල නිෂ්පාදකයින්

(රු. බිලියන 96.6) සහ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින් (රු. බිලියන 36.6) ඇතුළත් වූ අතර එය රු. බිලියන 204.5 ක් විය. අමතර ගෙවිය යුතු දෑ අතර වහළ මත සූර්ය පැනල සවි කරන්නන් සඳහා රු. බිලියන 3.7 ක් සහ කෙටි කාලීන ගෙවීම් වශයෙන් රු. බිලියන 39.7 ක් විය. කාරක ප්‍රාග්ධනය සඳහා වූ වාර ණය රු. බිලියන 162 ක් වූ අතර, ව්‍යාපෘති ණය රු. බිලියන 119 ක් විය.

ලං.වි.ම. සඳහා සහනාධාර ලබා නොදීමේ රජයේ ප්‍රතිපත්තියට සහ අඛණ්ඩ විදුලි සැපයුම පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන්, මාගේ මඟ පෙන්වීම යටතේ ලං.වි.ම. හි වෘත්තිකයන් විසින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කරන ලදී. මෙම සැලැස්ම මගින් ලං.වි.ම. මෙහෙයුම් වශයෙන් ලාභදායී කිරීමට සහ පාර්ශ්වකරුවන්ගේ සහය ඇතිව එහි ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂා කෙරිණි. මූල්‍ය උපාය මාර්ගයේ ප්‍රධාන අංග අතර පිරිවැය පිළිබිඹු කිරීම සඳහා පාරිභෝගික ගාස්තු සංශෝධනය කිරීම, මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම් අඩු කිරීම, කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා කාරක ප්‍රාග්ධනය සුරක්ෂිත කිරීම සහ ණය හිමියන්ගේ ගෙවීම් ක්‍රමානුකූලව පියවීම ඇතුළත් විය.

පළමු පියවර ලෙස, විස්තීර්ණ අධ්‍යයනයන් සිදු කරන ලද අතර ගාස්තු සංශෝධන සඳහා ගාස්තු යෝජනා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ගොනු කර නව ගාස්තු යෝජනා පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කරන ලදී. 2023 වසරේදී මෙම ගාස්තු සංශෝධන අනුමත කිරීමෙන් පසු, ලං.වි.ම. හි මුළු ආදායම, අනෙකුත් ආදායම් ද ඇතුළුව, 2022 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම ආදායම් වර්ධනය සමඟ ගල් අඟුරු මිල අඩුවීම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාගත් ඉන්ධන මිල අඩුවීම, ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම, පොලී අනුපාත අඩුවීම, මෙහෙයුම් හා නඩත්තු වියදම් අඩුවීම, පුනරාවර්තන වියදම් අඩුවීම යන කරුණු හේතුවෙන් පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා පිරිවැය අඩුවීම මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීමට දායක විය.

2023 පෙබරවාරි 15 වන දින පළමු ගාස්තු සංශෝධනය ලැබීමෙන් පසුව පවා ගල්අඟුරු මිලදී ගැනීම, තෙල් මිලදී ගැනීම, ස්වාධීන විදුලි බල නිෂ්පාදකයින් සහ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින් සඳහා ගෙවීම් පියවීම, මෙහෙයුම් හා නඩත්තු ද්‍රව්‍ය මිලදී ගැනීම, විදුලි බලාගාරවල ප්‍රධාන අලුත්වැඩියා සඳහා වියදම් දැරීම, දෛනික මෙහෙයුම් පිරිවැය සපුරාලීම සහ ඉහත සඳහන් මිලදී ගැනීම් සඳහා මහ බැංකුවෙන් විදේශ විනිමය ලබා ගැනීම සඳහා කාරක ප්‍රාග්ධනය ලබා ගැනීම සැබවින්ම අභියෝගාත්මක විය. ගාස්තු සංශෝධනයකින් පසු ආදායම වැඩි වීමට සැලකිය යුතු කාලයක් ගත වන බැවින්, ඉහත සඳහන් වියදම් සපුරාලීම සඳහා වාණිජ බැංකුවලින් කෙටි කාලීන මූල්‍යනය සිදුකර ගැනීම පිළිබඳ සොයා බැලීමට ලං.වි.ම. ට සිදු වූ අතර ඵලදායී ලෙස ණය ලබා ගැනීමට හැකි විය. මූල්‍ය අංශය විසින් ඵලදායී මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම මගින් ගල්අඟුරු මිලදී ගැනීම, ඉන්ධන සැපයුම් ගෙවීම්, ද්‍රව්‍ය මිලදී ගැනීම, පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්, සැපයුම්කරුවන් සඳහා සිදු කරන ගෙවීම් පියවීම සහ ප්‍රධාන අලුත්වැඩියා සඳහා වියදම් දැරීම ආදී මූල්‍ය බැඳීම් ක්‍රමානුකූලව ඉටු කිරීමට ලං.වි.ම. ට හැකි විය.

2023 වසර අවසානය වන විට, ලං.වි.ම. හි මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී තිබුණි. වහළ මත සවි කරන සූර්ය බලශක්ති පැනල නිෂ්පාදකයින් සහ දේශීය සැපයුම්කරුවන්ට තිබූ සමුච්චිත හිඟ මුදල් සම්පූර්ණයෙන්ම පියවා ඇති අතර පොලිය ද ඇතුළුව පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ට තිබූ හිඟ මුදල රු. බිලියන 26.2 දක්වා අඩු කර ඇත. ස්වාධීන විදුලි බල නිෂ්පාදකයින්ට තිබූ හිඟ ගෙවීම් රු. බිලියන 96.6 සිට රු. බිලියන 52.6 දක්වා අඩු කර ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට තිබූ හිඟ ගෙවීම් රු. බිලියන 71.3 සිට බිංදුව දක්වා අඩු කර ඇත. භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. බිලියන 126.2 ක ප්‍රාග්ධන ආධාරය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන විදුලි බල නිෂ්පාදකයින්ට තිබූ හිඟ ගෙවීම් පියවීමට උපකාරී විය. වසර අවසානයේ මුළු සමුච්චිත ණය ප්‍රමාණය රු. බිලියන 444.1 ක් විය.

මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අවශ්‍යතාවලට අනුකූලව, ලං.වි.ම. විසින් 2023 දී තොග සැපයුම් ගනුදෙනු බැංකු ගිණුම (BSTA) ක්‍රියාත්මක කරන ලද අතර, අභ්‍යන්තර මුදල් ප්‍රවාහ ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය කරන ලදී. බෙදාහැරීම් බලපත්‍රලාභීන්ගේ කාර්යයන් අවසර ලත් ආදායම් මූලධර්මවලට අනුකූල වන පරිදි ප්‍රතිසංවිධානය කරන ලද අතර තොග සැපයුම් ගනුදෙනු බැංකු ගිණුමේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කරන ලදී. 2023 වසරේදී, ලං.වි.ම. වසර හතක දිගු කාලයක පාඩුවලින් පසු ලාභදායී තත්ත්වයට පත්වීමට පමණක් නොව එහි වගකීම්වලින් සැලකිය යුතු කොටසක් පියවීමටද සමත් විය. උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය සහ පාර්ශ්වකරුවන්ගේ සහය මගින් මෙම ප්‍රතිසාධනය ළඟා කර ගන්නා ලදී.

පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව ව්‍යවස්ථාපිත ගිණුම් සහ නියාමන ගිණුම් කාලානුරූපව පිළියෙල කරන ලද අතර මූල්‍ය වාර්තාකරණයේ ඉහළ නිරවද්‍යතා සහ අවංකභාවය පවත්වා ගෙන යන ලදී.

2023 වසරේ බලශක්ති මුහුව

2023 වසරේ මුළු විදුලි බලශක්ති උත්පාදනය ගිගාවොට් පැය 15,576 ක් වූ අතර, රටේ බලශක්ති ඉල්ලුම අඩුවීම හේතුවෙන් 2022 ට සාපේක්ෂව 2.3% ක අඩුවීමක් පෙන්නුම් කරයි. සහායක සැපයුම් ද ඇතුළුව දෛනික සාමාන්‍ය උත්පාදනය දිනකට ගිගාවොට් පැය 44.3 ක් වූ අතර, එය වසර මුළදී පුරෝකථනය කර තිබූ දිනකට ගිගාවොට් පැය 45.0 ක අගයට ආසන්න විය.

වසර තුළදී, රටේ විදුලි බලශක්ති අවශ්‍යතාවයෙන් 50% ක් පුනර්ජනනීය සම්පත්වලින් ජනනය කර ඇති අතර, එය ගෝලීය සාමාන්‍යය වන 26% ට සාපේක්ෂව සැලකිය යුතු ජයග්‍රහණයකි. 2023 දී සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය බලශක්ති මිශ්‍රණයට 21% කින් දායක විය. ශ්‍රී ලංකාවේ ස්ථාපිත විදුලි බල උත්පාදන ධාරිතාවයෙන් 59% ක් පමණ පුනර්ජනනීය බලාගාරවලින් ලබා ගන්නා ලදී. වහළ මත සූර්ය උත්පාදනය ද ඇතුළුව සූර්ය බලශක්තිය බලශක්ති මිශ්‍රණයෙන් 5.5% ක් පමණ වූ අතර සුළං බලශක්තිය 5.3% කින් පමණ දායක විය. ප්‍රධාන ජල විදුලි බලය ගිගාවොට් පැය 4,573 ක් හෙවත් බලශක්ති මිශ්‍රණයෙන් 29.4% කට දායක වූ අතර එය වසර මුළදී ලං.වි.ම. විසින් පුරෝකථනය කර තිබූ ගිගාවොට් පැය 4,500 ක අගයට ආසන්න විය.

වසර තුළ ස්ථාවර විදුලි බල උත්පාදනය ලං.වි.ම. සහ පෞද්ගලික අංශයට අයත් ගල්අඟුරු සහ තෙල් පදනම් කරගත් බලාගාරවලින් ලබා ගන්නා ලදී. ගල්අඟුරු බලශක්තිය බලශක්ති මිශ්‍රණයට 29.8% කින් ද, තෙල් පදනම් කරගත් බලශක්තිය 20.1% කින් ද දායක විය. පුනර්ජනනීය ප්‍රභවයන් ද ඇතුළුව පෞද්ගලික විදුලි බලය බලශක්ති මිශ්‍රණයෙන් 25.6% ක් විය. වසරේ වාර්තා වූ උපරිම ඉල්ලුම මෙගාවොට් 2,415 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 11% ක අඩුවීමකි.

විකුණුම් සහ ආදායම් එකතු කිරීම

2023 වසරේදී, රටේ පැවති අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් බලශක්ති විකුණුම් ගිගාවොට් පැය 14,153 ක් වූ අතර එය 2022 ට සාපේක්ෂව 2.5% ක අඩුවීමකි. බෙදාහැරීම් අංශ 2 ඉහළම විදුලි විකුණුම් සහ ආදායම් වාර්තා කළ අතර, අනතුරුව පිළිවෙලින් අංශ 1, 3 සහ 4 විසින් වැඩි විකුණුම් ප්‍රමාණයන් වාර්තා කරන ලදි. සාමාන්‍ය විකුණුම් මිල රු. 42.86 ක් වූ අතර එය 2022 ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයක් වූ අතර විකුණුම් ස්ථානයේදී ඒකක පිරිවැය රු. 40.92 ක් විය.

අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් පැවතියද, නව සේවා සම්බන්ධතා 65,306 ක් ලබා දෙන ලද අතර, එමඟින් මුළු පාරිභෝගික සංඛ්‍යාව මිලියන 7.025 දක්වා ඉහළ ගියේය. වසර තුළදී හිඟව තිබූ සේවා සම්බන්ධතා 36,000 ක් ද නිරවුල් කරන ලදී. බිල්පත් කළ විකුණුම්වලින් ලද ආදායම රු. බිලියන 607 ක් දක්වා ඉහළ ගිය අතර එය 2022 ට වඩා සැලකිය යුතු ඉහළ අගයකි. ඉහළම ආදායම ගෘහස්ථ කාණ්ඩයෙන් උත්පාදනය වූ අතර, ඉනික්බිති කර්මාන්ත සහ සාමාන්‍ය කාර්ය කාණ්ඩ පෙළ ගැසිණි. වසර තුළදී ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කරන ලද අතර, වසර මුලදී මාස 1.32 ක්ව පැවති මාසික ආදායම් එකතු කරගැනීමේ කාලය මාස 1.25 දක්වා අඩු කර ගන්නා ලදී.

පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය

වසර තුළදී, මෙගාවොට් 150 ක පුනර්ජනනීය බලාගාර ධාරිතාවයන් ජාතික පද්ධතියට එක් කරන ලදී. මෙයට වහළ මත සූර්ය බලශක්ති සැලසුම් මෙගාවොට් 117 ක්, ජාලගත සූර්ය බලාගාර මෙගාවොට් 9 ක්, සුළං බලාගාර මෙගාවොට් 15 ක්, කුඩා ජල විදුලි බලාගාර මෙගාවොට් 5 ක් සහ ජෛව ස්කන්ධ බලාගාර මෙගාවොට් 4 ක් ඇතුළත් වේ. ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරනය (Net Accounting), ශුද්ධ ධන (Net Plus) සහ ශුද්ධ ධන ධන (Net Plus Plus) යන ව්‍යාපාරික ආකෘති සුමට කිරීම තුළින් වහළ මත සූර්ය බලශක්ති ප්‍රවර්ධනය කිරීමේදී ලං.වි.ම. සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. නව ශුද්ධ ධන ධන (Net Plus Plus) ආකෘතිය මඟින් තෙවන පාර්ශ්වයන්ට වහළ බදු දීමට හැකියාව ලැබුණු අතර, එමඟින් අතිරේක වහළ මත සූර්ය ධාරිතාවයන් ඒකාබද්ධ කිරීමට හැකි විය. ආයෝජනය, ව්‍යාපෘතියේ ජීවන චක්‍ර පිරිවැය, ව්‍යාපෘති ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් වැඩි වහළ මත සූර්ය බලශක්ති ස්ථාපනයන් දිරිගැන්වීම සඳහා සංවර්ධකයින්ට ආකර්ෂණීය සූර්ය බලශක්ති ගාස්තුවක් පිරිනමන ලදී.

"2023 සිට 2026 දක්වා සහ 2027 සිට 2030 දක්වා ජාතික පද්ධතියට පුනර්ජනනීය බලශක්ති සම්පත් ඒකාබද්ධ කිරීමේ ඉදිරි ගමන" පිළිබඳ වාර්තා සකස් කිරීම මඟින් ජාතික පද්ධතියට විශාල පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් ඒකාබද්ධ කිරීම පහසු කිරීමට ලං.වි.ම. විසින් ඵලදායී පියවර ගන්නා ලදී. මෙම උත්සාහයන් මඟින් රටේ පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කෙරිණි. තවද, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කඩිනම් කිරීම සඳහා ලං.වි.ම. විසින් "2023 සිට 2030 දක්වා සම්ප්‍රේෂණ පහසුකම් සංවර්ධනය කිරීමේ ඉදිරි ගමන" පිළිබඳ වාර්තාව සකස් කරන ලදී.

ඉදිකර-හිමිකර-මෙහෙයවන (BOO) පදනම මත සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම කඩිනම් කිරීමට ලං.වි.ම. සමත් වූ අතර ව්‍යාපෘතිය සඳහා අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කරන ලදී. මෙගාවොට් 150 ක හම්බන්තොට සූර්ය බලශක්ති ව්‍යාපෘති සහ රට පුරා විසිරී ඇති කුඩා පරිමාණ සූර්ය හා සුළං බලාගාර කිහිපයක් සඳහා ද අභිප්‍රාය ලිපි නිකුත් කරන ලදී. වසර තුළදී, ලං.වි.ම. සාම්පූර් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයූ අතර එහි ක්‍රියාත්මක කිරීම සහ අදාළ සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් (AIIB) සහාය ලබා ගන්නා ලදී. ඉදිකර-හිමිකර-මෙහෙයවන පදනම මත මන්නාරම මෙගාවොට් 50 ක සුළං බලාගාරයක් ඉදිකිරීම සඳහා මූලික කටයුතු සහ ටෙන්ඩර් ලේඛන සැකසීම සම්පූර්ණ කරන ලදී. මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට සහාය වීම සඳහා පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ශාඛාව අලුතින් පිහිටුවන ලදී.

ජාතික පද්ධතියට මහා පරිමාණ බලාගාර එක් කිරීම පහසු කිරීම

කෙරවලපිටිය මෙගාවොට් 350 ක සංයුක්ත චක්‍රීය බලාගාරය (සොබාදනවි) වසර අටකට පසු ඉදිකිරීම් ආරම්භ කරන ලද පළමු මූලික භාර තාප බලාගාරයයි. එහි ඉදිකිරීම් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (PPA) 2021 ජූනි 19 වන දින අත්සන් කරන ලදී. 2022 වසරේදී රටේ පැවති මූල්‍ය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ආසියානු සංවර්ධන බැංකුව ප්‍රමුඛ ණය අත්හිටුවන ලද අතර බලාගාරයේ ඉදිකිරීම් පිරිවැය ද විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය පරාමිතීන්ගෙන් බැහැරව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මේ හේතුවෙන් සංවර්ධකයා විසින් 2022 ජූනි 30 වන දින "හදිසි අනපේක්ෂිත තත්ත්වයක්" ප්‍රකාශයට පත් කර ඇත. ව්‍යාපෘතිය බැංකුකරණය කිරීමට හා ආසියානු සංවර්ධන බැංකුව ප්‍රමුඛ ණය වෙනුවට ශ්‍රී ලංකා බැංකුවලින් මූල්‍යනය ලබා ගැනීමට විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ පරාමිතීන් සංශෝධනය කළ යුතු බවට සංවර්ධකයා විසින් දන්වා ඇත.

මේ සම්බන්ධයෙන් විදුලිය මිලදී ගැනීමේ ගාස්තු සංශෝධනය සඳහා සාකච්ඡා ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 28 වන දින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට සංශෝධන අත්සන් කරන ලදී. රටේ අභියෝගාත්මක ආර්ථික තත්ත්වයක් තිබියදීත්, සංවර්ධකයා ව්‍යාපෘතියේ ස්ථාවර ප්‍රගතියක් පවත්වාගෙන ගිය අතර 2024 මැද භාගය වන විට මෙගාවොට් 212 ක ගෑස් ටර්බයිනය ක්‍රියාත්මක කිරීමෙන් සරල චක්‍රය සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය වසර 2023 දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලද අතර ප්‍රධාන සන්ධිස්ථාන සපුරාලීම සඳහා ඉදිකිරීම් කටයුතු සාර්ථකව සිදු කරන ලදී.

අත්හිටවූ ව්‍යාපෘති පුනර්ජීවනය

ශ්‍රී ලංකා රජය ණය ගෙවිය නොහැකි තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) විසින් 2022 අප්‍රේල් මාසයේදී විදුලිබල මණ්ඩලයේ පවතින සහ නව ව්‍යාපෘති සඳහා අරමුදල් වියදම් කිරීම අත්හිටුවන ලද අතර, එමඟින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතන අරමුදල් සපයන ව්‍යාපෘතිවල අවම ප්‍රගතියක් පෙන්නුම් කෙරිණි. ශ්‍රී ලංකාවේ ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාලයේ ධාරිතාව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මෙම අත්හිටුවීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාදයන්ට ලක්විය. කෙසේ වෙතත්, 2023 දී, ණය මුදල් නැවත ලබාදීම ආරම්භ වූ පසු ප්‍රතිපූරණය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙතින් පිරිනැමුණු අවබෝධය සමඟින් කොන්ත්‍රාත්කරුට හිඟ ගෙවීම් පියවීමෙන් විදුලිබල මණ්ඩල අරමුදල් භාවිතා කරමින් පැකේජ 01 සහ 02 හි වැඩ නැවත ආරම්භ කරන ලදී. පැකේජ 03 සහ 04 සඳහා වූ ගිවිසුම් 2023 මුල් භාගයේදී අවසන් කරන ලද අතර ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ වියදම් නැවත ආරම්භ වූ පසු නැවත

ටෙන්ඩර් කිරීමට සැලසුම් කර ඇත. කිලෝමීටර 23 ක් දිගින් යුත් පොල්පිටිය සිට කොත්මලේ දක්වා දිවෙන කි.වෝ.220/කි.වෝ.132 සතර පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය වැනි පැකේජ 03 යටතේ ඇති ඉහළ ප්‍රමුඛතා සහිත ඉදිකිරීමේ සම්ප්‍රේෂණ හා ඉදිකිරීම් ව්‍යාපෘති ශාඛාව විසින් නැවත ආරම්භ කරන ලදී. විදුලිබල මණ්ඩලය විසින් අරමුදල් සපයන මෙම වැදගත් කාර්යයන් 2025 අප්‍රේල් වන විට නිම කිරීමට ඉලක්ක කර ඇත.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයනු ලබන හරිත විදුලිබල සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (GPDEEIIP) අදියර-2 ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර 56 ක් දිග කි.වෝ. 33 කුළුණු මාර්ග, ගැන්ට්‍රි 04 ක් සහ ප්‍රාථමික උප පොළවල් 03 ක ඉදිකිරීම් 2023 වසර තුළ මනා ප්‍රගතියක් ලබා වසර අවසානය වන විට කටයුතුවලින් 95% ක් නිම කර ඇත. ඉඩම් ආරවුලක් හේතුවෙන් ප්‍රමාද වූ කි.වෝ. 220 නව පොල්පිටිය-හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය සාර්ථක හා පුළුල් ආරවුල් නිරාකරණයක් හරහා විසඳා 2023 අගෝස්තු මාසයේදී නිම කර ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් දකුණු පළාතේ විදුලි සැපයුමේ විශ්වසනීයත්වය වැඩි දියුණු විය.

කොවිඩ්-19 වසංගතය සහ රටේ දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් ප්‍රමාද වූ විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - පැකේජ 4, දීර්ඝ කාලීනව පැවති ගැටලු සාර්ථකව හසුරුවා ගැනීමෙන් පසු 2023 වසරේදී මනා ප්‍රගතියක් ලබාගන්නා ලදුව ව්‍යාපෘති ප්‍රගතිය 2023 වසරේදී 38% සිට 63% දක්වා ඉහළ නැංවිණි.

2023 මැයි මාසයේදී, ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ විදුලිබල මණ්ඩලයේ බස්නාහිර පළාත දකුණ 1 සඳහා අධීක්ෂණ පාලන සහ දත්ත උකහා ගැනුම් (SCADA) සහාය සහිත බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා GE T&D India Limited සහ GE Digital Services Europe සමූහය සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී. 2023 දෙසැම්බර් අවසන් වන විට පාලන මධ්‍යස්ථානයේ සිවිල් ඉදිකිරීම් සිදු කරමින් පැවති අතර, ද්‍රව්‍ය හා උපකරණ ලැබෙමින් පැවතිණි. 2023 ජූනි මාසයේදී, ලංකා විදුලිබල මණ්ඩලයේ පළමු වාණිජ පරිමාණ සුහුරු මනුකරණ ව්‍යාපෘතිය වන දෙහිවල සුහුරු මනුකරණ ව්‍යාපෘතිය සඳහා චීනයේ Yantai Dongfang Wisdom Electric Co. Ltd සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ දෙහිවල ප්‍රදේශයේ චිකලා, තෙකලා සහ තොග පාරිභෝගිකයන් 50,000 ක් පමණ සඳහා සුහුරු මනු පද්ධතියක් සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. 2023 දෙසැම්බර් වන විට ව්‍යාපෘතියේ විස්තරාත්මක සැලසුම් සකස් කරමින් පැවතිණි.

ඉහළ ප්‍රමුඛතා සහිත සම්ප්‍රේෂණ ජාල වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා ද්‍රව්‍ය, උපකරණ සහ අමතර කොටස් මිලදී ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණයවලින් ඉතිරි කිරීම් සහ උපයෝජනය නොකළ අරමුදල් ඇමරිකානු ඩොලර් මිලියන 21.8 ක් වෙන් කරන ලදී. මීට වවුනියාව-මන්නාරම කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය වැඩිදියුණු කිරීම, හබරණ - නව අනුරාධපුර කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම, මන්නාරම - නාඩුකුඩා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ නව අනුරාධපුර කොටුමා උප පොළේ කි.වෝ. 220 සම්ප්‍රේශණ සම්බන්ධතා දෙකක් ඉදිකිරීම ඇතුළත් වේ. ද්‍රව්‍ය හැර ඉදිකිරීම් කටයුතු සඳහා අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව විදුලිබල මණ්ඩලයේම අරමුදල්වලින් වෙන් කරන ලදී.

වසර තුළදී කෙරවලපිටිය සිට කොළඹ නගරය දක්වා කි.වෝ. 220 කේබල් ජාලයක් ඉදිකිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සමඟ එකඟතාවයකට එළඹිණි. උමා ඔය සහ මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු ද වේගවත් කරන ලදී. විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වඩාත්ම අභියෝගාත්මක කොටස වන පළමු මහළ මට්ටම දක්වා නිම කර ඇත. රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් පළමු මහළට ඉහළින් ගොඩනැගිල්ල ඉදිකිරීම අත්හිටුවා ඇත.

ඉන්දියා - ශ්‍රී ලංකා ජාල අන්තර් සම්බන්ධතාවය

වසර තුළදී ඉන්දියා - ශ්‍රී ලංකා ජාල අන්තර් සම්බන්ධතාවය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිලධාරීන් සහ ඉන්දියානු පාර්ශ්වකරුවන් අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි. දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ සාකච්ඡාවට භාජනය වී තිබූ ව්‍යාපෘතිය නිවැරදි දිශානතියට යොමු කරන ලද අතර ඉදිරි ගමන් මග පිළිබඳව පාර්ශ්ව අතර එකඟතාවයකට එළඹිණි. 2023 ජූලි මාසයේදී ඉහළ බලතල සහිත ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් යෝජිත දේශසීමා අන්තර් සම්බන්ධතාවය සාකච්ඡා කිරීම සහ ඉන්දියා - ශ්‍රී ලංකා ජාල සම්බන්ධතාවය ස්ථාපිත කිරීම පිළිබඳ ඉන්දියානු පාර්ශ්වයේ තාක්ෂණික විශේෂඥතාව හුවමාරු කර ගැනීම සඳහා ඉන්දියාව බලා පිටත් විය.

යෝජිත දේශසීමා අන්තර් සම්බන්ධතා සමඟ සම්බන්ධ අධි වෝල්ටීයතා සෘජු ධාරා (HVDC) පර්යන්තය ශ්‍රී ලංකාව පාර්ශ්වයෙන් කලින් සැලසුම් කළ නව හබරණ වෙනුවට මන්නාරමට මාරු කිරීමට තීරණය කරන ලදී. සම්ප්‍රේෂණ රැහැන් සම්බන්ධතාව සහ භූගත කේබල් සම්බන්ධතාව අතර විකල්ප තීරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා ආර්ථික අධ්‍යයනයන් සිදු කරන ලද අතර පසුව භූගත කේබල් භාවිතයෙන් අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට තීරණය කරන ලදී. බර ප්‍රවාහ අධ්‍යයන ඇතුළු අවශ්‍ය තාක්ෂණික අධ්‍යයනයන් සිදු කරන ලද අතර ව්‍යාපෘතියේ තාක්ෂණික ශක්‍යතාවය තහවුරු කරන ලදී. ඒ අනුව, ඉන්දියා - ශ්‍රී ලංකා ජාල සම්බන්ධතාවය පිළිබඳ ඒකාබද්ධ තාක්ෂණික කණ්ඩායම විසින් සකස් කරන ලද විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව අවසන් තීරණය සඳහා ඒකාබද්ධ කාර්ය සාධක කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.

බෙදාහැරීම් කළමනාකරණය

වසර ආරම්භයේදී, සේවා ප්‍රමිතීන් සපුරාලීමේදී සහ සුදුසු පාරිභෝගික සේවා මට්ටම් පවත්වාගෙන යාමේදී බෙදාහැරීම් අංශ සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දුන්හ. මෙම දුෂ්කරතා විදුලිබල මණ්ඩලය තුළ පැවති මූල්‍ය අර්බුදය සහ රට පුරා පැතිර තිබූ පුළුල් ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ ප්‍රසම්පාදන ගැටලුවලින් පැන නැගුණි. විවිධ ද්‍රව්‍ය හිඟ වූ අතර විදේශ විනිමය සීමා හේතුවෙන් ණයවර ලිපි විවෘත කිරීම වැළැක්විණි. මීට අමතරව, ද්‍රව්‍ය සැපයුම්කරුවන්ට රුපියල් මිලියන 6,000 ක පමණ හිඟ ගෙවීම් පැවතිණි.

විදුලිබල මණ්ඩලයේ සහ රටේ මූල්‍ය අර්බුදය සමනය වීමත් සමඟ, ද්‍රව්‍ය හා සේවා ප්‍රසම්පාදනය ක්‍රමයෙන් සාමාන්‍ය මට්ටම් කරා පැමිණි අතර ඒ අනුව පාරිභෝගික සේවාව වැඩිදියුණු විය. සේවා සම්බන්ධතා පොරොත්තු ලේඛනය නිරවුල් කරන ලද අතර, සැපයුම්කරුවන්ට තිබූ සියලුම හිඟ ගෙවීම් පියවන ලදී. වසර පුරා, ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය තුළද සැලකිය යුතු වැඩිදියුණු වීම් දක්නට ලැබුණු අතර වසර මුලදී මාස 1.32 ක් ව පැවති මාසික ආදායම් එකතු කරගැනීමේ කාලය මාස 1.25 දක්වා අඩු විය. සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානි 9.3% ක මට්ටමේ පවත්වාගෙන යන ලදී.

ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය බෙදාහැරීම් අංශ වෙත විමධ්‍යගත කරන ලද අතර, එමඟින් ඔවුන්ට අවසර දී ඇති ආදායම් මූලධර්ම මත පදනම්ව තම කටයුතු කළමනාකරණය කිරීමේ ස්වායත්තතාව ලබා දෙන ලදී. මීට අමතරව, වසර මුළදී දෙහිවල, කැලණිය සහ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශවල කෙටි පණිවිඩ පමණක් භාවිත කරන බිල්පත් ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර, පසුව මෙම ක්‍රමය අනෙකුත් ප්‍රදේශවලටද ව්‍යාප්ත කරන ලදී.

බෙදාහැරීම් අංශ විසින් සියලුම ව්‍යාපාරික ආකෘති සරල කිරීම මඟින් වහළ මත සූර්ය පැනල ප්‍රවර්ධනය කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කෙරිණි. නව Net Plus Plus ආකෘතිය මඟින් තෙවන පාර්ශ්වයන්ට වහළ කුලියට දීමට හැකියාව ලබා දුන් අතර, එමඟින් අතිරේක වහළ මත සූර්ය පැනල ධාරිතා ඒකාබද්ධ කිරීමට ඉඩ සැලසිණි.

මානව සම්පත් කළමනාකරණය

2023 වසරේදී, දිගු කලක් පුරා පැවති විනය පරීක්ෂණ සහ සේවක පැමිණිලි විසඳීමට ප්‍රමුඛතාවය දෙන ලදී. මෙම ගැටලු විසඳීම සඳහා විශේෂයෙන් පිහිටුවන ලද පැමිණිලි කළමනාකරණ කමිටුව නිතර රැස්විය. රජය සතු ආයතනවල බඳවා ගැනීම් නතර කිරීමට රජයෙන් දුන් නියෝගය හේතුවෙන්, විදුලිබල මණ්ඩලය මෙම ප්‍රතිපත්තියට අනුගත වී පවතින මානව සම්පත් සමඟ මෙහෙයුම් කළමනාකරණය කළේය. නව බඳවා ගැනීම් සීමා කර තිබියදීත්, විදුලිබල මණ්ඩලය 4 සිට 8 දක්වා කණ්ඩායම්වල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පුහුණුලාභීන් ස්ථිර සේවක සංඛ්‍යාවට සාර්ථකව අන්තර්ග්‍රහණය කර ගත්තේය. මීට අමතරව, අවශ්‍ය අනුමැතීන් සහිතව අනියම් සේවකයින් ස්ථිර කරන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් සේවකයින්ගේ උසස්වීම් දීර්ඝ කාලයක් පුරා සිදුනොවූ තත්ත්වයක පැවති බැවින්, 2023 වසරේදී උසස්වීම් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මානව සම්පත් කළමනාකරණය සහ සේවක පැමිණිලි විසඳීම කෙරෙහි අපගේ අවධානය වැඩි සහයෝගීතාවයක් සහිත හා ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට උපකාරී වී ඇත.

යහපාලනය

වසර තුළදී, විදුලිබල මණ්ඩලය විවිධ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් පහසු කිරීම, විගණන කමිටු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, කල් වේලා ඇතිව ගිණුම් පිළියෙල කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම හරහා යහපාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට කැපවිය. විගණන ක්‍රියාවලියට සහාය වීම සඳහා ඉල්ලා සිටි තොරතුරු හා ලේඛන ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ රජයේ විගණක වෙත කඩිනමින් සපයන ලදී. විස්තීර්ණ හා කාර්යක්ෂම අභ්‍යන්තර විගණන පහසුකරණයක් සඳහා අවශ්‍ය සම්පත් වෙන් කරන ලදී.

විදුලිබල මණ්ඩල කළමනාකාරිත්වය මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීමේදී විගණන හා කළමනාකරණ කමිටුවට සහාය විය. වසර තුළදී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සූදානම් කිරීමේ රැස්වීම් තුනක් පවත්වන ලද අතර, විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ පාලන පිළිවෙත් සමාලෝචනය කිරීමේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහාය වීම සඳහා විස්තරාත්මක වාර්තා සකස් කරන ලදී. පාලනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ මත පදනම්ව පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

විදුලිබල මණ්ඩල කළමනාකාරිත්වය මෙහෙයුම් සහ පාලන පිළිවෙත් පිළිබඳ තොරතුරු සහ අවබෝධයන් ලබා දීම සඳහා අනෙකුත් පාර්ලිමේන්තු කමිටුවලටද සහභාගී විය. නියාමන අනුකූලතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ආයතනය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ ඵලදායී ලෙස සම්බන්ධීකරණය විය. පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණයේ ඉහළම නිරවද්‍යතා සහ අවංකභාව මට්ටම් පවත්වා ගනිමින්, ව්‍යවස්ථාපිත සහ නියාමන ගිණුම් අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව කල්වේලා ඇතිව පිළියෙල කරන ලදී.

නිගමනය

2023 වසරේ සාර්ථකත්වයන් මඟින් ලංවිම සේවකයින්ගේ කැපවීම හා වෙහෙස මහන්සිය, එහි නායකත්වයේ උපායමාර්ගික දිශානතිය, සහ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය පිළිබිඹු කෙරේ. සැලකිය යුතු අභියෝගයන් ජය ගැනීමට, මූල්‍ය ස්ථාවරත්වය ඇති කර ගැනීමට, අඛණ්ඩ විදුලි සැපයුමක් පවත්වා ගැනීමට සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ආයතනය සතු හැකියාව එහි අනාගත වර්ධනය සඳහා යහපත් පදනමක් සපයයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ලෙස, වසර පුරා මා වෙත ලබා දුන් නොසැලෙන කැපවීම, කඩිසර සේවය සහ සහයෝගය වෙනුවෙන් අපගේ කැපවූ සියලුම සේවකයින් වෙත මාගේ හදපිරි කෘතඥතාවය පුද කරමි. අප මුහුණ දුන් අභියෝගයන් ජය ගැනීමෙහි සහ අපගේ ඉලක්ක සපුරා ගැනීමෙහිලා ඔබගේ උත්සාහයන් ඉමහත් සේ උපකාරී විය. එමෙන්ම, අතිගරු ජනාධිපතිතුමාට එතුමාගේ දූරදර්ශී නායකත්වය සහ නොසැලෙන සහය වෙනුවෙන් මාගේ හදපිරි කෘතඥතාවය පුද කරන අතර, ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යවරුන්, ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්, විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ලංවිම සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, ලංකා ගල් අඟුරු සමාගම, මහජන උපයෝගිතා කොමිෂන් සභාව, සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව යන ආයතනවල අඛණ්ඩ සහය සහ මඟපෙන්වීම වෙනුවෙන් ඔවුනටද ස්තූතිවන්ත වෙමි. අපගේ පාරිභෝගිකයින්, පෞද්ගලික විදුලි නිෂ්පාදකයින්, ව්‍යාපාරික සහකරුවන්, බැංකුකරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට වසර පුරා ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.


අවසාන වශයෙන්, අපගේ මෙහෙයුම් ඉදිරියට ගෙන යාමේදී ලබා දුන් අඛණ්ඩ සහය සහ නොපසුබට උත්සාහය වෙනුවෙන් ආයතනික කළමනාකරණ කණ්ඩායමට මාගේ අවංක ප්‍රශංසාව පුද කරමි. එක්ව අප සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, පාර්ශ්වකරුවන්ගේ සහය සහිතව ලංකා විදුලිබල මණ්ඩලය ඉදිරි වසරේදී තවත් උසස් මට්ටම් කරා ළඟා වනු ඇත්තේ යැයි විශ්වාස කරමි.

සැමට ස්තූතියි.



ඉංජිනේරු රොහාන් සෙනෙවිරත්න
සාමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ සිතියම 2023





මෙහෙයුම් සමාලෝචනය

ජනන අංශය

ජනන අංශය

ජනන අංශය ලංකා විදුලිබල මණ්ඩලයට අයත් සියලුම විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වගකිව යුතු වේ. මෙම අංශය මගින් ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 1,413.4 ක් වන ජල විදුලි බලාගාර දහඅටක්, ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 801 ක් වන තෙල් මගින් ක්‍රියාත්මක වන තාප විදුලි බලාගාර අටක්, ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 900 ක් වන ගල්අඟුරු බලාගාරයක් සහ ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 103.5 ක් වන සුළං බලාගාරයක් අධීක්ෂණය කෙරේ. මීට අමතරව, යාපනය අර්ධද්වීපයේ අවට දූපත්වල ඩීසල් බලාගාර කිහිපයක් ලංවිම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2023 වසර අවසානය වන විට ලංවිම සතු විදුලි බලාගාරවල මුළු ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 3,218 ක් විය.

විදුලි බලාගාරයන්හි කාර්ය සාධනය


2023 මුදල් වර්ෂයේදී, මහවැලි සංකීර්ණය තුළ මහවැලි ජලය භාවිතා කරන බලාගාර සහ මන්නාරම සුළං බලාගාරය ඇතුළු බලාගාරවල කාණ්ඩයේ විදුලි උත්පාදනය සතුටුදායක මට්ටමක පැවතුණි. මහවැලි සංකීර්ණය සැලකිය යුතු කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, වසර පුරා ගිගාවොට් පැය 2,635 ක් නිපදවමින් ජනන ඉලක්කවලට සැලකිය යුතු දායකත්වයක් සැපයීය.

එසේම, කැලණි ගඟ ඔස්සේ ක්‍රියාත්මක වන බලාගාර (ලක්ෂපාන සංකීර්ණය) 2023 දී ගිගාවොට් පැය 1,591 ක් ජනනය කරමින් ප්‍රශංසනීය ප්‍රතිඵල ලබා දුන්නේය. මීට අමතරව, වලවේ, කළු සහ ගල් ඔය ගංගාවලින් ජල සම්පත් භාවිතා කරන සමනල සංකීර්ණය වාර්ෂික ජනනයට ගිගාවොට් පැය 739 ක දායකත්වයක් සැපයීය.

ජල විදුලි උත්පාදනය සමඟ, තාපබල සංකීර්ණයද මෙම මුදල් වර්ෂය තුළ ගිගාවොට් පැය 1,975 ක් ජනනය කරමින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. තවද, ලක්විජය බලාගාරය (LVPP) ගිගාවොට් පැය 4,646 ක් වාර්තා කරමින් අපගේ සමස්ත ජනනයට සැලකිය යුතු දායකත්වයක් සැපයීය.

2023 දී ලංවිම ජනන මුහුව පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් සඳහා G1 රූපය බලන්න. එක් එක් බලාගාරයේ විදුලි ජනන දායකත්වයන් සහ ඒ හා සම්බන්ධ සාධක පිළිබඳ විස්තරාත්මක කරුණු G1 සිට G3 දක්වා වගුවල දක්වා ඇත.

මෙම දත්ත මගින් කාර්යක්ෂම විදුලි ජනනය සඳහා වූ අපගේ කැපවීම අවධාරණය කරන අතර රටේ වර්ධනය වන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා වූ කැපවීම ඉස්මතු කරනු ලබයි.



රූපය G1: ලං.වි.ම. ජනන මුහුව - 2023 වර්ෂය

වගුව G1: ලං.වි.ම. සතු ජලවිදුලි සහ සුළං විදුලි බලාගාර දායකත්වය

විදුලි බලාගාරය	ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.)	ජනනය (ගි.වො.පැ.)	උපයෝජ්‍යතා සාධකය (%)	බලාගාර සාධකය (%)
මහවැලි සංකීර්ණය	**920.3**	**2,635**		
වික්ටෝරියා	210	627.5	99.6	34.2
කොත්මලේ	201	415.3	99.7	23.7
ඉහළ කොත්මලේ	150	421.0	99.4	32.2
රන්දෙණිගල	122.6	321.7	97.9	30.3
රන්ටැඹේ	50	161.7	99.6	38.1
උකුවෙල	40	193.4	82.9	55.4
බෝවතැන්න	40	92.8	99.9	26.6
නිල්ලඹේ	3.2	9.7	99.9	33.3
තම්බපවණි (සුළං)	103.5	391.4	88.4	43.8
ලක්ෂපාන සංකීර්ණය	**388.8**	**1590.5**		
ලක්ෂපාන	153.8	776.4	94.3	57.8
පොල්පිටිය	90	430.1	93.7	54.7
කැනියන්	60	153.0	97.8	29.2
විමලසුරේන්ද්‍ර	50.0	126.7	92.6	29.0
බ්‍රෝඩ්ලන්ඩ්ස්	35	104.3	85.0	32.9

වගුව G1: ලං.වි.ම. සතු ජලවිදුලි සහ සුළං විදුලි බලාගාර දායකත්වය

විදුලි බලාගාරය	ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.)	ජනනය (ගි.වො.පැ.)	උපයෝජ්‍යතා සාධකය (%)	බලාගාර සාධකය (%)
සමනල සංකීර්ණය	**207.8**	**739.4**		
සමනලවැව	120	375.2	93.5	35.9
කුකුලේගඟ	75	335.5	83.4	55.2
උඩවලව	4	9.3	83.9	27.6
ඉඟිනියාගල	8.8	19.4	99.7	19.9
එකතුව	**1516.9**	**4,964.9**		

සටහන : තම්බපවණි හැර අන් සියල්ල ජලවිදුලි බලාගාර වේ.

වගුව G2: ලං.වි.ම. සතු තාප තෙල් විදුලි බලාගාර දායකත්වය

විදුලි බලාගාරය		ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.)	පවත්නා උපරිම ධාරිතාවය (මෙ.වො.)	ජනනය (ගි.වො.පැ.)	උපයෝජ්‍යතා සාධකය (%)	බලාගාර සාධකය (%)
සපුගස්කන්ද	A	80	70	205.7	75.7	34.9
	B	80	72	366.2	90.6	60.4
කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය	වායු තලබමන (GT)	110	110	701.1	81.9	49.5
	වාෂ්ප තලබමන (ST)	55	55		80.6	50.5
කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය 2	වායු තලබමන (GT)	157	101	167.5	73.9	17.8
	වාෂ්ප තලබමන (ST)		54		73.9	19.1
කැළණිතිස්ස වායු තලබමන - 07		115	115	84.0	94.0	7.7
කැළණිතිස්ස Frame V වායු තලබමන		80	32	0.9	24.0	0.2
ඩීසල් විදුලි බලාගාර - මෙ.වො. 40 x 1		40	40	43.5	75.1	10.2
උතුරු ජනනී		24	24	99.2	86.6	52.0
යාත්‍රාවක නැංවූ බලාගාරය		60	62.4	304	94.1	57.8
විදුලි ජනක යන්ත්‍ර (යාපනය කුඩා දූපත්වල)				2.7		
එකතුව		**801**	**735.4**	**1,974.8**		

වගුව G3: ලං.වි.ම. සතු ගල් අඟුරු විදුලි බලාගාර දායකත්වය

ලක්විජය විදුලි බලාගාරය	ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.)	දළ ජනනය (ගි.වො.පැ.)	ශුද්ධ ජනනය (ගි.වො.පැ.)	උපයෝජ්‍යතා සාධකය (%)	බලාගාර සාධකය (%)
ඒකකය 01	300	1,768.9	1,593.4	79.9	67.3
ඒකකය 02	300	2,082.5	1,875.5	85.1	79.2
ඒකකය 03	300	1,299.4	1,176.6	84.3	65.3

උද්දීපනයන්

වැළකුම් නඩත්තු ශක්තිමත් කිරීම මගින් නඩත්තු පිරිවැය අවම කිරීම

ලක්විජය විදුලි බලාගාරයේ යන්ත්‍ර අංක 03 හි පළමු A මට්ටමේ අලුත්වැඩියාව 2023-07-29 දින ආරම්භ කර 2023-11-17 දින සාර්ථකව නිම කරන ලදී. ලංවිම කාර්ය මණ්ඩලය, විදේශීය විශේෂඥයින් සහ දේශීය කොන්ත්‍රාත්කරුවන් ඇතුළු දක්ෂ කාර්ය මණ්ඩලයක් අලුත්වැඩියා කටයුතුවල නිරත විය.

මෙම අලුත්වැඩියාව අතරතුර ප්‍රධාන වශයෙන් බොයිලරය, ටර්බයිනය, ජනන යන්ත්‍රය සහ ඒ හා සම්බන්ධ උපකරණවල සවිස්තරාත්මක නඩත්තුව කෙරෙහි අවධානය යොමු කර තිබුණි. මධ්‍යම පීඩන සහ අඩු පීඩන රෝටරවල හානියට පත් ටර්බයින තල ප්‍රතිස්ථාපනය කිරීම සහ දෝෂ සහිත අඩු උෂ්ණත්ව සුපර් හීටර් (LTSH) පැනල අලුත්වැඩියා කිරීම වැනි නිවැරදි කිරීමේ නඩත්තු කාර්යයන්ද සිදු කරන ලදී. දෝෂ සහිත LTSH පැනල කොටස් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ සමඟ සන්ධි 4,700 ක් පමණ වෙල්ඩින් කටයුතුවලට ලක් විය.

කෙසේ වුවද, ජාතික වශයෙන් සහ ලංවිම තුළ පැවති මූල්‍ය අර්බුද හේතුවෙන් ඇණවුම් කරන ලද අමතර කොටස් ප්‍රමාද වී ලැබීම හේතුකොට අලුත්වැඩියාවට අභියෝග එල්ල විය.



රූපය G2: LTSH අලුත්වැඩියාවන් සිදු කරමින්

කොත්මලේ බලාගාරයේ යන්ත්‍ර අංක 03 හි Y-කලාවේ තරාපැවියේ තෙල් කාන්දුවක් හේතුවෙන් වීය අමතර තරාපැවියක් යොදා ප්‍රතිස්ථාපනය කරන ලදී.

තවද, පහත සඳහන් නිවාරණ නඩත්තු කටයුතු ද සිදු කරන ලදී:

- 1984 දී ස්ථාපනය කරන ලද තෙල් කාන්දු තිබූ ධාරා පරිණාමක දෙකක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව ධාරා පරිණාමක ස්ථාපනය කරන ලදී.
- යන්ත්‍ර අංක 02 සහ 03 සඳහා ටර්බයින පාලක පද්ධති යළි සවි කිරීම සම්පූර්ණ කරන ලදී.

වාර්තා කරන කාලය තුළ **වික්ටෝරියා බලාගාරයේ** නිවාරණ නඩත්තු මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී:

- සහායක පෝෂණ පරිපථ හතේම පැරණි සහ ක්‍රියාකාරිත්වයේ ගැටලු සහිත ඒවා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව වෝල්ට් 400 වායු පරිපථ කඩනයන් ස්ථාපනය කරන ලදී.
- නිවැරදි වෝල්ටීයතා මැනීම සහ ඉහළ කාර්යසාධනයක් සහතික කිරීම සඳහා කිලෝවෝල්ට් 220 ස්විච්යාර්ඩ්හි පැරණි අයිතම ප්‍රතිස්ථාපනය කිරීමට නව ධාරිතා වෝල්ටීයතා තරාපැවි (CVT) ස්ථාපනය කරන ලදී.
- යන්ත්‍ර අංක 3 හි ක්‍රියාවිරහිත වූ AVR පාලකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අමතර AVR පාලකයක් භාවිතා කරන ලද අතර, එමගින් විය හැකි බාධාවන් වැළැක්වීම සහ සුමට මෙහෙයුම් සහතික කිරීම සිදු විය.
- යන්ත්‍ර අංක 1 හි MIV විපථ කපාටය, සිසිලන ජල මෝටර් කපාටය, ගිනි නිවීමේ ආරක්ෂක කපාටය ප්‍රතිස්ථාපනය කරන ලද අතර සහන කපාට අලුත්වැඩියා කරන ලදී.



රූපය G3: CVT ස්ථාපනයන් සිදු කරමින්

වසර 6 ක කාලයක් තුළ වැලි බාදනය හේතුවෙන් **උකුවෙල බලාගාරයේ** යන්ත්‍ර අංක 02 හි ශීර්ෂ ආවරණයෙන් ජල කාන්දු සිදුවන බව හා එමගින් ලං.වි.ම. ට මෙහෙයුම් අලාභ සිදුවන බව 2022 නොවැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. ශ්‍රී ලංකාවේ මූල්‍ය අර්බුදය සහ එහි සේවාව ප්‍රමාද වීම් හේතුවෙන් මුල් උපකරණ නිෂ්පාදනායතනය (OEM) වෙතින් විදේශීය අධීක්ෂණ සේවා නොමැතිව ලංවිම කාර්ය මණ්ඩලය විසින් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

ප්‍රතිස්ථාපන කටයුතු 2022 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර මාස 4.4 ක් තුළ ලංවිම කාර්ය මණ්ඩලය විසින් සාර්ථකව අවසන් කරන ලදී. මෙමගින් ලංවිම කාර්ය මණ්ඩලය වෙත අගනා අත්දැකීම් සහ ප්‍රවීණත්වයන්ද ලබා ගත හැකි විය. මෙම ව්‍යාපෘතිය හේතුකොට ලංවිම වෙත රු. මිලියන 950 ඉක්මවූ මුදල් ප්‍රමාණයක් ඉතිරි කෙරිණි.



රූපය G4: තලබමන මුදුන් ආවරණය මාරු කරමින්

නවීකරණය වූ මෙහෙයුම් කටයුතු

රන්දෙනිගල බලාගාරයේ යන්ත්‍ර අංක 1 හි විද්‍යුත් පාලකය නවීන ඩිජිටල් පද්ධතියක් බවට වැඩිදියුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, එය රුපියල් මිලියන 40 ක් පමණ වටිනා සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරන්නකි. මෙම ව්‍යාපෘතිය මගින් බලාගාර විශ්වසනීයත්වය සහ මෙහෙයුම් පාලනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමක් සිදුකර ඇත. ස්ථාපනය කිරීමේ කටයුතු ලංවිම අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් දක්ෂ ලෙස සිදු කරනු ලැබ මුල් උපකරණ නිෂ්පාදනායතනය විසින් අධීක්ෂණය කර ඇති බැව් විශේෂයෙන් සඳහන් කළ යුතුව පවතී.

නවීකරණය කරන ලද මෙහෙයුම්වල **තම්බපවනි සුළං බලාගාරයේ** සුළං තලබමන 26 ක කොටස් ලෙස, ග්‍රහ වාහක බෙයරිමයේ බාහිර වලල්ලේ යාන්ත්‍රික අඟුලු දැමීම ශක්තිමත් කරමින් කුළුණු-උඩ වැඩිදියුණු කිරීමේ විසඳුම Vestas සහ ගියර් පෙට්ටි සැපයුම්කරු විසින් සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත.

මෙහෙවරෙහි යෙදවීමෙන් වසර 15 කට පමණ පසු පාලන කාඩ්පත් දෝෂ ඇතිවීමේ අනුපාතය ඉහළ යාම සහ පවතින Andritz AK1703 පාලන පද්ධතිය, Andritz Hydro නමැති මුල් උපකරණ නිෂ්පාදනායතනය විසින් අදියර වශයෙන් ඉවත් කිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් **කුකුළේ ගඟ බලාගාරයේ** බලාගාර ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමකට ලක් විය. මුල් උපකරණ නිෂ්පාදනායතනය හරහා දෘඩාංග සහ පුහුණුව ප්‍රසම්පාදනය කිරීමෙන් පසු ප්‍රධාන යෙදවුම් කපාටය (MIV) අලුත්වැඩියාව සඳහා සූදානම් කරන ලද උමං නඩත්තු කාලය තුළ පාලක හයම, ප්‍රධාන පාලන ගොඩනැගිලි පාලකය සහ කිලෝවෝල්ට් 33 කොටු පාලකය සමඟ සාර්ථකව ලංවිම කාර්ය මණ්ඩලය විසින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම් කටයුත්ත ලංවිම කාර්ය මණ්ඩලයට ඉමහත් ධනාත්මක අත්දැකීමක් වූ අතර, ඉංජිනේරුවන්ගේ සිට නුපුහුණු කම්කරුවන් දක්වා වූ සියළුදෙනා තුළ විශ්වාසය වර්ධනය කිරීමට හේතු විය. දෘඩාංග සහ පුහුණුව සඳහා මුළු වියදම රුපියල් මිලියන 113 ක් විය. ඊට අමතරව, ලංවිම කාර්ය මණ්ඩලය විසින් රුපියල් මිලියන 12 ක පිරිවැයක් දරමින් යන්ත්‍ර දෙකෙහිම ස්වයංක්‍රීය වෝල්ටීයතා නියාමන (AVR) පාලකයන් මුල් උපකරණ නිෂ්පාදනායතනයේ නව අනුවාදය වන Emerson RX3i යොදා ප්‍රතිස්ථාපනය කරන ලදී.



රූපය G5: පාලක ස්ථාපනය සහ වයරින්කරණ කටයුතු සිදු කෙරෙමින්

සේවකයන් සඳහා ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීම

තම්බපවනි සුළං විදුලි බලාගාරයේ සුළං ටර්බයිනයන්හි කටයුතු කරන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ලෝක සුළං සංවිධානය විසින් නිර්දේශ කරන ලද සුළං කාර්මිකයන් සඳහා වූ මූලික ආරක්ෂක පුහුණුව ඉලක්කගත විශේෂ පුහුණුවක් පවත්වන ලදි.



රූපය G6: පුහුණු කටයුතු අතරතුර

දැනට පවත්නා විදුලි බලාගාරයන්හි පැවැත්ම සහතික කිරීම

2023 නොවැම්බර් මාසයේදී **තම්බපවනි සුළං බලාගාරයේ** සුළං තලබමන ජනක යන්ත්‍රය - 02 (WTG-02) හි තලබමන තලයක් අකුණු සැර වැදීමකින් හානියට පත් වූ අතර, එය ප්‍රතිස්ථාපනය කිරීමට සිදු විය. කොන්ත්‍රාත්කරු විසින් ලංවිම කාර්ය මණ්ඩලයේ සහාය සහිතව ප්‍රතිස්ථාපන කටයුතු සිදු කරන ලද අතර, එමඟින් අනපේක්ෂිත අභියෝගවලට කඩිනමින් සහ ඵලදායී ලෙස මුහුණ දීමට ඇති අපගේ කැපවීම පෙන්නුම් කෙරේ.



රූපය G7: තලය ප්‍රවාහනය කෙරෙමින්

2020 වාර්ෂික නඩත්තුව අතරතුර **කුකුළේ ගඟ** යන්ත්‍ර අංක 2 හි නඩත්තු ආවරණය වසා දැමීම සම්බන්ධයෙන් බරපතල ගැටලුවක් මතු විය. ඒ අනුව, ආරක්ෂක කරුණු හේතුවෙන් වසර තුනක් තිස්සේ ස්පයිරල් ආවරණය සහ ඩ්‍රාෆ්ට් ටියුබය නඩත්තු නොකර තිබිණි. 2013 දී, එම ප්‍රධාන යෙදවුම් කපාටයෙහි සේවා ආවරණය ඇණ හිස් කැඩී යාම හේතුකොට පිළිසකර කිරීමට සිදු විය. කපාට කඳ සහ වලල්ල අතර නිෂ්පාදකයා විසින් ෂිම් සවිකුරු තබා තිබීම ගැටලුවට හේතු වී ඇති බව හෙළි විය. ලංවිම කාර්ය මණ්ඩලය විසින් 2013 දී මෙම ගැටලුව විසඳන ලදී. වසර හතකට පසු, නඩත්තු ආවරණයට ද මේ හා සමාන ගැටලුවක් මතු විය. එහි සංකීර්ණ බව පැවතියදීම, අලුත්වැඩියා කටයුතු ලංවිම කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. එය නැවත ස්ථානගත කිරීමකින් තොරව ප්‍රවේශ විය නොහැකි වූ බැවින් නඩත්තු ආවරණය පිළිසකර කිරීම විශේෂයෙන් අසීරු කරුණක් විය. මුල් සැලැස්ම අනුව එය ගෙන යා යුතුව පැවතියද, අවසාන මොහොතේ ඉස්මතුවූ අදහසක් හේතුකොට එය අංශක 180 කින් කරකැවීමෙන් පමණක් කාලය ඉතිරි කර ගැනීමට හැකි විය. මෙම නවෝත්පාදනය අලුත්වැඩියා කටයුතු ඉක්මන් කළ අතර, මෙහෙයුම් කටයුතු සඳහා යන්ත්‍ර අංක 1 කලින් නිදහස් කිරීමට ඉඩ සැලසිණි.



රූපය G8: අලුත්වැඩියා කටයුතු අතරතුර



ක්‍රියාවලිය ඩිජිටල්කරණය

සම්ප්‍රදායික කඩදාසි පාදක ලොග් පත්‍රිකාවලින් ටැබ් පාදක ජංගම ක්ෂේත්‍ර දත්ත ග්‍රහණ පද්ධතියකට මාරු වීම හරහා **රන්දෙනිගල සහ රන්ටැඹේ බලාගාරවල** මෙහෙයුම් අංශ විසින් ක්‍රියාවලි ඩිජිටල්කරණයේ ඉදිරි පියවරක් තබා ඇත. මෙම වෙනස විසින් බහුලව භාවිතා වන දත්ත වාර්තා ආකෘති අර්ධ ස්වයංක්‍රීය කරනු ලැබ ඇති අතර, ඒ හරහා බොත්තම් කිහිපයක් එබීමෙන් වාර්තා ජනනය කිරීම සහ ඉදිරිපත් කිරීම දක්වා ක්‍රියාවලිය සරල කර ඇත. මෙම පද්ධතිය මගින් කාර්යක්ෂමව දත්ත වාර්තා කර ගබඩා කරන අතර, වෙතිහාසික තොරතුරු හා ප්‍රවණතා සහ අසාමාන්‍යතාවල දෘශ්‍ය නිරූපණ පහසුවෙන් ලබා ගැනීමට පහසුකම් සපයයි.

ජනන පිරිවැය

2023 වසර සඳහා ජනන පිරිවැය වගුව G4 හි නිරූපණය කොට ඇත.

වගුව G4: ජනන පිරිවැය

සංකීර්ණය	විදුලි බලාගාරය	සමුච්චිත සැබෑ ශුද්ධ ජනනය (ගි.වො.පැ.)	සමුච්චිත සත්‍ය වියදම (ශ්‍රී ලං. රු. මිලියන)	සාමාන්‍ය ඒකක සමස්ත පිරිවැය (රු. / කි.වො.පැ.)
තාප	කැළණිතිස්ස වි.බ. - වායු ටර්බයිනය	84.9	10,442.1	122.96
	කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය	701.1	41,591.1	59.64
	කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය 2	167.5	12,617.2	75.05
	සපුගස්කන්ද	571.8	33,858.1	59.19
	විදුලි ජනක යන්ත්‍ර (යාපනය කුඩා දූපත්වල)	2.7	420.2	158.40
	උතුරු ජනනි	99.2	5,490.4	55.33
	යාත්‍රාවක නැංවූ විදුලි බලාගාරය	304.0	16,677.3	54.86
	මතුගම යටදොල විදුලි බලාගාරය සහ දකුණුජනනී විදුලි බලාගාරය මෙ.වො. 1 x 40	43.5	4,261.6	97.96
	සමස්ත තාප - ඉන්ධන	**1,974.8**	**125,358.0**	**63.57**
ගල් අඟුරු	**ලක්විජය විදුලි බලාගාරය**	**4,645.5**	**187,163.1**	**40.29**
සමස්ත තාප		**6,620.3**	**312,521.1**	**47.23**
මහවැලි	වික්ටෝරියා	627.5	886.8	1.41
	කොත්මලේ	415.3	1,205.1	2.90
	උකුවෙල	193.4	384.2	1.99
	බෝවතැන්න	92.8	346.3	3.73
	රන්දෙණිගල/ රන්ටැමේ	483.4	1,162.2	2.40
	නිල්ලඹේ	9.7	119.8	12.37
	ඉහළ කොත්මලේ	421.0	1,892.6	4.50
	මහවැලි (ජල) සමස්තය	**2,243.1**	**5,996.9**	**2.67**
ලක්ෂපාන	පැරණි සහ නව ලක්ෂපාන	776.4	1,173.9	1.51
	පොල්පිටිය	430.1	735.3	1.71
	විමලසුරේන්ද්‍ර	126.7	570.7	4.50
	කැනියන්	153.0	515.2	3.37
	බ්‍රෝඩ්ලන්ඩ්ස්	104.3	1,794.7	16.81
	ලක්ෂපාන සමස්තය	**1,590.5**	**4,748.0**	**2.99**
සමනල	සමනලවැව	375.2	1,646.7	4.39
	කුකුලේ ගඟ	335.5	685.9	2.04
	ඉඹිනියාගල	19.4	142.6	7.33
	උඩවලවේ	9.3	169.7	18.17
	සමනල සමස්තය	**739.5**	**2,644.8**	**3.58**
සමස්තය - ජල		**4,573.2**	**13,389.8**	**2.93**
තම්බපවා - සුළං		**391.4**	**7,658.6**	**19.57**
(ජනන ලක්ෂ්‍යයේදී) සමස්ත ලං.වි.ම. පිරිවැය		**11,584.7**	**333,569.6**	**29.81**

මූලාශ්‍රය: බලශක්ති අලෙවි ශාඛාව, ලං.වි.ම.

සටහන්

1. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා, ගල්අඟුරු ගෙවීම් ප්‍රමාද පොලී ගාස්තු සහ කෙටි හා දිගු කාලීන පොලී ගාස්තු වැනි ඉන්ධන මිලදී ගැනීම් හා සම්බන්ධ මූල්‍යකරණ පිරිවැය සංරචක වියදම් ගණනය කිරීමෙන් බැහැර කර ඇත.
2. බ්‍රෝඩ්ලන්ඩ් සහ තම්බපවනි බලාගාර සඳහා ව්‍යාපෘති මූල්‍ය පොලිය සහ ප්‍රාග්ධන සංරචක ඇතුළත් කර ඇත.
3. ක්ෂය වීම් ගාස්තු ගණනය කර ඇත.
4. බලශක්ති ගාස්තුවට ඉන්ධන සහ ඉන්ධන නොවන සංරචක ඇතුළත් වන අතර, බලශක්ති ගාස්තුව ගණනය කිරීම සඳහා විශේෂිත ඉන්ධන පරිභෝජන අනුපාත භාවිතා කර ඇත.
5. උමා ඔය බලාගාරය 2023 අවසානය වන විට මෙහෙවරෙහි යොදවා නොතිබූ බැවින් එහි ධාරිතා පිරිවැය සලකා බලා නොමැත.



මෙහෙයුම් සමාලෝචනය

සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ අංශය

විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශය එහි ව්‍යවස්ථාපිත වගකීම් සඳහා ස්ථිර කැපවීමකින් යුතුව ක්‍රියාත්මක වන අතර, රට පුරා සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය සහතික කරයි. නීතියෙන් නියම කර ඇති පරිදි, මෙම අංශය සම්ප්‍රේෂණ පද්ධතියේ ඉදිකිරීම්, නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු සඳහා වගකිව යුතු අතර, පද්ධතියේ විශ්වසනීයත්වය සහ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා විදුලි ප්‍රවාහය කළමනාකරණය කිරීමේ අධීක්ෂණයද සිදු කරයි.

මෙහෙයුම් අරමුණු

කාර්යක්ෂම සහ සම්බන්ධීකරණය කළ සම්ප්‍රේෂණ පද්ධතිය: මෙම අංශය කාර්යක්ෂම, සම්බන්ධීකරණය කළ, විශ්වසනීය සහ මිත්‍රශීලී සම්ප්‍රේෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා කැපවී සිටී. උපායමාර්ගික සැලසුම් සහ සූක්ෂම ක්‍රියාත්මක කිරීම් තුළින්, රටේ වර්ධනය වන ඉල්ලුම කාර්යක්ෂමව සපුරාලීම සඳහා සම්ප්‍රේෂණ ජාලය ප්‍රශස්ත කිරීමට අපේක්ෂා කරමු.

තොග වශයෙන් විදුලිය මිලදී ගැනීම් සහ විකුණුම්: පාරිභෝගිකයින් සඳහා ආරක්ෂිත, විශ්වසනීය සහ මිත්‍රශීලී විදුලි සැපයුමක් සහතික කිරීම ප්‍රමුඛ කාර්යයකි. සම්ප්‍රේෂණ අංශය බෙදාහැරීම් බලපත්‍රලාභීන්ට තොග වශයෙන් විදුලිය මිලදී ගෙන අලෙවි කරන අතර, රට පුරා පාරිභෝගිකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ජාලය හරහා විදුලිය නොකඩවා ලබාදීම එම කටයුතු පහසු කරයි.

ප්‍රමාණවත් ජනන ධාරිතාව: අපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලීමේ අපගේ කැපවීම පවත්වාගෙන යාම සඳහා, ප්‍රමාණවත් ජනන ධාරිතාවක් පවතින බව සහතික කිරීමට මෙම අංශය උනන්දුවෙන් කටයුතු කරයි. ජනන පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවයෙන් සහ ක්‍රියාකාරී සැලසුම් කිරීම තුළින්, රටේ වර්ධනය සහ සංවර්ධනය සඳහා සහය වීමට ප්‍රමාණවත් විදුලි සැපයුමක් පවත්වා ගැනීමට අපි උත්සාහ කරමු.

වෝල්ටීයතා සහ සංඛ්‍යාත පවත්වාගෙන යාම: විශ්වසනීය විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධතියේ අඛණ්ඩතාව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. සම්ප්‍රේෂණ අංශය කි.වෝ. 132 සහ කි.වෝ. 220 සඳහා ± 10% තුළ සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයන් සහ හර්ට්ස් 50 හි ± 1% තුළ සංඛ්‍යාතය සාවධානව නිරීක්ෂණය කර නියාමනය කරන අතර, ජාලයේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සහ සමස්ත පද්ධති කාර්යසාධනය වැඩිදියුණු කිරීම සිදු කරයි.

මෙහෙයුම් කාර්ය සාධනය

විදුලි පද්ධතිමය කාර්ය සාධනය

2023 වසරේදී මුළු ශුද්ධ විදුලි ජනනය ගිගාවොට් පැය 15,575.6 ක් වූ අතර, එය 2022 වසරේ ජනනයට සාපේක්ෂව 2.3% ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

2023 වසරේදී ලංවීම සතු ජල විදුලි බලාගාරවලින් ලබාගත් ශුද්ධ විදුලි ජනනය ගිගාවොට් පැය 4,573.2 ක් වූ අතර, එය වසරේ මුළු ජනනයෙන් 29.4% ක් විය. කෙසේ වෙතත්, මෙම අගය පෙර වසරේ නිමැවුමට සාපේක්ෂව 14.7% ක අඩුවීමක් පෙන්නුම් කරයි.


තවද, තම්බපවනි සුළං බලාගාරය මුළු ජනනයෙන් 2.5% ක් සහ මුළු පුනර්ජනනීය බලශක්ති ජනනයෙන් 5% ක් වන ගිගාවොට් පැය 391.4 ක දායකත්වයක් සැපයීය.

ලක්විජය බලාගාරයේ වාර්ෂික විදුලි ජනනය ගිගාවොට් පැය 4,645.5 ක් වූ අතර, එය 2023 දී මුළු ජනනයෙන් 29.8% ක සැලකිය යුතු දායකත්වයක් සැපයීය.

එසේම, ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ගේ (IPP) තාප (තෙල්) විදුලි ජනනයේ දායකත්වය ගිගාවොට් පැය 1,160.1 ක් වූ අතර, එය මුළු ජනනයෙන් 7.4% ක් නියෝජනය කරයි.


ACE Power (ඇඹිලිපිටිය) සහ ACE Power (මාතර) යන නම්වලින් ක්‍රියාත්මක වන ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ගේ බලාගාර පිළිවෙලින් 2023-09-05 සහ 2023-08-21 දින සිට මාස හයක හිවිසුම් කාලයක් සඳහා ආරම්භ කරන ලද බව සඳහන් කිරීම වැදගත් වේ.

2023 මූල්‍ය වර්ෂයේදී වහල මත සූර්ය ජනනය ඇතුළත් මුළු ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ගේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ජනනය ගිගාවොට් පැය 2,830.7 ක් විය. මෙම සැලකිය යුතු නිමැවුම මුළු විදුලි ජනනයෙන් 18.2% ක දායකත්වයක් නියෝජනය කළ අතර පෙර වසරට සාපේක්ෂව 9.3% ක සැලකිය යුතු වැඩිදියුණුවක් පෙන්නුම් කළේය.




රූපය T1: 2023 වසර සඳහා බලශක්ති ජනන මුහුව

තවද, 2023 වසරේදී ල.වි.ම. ජල විදුලි හා සුළං විදුලි ජනනය ඇතුළුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ සමස්ත දායකත්වය මුළු විදුලි ජනනයෙන් 50.0% ක් බව අවධාරණය කිරීම වැදගත් වේ. මෙතුළ වඩාත් තිරසාර හා පරිසර හිතකාමී බලශක්ති මුහුවක් සාක්ෂාත් කර ගැනීම සඳහා සැලකිය යුතු පියවරක් පෙන්නුම් කරයි.



රූපය T2: 2022 සහ 2023 වසර වල වාර්ෂික විදුලිය ජනනය සඳහා විවිධ බලශක්ති මූලාශ්‍රයන්හි දායකත්වය

වසර පුරා මාසික විදුලි ජනනයේ වෙනස්කම්, කාලගුණික තත්ත්වයන්හි වෙනස්කම් හා එක් එක් මාසයේ දින ගණන මත රඳා පවතී. මෙම බලපෑම් දෙනික සාමාන්‍ය ජනන රටාවේද නිරීක්ෂණය කළ හැකිය.




රූපය T3: 2022 හා 2023 වසර වල සාමාන්‍ය දෛනික ජනන විචලනය (ශුද්ධ) ගි.වො.පැ./දින

සටහන: ප්‍රමාණවත් නොවන ජනන ධාරිතාව හේතුවෙන් 2022 වසර පුරා සහ 2023 ජනවාරි හා පෙබරවාරි මාසවලදී සැලසුම් කළ විදුලි බිඳවැටීම් සිදු කරන ලදී.

2023 වසරේ උපරිම රාත්‍රී ඉල්ලුම 2023-03-29 දින පැය 19:00 ට මෙගාවොට් 2,414.8 ක් ලෙස වාර්තා විය. මෙය වසරේ වාර්තාගත වූ ඉහළම උපරිම රාත්‍රී ඉල්ලුමයි. සාමාන්‍යයෙන් උපරිම රාත්‍රී ඉල්ලුම නියං සමයේදී නිරීක්ෂණය කෙරේ.

2023 වසරේ උපරිම දිවා ඉල්ලුම මෙගාවොට් 2,166.0 ක් වූ අතර එය 2023-08-22 දින පැය 16:00 ට වාර්තා විය. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ වහල මත සවි කළ සූර්ය බලශක්ති ජනනයේ වැඩි දායකත්වය හේතුවෙන් උපරිම ඉල්ලුමේ කාලය සවස් යාමයට මාරු වී ඇති බවයි.

තවද, 2023 වසරේ අවම පද්ධති ඉල්ලුම 2023-09-30 දින පැය 03:00 ට මෙගාවොට් 928.4 ක් ලෙස වාර්තා විය. මෙම ඉල්ලුම් විචලනයන් වසර පුරා විදුලි පරිභෝජන රටාවල ගතික ස්වභාවය පෙන්නුම් කරයි.



රූපය T4: පසුගිය වසර තුන ඇතුළත වාර්ෂික උපරිම රාත්‍රී ඉල්ලුම් දින බැර වක්‍ර


වාර්තාකරණ කාලසීමාව පුරාවට, අපගේ විදුලි පද්ධතිය දෛනික ජනන මිනුම්වල සැලකිය යුතු කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2023-08-22 දින පද්ධතිය ගිගාවොට් පැය 45.1 ක උපරිම දෛනික ජනනයක් අත්කර ගත්තේය. ප්‍රතිවිරුද්ධ ලෙස, 2023-12-09 දින පද්ධතිය ගිගාවොට් පැය 28.2 ක අවම දෛනික ජනනයක් වාර්තා කළේය. මෙම සංඛ්‍යාවනට දුරස්ථ-මනු කියවීම් සහිත ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනන ප්‍රභවයන්ගේ දායකත්වයද ඇතුළත් බව සැලකිය යුතුය.

සැලසුම් කළ විදුලිය බිඳ වැටීම්

2022 වසරේ සිට, රට තුළ පැවති මූල්‍යමය බාධක හේතුවෙන්, ල.වි.ම. විසින් දිවයින පුරා කාල සටහන් සහිත සැලසුම් කළ විදුලි බිඳවැටීම් ආරම්භ කළේය. ගාස්තු වැඩි කිරීමක් හේතුවෙන් ල.වි.ම. ට රටට අඛණ්ඩ විදුලිය සැපයීමේ හැකියාව වැඩි දියුණු කරගත හැකි වූ 2023 පෙබරවාරි මැද දක්වා මෙම බිඳවැටීම් පැවතුණි. 2023-02-15 දින වන විට මෙම සැලසුම් කළ විදුලි බිඳවැටීම් හේතුවෙන් සපයා නොමැති මුළු බලශක්තිය ගිගාවොට් පැය 88.6 කි. මෙම මූලික අභියෝගයන්ට මුහුණ දුන්නද, ජාතියේ බලශක්ති අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා වූ සිය නම්‍යශීලිත්වය මෙන්ම කැපවීමද ප්‍රකට කරවමින් විදුලි සැපයුමේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේ කැපවීම ල.වි.ම. තවදුරටත් පවත්වාගෙන ගියේය.

ජලාශ කාර්ය සාධනය

2023 වසරේදී ජල ගබඩාව ගිගාවොට් පැය 909.6 කින් ආරම්භ වූ අතර එය පූර්ණ ධාරිතාවයෙන් 75.3% කි. වසර පුරා ගිගාවොට් පැය 4,902 ක ජලය ගලා ඒමක් ලැබුණි. අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා පළමු අර්ධයේදී, ගිගාවොට් පැය 1,182.8 ක අඩු ගලා ඒමක් නිරීක්ෂණය කෙරුණු අතර, සැප්තැම්බර් මාසයේදී අවම ජල ගබඩාව වන ගිගාවොට් පැය 278.5 ක් වාර්තා විය. කෙසේ වෙතත්, අවසාන කාර්තුවේදී ජල ආගලනයේ සැලකිය යුතු වැඩිවීමක් අත්විඳි අතර, දෙසැම්බර් මාසයේදී ගිගාවොට් පැය 1,241.7 ක උපරිම ගබඩාවක් ළඟා කරගනිමින්, සියලුම ජලාශ පාහේ පිටාර මට්ටමට ළඟා විය. නොවැම්බර් මාසයේදී ගිගාවොට් පැය 1,061.7 ක ඉහළම මාසික ආගලනය නිරීක්ෂණය වූ අතර, දෛනික සාමාන්‍ය ගලා ඒම ගිගාවොට් පැය 35.4 ක් විය. වසර අවසානයේදී ජලාශ ගබඩා ධාරිතාව ගිගාවොට් පැය 1,217.5 ක් වූ අතර, ධාරිතාවයෙන් 97.6% ක් වන පරිදි සම්පූර්ණයෙන්ම පාහේ යළි පිරී පැවතිණි.



රූපය T5: පසුගිය වසර තුන ඇතුළත ජල ගබඩා විචලනයන්.

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘතිවල කාර්ය සාධනය

තිරසර බලශක්ති ප්‍රභවයන් ඒකාබද්ධ කිරීම වැඩි දියුණු කිරීමේ අපගේ අරමුණ ඔස්සේ, වාර්තාකරණ කාලසීමාව තුළ ලං.වි.ම. සැලකිය යුතු සන්ධිස්ථාන සාක්ෂාත් කරගෙන ඇත. විශේෂයෙන්ම, බිම් මට්ටමේ සූර්ය පැනල ව්‍යාපෘති හයක්, සුළං බලශක්ති ව්‍යාපෘති දෙකක්, කුඩා ජල විදුලි ව්‍යාපෘති තුනක්, සහ පෙව ස්කන්ධ ව්‍යාපෘතියක් සාර්ථකව ක්‍රියාත්මක කළ බැව් සතුටින් ප්‍රකාශ කරන්නෙමු. T1 වගුවේ දැක්වෙන පරිදි මෙම උත්සාහයන් මගින් සාමූහිකව මෙගාවොට් 31.7 ක මුළු ස්ථාපිත ධාරිතාවයකට දායකත්වය සපයයි.

තවද, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති 71 ක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා වූ අපගේ කැපවීම ස්ථිරව පවතී. මෙම ව්‍යාපෘති පෝෂක ක්‍රියාවලිය සහ ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළු විවිධ අදියරයන් හරහා ප්‍රගතිය ලබමින් පවතී. පෝෂක ක්‍රියාවලිය යටතේ පවතින ව්‍යාපෘති සහ ටෙන්ඩර් ක්‍රියාවලිය යටතේ පවතින ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර විස්තර පිළිවෙලින් T2 සහ T3 වගුවල දැක්වේ. මෙම ජයග්‍රහණයන් තිරසර බලශක්ති විසඳුම් ඉදිරියට ගෙන යාම සඳහා වූ අපගේ කැපවීම අවධාරණය කරමින් අපගේ සමස්ත අරමුණු ලඟාකර ලබා ගැනීමට ඇති ප්‍රගතිය පෙන්නුම් කරයි.

වගුව T1: කි.වෝ්. 33 හා ඉහළ අගයන්ගෙන් මෙහෙවරෙහි යොදවන ලද ස.නො.පු.බ. ව්‍යාපෘති පිළිබඳ විස්තර.

කොටුමා උපපොළ	තාක්ෂණය	ව්‍යාපෘති සංඛ්‍යාව	මෙහෙවරෙහි යොදවන ලද ධාරිතාවය (මෙ.වො.)
අම්පාර	බිම නංවන ලද සූර්ය පැනල	1	1
හොරණ	බිම නංවන ලද සූර්ය පැනල	1	2
මන්නාරම	සුළං	2	15
පන්නල	බිම නංවන ලද සූර්ය පැනල	2	2
වවුනතිව්	බිම නංවන ලද සූර්ය පැනල	2	2
මොණරාගල	කෘෂි අපද්‍රව්‍ය	1	4
ඉහළ රත්ගඟ	කුඩා ජලවිදුලි	1	1
දිග්ගල	කුඩා ජලවිදුලි	1	4.4
කැටරන් ඔය	කුඩා ජලවිදුලි	1	0.3
එකතුව		**12**	**31.7**

වගුව T2: පෝෂක අය ක්‍රම ක්‍රියාවලිය යටතේ ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති විස්තර

කාණ්ඩය	ව්‍යාපෘති සංඛ්‍යාව	පූර්ණ ධාරිතාව (මෙ.වො.)	කොටුමා උපපොළ
කුඩා ජලවිදුලි	17	18.95	කෑගල්ල, නාවලපිටිය, මාලිබොඩ, රිකිල්ලගස්කඩ, නුවරඑළිය, උකුවෙල, රත්නපුර, දෙනියාය
සූර්ය	9	49.4	ඇඹිලිපිටිය, බෙලිඅත්ත, වවුනතිව්, හම්බන්තොට පැරණි, වව්නියාව, බලංගොඩ, වාලච්චේන
සුළං	2	20	පුත්තලම
කෘෂි අපද්‍රව්‍ය	1	2	හම්බන්තොට පැරණි
පෙවස්කන්ධ	2	15	අම්පාර, වව්නියාව
නාගරික අපද්‍රව්‍ය	1	3.4	වේයන්ගොඩ
එකතුව	**32**	**108.75**	

වගුව T3: ටෙන්ඩර් ක්‍රියාවලියය යටතේ සිදු කෙරෙමින් පවත්නා ව්‍යාපෘති පිළිබඳ විස්තර

ව්‍යාපෘතිය	බලාගාර සංඛ්‍යාව	මුළු ධාරිතාව (මෙ. වො.)	කොටුමා උපපොළ	තත්ත්වය
මෙ.වො. 90 X 1 සූර්ය විදුලි පැනල	9	9	ත්‍රිකුණාමලය, අම්පාර	ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී
මෙ.වො. 10 පොළොන්නරුව සූර්ය විදුලි පැනලය	1	10	වාලච්චේන	
මෙ.වො. 60 සුළං විදුලිබල (ධාරිතා විචලනය මෙ.වො. 1-10 අතර වේ)	2	10	මාදම්පේ	සියලු අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත
මෙ.වො. 100 සියඹලාණ්ඩුව සූර්ය විදුලි පැනලය	1	100	ඇතිමලේ	විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කොට ඇත
මෙ.වො. 30 සූර්ය විදුලිබල පැනල (ධාරිතා විචලනය මෙ.වො. 1-5 අතර වේ)	2	5	බෙලිඅත්ත, නාවලපිටිය	සියලු අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත
	-	25	පල්ලෙකැලේ, මාතර, වවුනතිව්	නැවත ටෙන්ඩර් කැඳවන ලදුව පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට නියමිතව ඇත.
මෙ.වො. 40 සූර්ය පැනල (මෙ.වො. 5 ධාරිතාවය)	8	40	ගාල්ල, කප්පල්තුරේ	අභිප්‍රාය ලිපි 5ක් අත්සන් කොට, අභිප්‍රාය ලිපි 3 ක් අත්සන් කිරීමට නියමිතව ඇත
මෙ.වො. 20 සුළං විදුලිබල (ධාරිතා විචලනය මෙ.වො. 2.5-10 අතර වේ)	4	20	මන්නාරම	සියලු අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත
මෙ.වො. 70 සූර්ය විදුලිබල පැනල (ධාරිතා විචලනය මෙ.වො. 1-5 අතර වේ)	12	51	අනුරාධපුර, අම්පාර, ගාල්ල, මහව, කුරුණෑගල, හබරණ, මාදම්පේ, මාතර	සියලු අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත
	-	19	හබරණ, කුරුණෑගල, කොස්ගම, පන්නල, වේයන්ගොඩ, අම්පාර	නැවත ටෙන්ඩර් කැඳවන ලදුව පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමට නියමිතව ඇත.
මෙ.වො. 165 සූර්ය විදුලිබල පැනල (ධාරිතා විචලනය මෙ.වො. 1-5 අතර වේ)	-	165	අම්පාර, පැරණි අනුරාධපුර, අතුරුගිරිය, බෙලිඅත්ත, දෙනියාය, ගාල්ල, හබරණ, හොරණ, කොස්ගම, කුරුණෑගල, මාදම්පේ, මහියංගනය, මහව, මාතර, මතුගම, පන්නල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, වවුනතිව්, වේයන්ගොඩ	ටෙන්ඩර්ය ප්‍රකාශයට පත් කර 2024 මැයි 03 දින වසා දැමීමට නියමිතය.
එකතුව	**39**	**454**		

උද්දීපනයන්

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරයන්හි තත් කාලීන අධීක්ෂණ කටයුතු ඉහළ නැංවීම

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) බලාගාරවල තත්කාලීන ජනනය නිරීක්ෂණය කිරීමට ඇති නොහැකියාව යන එමඟින් පිළිබිඹු වූ ඍනාත්මක ඉල්ලුම මෙම වසරේ අප විසින් විසඳුම් සැපයූ වැදගත් අභියෝගයක් විය. මේ සඳහා ප්‍රතිචාර වශයෙන්, පද්ධති පාලන ශාඛාව විසින්, තොරතුරු තාක්ෂණ ශාඛාව සමඟ එක්ව මෙම ගැටලුව නිවැරදි කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් දියත් කරන ලදි.

මෙම මූලපිරීම සැලකිය යුතු ප්‍රතිඵල ලබා දුන් අතර, මෙගාවොට් 650 ඉක්මවන ස්ථාපිත ධාරිතාවක් සහිත ස.නො.ජු.බ. බලාගාර 280 කට වැඩි ප්‍රමාණයක් අපගේ නිරීක්ෂණ පද්ධතිවලට සාර්ථකව ඒකාබද්ධ කිරීමට හැකි විය. මෙම උත්සාහයේ උච්චතම අවස්ථාව වනුයේ CEB Assist වේදිකාව හරහා දත්ත අබණ්ඩව දෘශ්‍යමාන කිරීමයි.

තවද, සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරවලින් ක්‍රියාකාරී බලශක්ති ජනනය තත්කාලීනව නිරීක්ෂණය කිරීම සඳහා අපගේ පාලන මැදිරිය තුළ කැපවූ කවුළුවක් ස්ථාපිත කළෙමු (රූපය T6). මෙම සංවර්ධනය අපගේ දින-පෙර සැපයුම් සැලසුම්වල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීමට සහ අපගේ සැපයුම් මෙහෙයුම්වල ආර්ථික අංශ ප්‍රශස්ත කිරීමට සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇත.

මෙම ජයග්‍රහණය වැදගත් මෙහෙයුම් අභියෝග විසඳීම සඳහා තාක්ෂණය සහ සහයෝගීතාවය ප්‍රයෝජනයට ගැනීමට ඇති අපගේ කැපවීම අවධාරණය කරන අතර, එමඟින් අපගේ බලශක්ති කළමනාකරණ ප්‍රයත්නයන්හි කාර්යක්ෂමතාව සහ සඵලදායීතාව වැඩි දියුණු කරයි.

NCRE Real-time Dashboard

Real-time NCRE Power

		Mini-Hydro	Ground Solar	Wind	Biomass/W2E	Total	Rooftop	Total NCRE
Present Power Real-Time	/MW	111.74	88.00	32.78	2.41	234.93	0.008000	234.93
Monitoring Capacity	/MW	344.25	133.86	150.45	22.99	651.54	0.15	651.70
Total Installed Capacity	/MW	417.61	134.38	153.45	45.29	750.73	802.13	1,552.86
Monitoring Plants	/Nos	154	79	18	6	257	25	282
Total Plants	/Nos	218	83	19	12	332	53,399	53,731

Note: Rooftop solar category includes both CEB and LECO.

රූපය T6: තත්කාලීන ස.නො.ප්‍රෙ.බ. උපකරණ පුවරුව.

මනු සන්නිවේදන තාක්ෂණ ප්‍රගතීන්

ලං.වි.ම. විසින් දුරස්ථ මීටර සන්නිවේදන තාක්ෂණය ජංගම සන්නිවේදන ගෝලීය පද්ධතිය (GSM) පදනම් කරගත් සම්බන්ධතාවයේ සිට ප්‍රකාශ තන්තු ජාල සම්බන්ධතාවය දක්වා සැලකිය යුතු වැඩිදියුණු කිරීමක් සිදු කරන ලදී. 2023 වසර අවසන් වන විට, කොටුමා උප පොළවල් 65 ක බලශක්ති මනු ප්‍රකාශ තන්තු ජාලයට සාර්ථකව ඒකාබද්ධ කිරීම සිදු කර ඇති අතර එය සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි. මිනුම්වල නිරවද්‍යතාව සහතික කිරීම සඳහා බලශක්ති මීටර වාර්ෂිකව දැඩි පරීක්ෂාවකට ලක් කිරීම ක්‍රියාත්මක කර ඇත. මෙම දියුණුව බලශක්ති කළමනාකරණයේ නවීකරණය සහ නිරවද්‍යතාවය සඳහා ඇති අපගේ කැපවීම පෙන්නුම් කරන අතර, එමඟින් අංශයේ තාක්ෂණික නවෝත්පාදනයේ පෙරගමන්කරු ලෙස අප ස්ථානගත කරයි.

සම්ප්‍රේෂණ යටිතල පහසුකම් පුළුල් කිරීම

අපගේ සම්ප්‍රේෂණ ජාලයේ වැදගත් අංග දෙකක් සාර්ථකව භාර දුන් බැවි සතුටින් ප්‍රකාශ කරමු. පිටකොටුව (උප B) කිලෝවෝල්ට් 132/11, මෙගාවොට් ඇම්පියර් 63 කොටුමා උප පොළ සහ නව පොල්පිටිය-හම්බන්තොට කිලෝවෝල්ට් 220, කිලෝමීටර 150 සම්ප්‍රේෂණ මාර්ගය. මෙම එකතු කිරීම් මඟින් අපගේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට දරන අඛණ්ඩ ප්‍රයත්නයන්හි වැදගත් සන්ධිස්ථාන සනිටුහන් කරයි.

සංවර්ධනය බලගැන්වීම: මහා පරිමාණ විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා පහසුකම්කරණය

ජාතියේ බලශක්ති යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා දැඩි කැපවීමක් පෙන්නුම් කරමින් මහා පරිමාණ බලාගාර ව්‍යාපෘති සංවර්ධනය කිරීමේදී ලං.වි.ම. සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. අභිප්‍රාය ලිපිය (LOI) සාර්ථකව නිකුත් කරමින්, ඉදිකොට-හිමිකර-ක්‍රියාත්මක කිරීමේ (BOO) පදනම මත මෙගාවොට් 100 ක සියඹලාණ්ඩුව සූර්ය බලාගාර ව්‍යාපෘතියේ කඩිනම් ප්‍රගතිය ප්‍රධාන ජයග්‍රහණයන් අතර වේ.

මීට අමතරව, වසර අටකට පසු ශ්‍රී ලංකාවේ පළමු මූලික භාර තාප බලාගාරය වන කෙරවලපිටිය (සොබදනවි) හි මෙගාවොට් 350 ක සංයුක්ත චක්‍ර බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කිරීම ලං.වි.ම. විසින් අධීක්ෂණය කරන ලදී. ආර්ථික අභියෝග සහ අවශ්‍ය මූල්‍ය ගැලපීම්වලට මුහුණ දුන්නද, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට (PPA) සංශෝධන අත්සන් කරන ලද අතර, එමඟින් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කළ හැකි බව සහතික කර 2024 මැද භාගය වන විට මෙගාවොට් 212 ක ගෑස් ටර්බයිනයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ අඛණ්ඩ ප්‍රගතිය සහතික කෙරිණි.

තවද, 2023 අප්‍රේල් මාසයේදී දැන් "KCCP2" ලෙස නම් කර ඇති මෙගාවොට් 163 ක Sojitz සංයුක්ත චක්‍ර බලාගාරය ලං.වි.ම. විසින් සාර්ථකව අත්පත් කරගෙන ප්‍රතිසංස්කරණය කරන ලද අතර, එමඟින් ජාතියේ විදුලි ජනන ධාරිතාවය තවදුරටත් ශක්තිමත් කෙරිණි. මෙම ප්‍රයත්නයන් මඟින් අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ බලාගාර සංවර්ධනය සහ රටේ බලශක්ති අංශය ඉදිරියට ගෙන යාම සඳහා ලං.වි.ම. හි ක්‍රියාකාරී ප්‍රවේශය අවධාරණය කෙරේ.



මෙහෙයුම් සමාලෝචනය

බෙදාහැරීමේ අංශ

බෙදාහැරීමේ අංශ

බෙදාහැරීමේ අංශ අපගේ ආයතනයේ අත්‍යවශ්‍ය කොටස් ලෙස ක්‍රියාත්මක වන අතර, අපගේ වටිනා පාරිභෝගිකයන් වෙත ඉහළම මට්ටමේ විදුලි සැපයුම් හා සේවාවන් ලබාදීමේ වගකීම දරයි. ලංකා විදුලිබල මණ්ඩලය රටේ මුළු විදුලිය අලෙවි ප්‍රමාණයෙන් 89% ක් සිදුකරනු ලබන අතර, ඉතිරි කොටස අපගේ ලං.වි.ම. අනු ආයතනයක් වන ලංකා විදුලි පෞද්ගලික සමාගම (LECO) විසින් කළමනාකරණය කරනු ලබයි.

අපගේ බෙදාහැරීමේ යටිතල පහසුකම් බෙදාහැරීමේ අංශය 1 (DD1), බෙදාහැරීමේ අංශය 2 (DD2), බෙදාහැරීමේ අංශය 3 (DD3) සහ බෙදාහැරීමේ අංශය 4 (DD4) ලෙස වෙන් කර ඇත. මෙම භූගෝලීය කලාපීකරණය පරිපාලන කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් සඵලතාවය ප්‍රශස්ත කිරීම සඳහා නිවැරදිව සැලසුම් කර ඇති අතර එමඟින් සැපයුම් ගුණාත්මකභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව අඛණ්ඩව වැඩිදියුණු කරයි.

අපගේ බෙදාහැරීමේ ජාලයේ මූලික කොටස් වන්නේ කිලෝවෝල්ට් 33 සහ කිලෝවෝල්ට් 11 මධ්‍යම වෝල්ටීයතා (MV) රැහැන්, වෝල්ට් 400 අඩු වෝල්ටීයතා (LV) රැහැන් සහ බෙදාහැරීමේ තරාපැවි වේ. කිලෝවෝල්ට් 220 සහ කිලෝවෝල්ට් 132 සම්ප්‍රේෂණ පද්ධති මඟින් පහසුකම් සපයනු ලබන විදුලිය දිවයින පුරා ග්‍රිඩ් උපපොලවල් හරහා සම්ප්‍රේෂණය කරනු ලබන අතර, එය අපගේ බෙදාහැරීමේ ජාලය සමඟ සුමටව ඒකාබද්ධ වී පුළුල් හා විශ්වසනීය විදුලි සේවා ප්‍රවේශයක් සහතික කරයි.

මෙහෙයුම් ව්‍යුහය

අපගේ බෙදාහැරීමේ අංශ තුළ, මෙහෙයුම් ඒකක පළාත් අනුව සංවිධානය කර ඇත. මෙහිදී සැලකිය යුතු කරුණක් නම් මෙම සන්දර්භය තුළ පළාත්වල සීමා කිරීම රටේ පරිපාලන පළාත් සමඟ නිවැරදිව නොගැලපිය හැකි බවයි. සේවය ලබා දෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව මත පදනම්ව එක් එක් පළාත ප්‍රදේශවලට අනු බෙදුම්කොට ඇති අතර, පාරිභෝගික සබඳතා සහ සේවා සැපයීම කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSCs) වලට තවදුරටත් කොටස් කර ඇත.

එක් එක් අංශය යටතට වැටෙන නිශ්චිත පළාත් සහ ප්‍රදේශ පහත වගු D1 සිට D4 දක්වා විස්තර කර ඇත. මෙම වගු අපගේ බෙදාහැරීමේ අංශවල භූගෝලීය ව්‍යාප්තිය සහ සංවිධාන ව්‍යුහය දක්වන යොමු ලෙස කටයුතු කරමින් අපගේ මෙහෙයුම් භූමි දර්ශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීම සහ ඵලදායී කළමනාකරණයද පහසු කරයි.

මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 1 හි මෙහෙයුම් විෂය පථය තුළ වයඹ, උතුරු සහ උතුරු මැද පළාත්වල සම්පූර්ණ ප්‍රදේශය සහ බස්නාහිර පළාතේ කොටසක් ආවරණය වන අතර, එහි කළමනාකරණය ප්‍රාදේශීය කාර්යාල 19 ක් හරහා සිදු කෙරේ. බෙදාහැරීමේ අංශය 1 පළාත් පහක් වටා ව්‍යුහගත කර ඇත: වයඹ I, වයඹ II, උතුරු මැද, උතුරු, සහ කොළඹ නගරය වශයෙනි.

මෙම ව්‍යුහය තුළ, වයඹ I සහ වයඹ II පළාත් එක් එක් ප්‍රදේශ හතරකට අනු බෙදුම්කර ඇති අතර, උතුරු මැද පළාත ප්‍රදේශ තුනකට කොටස් කර ඇත. ඒ හා සමානව, උතුරු සහ කොළඹ නගර පළාත් එක් එක් ප්‍රදේශ හතරකට බෙදා ඇති අතර, එය 2023 වර්ෂයේ සංවිධාන ව්‍යුහයේ දැක්වෙන පරිදි වගුව D1 හි විස්තර කර ඇත. මෙම සීමා නිර්ණය කිරීම මගින් බෙදාහැරීමේ අංශය 1 තුළ නිවැරදි කළමනාකරණයක් සහ එහි මෙහෙයුම් ක්ෂේත්‍ර තුළ සේවා සැපයීම ප්‍රශස්ත කිරීම සහතික කරමින් සම්පත් ඵලදායී ලෙස වෙන් කිරීමට හැකියාව ලබා දෙයි.

වගුව D1: බෙදාහැරීමේ අංශය 1 හි මෙහෙයුම් ප්‍රදේශ

අංශය	පළාත	ප්‍රදේශය
බෙදාහැරීම් අංශය 1	වයඹ I	හලාවත, කුලියාපිටිය, වෙන්නප්පුව සහ පුත්තලම
	වයඹ II	කුරුණෑගල, වාරියපොල, නාරම්මල සහ මහව
	උතුරු මැද	අනුරාධපුර, කැකිරාව සහ මින්නේරිය
	උතුරු	යාපනය, යාපනය නැගෙනහිර, කිලිනොච්චි සහ වවුනියාව
	කොළඹ නගර	උතුරු කොළඹ, දකුණු කොළඹ, බටහිර කොළඹ සහ නැගෙනහිර කොළඹ

ඒ හා සමාන ආකාරයකින්, බෙදාහැරීමේ අංශය 2 නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල සම්පූර්ණ ප්‍රදේශය මෙන්ම බස්නාහිර සහ සබරගමුව පළාත්වල කොටස් ද ආවරණය කරමින් එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කරන අතර, සුමට කළමනාකරණය සඳහා ප්‍රාදේශීය කාර්යාල 25 ක් භාවිතා කරයි. මෙම අංශය පළාත් හතරකින් සමන්විත වේ, එනම් නැගෙනහිර, මධ්‍යම පළාත I, මධ්‍යම පළාත II, සහ බස්නාහිර පළාත උතුර වශයෙනි.

මෙම සංවිධාන ව්‍යුහය යටතේ, නැගෙනහිර පළාත ප්‍රදේශ පහකට තවදුරටත් බෙදා ඇති අතර, මධ්‍යම පළාත I ප්‍රදේශ හයකට අනු බෙදුම්කර ඇති අතර, මධ්‍යම පළාත II ප්‍රදේශ හතකට අනු බෙදුම්කර ඇත. ඒ හා සමානව, බස්නාහිර පළාත උතුර ප්‍රදේශ හතකට කොටස් කර ඇත. 2023 වර්ෂය සඳහා වගුව D2 හි දක්වා ඇති පරිදි මෙම බෙදීම් සහ උප බෙදීම්, බෙදාහැරීමේ අංශය 2 තුළ සිදුකර ඇත. කාර්යක්ෂම මෙහෙයුම් සංවිධානය කිරීමේදී මෙය ඉතා වැදගත් වන අතර, එහි මෙහෙයුම් බල ප්‍රදේශ පුරා කේන්ද්‍රගත සේවා සැපයීම සහ සම්පත් ප්‍රශස්තකරණය පහසු කරයි.

වගුව D2: බෙදාහැරීමේ අංශය 2 ට අදාළ මෙහෙයුම් ප්‍රදේශය

අංශය	පළාත	ප්‍රදේශය
බෙදාහැරීම් අංශය 2	නැගෙනහිර	අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වාලච්චේන සහ කල්මුණේ
	මධ්‍යම පළාත I	දඹුල්ල, ගලගෙදර, මහනුවර නගර, කටුගස්තොට, කුණ්ඩසාලේ සහ මාතලේ
	මධ්‍යම පළාත II	කෑගල්ල, මාවනැල්ල, පේරාදෙණිය, නුවරඑළිය, හිණිගත්හේන, නාවලපිටිය සහ හඟුරන්කෙත
	බස්නාහිර පළාත උතුර	ගම්පහ, කැළණිය, මීගමුව, ජා-ඇල, දිවුලපිටිය, වේයන්ගොඩ සහ කිරිඳිවැල

බෙදාහැරීමේ අංශය 3 බස්නාහිර පළාත (බස්නාහිර පළාත දකුණ II), සබරගමුව පළාත සහ ඌව පළාත තුළ ප්‍රදේශ ආවරණය කරමින් එහි මෙහෙයුම් ව්‍යාප්ත කරයි. විශේෂයෙන්, මෙම එක් එක් පළාත වගුව D3 හි විස්තර කර ඇති පරිදි තවදුරටත් වෙන් වූ ප්‍රදේශ පහකට බෙදා ඇත.

වගුව D3: බෙදාහැරීමේ අංශය 3 ට අදාළ මෙහෙයුම් ප්‍රදේශ

අංශය	පළාත	ප්‍රදේශය
බෙදාහැරීමේ අංශය 3	බස්නාහිර පළාත දකුණ II	බණ්ඩාරගම, හෝමාගම, අවිස්සාවේල්ල, ශ්‍රී ජයවර්ධනපුර සහ හොරණ
	සබරගමුව	රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ සහ ඇඹිලිපිටිය
	ඌව	බදුල්ල, දියතලාව, මොණරාගල, මහියංගනය සහ වැල්ලවාය

වර්තමාන මූල්‍ය කාල පරිච්ඡේදයේදී, බෙදාහැරීමේ අංශය 4 බස්නාහිර පළාතේ කොටසක් (බස්නාහිර පළාත දකුණ I), දකුණු පළාතේ සම්පූර්ණ ප්‍රදේශය, සහ සබරගමුව හා ඌව පළාත්වල සමහර ප්‍රදේශ ආවරණය කිරීමට එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කරයි. 2023 වර්ෂය වනවිට විශේෂයෙන්, බස්නාහිර පළාත දකුණ I වෙන් වූ ප්‍රදේශ හතරකින් සමන්විත වන අතර, දකුණු පළාත I සහ දකුණු පළාත II පිළිවෙලින් ප්‍රදේශ හතරකට සහ තුනකට උප බෙදුම්කර ඇත (වගුව D 4 බලන්න).

වගුව D4: බෙදාහැරීමේ අංශය 4 හි මෙහෙයුම් ප්‍රදේශ

අංශය	පළාත	ප්‍රදේශය
බෙදාහැරීමේ අංශය 4	දකුණු පළාත I	අම්බලන්ගොඩ, ගාල්ල, අකුරැස්ස සහ බද්දේගම
	දකුණු පළාත II	තංගල්ල, හම්බන්තොට සහ මාතර
	බස්නාහිර පළාත දකුණ I	රත්මලාන, කළුතර, දෙහිවල සහ මතුගම

පළාත් තුළ මෙහෙයුම් අධීක්ෂණයට අමතරව, අංශ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සහාය සේවා පහසු කිරීම සඳහා සියලුම බෙදාහැරීමේ අංශ හරහා වෙන් වූ ශාඛා තුනක් ස්ථාපිත කර ඇත. මෙම ශාඛාවලට ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව, සැලසුම් හා සංවර්ධන ශාඛාව, සහ වාණිජ හා ආයතනික ශාඛාව ඇතුළත් වේ. තවද, බෙදාහැරීමේ අංශය 1 තුළට මෙහෙයුම් සම්බන්ධීකරණය සහ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා බෙදාහැරීමේ සම්බන්ධීකරණ ශාඛාව ද ඇතුළත් කෙරේ.

බෙදාහැරීමේ අංශයන්හි ප්‍රධාන අරමුණු

අපගේ බෙදාහැරීමේ අංශවල ප්‍රධාන අරමුණු යටතේ, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා ගුණාත්මකභාවයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනිමින් පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සහ ඉක්මවා යාම සඳහා දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරන්නෙමු. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපායමාර්ගික අවධානය තුළ මූලපිරීම් පරාසයක් ආවරණය කෙරේ:

1. **මෙහෙයුම් සහ නඩත්තු කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම**: අපගේ පාරිභෝගිකයන්ට වඩා හොඳින් සේවය කිරීම සඳහා අපගේ මෙහෙයුම් සහ නඩත්තු කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අඛණ්ඩව උත්සාහ කරමු.
2. **බෙදාහැරීමේ ජාල පාලන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම**: සුමට මෙහෙයුම් සහතික කිරීම සහ අපගේ පාරිභෝගිකයන්ගේ පුළුල් වෙමින් පවත්නා අවශ්‍යතා සපුරාලීම සඳහා නවීනතම බෙදාහැරීමේ ජාල පාලන මධ්‍යස්ථාන සහ අනෙකුත් සන්නිවේදන යෙදුම් පවත්වාගෙන යන්නෙමු.
3. **උපායමාර්ගික ක්‍රියා සඳහා තාක්ෂණික සැලසුම්කරණය**: සම්පත් ප්‍රශස්ත ලෙස වෙන් කිරීම සහතික කරමින්, ආයතනික අරමුණු සමඟ අංශ උපායමාර්ග ලෙස පෙළගැස්වීම සඳහා සූක්ෂ්ම තාක්ෂණික සැලසුම්කරණයක් සිදු කරමු.
4. **විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම**: පද්ධති හානි අවම කරමින් විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව ජාත්‍යන්තර ප්‍රමිතීන් දක්වා ඉහළ නැංවීමට විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කිරීමට කැපවී සිටිමු.
5. **නිසි මූල්‍ය කළමනාකරණය**: නිවැරදි අයවැයකරණය, මූල්‍යකරණය සහ උනන්දුවෙන් යුත් නිරීක්ෂණය හරහා නිසි මූල්‍ය කළමනාකරණය සහතික කරමු.
6. **මුදල් ප්‍රවාහ කළමනාකරණය**: ආරක්ෂිත මුදල් ප්‍රවාහ කළමනාකරණයක් පවත්වා ගැනීම සඳහා කාලීනව ආදායම් එකතු කිරීමට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
7. **ද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය**: සුමට මෙහෙයුම් සහ සම්පත් ප්‍රශස්තකරණයක් සහතික කිරීම සඳහා දැඩි ද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇත.
8. **බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම**: නවීනතම ඉල්ලුම්-පාර්ශ්ව කළමනාකරණ සංකල්ප සහ පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා ක්‍රියාකාරී බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කරමු.
9. **ප්‍රමිතීන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම**: නවීන කර්මාන්ත භාවිතයන් සමඟ යාවත්කාලීනව සිටීම සඳහා ප්‍රමිතීන්, පිරිවිතර, ක්‍රියාපටිපාටි සහ කළමනාකරණ තොරතුරු නියමිත පරිදි සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.
10. **වැඩිදියුණු කළ පර්යේෂණ සහ සංවර්ධනය**: මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණයන් සංවර්ධනය කිරීමට අපගේ පර්යේෂණ සහ සංවර්ධන කැපවීම ඉවහල් වේ.
11. **ශ්‍රම බලකාය සංවර්ධනය**: සාර්ථකත්වය සහ වෘත්තීය වර්ධනය සඳහා උපරිම අවස්ථා ඇති කරමින් පුළුල් ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් හරහා අපගේ ශ්‍රම බලකාය වෙනුවෙන් ආයෝජනය කරමු.
12. **පරිසර ආරක්ෂණය සහ සංරක්ෂණය**: තිරසර භාවිතයන් පවත්වාගෙන යන බව සහතික කරමින්, මෙහෙයුම් කරන සියලුම ප්‍රදේශවල පරිසරය ආරක්ෂා කිරීමට සහ සංරක්ෂණය කිරීමට කැපවී සිටින්නෙමු.

මෙම සාමූහික උත්සාහයන් හරහා, විශිෂ්ට සේවාවක් සැපයීම, නවෝත්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සහ අප සේවය කරන ප්‍රජාවන්ට ධනාත්මකව දායක වීම කෙරෙහි අවධානය යොමු කර සිටිමු.

වඩා සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම සහ තිරසර බව වර්ධනය කිරීම

2023 වසරේදී, අපගේ සංවිධානය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ තිරසර වර්ධනයක් ලබා ගැනීම ප්‍රමුඛතාගත කළෙමු. වගුව D5 සිට D9 දක්වා ප්‍රධාන දත්ත මගින් බෙදාහැරීමේ පද්ධති වැඩිදියුණු කිරීමට සහ පාරිභෝගික ජන විකාශනය, අලෙවිය සහ ආදායම විශ්ලේෂණය කිරීමට දරන ලද උත්සාහයන් හෙළි කරයි.

රූපය D1 මගින් වසර පහක කාලයක් තුළ ලං.වි.ම. පාරිභෝගික පදනමේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන අතර, එමගින් වෙළඳපොළ ඉල්ලුම සපුරාලීමට ඇති අපගේ අනුවර්තනීය බව සහ කැපවීම පිළිබිඹු කරයි. උපායමාර්ගික ආයෝජන සහ දත්ත-පාදක තීරණ ගැනීම හරහා, මෙහෙයුම් ප්‍රශස්ත කර ඇති අතර කර්මාන්ත නායකයින් ලෙස අප ස්ථානගත කරනු ලැබ ඇත. ඉදිරි දැක්මක් සහිතව නවෝත්පාදනය, කාර්යක්ෂමතාව සහ සියලුම පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබාදීම සඳහා කැපවී සිටිමු.

වගුව D5: ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනයන්

විස්තරය	බෙ.අ. 1	බෙ.අ. 2	බෙ.අ. 3	බෙ.අ. 4
සේවා ප්‍රදේශය[1] (වර්ග කි.මී.)	26,931	16,817	13,900	6,466
ප්‍රදේශ (සංඛ්‍යාව)	19	25	15	11
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව)	61	91	53	42
පාලක මධ්‍යස්ථාන (සංඛ්‍යාව)	4	3	3	-
ඇමතුම් මධ්‍යස්ථාන (සංඛ්‍යාව)	4	3	3	2
තොග පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	5,190	4,123	2,514	2,045
සිල්ලර පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	2,025,171	2,408,186	1,428,886	1,148,646
සමස්ත පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	2,030,361	2,412,309	1,431,400	1,150,691
පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් දර්ශකය (SAIDI) (විනාඩි/පාරිභෝගිකයන්/වර්ෂය)	2,447	6,074	4,606	4,489
පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් වාර දර්ශකය (SAIFI) (අතුරු බිඳුම්/පාරිභෝගිකයන්/වර්ෂයකට)	10	40	37	33
මිලදීගත් විදුලිය ඒකක (ගි.වො.පැ.)	3,730	3,670	1,717	1,727
පාරිභෝගිකයන් වෙත අලෙවි කරන ලද විදුලිය ඒකක (ගි.වො.පැ.)	4,007	4,303	2,449	1,855
බෙදාහැරීමේ අලාභය (%)	6.8%	6.9%	7.2%	7.8%
අලෙවි කරන ලද ඒකකවලින් ඉපැයූ ආදායම (රු. මිලියන)	179,918.54	182,725.56	104,868.20	81,166.86
සාමාන්‍ය අලෙවි මිල (රු./කි.වො.පැ.)	44.90	42.47	42.82	43.75
ලැබිය යුතු තත්ත්වය (මාස)	1.3	1.3	1.3	1.3
වසරතුල ලබාදුන් නව සම්බන්ධතා (සංඛ්‍යාව)	31,417	25,522	19,175	11,914

[1] වනාන්තර හා විදුලි ජාලයන් නොමැති දූපත් හැර

වගුව D6: බෙදාහැරීමේ යටිතල පහසුකම් එක් කිරීම් - වර්ෂය 2023

විස්තරය	එකකය	බෙ.අ. 1	බෙ.අ. 2	බෙ.අ. 3	බෙ.අ. 4
බෙදාහැරීමේ රැහැන් (උඩිස්)					
කි.වෝ. 33 (රැහැන් දිග)	කි.මී.	12,414	10,399	16,960	4,588
කි.වෝ. 11 (රැහැන් දිග)	කි.මී.	763	371	34	261
අඩු වෝල්ටියතා (පරිපථ දිග)	කි.මී.	49,006	42,286	33,726	27,287
යටිබිම් බහන්					
කි.වෝ. 33 (රැහැන් දිග)	කි.මී.	22	10	10	9
කි.වෝ. 11 (රැහැන් දිග)	කි.මී.	915	151	5	32
අඩු වෝල්ටියතා (පරිපථ දිග)	කි.මී.	798	61	6	4
උපපොළ					
කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ සංඛ්‍යාව	සංඛ්‍යාව	44	30	11	48
අඩු වෝල්ටියතා බෙදාහැරීමේ උපපොළ සංඛ්‍යාව	සංඛ්‍යාව	12,290	11,787	7,059	5,736

වගුව D7: අයකුම කාණ්ඩයට අනුව පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව


විස්තරය	බෙ.අ. 1	බෙ.අ. 2	බෙ.අ. 3	බෙ.අ. 4
ගෘහස්ථ	1,703,166	2,081,321	1,250,381	1,000,764
ආගමික	14,682	14,774	8,135	6,191
කර්මාන්ත	38,408	15,645	9,625	6,874
හෝටල්	158	267	49	167
රජයේ	2,164	2,864	2,776	1,498
පොදු කාර්ය	269,021	296,803	160,270	135,195
කෘෂිකාර්මික	2,762	635	164	2
එකතුව	**2,030,361**	**2,412,309**	**1,431,400**	**1,150,691**

වගුව D8: අයකුම කාණ්ඩයට අනුව අලෙවිය (ගි.වෝ.පැ.)

විස්තරය	බෙ.අ. 1	බෙ.අ. 2	බෙ.අ. 3	බෙ.අ. 4
ගෘහස්ථ	1,327	1,539	860	769
ආගමික	30	22	10	10
කර්මාන්ත	1,005	1,758	1,006	509
හෝටල්	125	72	10	86
රජයේ	87	63	26	43
පොදු කාර්ය	1,390	811	537	419
කෘෂිකාර්මික	2	1	-	-
විවි ලාම්පු	41	37	-	19
එකතුව	**4,007**	**4,303**	**2,449**	**1,855**

වගුව D9: අයකුම කාණ්ඩයට අනුව ආදායම (රු. මිලියන)


විස්තරය	බෙ.අ. 1	බෙ.අ. 2	බෙ.අ. 3	බෙ.අ. 4
ගෘහස්ථ	59,736	66,128	36,625	33,760
ආගමික	1,298	967	417	428
කර්මාන්ත	38,177	68,221	38,883	20,044
හෝටල්	5,177	3,171	455	3,585
රජයේ	4,528	3,326	1,330	2,201
පොදු කාර්ය	70,915	40,881	27,151	21,149
කෘෂිකාර්මික	88	29	7	0.04
විවි ලාම්පු	-	3	-	-
එකතුව	**179,919**	**182,726**	**104,868**	**81,167**



රූපය D1: පාරිභෝගික ගිණුම්වල වසර පහක ප්‍රගතිය

විදුලියනය සඳහා වූ ප්‍රවේශය

ශ්‍රී ලංකාව පුරා විදුලියන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා අප විසින් නොකඩවා දරන ලද උත්සාහයන් තුළ, පසුගිය වසරේදී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. විදුලියනය සඳහා ප්‍රවේශය පළාත් අතර වෙනස් වන අතර, ඇතැම් පළාත් සැලකිය යුතු ජයග්‍රහණ පෙන්නුම් කරයි. විශේෂයෙන්, කොළඹ නගරය, බස්නාහිර පළාත උතුර, බස්නාහිර පළාත දකුණ I, දකුණු පළාත I, සහ දකුණු පළාත II යන සියල්ලම 100% විදුලියන ප්‍රවේශයක් ලබා ගෙන ඇති අතර, එය අපගේ විදුලියන මුල පිරීම්වල සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම ජයග්‍රහණ මගින් සමාජ-ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යාමේ සහ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීමේදී විදුලියනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.



රූපය D2: විදුලියන මට්ටම 2022/2023

මූල්‍ය අර්බුදයක් වැනි සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමට සිදු වුවද, විදුලියන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා ලං.වි.ම. දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත. කැපී පෙනෙන ලෙස, ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ ද්‍රව්‍ය හිඟය නිසා වසර ආරම්භයේදී පැවති සේවා සම්බන්ධතාවලින් 88% ක් පමණ සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කර ඇති අතර, එමගින් නිවාස සහ ව්‍යාපාර සඳහා විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සැලකිය යුතු ලෙස වැඩි දියුණු කර ඇත. මෙම ජයග්‍රහණය බාධක ජය ගැනීම සඳහා ලං.වි.ම. දරන කැපවීම පමණක් නොව ජාතික යටිතල පහසුකම් සහ ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යාමේදී එහි තීරණාත්මක කාර්යභාරය ද අවධාරණය කරයි.

සහයෝගීතා උත්සාහයන් සහ උපාය මාර්ගික ආයෝජන හරහා, ජාතිය පුරා සියලු ප්‍රජාවන් සඳහා සාධාරණ විදුලි ප්‍රවේශයක් සහතික කිරීමේ අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අපි කැපවී සිටිමු.

වහළය මත සවිකරන සූර්ය පැනල (PV) මුලපිරීම් ඉදිරියට ගෙනයාම


හරිත බලශක්තිය ඒකාබද්ධ කිරීම ප්‍රශස්ත කිරීමට ඇති අපගේ කැපවීමට අනුකූලව, විදුලි පාරිභෝගිකයින් සඳහා වහල මත සවිකරන සූර්ය පැනල (PV) පද්ධති ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සපයා ඇත්තෙමු. ශුද්ධ මානනය(Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting), ශුද්ධ ධන (Net +) සහ ශුද්ධ ධන ධන (Net ++) යන ක්‍රම හතර හරහා, පාරිභෝගිකයින්ට තම පරිශ්‍රයන්හි විදුලිය උත්පාදනය කළ හැකි අතර ඔවුන්ගේ ජනන යන්ත්‍ර ලංකා විදුලිබල මණ්ඩල (ලං.වි.ම.) පද්ධතිය සමඟ සම්මුහුර්ත කළ හැකිය. මෙමගින් ඔවුන්ට බලශක්තිය පරිභෝජනය කිරීමට සහ අපනයනය කිරීමට හැකියාව ලබා දෙයි. වගුව D10 මගින් 2023 වසර අවසානය වන විට තිබූ සූර්ය පැනල සම්බන්ධතා පිළිබඳ විස්තර සපයන අතර, එතුළ මෙම ක්ෂේත්‍රයේ අපගේ ප්‍රගතිය පෙන්නුම් කරයි.

වගුව D10: වහළය මත සවිකරන සූර්ය පැනල සම්බන්ධතා පිළිබඳ විස්තර - 2023 වර්ෂය

ඇංශය	අයිතමය	ශුද්ධ මානනය	ශුද්ධ ගිණුම්කරණය	ශුද්ධ ධන
බෙ.අ. 1	පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	3,667	6,762	1,069
	ස්ථාපිත ධාරිතාව (මේ.වෝ.)	33,125.9	67,956.2	67,154.9
	පද්ධතියට එක් කල බලශක්තිය (ගි.වෝ.පැ.)	20	57.7	86.8
බෙ.අ. 2	පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	2,425	7,696	662
	ස්ථාපිත ධාරිතාව (මේ.වෝ.)	25,519.8	75,404.5	104,675.3
	පද්ධතියට එක් කල බලශක්තිය (ගි.වෝ.පැ.)	10.2	67.6	130.4
බෙ.අ. 3	පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	2,462	5,614	760
	ස්ථාපිත ධාරිතාව (මේ.වෝ.)	23,122.9	49,899.1	80,178.7
	පද්ධතියට එක් කල බලශක්තිය (ගි.වෝ.පැ.)	9.8	38.9	90.7
බෙ.අ. 4	පාරිභෝගිකයන් (සංඛ්‍යාව)	2,165	5,995	550
	ස්ථාපිත ධාරිතාව (මේ.වෝ.)	19,438.9	56,462.0	49,545.6
	පද්ධතියට එක් කල බලශක්තිය (ගි.වෝ.පැ.)	10.3	51.5	58.1

D3 රූපය මගින් පසුගිය වසර පහ තුළ සූර්ය බලශක්ති සම්බන්ධතාවලින් ලැබෙන බලශක්ති අපනයනයන්හි වර්ධනය නිරූපණය කරයි. මෙම මුලපිරීම් අපගේ ප්‍රජාව තුළ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීමට සහ තිරසර භාවිතයන් වැඩිදියුණු කිරීමට ඇති කැපවීම පෙන්නුම් කරයි.

තවද, මූල්‍ය අර්බුදය හේතුවෙන් ඒකරාශි වී තිබූ වහල මත සවිකරන සූර්ය බලශක්ති උපකරණ සඳහා වන රුපියල් බිලියන 4 ක පමණ හිඟ මුදල් ලං.වි.ම. විසින් සාර්ථකව පියවා ඇත. මෙම තීරණාත්මක ක්‍රියාමාර්ගය තුළින් තවත් වහල මත සූර්ය පැනල සවි කිරීමට පාරිභෝගිකයන් දිරිගන්වා ඇති අතර, එමගින් වහල මත සූර්ය පැනල (PV) ව්‍යාපෘති ඉදිරියට ගෙන යනු ලබයි. වහල මත සූර්ය බලශක්ති ව්‍යාප්තිය පහසු කිරීම තුළින්, ලං.වි.ම. වර්තමාන බලශක්ති අවශ්‍යතා සපුරාලීමට පමණක් නොව දිගුකාලීන බලශක්ති තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ද සැලකිය යුතු පියවර ගනිමින් සිටී.



රූපය D3: පසුගිය වසර 5 ඇතුළත වහළය මත සවිකරන සූර්ය පැනල ද්‍යායකත්වයේ වැඩිදියුණුව ශ්‍රී.මෙ.පැ.යවලින්

උද්දීපනයන්

තරු වර්ගීකරණ වැඩසටහන්

ලං.වි.ම. පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා වන තරු ශ්‍රේණිගත කිරීමේ අත්පොතෙහි දෙවන සංස්කරණය 2023 මාර්තු මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. එම අත්පොත නූතන පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල සේවා තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන වසර පුරා ක්‍රියාත්මක කිරීමට උපකාරී විය. ආර්ථික හා ජීවන තත්ත්වයන්හි වැඩිදියුණුව සමඟ පාරිභෝගිකයින් ලං.වි.ම. යෙන් අපේක්ෂා කරන සේවා ගුණාත්මක මට්ටම ඉහළ ගොස් ඇති අතර, එමගින් සේවා ගුණාත්මකභාවය ක්‍රියාත්මක කිරීම තීරණාත්මක අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.



රූපය D4: තරු ශ්‍රේණිගතකරණ සම්මාන උත්සවය

2023 දෙසැම්බර් 31 වන විට, ලං.වි.මෙ.යේ තරු ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයේ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ලං.වි.ම. හි බෙදාහැරීමේ අංශ හතර විසින් බොහෝ පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල තරු තුනේ මට්ටමේ විගණනය ආරම්භ කර ඇති අතර, පාරිභෝගික සේවා මධ්‍යස්ථානවලින් 47% කට වැඩි ප්‍රමාණයක් තරු තුනේ මට්ටම දක්වා ළඟා වී ඇත. තරු තුන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු, බෙදාහැරීමේ අංශය 2 හි සුදුසුකම් ලත් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා 2023 දී සිවි-තරු මට්ටමේ විගණනය ආරම්භ කරන ලදී. සිවි-තරු මට්ටම සඳහා ඇගයීම් නිර්ණායක තරු තුනේ මට්ටමට සමාන වන අතර, මැදි වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා ජාලවල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, සිවි-තරු මට්ටම සඳහා සුදුසුකම් ලැබීමට පසුගිය වසර දෙක අතර බිඳවැටීම්වල අවම වශයෙන් 10% ක අඩුවීමක් අවශ්‍ය වේ. ලං.වි.ම. හි පවත්වන ලද තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ විස්තරාත්මක දළ විශ්ලේෂණයක් D11 වගුවෙහි දැක්වේ.

වගුව D11: තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන් සම්බන්ධ සවිස්තරාත්මක සමාලෝචනය

බෙදාහැරීමේ අංශය	පාරිභෝගික සේ.ම. සංඛ්‍යාව	තනි තරු සම්මානිත පාරිභෝගික සේ.ම. සංඛ්‍යාව	තරු දෙක පිරිනමන ලද පාරිභෝගික සේ.ම. සංඛ්‍යාව	තරු තුන පිරිනමන ලද පාරිභෝගික සේ.ම. සංඛ්‍යාව
බෙ.අ. 1	61	9	28	23
බෙ.අ. 2	91	12	32	47
බෙ.අ. 3	53	-	11	42
බෙ.අ. 4	42	-	37	4
ලං.වි.ම. සමස්තය	**247**	**21**	**108**	**116**

දකුණු පළාත II තුළ තරාපැවි අලුත්වැඩියා වැඩපළ ස්ථාපනය


වසර තුළදී, ලං.වි.ම. දකුණු පළාත II හි තරාපැවි අලුත්වැඩියා කිරීමේ කර්මාන්තශාලාවක් සාර්ථකව ස්ථාපිත කෙරිණි. මෙම මුලපිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් බෙලිඅත්ත, සිටිනාමලුව, දෙව්විමන වත්තෙන් පර්චස් 60 ක ඉඩමක් ලබාගැනීම සහ භාවිතයෙන් ඉවත් කරන ලද කණු සහ කුළුණු කොටස් භාවිතා කරමින් තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් විය. කර්මාන්තශාලාව 2023-06-08 දින ක්‍රියාත්මක වීම ආරම්භ කළ අතර තරාපැවි 7 ක් අලුත්වැඩියා කර ඇති අතර, එමගින් රුපියල් මිලියන 20.78 ක පිරිවැය ඉතිරියක් සිදු විය. තවද, තරාපැවි 126 ක ස්ථානීයව සුළු අලුත්වැඩියා කටයුතු සිදු කර ඇති අතර, එය ප්‍රදේශයේ තරාපැවි අක්‍රීය වීම් අඩු කිරීමට සහ විදුලි බෙදාහැරීමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට දායක වී ඇත.



රූපය D5: තරාපැවි අලුත්වැඩියා වැඩපළ ස්ථාපනය

යටිතල පහසුකම් සංවර්ධනය හරහා නැගෙනහිර පළාත සවිබල ගැන්වීම

වවුනතිවි කොටුමා උපපොළේ සිට උරණි ගෑන්ට්‍රිය දක්වා කි.වෝ. 33 ද්විත්ව පරිපථ ලින්ක්ස් විදුලි රැහැන් ව්‍යාපෘතිය නිම කිරීම මඩකලපුව ප්‍රදේශයට ස්ථාවර විදුලිය සැපයීම සඳහා සැලකිය යුතු පියවරක් සනිටුහන් කරයි. කලපුව හරහා කිලෝමීටර 1.1 ක දුරක් විහිදී යන මෙම සංවර්ධන සබැඳිය කලාපීය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන අඛණ්ඩ විදුලි සැපයුම සහතික කරයි.



රූපය D6: කළපුව හරහා දිවෙන මාර්ගය

රුපියල් මිලියන 126.8 ක මුළු ආයෝජනයක් සහිතව, 2022 අගෝස්තු සහ 2023 මැයි අතර කාලයේදී ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය කාලීන සහ කාර්යක්ෂම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඇති අපගේ කැපවීම පෙන්නුම් කරන්නක් වේ. Geo Engineering සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරමින් අභියෝග සාර්ථකව ජය ගනිමින් අත්‍යවශ්‍ය බලශක්ති යටිතල පහසුකම් සැපයීමට ලං.වි.ම. කටයුතු කර ඇති අතර, එමගින් නැගෙනහිර පළාතේ තිරසර සංවර්ධනය සඳහා පදනම සකසා ඇත.

වැඩිදියුණු කළ සේවා සම්පාදනයක් සඳහා යටිතල පහසුකම් නවීකරණය

බස්නාහිර පළාත දකුණ 1 සඳහා අධීක්ෂණ පාලන සහ දත්ත උකහා ගැනුම් (SCADA) සහායක උසස් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම සේවා විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වූ අපගේ කැපවීමේ තීරණාත්මක පියවරක් සනිටුහන් කරයි. දෙහිවල, ගල්කිස්ස, රත්මලාන වැනි ප්‍රධාන නගර සහ කළුතර වැනි කාර්මික කලාප ආවරණය කරමින්, මෙම මුලපිරීම ඉහළ මට්ටම් පරිභෝගිකයින් බොහෝ දෙනෙකු ඇතුළු විදුලි පාරිභෝගිකයින් 300,000 කට වැඩි පිරිසකට සේවා සපයයි. සුහුරු මනු සහ SCADA ඇතුළු ස්වයංක්‍රීයකරණය සහ උසස් කළමනාකරණ පද්ධති කෙරෙහි අවධානය යොමු කරමින්, විශ්වසනීයත්වය සහ සේවා ගුණාත්මකභාවය සඳහා වන වැඩිවන ඉල්ලුම සපුරාලීමට අපි අපේක්ෂා කරමු. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද මෙම ව්‍යාපෘතිය, අපගේ පාරිභෝගිකයින්ගේ ප්‍රයෝජනය සඳහා නවීනතම තාක්ෂණය යොදා ගැනීමට ඇති අපගේ කැපවීම පෙන්නුම් කරයි. 2023 වසර අවසන් වන විට බොහෝ ඉංජිනේරු සැලසුම් අනුමැතීන් සහ විදේශ පුහුණුව සම්පූර්ණ කර ඇති අතර, එමගින් බෙදාහැරීමේ මෙහෙයුම් නවීකරණය කිරීම සඳහා අපගේ පුරෝගාමී ප්‍රවේශය පෙන්නුම් කරයි.

සුහුරු මනුකරණය හරහා මෙහෙයුම් විප්ලවීයකරණය

දෙහිවල සුහුරු මනු ව්‍යාපෘතිය ආරම්භ කිරීම නවීනතම තාක්ෂණය සහ වැඩිදියුණු කරන ලද සේවාවන් සමඟ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා වූ අපගේ ගවේෂණයේ සැලකිය යුතු පියවරක් සනිටුහන් කරයි. චීනයේ Yantai Dongfang Wisdom Electric Co. Ltd සමඟ සහයෝගීතාවයෙන්, ලං.වි.ම. දෙහිවල ප්‍රදේශයේ පාරිභෝගිකයින් 50,000 ක් පමණ ආවරණය කරමින් සිය පළමු වාණිජ මට්ටමේ සුහුරු මනු මුලපිරීම ආරම්භ කර ඇත. මාස 19 ක් තුළ නිම කිරීමට නියමිත මෙම ව්‍යාපෘතියට පූර්ණ සුහුරු මනු පද්ධතියක් සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. මෙම පද්ධතිය ක්‍රියාත්මක වූ පසු, තත්‍ය කාලීන මනු දත්ත ප්‍රවේශය සක්‍රීය වනු ඇති අතර, එමගින් දුරස්ථ මනු කියවීම, විසන්ධි කිරීම සහ නැවත සම්බන්ධ කිරීම පහසු වන අතර, එමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සහ ක්‍රියාවලීන් සරල කිරීම සිදු වේ. මෙම පුරෝගාමී උත්සාහය අපගේ පාරිභෝගිකයින්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීම සහ තිරසර වර්ධනය ඉදිරියට ගෙන යාම සඳහා නවෝත්පාදන තාක්ෂණය යොදා ගැනීමට ඇති අපගේ කැපවීම අවධාරණය කරන්නක් වේ.

සවිබල ගැන්වුණු ආදායම් එකරාශිකරණය


පසුගිය වසර තුළ, ලං.වි.ම. විසින් එහි ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු පියවර ගන්නා ලදි. විවිධ උපායමාර්ගික මුලපිරීම් හරහා අපගේ මූල්‍ය ස්ථාවරත්වය සහ සම්පත් කළමනාකරණය වැඩිදියුණු කළෙමු.

ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කර, ප්‍රාදේශීය කාර්යාලවලට වගකීම් පවරන ලදී. මෙහෙයුම් කටයුතු සරල කර, වගවීම වැඩිදියුණු කර, කලාපීය අභියෝගයන්ට ඵලදායී ලෙස මුහුණ දීමෙන් එකතු කිරීම් වේගවත් කෙරිණි.

තවද, කොට්ඨාශ සඳහා අවසර දී ඇති ආදායම් මූලධර්ම ක්‍රියාත්මක කර, විවිධ කොට්ඨාශ සඳහා පැහැදිලි ආදායම් ඉලක්ක සකස් කර ඒවායේ කාර්ය සාධනය දැඩි ලෙස නිරීක්ෂණය කළෙමු. මෙම ප්‍රවේශය හේතුකොට ආයතනය පුරා වගකීම් සහගත සහ ක්‍රියාකාරී ආදායම් කළමනාකරණ සංස්කෘතියක් වර්ධනය විය.

මෙම උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස, අපගේ හිඟ මුදල් තත්ත්වය මාස 1.3 ක ප්‍රශංසනීය මට්ටමක පවත්වාගෙන ගියෙමු. මෙම වැඩිදියුණු කිරීම් හරහා ලංවිමෙහි මූල්‍ය ආරක්ෂාව ශක්තිමත් කෙරුණු අතර වැදගත් යටිතල පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම් සඳහා නැවත ආයෝජනය කිරීමට හැකියාව ලබා දෙන ලදි.

ලං.වි.ම. පාරිභෝගිකයින්ට විශ්වසනීය විදුලි සේවාවන් සැපයීම සහ තිරසර වර්ධනය උදෙසා සහාය වීම සඳහා අපගේ ආදායම් එකතු කිරීමේ යාන්ත්‍රණයන් අඛණ්ඩව සංශෝධනය කිරීමට කැපවී සිටින්නෙමු.



රූපය D7: බෙදාහැරීමේ සිතියම -2023



මෙහෙයුම් සමාලෝචනය

ව්‍යාපෘති අංශය

ව්‍යාපෘති අංශය

2010 වසරේ ස්ථාපිත කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශය, විදේශීය ආයතන, ශ්‍රී ලංකා රජය (GOSL) සහ ලංවිම විසින් අරමුදල් සපයන ලද වැදගත් විදුලි උත්පාදන හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. මෙම ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම සමස්ත විදුලි පද්ධතියේ ධාරිතාව හා විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

ගෝලීය වසංගතය සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ සැලකිය යුතු අභියෝගවලට මුහුණ දුන්නද, 2023 වසර ව්‍යාපෘති අංශය සඳහා තවත් අභියෝගාත්මක හා සාර්ථක වසරක් විය. දැඩි අධීක්ෂණයෙන් හා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතුව, අංශය රුපියල් බිලියන 28 කට අධික ව්‍යාපෘති කටයුතු කළමනාකරණය කර ක්‍රියාත්මක කිරීමට සමත් විය.

2023 වසර පුරා ව්‍යාපෘති අංශය විදුලි පද්ධතියේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට කැපවිය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අංශය විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය

මධ්‍යම කඳුකරයේ මහවැලි ගඟේ ඉහළ ප්‍රදේශයේ පිහිටි මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය, මෙගාවොට් 30.5 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ගලායන ජලයෙන් ක්‍රියාත්මක ක්‍රමයේ අධි ඉල්ලුමක් සහිත අවස්ථාවන්හි ක්‍රියාත්මක කෙරෙන විදුලි බලාගාරයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ පිටාර දොරටු 5 කින් සමන්විත මීටර් 37 ක් උස, මීටර් 236 ක් දිග කොන්ක්‍රීට් ගුරුත්ව බැම්මක් ඉදිකිරීම සිදු කෙරේ. වේල්ලේ ඉහළ කොටසේ ඇති ප්‍රවේශ ස්ථානයක් හරහා භූගත ජල මාර්ගයක්, සර්ජ් ටැංකියක් සහ ගඟේ වම් ඉවුරේ පිහිටි පෙන්ස්ටොක් නළයක් වෙත ජලය හරවනු ලැබේ. එතැන් සිට එය අර්ධ භූගත විදුලි බලාගාරය වෙත යොමු කර මහවැලි ගඟට නැවත මුදා හරිනු ලැබේ.



රූපය P1: මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය.

මීට අමතරව, නව පොල්පිටිය කොටුමා උපපොළේ සිට කිරිබත්කුඹුර කොටුමා උපපොළ දක්වා කිලෝවොට් 132 ක සම්ප්‍රේෂණ මාර්ගයක් මොරගොල්ල කිලෝවොට් 132 ස්විච් අංගනය හා සම්බන්ධ කෙරේ.

තවද, කිලෝවොට් 360 ක ධාරිතාවයකින් යුත් කුඩා ජල විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩ පාරිසරික ප්‍රවාහයක් පවත්වා ගැනීමට වේල්ලේ පිටාර නළයක් සවි කිරීමට සැලසුම් කර ඇත.

ව්‍යාපෘතිය කොටස් හතරකට බෙදා ඇත: A1 කොටස - පූර්ව සූදානම් වැඩ, A2 කොටස - ප්‍රධාන සිවිල් වැඩ, B කොටස - යාන්ත්‍රික හා විදුලි පහසුකම්, සහ 3 කොටස - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ සහාය වශයෙනි. එක් එක් කොටස සඳහා විස්තරාත්මක ප්‍රගති වාර්තා පහත දැක්වේ.

බලාගාර ධාරිතාව	මෙ.වො. 30.5	
අරමුදල්කරණ සැකසුම්	අංක: 3146 (SF)/3147-SRI) දරණ ආසියානු සංවර්ධන බැංකු ණය	
ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය	**විදේශීය අරමුදල්**	ඒ.ජ.ඩො. මිලියන 113.9
	ශ්‍රී ලංකා රජයේ අරමුදල් (ලං.වි.ම.)	රු. මිලියන 3,958
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය	2024 මැයි	
අපේක්ෂිත වාර්ෂික බලශක්තිය	ගි.වො.පැ. 100	
ව්‍යාපෘති උපාංගය	**භෞතික ප්‍රගතිය**	**කොන්ත්‍රාත්කරු**
සූදානම්කාරීත්ව කටයුතු	76%	වී.වී. කරුණාරත්න සහ සමාගම
ප්‍රධාන සිවිල් කටයුතු	40%	චීනයේ Gezhouba Group සමාගම
යාන්ත්‍රික සහ විදුලි පහසුකම්	28%	චීනයේ Dongfang Electric International Corporation, ආයතනය

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

බදුල්ල දිස්ත්‍රික්කයේ වාරිමාර්ග අමාත්‍යාංශය (MOI) යටතේ ක්‍රියාත්මක වන උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (UOMDP) අවසන් අදියරට ළඟා වෙමින් පවතී. මෙම වාරිමාර්ග හා ජල විදුලි සංකීර්ණය තුළට උමා ඔය සහ එහි අතු ගංගාවක් හරහා වේල්ල දෙකක්, අන්තර් ජලාශ මාරු උමඟක් සහ මෙගාවොට් 120 ක ධාරිතාවයකින් යුත් භූගත ජල විදුලි බලාගාරයක් ඇතුළත් වේ. මීට අමතරව හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල හෙක්ටයාර 5,000 ක පමණ භූමි ප්‍රමාණයක් සඳහා වාරි ජලය හරවා යැවීමද මෙයට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 290 ක විදුලි බලයක් නිපදවනු ඇතැයි අපේක්ෂා කරන අතර, විදුලි උත්පාදන පහසුකම් සහ රන්දෙණිය ස්විච් අංගනය කිලෝමීටර 22.7 ක කිලෝවොට් 132 ක සම්ප්‍රේෂණ මාර්ගයක් හරහා බදුල්ල කොටුමා උපපොළ වෙත සම්බන්ධ වනු ඇත. ලංවිම තාක්ෂණික කාර්ය මණ්ඩලය උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත අනුයුක්ත කර ඇති අතර, විදුලි-යාන්ත්‍රික වැඩ සඳහා විශේෂඥ දැනුම ලබා දෙයි. විස්තරාත්මක ව්‍යාපෘති තොරතුරු පහත දැක්වේ.

ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය	ඒ.ජ.ඩො. මිලියන 530
කොන්ත්‍රාත්කරු	ඉරානයේ FARAB සමාගම
සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය	2024 අප්‍රේල්
භෞතික ප්‍රගතිය	98.5%

දුව ස්වභාවික වායු ව්‍යාපෘතිය (LNGP)

ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ජාතික වශයෙන් තීරණය කළ දායකයින්ගේ රාමුව යටතේ රජය විසින් දක්වා ඇති කැපවීම්වලට අනුකූලව දුව ස්වභාවික වායු ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. දුව ස්වාභාවික වායු ගබඩා කිරීමේ සහ ප්‍රති-වායුකරණ ඒකකයක්

(FSRU) ස්ථාපනය කිරීම සහ කෙරවලපිටිය සහ කැලණිතිස්ස බලාගාර වෙත ස්වභාවික වායු ගබඩා කිරීමේ සහ ප්‍රති-වායුකරණ ඒකකය සම්බන්ධ කරන ස්වාභාවික වායු නල මාර්ග ඉදිකිරීම යන ප්‍රධාන අංග දෙකකින් සමන්විත වේ. 2026 වසර අවසන් වන විට ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාර සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම සහතික කිරීම සඳහා මෙම ව්‍යාපෘති ඉතා වැදගත් වේ. අපගේ ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

දිවයිනේ විදුලි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා වූ කැපවීම යටතේ, ලංවිම ව්‍යාපෘති අංශය දැනට විවිධ සම්ප්‍රේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කරමින් සිටී.

මෙම මූල පිරිම් විදුලි ඉල්ලුමේ අපේක්ෂිත වර්ධනයට අවශ්‍ය පුළුල් කිරීම් සඳහා සහ විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ව්‍යාපෘති අතරින් සමහරක් ඉදිරි උත්පාදන ව්‍යාපෘතිවල උත්පාදන ධාරිතා ඒකාබද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, අනෙක්වා පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා කොටුමා මට්ටමේ මැදිහත්වීම් සිදු කරයි. 2023-12-31 දිනට සිදුවෙමින් පවතින සම්ප්‍රේෂණ සංවර්ධනයන්හි ප්‍රගතිය වගුව P1 හි දක්වා ඇත. වර්ණ-කේතගත ප්‍රගති තීරු මගින් සැලසුම් කළ සන්ධිස්ථාන සහ සත්‍ය ප්‍රගතිය අතර වෙනස පැහැදිලිව පෙන්නුම් කරන අතර, එමගින් ව්‍යාපෘති ප්‍රගතිය ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීමට පහසුකම් සලසයි.

විස්තරය : ΔD - ඉලක්කයෙන් බැහැරවීම	Δ D< 10%	10%< Δ D< 25%	25%< Δ D< 50%	Δ D>50%

වගුව P1: ක්‍රියාත්මකව පවත්නා සම්ප්‍රේෂණ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය (රු. මිලියන)	2023-12-31 දිනට භෞතික ප්‍රගතිය	2023-12-31 දිනට භෞතික ඉලක්කය	නිම කෙරෙන දිනය
මහ කොළඹ සම්ප්‍රේෂණ සහ හානි අවමකරණ ව්‍යාපෘතිය	කෙරවළපිටියේ සිට කොළඹ L දක්වා දෙවන කි.වෝ. 220 කේබලය ඉදිකිරීම	9,119	10.0%	64%	2025 අගෝස්තු
	කොළඹ නගර සම්ප්‍රේෂණ ජාල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2	30,295	0.0%	10%	2026 දෙසැම්බර්
	බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය	1,148	5.0%	30%	2025 දෙසැම්බර්
ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලි ව්‍යාපෘතිය	හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය කොටස - A උපපොළ	6,958	99.9%	100%	2024 මාර්තු
	හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය කොටස B - සම්ප්‍රේෂණ මාර්ගය	17,770	99.8%	99.9%	2024 පෙබරවාරි
හරිත විදුලි සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර II	පැකේජය 1/B කොටස - නව පොල්පිටිය - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය	5,794	100.0%	100%	2023 සැප්තැම්බර්
	පැකේජය 2 / B2A කොටස - පාදුක්ක - හොරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	592	51.15%	100%	2023 නොවැම්බර්
	ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 3/ A1 කොටස - කොළඹ B කොටුමා උපපොළ, කොළඹ C - කොළොන්නාව කි.වෝ. 132 ව.මි.මී. 800 කේබලය ආශ්‍රිත තනි ඇතුළු හා පිටත සම්බන්ධතාවය ඉදිකිරීම සහ කොළඹ C සහ කොළොන්නාව කොටුමා උපපොළ විශාලනය	1,261	100.0%	100%	2023 ඔක්තෝබර්
	ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 8/ A කොටස - නාඩුකුඩා කි.වෝ. 220/33 කොටුමා උපපොළ විශාලනය, ආනියාකන්ද කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, චුන්නාකම් කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය,	1,382			කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි
	ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 8/ ඊ කොටස - අම්බලන්ගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, පන්නල කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය සහ මෙ.වෝ.ඇ. 31.5 කි.වෝ. 132/33 අතිරේක තරාපැවි 2 ක් සැපයුම	1,494	60.0%	65%	2024 ජනවාරි

ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය (රු. මිලියන)	2023-12-31 දිනට භෞතික ප්‍රගතිය	2023-12-31 දිනට භෞතික ඉලක්කය	නිම කෙරෙන දිනය
හරිත විදුලි සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර II	විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහාය ව්‍යාපෘතිය (SESRIP) : පැකේජය 7 - A3 කොටස: කොළඹ නගර කොටුමා උපපොළයන්හි මෙ.වෝ.ඇ. 124 බ්‍රේකර් ස්විච් ධාරිත්‍රක කැන් ස්ථාපනය සහ තුල්හිරිය කොටුමා උපපොළේ අවසුසරගත බ්‍රේකර් ස්විච් ධාරිත්‍රක කැන් මාරු කිරීම	1,705			කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි
	විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහාය ව්‍යාපෘතිය (SESRIP) : පැකේජය 7 - A1 කොටස: පන්නිපිටිය කොටුමා උපපොළ මෙ.වෝ.ඇ. 100 බ්‍රේකර් ස්විච් ධාරිත්‍රක කැන් ස්ථාපනය	1,104	78.0%	100%	2023 සැප්තැම්බර්
	විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහාය ව්‍යාපෘතිය (SESRIP) : පැකේජය 7 - A2 කොටස: බියගම කොටුමා උපපොළේ ස්ථිතික වාර පද්ධතිය (SVS) ස්ථාපනය	1,681	99.00%	100%	2024 පෙබරවාරි
ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය	පැකේජය 1: කි.වෝ. 400, කි.වෝ. 220 සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග	13,003	60.2%		කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලදි
	පැකේජය 2: කොටුමා උපපොළ ඉදිකිරීම සහ විශාලනය	7,418	74.2%	90%	2025 ජූලි
	පැකේජය 3: සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම: (කි.වෝ. 220, කි.වෝ. 132)	12,000	60.0%		කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි
	පැකේජය 4: බෙදාහැරීමේ උපපොළ සහ කේබල් ඉදිකිරීම (කි.වෝ. 33, කි.වෝ. 11, කි.වෝ. 0.4)	4,594	40.0%		කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදි
හරිත විදුලි සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර I	කැස්බෑව සහ කළුතර කොටුමා උපපොළ ඉදිකිරීම සහ නව අනුරාධපුර සහ පැරණි අනුරාධපුර කොටුමා උපපොළ විශාලනය	2,738	100.0%	100%	2023 පෙබරවාරි
	අදියර 2 - පැකේජය 9: කෙරවලපිටිය කි.වෝ. 220 ස්විච්චිකරණ ස්ථානය	2,910	88.0%	96%	2024 පෙබරවාරි
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	මැදගම - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	3,206	24.0%	86%	2025 ජනවාරි
	වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	1,400	6.0%	57%	2024 දෙසැම්බර්
	අතුරුගිරිය - කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය විශාලනය	170	15.0%	97%	2024 ජූනි
	පූනරින් - කිලිනොච්චි කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	3,400	12.0%	37%	2025 දෙසැම්බර්
	කොළොන්නාව - පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	960	10.0%	61%	2024 ජූනි
	කැළණිතිස්ස - කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ උස වැඩිකිරීම	702	9.0%	79%	2024 අප්‍රේල්
	නව අනුරාධපුර කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 2x250 ප්‍රතිචාරකය සහ මන්නාරම කොටුමා උපපොළේ 1x150 ප්‍රතිචාරකය ස්ථාපනය	1,463	100.0%	100%	2023 මාර්තු
	වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම (ද්විත්ව බස්බාර් සහිතව මෙ.වෝ.ඇ. 2x45 තරාපැවි)	1,898	96.0%	98%	2023 දෙසැම්බර්
	කැළණිතිස්ස කි.වෝ. 132 ගෑස් පරිවරණිත උපපොළ පුළුල් කිරීම	464	95.0%	100%	2024 මාර්තු

ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය (රු. මිලියන)	2023-12-31 දිනට භෞතික ප්‍රගතිය	2023-12-31 දිනට භෞතික ඉලක්කය	නිම කෙරෙන දිනය
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	නව පොල්පිටිය ස්විච්චිකරණ ස්ථානයේ කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග අංගන දෙකක් ඉදිකිරීම	291	100.0%	100%	2023 මාර්තු
	කොටුගොඩ විශාලන කටයුතු	73	100.0%	100%	2023 දෙසැම්බර්
	බලංගොඩ විශාලන කටයුතු	67	56.0%	73%	2023 දෙසැම්බර්
	අතුරුගිරිය විශාලන කටයුතු	15	69.0%	82%	2023 දෙසැම්බර්
	රත්මලාන කොටුමා උපපොළේ කි.වෝ. 33 පෝෂක අංගන දෙකක් ඉදිකිරීම	148	100.0%	100%	2023 සැප්තැම්බර්
	රන්ටැඹේ ස්විච් අංගනයේ කි.වෝ. 220 ගෑස් පරිවරණිත උපපොළ ඉදිකිරීම	2,809	6.0%	6%	2025 දෙසැම්බර්
	වික්ටෝරියා විදුලි බලාගාරයේ කි.වෝ. 220 1 1/2 බ්‍රේකර් පද්ධතියක් ඉදිකිරීම	229	16.0%	20%	2023 දෙසැම්බර්
	රන්දෙණියේ කි.වෝ. 132 ස්විච් අංගනයක් ඉදිකිරීම (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය)	350	97.0%	100%	2023 ජූලි
	කි.වෝ. 132 තනි බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග අංගනය අම්පාර කොටුමා උපපොළේ ඉදිකිරීම	85	5.0%	15%	2023 දෙසැම්බර්

ව්‍යාපෘති අංශය මුහුණ පෑ අභියෝග


වසර පුරා, රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් සැපයුම් දාමයේ බාධා ඇතිවීම නිසා ව්‍යාපෘති අංශයට සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමට සිදු විය. විදේශ විනිමය හිඟය හේතුවෙන් විදේශයන්ගෙන් උපකරණ ලබා ගැනීමේ ප්‍රමාදයන් තවදුරටත් උග්‍ර වූ අතර, එමගින් ව්‍යාපෘති කාල සටහන්වල සැලකිය යුතු ප්‍රමාදයන් ඇති විය.

තවද, ශ්‍රී ලංකා රුපියලේ අවප්‍රමාණය වීම හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම, ප්‍රමාණ බිල්පත් ඇස්තමේන්තු (BOQ) සඳහා පිළිගත හැකි මට්ටම් ඉක්මවා ගිය විශාල සංශෝධන ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුවන් පොළඹවා ඇත. මෙම සංශෝධිත ප්‍රමාණ බිල්පත් ඇස්තමේන්තු අනුමත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය තවදුරටත් අඩාල වී ව්‍යාපෘති කාලසටහන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය.

විදේශ අරමුදල් සහිත ණය අත්හිටුවීම් ද සැලකිය යුතු බාධාවක් වූ අතර, එමගින් ඉදිකිරීම් පිරිවැය සහ උපකරණ මිලදී ගැනීම ඇතුළු ව්‍යාපෘති වියදම් දැරීමට අරමුදල් හිඟයක් ඇති විය. මෙම හිඟය හේතුකොට සමාලෝචිත කාලය තුළ ව්‍යාපෘති ප්‍රගතිය සහ නිම කිරීම සැලකිය යුතු ලෙස අඩාල විය.

මීට අමතරව, ලංවිම වෙතින් පළපුරුදු තාක්ෂණික කාර්ය මණ්ඩලය ඉවත්ව යාම හේතුවෙන් සිදුවෙමින් පවතින ව්‍යාපෘති කටයුතු සඳහා කාර්ය මණ්ඩල හිඟයක් ඇති වූ අතර, එමගින් ව්‍යාපෘති ප්‍රගතිය තවදුරටත් අඩාල විය.

තවද, බෙදාහැරීම් බලපතලාභීන්ට ලබා දී ඇති නීතිමය ප්‍රතිපාදන සම්ප්‍රේෂණ බලපතලාභීන් වෙත ලබා දී නොමැති අතර, අධිකරණ නඩු කටයුතුවලදී මෙම කරුණ ඉස්මතු කර ඇත. මෙම විෂමතාව හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාද ඇති වී ඇති අතර, එමගින් ලංවිම වෙත සැලකිය යුතු මෙහෙයුම් අලාභ සිදු වී ඇත.



මෙහෙයුම් සමාලෝචනය

වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණ අංශය ආයතනික වත්කම්වල කාර්යක්ෂම භාවිතය සහතික කිරීම සඳහා ඒවා අධීක්ෂණය කර නඩත්තු කරයි. මෙම අංශය ලංවිම හි ආර්ථික වර්ධනය, සමාජ ප්‍රගතිය සහ පාරිසරික සංවර්ධනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. අංශය ශාඛා පහකින් සමන්විත වන අතර, එක් එක් ශාඛාව අංශයේ සමස්ත අරමුණු සඳහා අනන්‍ය ලෙස දායක වේ. වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාව අංශයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා මානව සම්පත් ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එය ව්‍යවස්ථාපිත කාර්යයන්ට හානියක් නොවන පරිදි අමතර ආදායම් උත්පාදනය කරමින් ලංවිම ඉඩම් සහ ගොඩනැගිලි කාර්යක්ෂමව කළමනාකරණය කරයි. සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව විශේෂිත ව්‍යුහාත්මක සැලසුම් ඒකකයක සහය ඇතිව ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කරයි. වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව අනතුරු හා සෞඛ්‍ය ගැටලු අවම කිරීමේ අරමුණින් ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. පුහුණු ශාඛාව සේවක කුසලතා වැඩිදියුණු කිරීම සහ විකාශනය වන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරයි. වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව විවිධ මෙහෙයුම් ඒකක හරහා අලුත්වැඩියා හා නඩත්තු කටයුතු කළමනාකරණය කරයි. මීට අමතරව, ආරක්ෂක ඒකකය ආයතනය තුළ කාර්ය මණ්ඩලයේ හා වත්කම්වල ආරක්ෂාව සහතික කරයි.

මෙහෙයුම් කාර්ය සාධනය

විශිෂ්ටත්වය බලගැන්වීම: 2023 වසර තුළ පුහුණු සහ සංවර්ධන මූලාරම්භයන්

2023 වසරේදී, පුහුණු ශාඛාව ලංවිම තුළ අඛණ්ඩ ඉගෙනුම් හා වෘත්තීය වර්ධන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. වගුව A1 හි විස්තරාත්මකව දක්වා ඇති පරිදි සම්පූර්ණ පුහුණු වැඩසටහන්වලින් ලංවිම පුහුණුලාභීන් 7,593 දෙනෙක් ප්‍රතිලාභ ලැබූහ. විශේෂයෙන්ම, විධායක නිලධාරීන් 130 දෙනෙකු සහ විධායක නොවන නිලධාරීන් නව දෙනෙකු විදේශීය තාක්ෂණික පුහුණුව, පරීක්ෂණ හා නිල සංචාර සඳහා යැවීමෙන් ආයතනය ගෝලීය නිපුණතාව කෙරෙහි එහි කැපවීම පෙන්නුම් කළේය.



රූපය A1: ක්‍රියාත්මක පුහුණු කටයුතු

තවද, පුහුණු ශාඛාව විධායක නිලධාරීන් නව දෙනෙකු, මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩල (MLTS) සේවකයින් දෙදෙනෙකු සහ ක්ෂේත්‍ර සේවකයින් 12 දෙනෙකු සඳහා පිළිගත් ආයතනවල දේශීය පුහුණු අවස්ථා පහසුකම් සැලසූ අතර, එමගින් බලශක්ති අංශයේ ගතික අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ කුසලතා වර්ධනය කරන ලදී. ඒ අතරම, ශාඛාව ඉංජිනේරු උපාධි හා ඩිප්ලෝමා මට්ටමේ සිසුන් 336 දෙනෙකු සඳහා කාර්මික පුහුණුව ලබා දීමෙන් ආයතනය තුළ ඔවුන්ගේ විභවතාවය වර්ධනය කිරීමට දායක විය.

සේවක යහපැවැත්ම හා මෙහෙයුම් විශිෂ්ටත්වය කෙරෙහි එහි කැපවීමට අනුකූලව, පුහුණු ශාඛාව පිළිවෙලින් සේවකයින් 1,796, 292 සහ 471 දෙනෙකු සඳහා ප්‍රථමාධාර, ගිනි ආරක්ෂණ සහ ඵලදායිතා පුහුණු සැසි පැවැත්වීය. තවද, ශාඛාව 2023 වසරේදී උසස්වීම් විභාග 8 ක් සහ බඳවා ගැනීමේ විභාග 6 ක් පැවැත්වූ අතර, එමගින් ලංවිම තුළ වෘත්තීය ප්‍රගතිය සඳහා සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් සහතික කරන ලදී.

මෙම මූලපිරීම් මගින් නිරන්තරයෙන් විකාශනය වන බලශක්ති ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය සඳහා අවශ්‍ය කුසලතා හා දැනුමෙන් එහි ශ්‍රම බලකාය සවිබල ගැන්වීමට ලංවිම දරන නොසැලෙන කැපවීම අවධාරණය කෙරේ. පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමෙන්, ලංවිම දක්ෂතා වර්ධනය කරනු පමණක් නොව, නවෝත්පාදන හා විශිෂ්ටත්ව සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින්, වර්තමානයේ සහ අනාගතයේ ආයතනයේ සාර්ථකත්වය ඉහළ නංවයි.

වගුව A1: 2023 වසර තුළ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව

පුහුණු පාඨමාලාව/ කාණ්ඩය	සහභාගි වූවන් සංඛ්‍යාව	
	පිළියන්දල පුහුණු මධ්‍යස්ථානය	කාසල්රී පුහුණු මධ්‍යස්ථානය
මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩලය (MLTS)	314	-
කාර්මික ශ්‍රේණි	3,110	1,030
ලිපිකරු හා සමාන්තර සේවා	659	-
කාර්යාල සේවක සේවය	197	-
ඉංජිනේරුවරුන් සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු	508	185
සෙසු විධායක නිලධාරීන් සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු	131	-
ලිපිකරු සේවා සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු	510	460
කාර්මික ශ්‍රේණි සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු	216	81
බාහිර ආයතන	18	174
එකතුව	**5,663**	**1,930**

නඩත්තු සමාලෝචනය

2023 වසර තුළ සිදු කරන ලද නඩත්තු කටයුතු වගුව A2 හි විස්තර කර ඇති පරිදි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් අංගයන්ගේ පුළුල් පරාසයක් ආවරණය කළේය. විශේෂයෙන්ම, ඩීසල් විදුලි ජනක යන්ත්‍ර, වායුසමන යන්ත්‍ර, සෝපාන ඒකක සහ ලංවිම වාහන සඳහා අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කරන ලද අතර, එමගින් ඒවායේ ශක්‍යතාවය හා ආයු කාලය සහතික කෙරිණි.

වගුව A2: වැඩපල සහ උපකාරක සේවා සම්බන්ධ කාර්ය සාධන විස්තර

කාර්ය කාණ්ඩය	කාර්ය සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)
ඩීසල් විදුලි ජනන යන්ත්‍ර කුලියට ලබාදීම, නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු	301	525
වායු සමීකරණ ඒකකයන්හි වාර්ෂික නඩත්තු සේවා, නව ස්ථාපනයන්, අලුත්වැඩියාවන් සහ ප්‍රතිසංස්කරණ කටයුතු.	517	522
සෝපාන ඒකක ආශ්‍රිත වාර්ෂික නඩත්තු සේවා, නව ස්ථාපනයන්, අලුත්වැඩියාවන්, ප්‍රතිසංස්කරණ, පරීක්ෂණ සහ උපදේශන සේවා.	56	53.1
ඉදිකිරීම් කටයුතු, නිෂ්පාදන කටයුතු, විදුලි කටයුතු, වාහන අලුත්වැඩියා සහ වාහන සේවාකරණයන්	452	82.8

තවද, නවීන සේවා තාක්ෂණය හා තත්ත්ව කළමනාකරණ පද්ධති ඒකාබද්ධ කරමින් අභ්‍යන්තර වාහන සේවා පහසුකම සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම හේතුවෙන් වසර පුරා වාහන 347 ක් සේවා කිරීමට හැකි වූ අතර, එය පෙර වසරවලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස 47% ක වැඩිවීමක් සනිටුහන් කළේය.

මීට අමතරව, සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව විසින් අධීක්ෂණය කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා කටයුතුවල කාර්යසාධනය වගුව A3 හි ලේඛනගත කර ඇති අතර, එමගින් යටිතල පහසුකම්වල අඛණ්ඩතාව හා මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා ආයතනය දරන අඛණ්ඩ ප්‍රයත්නයන් පිළිබඳ අවබෝධයක් ලබා දෙයි.

වගුව A3: ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියාවන් ආශ්‍රිත කාර්ය සාධනය - 2023 වසර

කාර්ය විස්තරය	වටිනාකම (රු. මිලියන)
දියතලාව ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම	76.0
දැරණියගල පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC) ගොඩනැගිල්ල ඉදිකිරීම	34.5
පිළියන්දල වැඩපල ගොඩනැගිල්ල ඉදිකිරීම	55.9
මීරිගම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ මීගමුව ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලය නවීකරණය	40.6
මීරිගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, නාඩුකුඩා සංචාරක බංගලාව, ජාතික පද්ධති පාලන මධ්‍යස්ථාන (NSCC) සහ බස්නාහිර පළාත දකුණ II (WPS II) ගබඩා නවීකරණය	121.5
කොළොන්නාව ගබඩා ගොඩනැගිල්ල සහ පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව ප්‍රතිසංස්කරණය	73.2
එකතුව	**401.7**

සේවාස්ථාන ආරක්ෂාව සහතික කිරීම: සෞඛ්‍ය සහ ආරක්ෂක මූලාරම්භයන් - 2023



රූපය A2: ආරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම


2023 පුරා පවත්වන ලද වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ වැඩසටහන් සහ ආරක්ෂක පරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක දළ විශ්ලේෂණයක් වගුව A4 හි ඉදිරිපත් කර ඇත. මෙමගින් සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත හා සුරක්ෂිත වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ලංවිම දරන නොසැලෙන කැපවීම ඇඟවේ.

වගුව A4: සෞඛ්‍ය හා ආරක්ෂක වැඩසටහන් හා පරීක්ෂාවන් පිළිබඳ විස්තර

අංශය	ආරක්ෂක පරීක්ෂාවන් සංඛ්‍යාව	ආරක්ෂක වැඩසටහන්	
		වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූවන් සංඛ්‍යාව
ජනන	10	09	433
සම්ප්‍රේෂණ	3	10	577
බෙදාහැරීමේ	91	80	5579
සෙසු	-	01	83
එකතුව	**104**	**100**	**6672**

හදිසි අනතුරු සාරාංශය

ලංවිම සුරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා උපායමාර්ගික වගකීම දරන අතර, අනතුරුවලින් තොර සේවා ස්ථානයක් ගොඩනගා සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ වගකීම වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව වෙත පවරා ඇත. රූපය A3 මඟින් 2023 වසර සඳහා ආයතනික අනතුරු සාරාංශය ඉදිරිපත් කරයි. සියලුම ලංවිම සේවකයින් සඳහා සුරක්ෂිත වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා ලංවිම ආරක්ෂක විගණන සිදු කරයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ග ආරම්භ කරමින්, ලං.වි.ම. විසින් ක්ෂේත්‍ර සේවකයන් සහ පොදු මහජනතාව වෙතද ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් සමනය කරමින් දීපව්‍යාප්ත මට්ටමින් ප්‍රාථමික උපපොළ, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන, වැඩබිම් හා විදුලි බලාගාර පරීක්ෂාව සිදුකරනු ලබයි.



රූපය A3: කොන්ත්‍රාත් සේවකයන්ද ඇතුළත්ව බරපතල සහ වාර්තා කළ යුතු මට්ටමේ හදිසි අනතුරු

ඉඩම් සහ ගොඩනැගිලි විස්තර

ලංවිම විසින් හිමිකම් කියන ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගැනීම, මිනුම්කරණය සහ තක්සේරු කිරීම අපගේ වත්කම් කළමනාකරණයේ ප්‍රමුඛතාවයකි. 2023 වසර අවසානය වන විට, මෙම වත්කම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු A5 වගුවේ (ඉඩම් සඳහා) සහ A6 වගුවේ (ගොඩනැගිලි සඳහා) සවිස්තරාත්මකව ලේඛනගත කර ඇත. මෙම වගු මඟින් පාර්ශ්වකරුවන්ට ලංවිම සතු දේපල පිළිබඳ සම්පූර්ණ දළ විශ්ලේෂණයක් ලබා දෙන අතර, අනාගත ව්‍යාපෘති සඳහා දැනුවත් තීරණ ගැනීමට සහ උපායමාර්ගික සැලසුම් සකස් කිරීමට පහසුකම් සලසයි.

වගුව A5: 2023 වසර අවසානය වනවිට ඉඩම් සම්බන්ධ විස්තර

අංශය	ඉඩම් සංඛ්‍යාව	ඉඩමේ විශාලත්වය			වටිනාකම (රු. මිලියන)
		අ.	රූ.	පර්.	
බෙදාහැරීමේ අංශය 1	206	157	0	31.65	8,206
බෙදාහැරීමේ අංශය 2	398	138	1	35.51	5,252
බෙදාහැරීමේ අංශය 3	129	68	0	39.86	3,501
බෙදාහැරීමේ අංශය 4	161	66	3	1.14	3,835
වත්කම් කළමනාකරණ	5	45	2	14.55	5,366
සම්ප්‍රේෂණ	123	409	2	6.28	15,413
ජනන	3,665	7,062	2	1.98	689
එකතුව	**4,687**	**7,948**	**1**	**10.97**	**42,262**

වගුව A6: 2023 වසර අවසානය වනවිට ගොඩනැඟිලි සම්බන්ධ විස්තර

අංශය	ගොඩනැගිලි සංඛ්‍යාව	වපසරිය වර්ග මීටරවලින්
බෙදාහැරීමේ අංශය 1	272	252,410.66
බෙදාහැරීමේ අංශය 2	436	308,561.71
බෙදාහැරීමේ අංශය 3	215	162,642.11
බෙදාහැරීමේ අංශය 4	170	120,715.30
වත්කම් කළමනාකරණ	75	20,736.04
සම්ප්‍රේෂණ	117	47,486.34
ජනන	1,043	285,773.29
ව්‍යාපෘති	30	9,569.51
ආයතනික ක්‍රමෝපාය	8	7,597.32
එකතුව	**2,366**	**1,215,492.28**

උද්දීපනයන්

කි.වෝ. 132 මාර්ග අංගන පුහුණු මාදිලිය දියත් කිරීම

පුහුණු අංශය සඳහා සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2023 වසරේදී පුහුණු කටයුතු සඳහා කි.වෝ. 132 මාර්ග අංගන මාදිලිය විවෘත කරන ලදී. මෙම සැලකිය යුතු සංවර්ධනය මගින් ලංවිම තුළ දීර්ඝ කාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් සපුරාලනු ලබන අතර, ඉංජිනේරුවන්, විදුලි අධිකාරිවරුන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසයි. මෙම පුහුණු ආකෘතිය හඳුන්වාදීම තුළ තාක්ෂණික විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීමට සහ බලශක්ති අංශයේ සංකීර්ණතා සමඟ කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා සමඟ ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමට ඇති අපගේ කැපවීමේ සන්ධිස්ථානයක් නියෝජනය කෙරේ.



රූපය A4: අලුතින් දියත් කරන ලද කි.වෝ. 132 මාර්ග අංගන මාදිලිය.

සංචාරක කර්මාන්තය සඳහා ජලාශ ක්‍රමෝපායිකව උපයෝජනය

උපයෝජනය නොකළ සම්පත්වලින් ආදායම උපරිම කිරීමේ ලංවිම හි උපායමාර්ගික අරමුණට අනුකූලව, සමාලෝචිත වසර තුළ සංචාරක හා විනෝදාස්වාද කටයුතු සඳහා ජලවිදුලි ජලාශ ප්‍රයෝජනයට ගන්නා ලදී. මෙම මූලපිරීම යටතේ පාවෙන ගුවන් යානා සහ බෝට්ටු සේවා ක්‍රියාත්මක විය. එමඟින් ආදායම් උත්පාදනයට සහ ප්‍රාදේශීය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට දායකත්වයක් ලබාදෙන ලදී. කාසල්රී ජලාශයේ බෝට්ටු සේවා සඳහා MJF Holdings සහ Farm Resort Collection (Pvt.) Ltd. සමඟ ඇති කරගත් ගිවිසුම් සාර්ථකව ක්‍රියාත්මක වීම මෙම ව්‍යාපෘතියේ ශක්‍යතාව තහවුරු කරයි. තවද, කාසල්රී ජලාශයේ පාවෙන ගුවන් යානා මෙහෙයුම් සඳහා Saffron Aviation සමඟ නව ගිවිසුමක් අත්සන් කිරීම, අපගේ වත්කම් අනෙක්නය වාසි සඳහා යොදා ගැනීමේ අඛණ්ඩ වර්ධනය සහ විවිධාංගීකරණය පෙන්නුම් කරයි.

වත්කම් ලේඛණය ගොඩනැගීම සහ ඉඩම් හඳුනා ගැනීම

සම්පූර්ණ වත්කම් කළමනාකරණය සඳහා, ලංවිම විසින් 2023 වසරේදී සිය වත්කම් ලේඛනය සාර්ථකව පිළියෙල කිරීමට නොකඩවා කටයුතු කරන ලදී.

විශේෂයෙන්, ජනන අංශය විසින් ඉඩම් කොටස් 573 ක් හඳුනාගත් අතර, බෙදාහැරීමේ අංශය 3 විසින් එක් ඉඩම් කොටසක් හඳුනාගන්නා ලදී. මෙම උත්සාහය මගින් ජනන අංශයේ හඳුනාගත් මුළු ඉඩම් කොටස් සංඛ්‍යාව 3,665 දක්වා සහ අනෙකුත් අංශවල ඉඩම් කොටස් 1,022 දක්වා ඉහළ නැංවිණි. මෙම සවිස්තරාත්මක වාර්තාකරණය සහ හඳුනාගැනීමේ ක්‍රියාවලිය සියලු අංශ පුරා ලංවිම හි වත්කම් විනිවිදභාවය, වගවීම සහ ඵලදායී භාවිතය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ජලාශ පරිශ්‍ර සඳහා ප්‍රජා සමීක්ෂණය

ඵලදායී ජලාශ කළමනාකරණය සඳහා, සමාලෝචනයට ලක් වූ වසර තුළ මාවුස්සාකැලේ ජලාශ පරිශ්‍රයේ සම්පූර්ණ ප්‍රජා සමීක්ෂණයක් ලංවිම විසින් සාර්ථකව නිම කරන ලදී. මෙම සමීක්ෂණය මගින් අනවසර ඇතුළුවීම් හඳුනාගැනීම සහ බලාත්මක කිරීමේ සහ සැලසුම් කිරීමේ කටයුතු සඳහා අත්‍යවශ්‍ය විස්තර රැස් කිරීම අරමුණු කෙරිණි. ඉන් අනතුරුව, රෙගුලාසි අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා ප්‍රජා සමීක්ෂණ වාර්තාව ඉඩම් අමාත්‍යාංශයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරන ලදී. තවද, ක්‍රියාකාරී සැලසුම්කරණයේ වැදගත්කම හඳුනාගනිමින්, පොල්පිටිය සහ කැනියන් ජලාශ සඳහා නව මිනුම් සැලසුම් පිළියෙල කිරීමට සමීක්ෂණ ඉල්ලීමක් යොමු කරන ලදී. මෙමගින් තිරසර සම්පත් කළමනාකරණය සහ ප්‍රජා සහභාගීත්වය සඳහා ලංවිම හි කැපවීම පෙන්නුම් කෙරේ.



මෙහෙයුම් සමාලෝචනය

ආයතනික ක්‍රමෝපාය අංශය

ආයතනික ක්‍රමෝපාය අංශය

ආයතනික ක්‍රමෝපාය අංශයේ පරිනාමය හා විකාශනය

ආයතනික ක්‍රමෝපාය අංශය මුලින්ම 2010 වසරේදී පිහිටුවනු ලැබුවේ ලංවිම හි බාහිර හා අභ්‍යන්තර පරිසරයන් හා ඒවායේ ගතික ස්වභාවය පරීක්ෂා කර, ලංවිම හි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා එය එහි ප්‍රතිපත්ති, ක්‍රියාවලීන්, භාවිතයන් හා සම්පත් සමඟ අනුගත කිරීම සඳහාය. මුල් කාලයේදී ලංවිම හි ආයතනික ක්‍රමෝපාය අංශය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත විය යුතුව තිබුණි. එක් අංශයක් ලංවිම හි අභ්‍යන්තර උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර අනෙක් අංශය ලංවිම සමූහ උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතුව පැවතිණි. කෙසේ වෙතත්, 2010 දී අභ්‍යන්තර උපායමාර්ග අංශය පමණක් පිහිටුවන ලද අතර, ලංවිම සමූහ උපායමාර්ග අංශය පසුව සංවර්ධනය කිරීමට අදහස් කරන ලදී.

අංශයේ ප්‍රධාන කාර්යභාරය වූයේ ලංවිම ව්‍යාපාර සංවර්ධන උපායමාර්ග හරහා එය ශ්‍රී ලංකාවේ ගෞරවනීය ශක්‍ය ව්‍යාපාරික ආයතනයක් ලෙස ඉහළ නැංවීමයි. අංශය මුලින්ම ශාඛා තුනකින් සමන්විත විය. එනම් ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය (B&OS) ශාඛාව, ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු (CS&RA) ශාඛාව, සහ ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව, (FS&PD) ශාඛාව වශයෙනි. මේවා අතරින් ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව පමණක් 2010 දී මුලින්ම පිහිටුවන ලදි. එය පිහිටුවීමෙන් පසු, ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් ලංවිම ක්‍රියාවලීන් පිළිබඳ ප්‍රධාන පරතර විශ්ලේෂණයක් සිදු කරන ලද අතර, ලංවිම හි පාරිභෝගික-කේන්ද්‍රීය සේවා සංස්කෘතියේ, ආරක්ෂාව-සම්බන්ධ කාර්යසාධනයේ, නවෝත්පාදන-ප්‍රවර්ධන සංස්කෘතියක් නොමැතිකම, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කාර්යසාධන දර්ශක (KPIs) භාවිතා නොකිරීම, සහ දුර්වල උපායමාර්ග ක්‍රියාත්මක කිරීම, සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලය සමඟ අනුගත වීම සඳහා ආයතනික උපායමාර්ග සන්නිවේදනය කිරීම, සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා නිරීක්ෂණය කිරීම යන කරුණුවල සැලකිය යුතු දුර්වලතා හඳුනා ගන්නා ලදී. වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව පිහිටුවීම, නවෝත්පාදන තරඟය හඳුන්වා දීම, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ඇගයීම සඳහා තරු ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය, උපායමාර්ග නිරීක්ෂණ මෙවලම වන "සමතුලිත ලකුණු කාඩ්පත" හඳුන්වා දීම මෙම මුල පිරීම්වල ප්‍රතිඵලයක් ලෙස සිදු විය. පසුව, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව සහ ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව ද පිහිටුවන ලද අතර තොරතුරු තාක්ෂණ (IT) ශාඛාව, පර්යේෂණ හා සංවර්ධන (R&D) ශාඛාව, සහ ප්‍රචාරණ ඒකකය ද පාරිභෝගික සේවා අංශ ව්‍යුහයට ඒකතු කරන ලදී. මෙමගින් පාරිභෝගික සේවා අංශයේ කාර්යභාරය සංවිධාන උපායමාර්ග කේන්ද්‍රීය මට්ටමක සිට වඩාත් මෙහෙයුම් අංශ දක්වා පුළුල් විය.

කාර්ය මූලික සමාලෝචනය

දැනට, ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව ලංවිම හි උපායමාර්ගික සැලසුම්කරණයට අත්‍යවශ්‍ය වන අතර, එමගින් ප්‍රධාන ව්‍යාපාරික හා මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරමින් ආයතනයේ ආයතනික ප්‍රතිරූපය වර්ධනය කරමින් ආයතනික සැලැස්මට අදාළව කාර්යසාධනය නිරීක්ෂණය කරයි. විශේෂයෙන්, ප්‍රචාරණ ඒකකය මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වන අතර, ඵලදායී සන්නිවේදනය හා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය පහසු කරයි.

ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම සඳහා ලංවිම වෙත නිකුත් කර ඇති බලපත්‍ර සම්බන්ධ කරුණු කළමනාකරණය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එය බලපත්‍රලාභීන් සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් නියාමන අනුකූලතාව සහතික කරයි. මීට අමතරව, ශාඛාව අවසාන පාරිභෝගික ගාස්තු සකස් කිරීම හා ආයතනික උපායමාර්ග සැකසීමට දායක වන අතර, සංඛ්‍යාන ඒකකයේ අධීක්ෂණය සිදු කරයි.

ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව තුළ, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කාර්යමූලික උපායමාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරී ඇත. අදාළ මෙහෙයුම් අත්පොත් සමඟ අනුකූල වීම සහතික කරමින් පද්ධති හා ක්‍රියාපටිපාටි පූර්ණ ලේඛනගත කිරීම මෙහි ප්‍රමුඛතාවයකි.

තොරතුරු තාක්ෂණ ශාඛාව ලංවිම හි ව්‍යාපාර ක්‍රියාවලීන් සුදුසු තාක්ෂණය සමඟ අනුගත කිරීමට කැප වී සිටින අතර, ඩිජිටල්කරණ අවශ්‍යතා ඵලදායීව සපුරාලීම සඳහා අභ්‍යන්තර සංවර්ධනය සහ බාහිර මූලාශ්‍ර භාවිතය වැනි විවිධ උපායමාර්ග භාවිතා කරයි. මෙම ශාඛාව තාක්ෂණික දියුණුව හරහා කාර්යක්ෂමතාව සහ පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව ගෘහස්ථ සහ සහයෝගිතා පර්යේෂණ කටයුතු මෙහෙයවන අතර, විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරමින් විශේෂිත අධ්‍යයනයන් සිදු කරයි. විශේෂයෙන්, එය ප්‍රහාමිතික පරීක්ෂණ සඳහා පිළිගත් අලෝකකරණය පිළිබඳ කලාපීය මධ්‍යස්ථානය (RCL) අධීක්ෂණය කරන අතර, එමගින් නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීමේ සහ කර්මාන්ත ප්‍රමිතීන් ඉහළ නැංවීමේ එහි කාර්යභාරය අවධාරණය කෙරේ.

උද්දීපනයන්

ගෘහස්ථ සංවර්ධන බිල්කරණ පද්ධතිය

ලංවිම විසින් දැනට භාවිතා කරන පැරණි බිල්පත් පද්ධතිය, යල් පැන ගිය තාක්ෂණය සහ පැරණි තාක්ෂණික වේදිකා පිළිබඳ පළපුරුදු කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ප්‍රතිස්ථාපනය කිරීමේ හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ගෘහස්ථව සංවර්ධනය කරන ලද පද්ධතියකින් බිල්පත් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. ව්‍යාපෘති සැලැස්මක් සකස් කර, ලංවිම අභ්‍යන්තර ව්‍යාපෘති කළමනාකරණ සම්පත් සහ බඳවා ගත් සංවර්ධන සම්පත් මිශ්‍රණයක් භාවිතා කරමින්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් යටතේ නව බිල්පත් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ අවශ්‍ය අනුමැතීන් ලබා ගන්නා ලදී.

විද්‍යුත් තැපැල් විසඳුම වළාකුළු පාදක වේදිකාවක් (Cloud-Based Platform) වෙත සංක්‍රමණය කිරීම

ලංවිම හි ආයතනික විද්‍යුත් තැපැල් විසඳුම පරිශ්‍රය-තුළ යටිතල පහසුකම්වල සිට වලාකුළු යටිතල පහසුකම් වෙත සේවාවක්-ලෙස-මෘදුකාංග (SaaS) ආකෘතියක් යටතේ සංක්‍රමණය කරන ලදී. මෙම ප්‍රසම්පාදනය මූලික විද්‍යුත් තැපැල් විසඳුම් සැපයීමට පමණක් නොව, ඉහළ පෙළේ විධායක නිලධාරීන්ට ඔවුන්ගේ අත්‍යවශ්‍ය දෛනික රාජකාරී තවත් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සීමිත ප්‍රමාණයක කාර්යාලීය යෙදුම් කට්ටලයක්ද සැපයීමට හේතු විය.

නව සයිබර් ආරක්ෂණ පියවර

පසුගිය වසරේදී ලංවිම හි අන්තර්ජාල ගෙවීම් ද්වාරයට (IPG) සිදු වූ හානිය හේතුවෙන්, බාහිර පරිසරයන්ට නිරාවරණය වී ඇති අන්තර්ජාල ගෙවීම් ද්වාරය සහ ලංවිම වෙබ් අඩවිය සුරක්ෂිත කිරීමට වහා පියවර ගන්නා ලද අතර නව ගෙවීම් ද්වාරයක් සංවර්ධනය කරන ලදී. ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා සූදානම්කාරිත්ව කණ්ඩායමේ (CERT) උපදෙස් හා නිර්දේශ සමඟ නව අන්තර්ජාල ගෙවීම් ද්වාරයෙහි ආරක්ෂණ පියවරයන් කිහිපයක් ඇතුළත් කරන ලදී.

මානව සම්පත් විගණනය

යාවත්කාලීන කරන ලද කාර්ය ප්‍රමිතීන්ට අනුකූලව මුළු ලංවිම ආයතනය පුරා විහිදි පූර්ණ මානව සම්පත් විගණනයක් සිදු කරන ලද අතර, පසුව එය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. මෙම නව කාර්ය ප්‍රමිතීන් සකස් කරන ලද්දේ විකාශනය වන ව්‍යාපාරික භූදර්ශනයන්, තාක්ෂණික දියුණුව, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, සහ ඩිජිටල්කරණයේ වර්ධනය වන ප්‍රවණතාවයට ප්‍රතිචාර වශයෙනි.



සූර්ය බලශක්ති යටිතල පහසුකම් හා අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ ජාල ධාරිතාවයේ ප්‍රගමණයන්



රූපය C1: ලක්විජය විදුලි බලාගාරයේ ස්ථාපිත වහළය මත සවිකරන සූර්ය පැනල පද්ධතිය

2023 වසරේදී, අපගේ පුනර්ජනනීය බලශක්ති යටිතල පහසුකම් ප්‍රගමණයේ සහ අපගේ අඩු වෝල්ටීයතා බෙදාහැරීම් ජාල ධාරිතාවය වැඩි දියුණු කිරීමේ විෂයයෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. ලක්විජය විදුලි බලාගාර පරිපාලන ගොඩනැගිල්ල සඳහා කිලෝවොට් 75 ක වහල මත සවිකරන සූර්ය පැනල පද්ධතියක් සහ ලංවිම ප්‍රධාන කාර්යාල ආපනශාලා ගොඩනැගිල්ල සඳහා කිලෝවොට් 60 ක වහල මත සවිකරන සූර්ය පැනල පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තුළ තිරසර බලශක්ති විසඳුම් සඳහා අප දරණ කැපවීම පෙන්නුම් කෙරේ. මෙයට සමගාමීව, පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් 2023 දෙසැම්බර් මාසයේදී තාක්ෂණික නිරීක්ෂණ වාර්තාවක් නිකුත් කරන ලද අතර, එමගින් වැඩි වශයෙන් වහල මත සවිකරන සූර්ය පැනල සම්බන්ධතා ඇතුළත් කර ගැනීම සඳහා අඩු වෝල්ටීයතා බෙදාහැරීම් ජාල ධාරිතාවය වැඩි දියුණු කිරීමට අදාළ නිර්දේශ දක්වා ඇත. 2024 දී මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර එමගින් විකාශනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම සඳහා අපගේ ක්‍රියාකාරී ප්‍රවේශය අවධාරණය කරයි.

ලං.වි.ම. සුහුරු මනුකරණ විසඳුම

2023 වසර තුළදී, ලංවිම සඳහා සුහුරු මනු විසඳුමක් සංවර්ධනය කරන ලද අතර, එමගින් සුහුරු මනු ක්‍රියාකාරිත්වය සහිත පවතින ලංවිම බලශක්ති මීටර, අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද ලංවිම ප්‍රධාන-අන්ත පද්ධතිය (HES) සහ CEBAssist වේදිකාව සමඟ ඒකාබද්ධ කළ හැකිය. රත්මලානේදී මෙම සුහුරු මනු විසඳුම සඳහා නියමු ව්‍යාපෘතියක් සිදු කරන ලදී.

තිරසර බලශක්ති අනාගතයක් කරා ගමන් කිරීම : ලං.වි.ම. 2024-2028 ආයතනික සැලැස්ම

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් දක්වා ඇති "රාජ්‍ය හිමිකාරිත්වය තියෙන ආයතනයන් සහිත ව්‍යවසායන් සඳහා ආයතනික පාලන මාර්ගෝපදේශ" වලට අනුකූලව, ලංවිම 2024-2028 වසර සඳහා සිය ආයතනික සැලැස්ම සකස් කිරීමේ වැදගත් කාර්යයට අවතීර්ණ විය. පිළිගත් වෘත්තීය සේවා වන KPMG ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, ලංවිම ඉදිරි වසර පහ සඳහා සිය මෙහෙයුම් හා උපායමාර්ගික ව්‍යායාමයන් මෙහෙයවීම සඳහා පූර්ණ මාර්ග සිතියමක් සැකසීමට උනන්දුමත් විය. සූක්ෂම ක්‍රියාවලියක් හරහා, ආයතනය සිය පුළුල් දැක්ම හා මෙහෙවර සමඟ සමීපව අනුගත වන නව ඉලක්ක, උපායමාර්ගික අරමුණු, සහ ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග සාර්ථකව සකස් කළේය. මෙම සන්ධිස්ථානීය ජයග්‍රහණය තුළ බලශක්ති අංශය තුළ තිරසර වර්ධනය සහ සේවා සැපයීමේ විශිෂ්ටත්වය සඳහා ලංවිම දරන නොසැලෙන කැපවීම අවධාරණය කෙරේ.

තිරසර විදුලිය සැපයුමක් සහතික කිරීම සඳහා ගාස්තු සංශෝධන මෙහෙයවීම

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් දක්වා ඇති පරිදි බලශක්ති අංශය සඳහා වන ශ්‍රී ලංකා රජයේ සාමාන්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව, සිතාමතා විදුලි කප්පාදු ඉවත් කිරීම සහ රජයේ සහනාධාර මත රඳා පැවතීම නැවැත්වීම සඳහා ස්ථාපිත කරන ලද නව අර්ධ-වාර්ෂික කාලසටහනට අනුකූලව ලංවිම 2023 වසර පුරා සැලකිය යුතු ගාස්තු සංශෝධන සිදු කළේය. ලංවිම විසින් ඉදිරිපත් කරන ලද ගාස්තු සංශෝධන යෝජනා තුනකට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා අනුමැතිය ලබා දුන් අතර, මූලික සංශෝධනයේදී දශකයකට පසු ප්‍රථම වරට පිරිවැය පිළිබිඹු කරන ගාස්තුවක් සාර්ථකව ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. මෙම ප්‍රතිෂ්ඨාපනය හේතුකොට රටේ ආර්ථිකය යථා තත්වයට පත්වීමට අත්‍යවශ්‍ය සහ කර්මාන්ත, ව්‍යාපාර සහ මහජනතාවට ප්‍රයෝජනවත් වන අඛණ්ඩ පැය 24x7 විදුලි සැපයුමක් සඳහා අවශ්‍ය පහසුකම් සැලසිණි.

කෙසේ වෙතත්, 2023 ජූලි-දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පනවන ලද 14.2% ක ගාස්තු අඩු කිරීම සහ ජලවිදුලි සංචිත කෙරෙහි

දැඩි නියඟ තත්වයන්හි බලපෑම වැනි අභියෝග මධ්‍යයේ, ලංවිම අතිරේක ගාස්තු ගැලපීම් අවශ්‍ය කරන අසාමාන්‍ය තත්වයන් හරහා ගමන් කළේය. ගාස්තු කාලසීමාව කාර්තුමය පදනමක් දක්වා සංශෝධනය කිරීමට රජය ගත් තීරණය සමඟ, ලංවිම අවදානම් කණ්ඩායම්වලට සහන සැපයීමට සහ ප්‍රධාන ආර්ථික ආයතනවලට සහාය වීමට ඇති කැපවීම පිළිබිඹු කරමින්, ගාස්තු අඩු කිරීම සඳහා අතිරික්ත වෙන් කිරීමක් ඇතුළුව ක්‍රියාකාරී යෝජනා සමඟින් සිය ප්‍රතිචාර දැක්වීය.

කාර්යක්ෂම පිරිවැය අවමකරණ මූලාරම්භයන්

2023 දී, ඩිජිටල් ප්‍රකාශන ක්‍රම අනුගමනය කිරීම සහ විදුලිය බිඳ වැටීම් දැන්වීම් සඳහා QR කේත ඒකාබද්ධ කිරීම ඇතුළු නවෝත්පාදන පිරිවැය-අඩු කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කරන ලදී. තොරතුරු සඳහා පරිශීලකයින් ලංවිම ආයතනික වෙබ් අඩවිය වෙත යොමු කිරීමෙන් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරමින් මෙම උත්සාහයන් මගින් වෙළඳ දැන්වීම්, මුද්‍රණ සහ ප්‍රකාශන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කෙරිණි. තවද, ලංවිම නිල පුවත්පත වන 'ලං.වි.ම.' ඩිජිටල් ආකෘතියකට මාරු කිරීම හේතුකොට කඩදාසි-පාදක සන්නිවේදනය මත පැවති රඳා පැවතීම තවදුරටත් අවම කෙරිණි.

2023 වසර පුරා අංශයේ අනෙකුත් සැලකිය යුතු ජයග්‍රහණ පහත විස්තර කර ඇත.

- වසර තුළදී, චක්‍රලේඛ, අත්පොත්, සහ ලේඛන පද්ධතිය (CMDS) නැවත සකස් කරන ලද අතර මේවන විට විතුළ පුළුල් කරන ලද විශේෂාංග සහ වැඩි දියුණු කරන ලද සෙවුම් කාර්යයන් ඇතුළත් වන අතර, එමගින් පරිශීලකයින්ට වඩාත් ගවේෂණාත්මක සහ තෘප්තිමත් සෙවුම් අත්දැකීමක් ලබා දෙයි.

- සේවා සම්පාදනයේදී කාර්යක්ෂමතාව, අනුකූලතාව, සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් 2023 දී නිතර ඉල්ලුම් කරනු ලබන සේවා කිහිපයක් සඳහා සම්මත අයදුම්පත් ගොඩනඟන ලදී.

- 1995 දී මුලින්ම ප්‍රකාශයට පත් කළ දින සිට වෙනස් නොකළ සියලුම පුද්ගල අත්පොත් 2023 දී සංශෝධනය කර සංශෝධිත අනුවාද නිර්මාණය කරන ලදී. මේවාට 'දිවයින තුළ රාජකාරී සංචාර,' 'වැටුප් හා වේතන,' සහ 'නිවාඩු, නිවාඩු වැටුප්/හිලව් නිවාඩු, සහ අතිකාල' වැනි අත්පොත් ඇතුළත් වේ.

- වත්මන් සහ විශ්‍රාමික සේවකයින්ට ඕනෑම ස්ථානයක සිට පහසුවෙන් ලංවිම සංචාරක බංගලා වෙන් කරවා ගැනීමට හැකි වන පරිදි අන්තර්ජාලය හරහා සංචාරක බංගලා වෙන් කිරීමේ පද්ධතියට ප්‍රවේශය ලබා දීමට පියවර ගන්නා ලදී.

- සියලුම කාර්ය මණ්ඩල කාණ්ඩ ආවරණය කරමින් චිත්තවේගී බුද්ධිය, උපායමාර්ගික මූලාශ්‍රකරණය, ආකල්ප, සහ කණ්ඩායම් පරිසරයක ඵලදායිතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

- පාරිභෝගික භාර සහ ප්‍රතිජනනීය බලශක්තිය (RE) උත්පාදන සම්බන්ධතා සම්බන්ධ කිරීම සඳහා අන්තර්-බස් තරාපැවිවල තෘතීයික දඟරය (දැනට භාවිතා නොකරන) භාවිතා කිරීමේ හැකියාව විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී.

- 2023 මාර්තු මාසයේදී ලං.වි.ම. පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා වන තරු ශ්‍රේණිගත කිරීමේ අත්පොතෙහි දෙවන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීම අපගේ ආයතනය සඳහා සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ඒ අනුව, මෙම වාර්තාවේ බෙදාහැරීම් අංශ කොටසෙහි දක්වා ඇති තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන්, අත්පොතෙහි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රගමණය විය. මෙම මූල පිරීම හරහා ආයතනයේ සියලුම අංශ තුළ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම සහ මෙහෙයුම් ක්‍රියාවලීන් සුමට කිරීම සඳහා වූ අපගේ කැපවීම අවධාරණය විය.



මෙහෙයුම් සමාලෝචනය

මූල්‍ය අවදානම් කළමනාකරණය
තාක්ෂණික අවදානම් කළමනාකරණය
තිරසරභාවය සම්බන්ධ වාර්තාව
ආයතනික සමාජ වගකීම් වාර්තාව

මූල්‍ය අවදානම් කළමනාකරණය

තිරසර මූල්‍ය ස්ථායීතාවය සඳහා, 2023 මූල්‍ය වර්ෂය තුළ ලංවිම විසින් එහි මෙහෙයුම් පරිසරයේ පවතින විවිධ අවදානම් සූක්ෂම ලෙස හසුරුවන ලදී. මෙම පරිච්ඡේදය මගින් ලංවිම මුහුණ දුන් ප්‍රධාන මූල්‍ය අවදානම්, පිළිවෙලින් ඒවායේ බලපෑම් සහ යොදා ගත් අවදානම් අවම කිරීමේ උපාය මාර්ග පැහැදිලි කරයි.

පොළී අනුපාත අවදානම

පවත්නා වෙළඳපොළ ක්‍රියාකාරිත්වය පිළිබඳව දැනුවත්ව සිටි ලංවිම විසින්, පොළී අනුපාත උච්චාවචනයන්ට ඇති සංවේදීතාවය හඳුනා ගන්නා ලදී. උපරිම ණය සීමාව භාවිතා කිරීම සහ බර තැබූ සාමාන්‍ය ණය දීමේ අනුපාතයට (AWPLR) සම්බන්ධ කාලීන ණය මත රඳා පැවතීම සැලකිල්ලට ගනිමින්, ආයතනය පොළී අනුපාත නිරාවරණයන් කළමනාකරණය කිරීමේදී අවධානයෙන් කටයුතු කර ඇත. ප්‍රති උපාය මාර්ගයක් ලෙස, ලංවිම විසින් වසර පහක කාලයක් සඳහා 9.35% ක ස්ථාවර කූපන් අනුපාතයකට ණයකර නිකුත් කරන ලදී. තවද, සියලුම ණය වාරික සඳහා කාලීන ගෙවීම් කාලසටහන්වලට අනුකූල වීම ලංවිම හි පොළී අනුපාත අවදානම අවම කිරීමේ කැපවීම පෙන්නුම් කරයි.

විනිමය අනුපාත අවදානම

පහත වැටෙන විනිමය අනුපාත පසුබිමක් තුළ, ලංවිම විසින් විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. ආනයන සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක් ක්‍රමානුකූලව සකස් කිරීම සහ එම ලැයිස්තුවට අනුව ණයවර ලිපි සහ විදුලි සංදේශ මාරු කිරීම් සැලකිලිමත්ව කළමනාකරණය කිරීම මගින්, ලංවිම අනවශ්‍ය විනිමය අනුපාත උච්චාවචනයන්ගෙන් ආරක්ෂා විය. මෙම උපායමාර්ගික ප්‍රවේශය මගින් මූල්‍ය වර්ෂය පුරා විනිමය අනුපාත අවදානම ප්‍රඥාගෝචර ලෙස කළමනාකරණය කිරීම සහතික කෙරිණි.

ණය අවදානම

ද්‍රවශීලතාව ආරක්ෂා කිරීමේ අත්‍යවශ්‍යතාවය හඳුනාගනිමින්, පාරිභෝගික ගෙවීම් ප්‍රමාද වීමෙන් මතුවන ණය අවදානම් ගැටලු ලංවිම විසින් විසඳන ලදී. පාරිභෝගික ගෙවීම් ප්‍රමාදයන්ට සාපේක්ෂව සැපයුම්කරුවන්ට ගෙවීම් ප්‍රමාද කිරීමේ උපාය මාර්ග යක් ක්‍රියාත්මක කිරීමෙන්, ලංවිම විසින් සිය ද්‍රවශීලතා තත්ත්වය ඵලදායී ලෙස කළමනාකරණය කරන ලදී. මෙම ප්‍රඥාගෝචර ප්‍රවේශය හේතුකොට විය හැකි ද්‍රවශීලතා සීමාවන් මධ්‍යයේ ලංවිම හි මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා විය.

වෙළඳ භාණ්ඩ අවදානම

රුසියා-යුක්‍රේන ගැටුමෙන් පැන නැගුණු භූ-දේශපාලනික කැළඹීම විසින් ගෝලීය භාණ්ඩ වෙළඳපොළවල් හරහා ප්‍රතිධ්වනිගතව ලෝක තෙල් මිල ගණන්වලට බලපෑමක් ඇති කරන ලදී. කෙසේ වෙතත්, පෙර වසරට සාපේක්ෂව වාසිදායක තත්ත්වයක පැවති ගල්අඟුරු මිල ගණන් ප්‍රයෝජනයට ගැනීමෙන් ලංවිම විසින් මෙම අභියෝගය දක්ෂ ලෙස හසුරුවන ලදී. තවද, ලංවිම විසින් ජල විදුලිය සහ අනෙකුත් සම්ප්‍රදායික නොවන බලශක්ති ප්‍රභවයන්ගේ භාවිතය උපරිම කරන ලද අතර, එමගින් භාණ්ඩ මිල අවදානම අවම කර මෙහෙයුම් ආශ්‍රිත ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරන ලදී.

ද්‍රවශීලතා අවදානම

ගාස්තු ගැලපීම් හේතුවෙන් පෙර හිඟ මුදල් පියවීම අවශ්‍ය වූ අතර, එමගින් ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණයේ වැදගත්කම අවධාරණය කෙරිණි. ද්‍රවශීලතා අවදානම විසඳීම සඳහා, ලංවිම විසින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) සහ ස්වාධීන විදුලි නිෂ්පාදකයින් (IPP) ආශ්‍රිත හිඟ ගෙවීම්වලට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. සම්පත් මෙසේ උපාය මාර්ගිකව වෙන් කිරීම මගින් අත්‍යවශ්‍ය සේවාවන්හි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික වූ අතර ලංවිම හි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කරන ලදී.

නිගමනය වශයෙන්, අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා වූ ක්‍රියාකාරී ප්‍රවේශයකින් සමන්විත ලංවිම ශක්තිමත් මූල්‍ය අවදානම් කළමනාකරණ රාමුව විසින් මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහ මෙහෙයුම් අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා ඇති කැපවීම පෙන්නුම් කරයි. නිශ්චිත අවදානම් නිරාවරණයන් සඳහා සකස් කරන ලද ක්‍රමෝපායික අවම කිරීමේ උපාය මාර්ග භාවිතා කිරීමෙන්, ලංවිම විසින් සංකීර්ණ මූල්‍ය භූමි දර්ශනයක් ප්‍රඥාගෝචර සහ නම්‍යශීලී ලෙස හසුරුවන ලද අතර, එමගින් එහි මූල්‍ය අඛණ්ඩතාව ආරක්ෂා කර පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් කරන ලදී.

තාක්ෂණික අවදානම් කළමනාකරණය

අවදානම් හඳුනා ගැනීම

විදුලිය සම්බන්ධ අවදානම් සහ එහි ක්‍රියාකාරකම්වල ස්වභාවය අනුව, අවදානම් අවම කිරීමේ ක්‍රියාපටිපාටි ලංවිම හි මෙහෙයුම්වල කොටසකි. විශ්වසනීය සහ මිත්‍රශීලී විදුලි සැපයුම්කරුවෙකු ලෙස ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගුණාත්මක වූද, ආයතනයේ නිසි ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි වූද අවදානම් හඳුනාගෙන ඇත.

අවදානම් හඳුනාගැනීම ඒවා සිදුවීමේ සම්භාවිතාව සහ එහි (ධනාත්මක හෝ ඍණාත්මක) ප්‍රතිවිපාකවල ප්‍රමාණය අනුව වර්ගීකරණය කර සුදුසු පියවර ගැනීම ඉතා වැදගත් වේ. හඳුනාගත් සහ වර්ගීකරණය කරන ලද ඉහළ ප්‍රතිවිපාක සහිත ඇතැම් අවදානම් සැලසුම්කරණ ක්‍රියාවලි, ආයතනික සැලැස්ම, දිගුකාලීන විදුලි ජනන ව්‍යාප්ති සැලැස්ම, දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම සහ අයවැය තුළ ආමන්ත්‍රණය කර ඇත. අනෙකුත් කරුණු වගකිවයුතු අංශ විසින් හදිසි ක්‍රියාපටිපාටි තුළ සාකච්ඡා කෙරේ.

මූල්‍ය අවදානම හා තාක්ෂණික කාර්ය සාධනය කෙරෙහි එහි බලපෑම

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30(2) (ආ) වගන්තිය යටතේ, අනුමත ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී දරන ලද සියලුම සාධාරණ පිරිවැය අය කර ගැනීමට ලංවිම ට අවසර ඇත. එම වගන්තිය මගින් ලංවිම වෙත මූල්‍යමය වශයෙන් ශක්‍යතාවයක් ඇති ආකාරයෙන් එහි අනුමත ප්‍රධාන ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බව සහතික කෙරේ. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ V වන කොටස යටතේ, එහි පිරිවැය අය කර ගැනීම සඳහා ගාස්තු සහ අය කිරීම් නියම කිරීමේ බලය ලංවිම සතුව පැවතිණි. කෙසේ වෙතත්, එම බලතල ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ අවලංගු කර නියාමනායතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට (PUCSL) ලබා දී ඇත. මුළු රටටම 'ඒකාකාර ජාතික අයකුමයක්' (UNT) පැවතිය යුතුය යන්න රජයේ ප්‍රතිපත්තිය වන බැවින් තනි බලපත්‍රලාභියෙකුට සිදුකළ නොහැකි කටයුත්තක් වන ඒකීය ජාතික ගාස්තුවක් පවතින කාලවලදී සියලුම පාරිභෝගිකයන්ට අදාළවන පරිදි අවසාන පාරිභෝගික ගාස්තු කාලසටහන සැකසීමේ කාර්යය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි වගකීම බවට පත් කර ඇත.

2014 දී විදුලි ගාස්තු අඩු කිරීමෙන් පසු 2022 අගෝස්තු දක්වා ගාස්තු ගැලපීම් සිදු නොවීය. වසර හතක කාලයක් තුළ පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් ලංවිම මත මූල්‍ය පීඩනයක් ගොනු විය. 2023 දී, "විදුලි කර්මාන්තය සඳහා වන සාමාන්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශය" සංශෝධනය කරන ලද අතර, පාරිභෝගික විදුලි ගාස්තු අවම වශයෙන් මාස හයකට වරක් විදුලියේ පිරිවැයට අනුකූලව සංශෝධනය කළ යුතු බව නියම කරන ලදී. මෙම සංශෝධනය මගින් පෙනී යන අනාගතයේදී ලංවිම හි අහිතකර මූල්‍ය තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, පුනර්ජනනීය බලශක්තිය සඳහා වන දැඩි ඉලක්ක සහ ස්වභාවික වායු (NG) පාදක කරගත් විදුලි ජනනය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බැවින්, විදුලි ජනනයට අදාළ සමස්ත පිරිවැය අඩු වනු ඇතැයි ලංවිම අපේක්ෂා කරයි.

ප්‍රමාණවත් නොවන ජනන ධාරිතාවය පිළිබ!ද අවදානම

ලංවිම දිගුකාලීන විදුලි ජනන ව්‍යාප්ති සැලසුම්වල (දිගුකාලීන අවශ්‍යතා සහ මධ්‍යකාලීන තාවකාලික අවශ්‍යතා යන දෙකම සඳහා) හඳුනාගත් විදුලි ධාරිතා සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කර නොමැති අතර, එමගින් ලංවිම ට අපේක්ෂිත මට්ටමට වඩා අඩු සංචිත ධාරිතා ආන්තිකයන් සමඟ මෙහෙයුම් කටයුතු කිරීමට සිදු වී ඇත. සැලසුම් කළ ජනන එකතු කිරීම් කාලානුරූපව ඉදි කිරීමට නොහැකි වීම හේතුකොට විෂම චක්‍රයක් නිර්මාණය වේ. අඩු සංචිත ආන්තික හේතුවෙන් පවතින විදුලි බලාගාර නිවාරණ නඩත්තු හෝ වෙනත් සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා නියමිත කාලසටහනට අනුව ක්‍රියාවිරහිත කිරීම වැළකේ. එය යන්ත්‍රවල විශ්වසනීයතත්වයට බලපාන අතර ඉල්ලුම සපුරාලීම සඳහා පවතින ධාරිතාවය තවදුරටත් අවම කරයි. සංචිත ධාරිතාවය නොමැති වීම බර පැටවීම් සීමා කිරීමට (load shedding) හේතු වන අතර අයහපත්ම තත්ත්වයන්හිදී පද්ධති අසාර්ථක වීමට හේතු වේ. තවද, පද්ධතියේ ප්‍රමාණවත් නොවන සංචිත ජනන ධාරිතාව හේතුවෙන් දිගු වියළි කාලවලදී සහ/හෝ විශාල ජනන ඒකකයක ක්‍රියාවිරහිත වීම සඳහා විකල්ප ලෙස කෙටි කාලීන අතිරේක බලශක්තිය මිලදී ගැනීමට ලංවිම ට සිදු වේ.

ජාල ව්‍යාප්ති අවදානම - ජාල ව්‍යාප්ති ප්‍රමාදයන්

අනාගත විදුලි බලාගාරවලින් විදුලිය ගෙන යාම සහ වැඩි වන බලශක්ති ඉල්ලුම වඩාත් විශ්වසනීය ආකාරයෙන් සැපයීම සඳහා, අධි, මධ්‍යම සහ අඩු වෝල්ටීයතා සඳහා ජාල ව්‍යාප්ති සැලසුම් කර ඇත. මීට නව සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් පරිපථ ඉදිකිරීම, ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම/නව ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම, ජාල ගුණාත්මකතා වැඩිදියුණු කිරීම් ආදිය ඇතුළත් වේ. විදුලි බලාගාරවලින් විදුලිය සම්ප්‍රේශණය කිරීම සඳහා නව සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සමඟ නිසි පරිදි කාල නියමයන්ට අනුව සිදු කළ යුතු අතර, මුළින් සඳහන් කරන ලද දෑ ප්‍රමාද වීම පසු සඳහන් දෑ වලින් විදුලිය සම්ප්‍රේශණය කිරීම ප්‍රමාද වීමට හේතු වේ. තවද, වසර 20 ක් හෝ ඊට වැඩි කාලයක් ක්‍රියාත්මකව ඇති සංයුක්ත වායු පරිවරණය කළ ග්‍රිඩ් උපපොළ ඇතුළු සමහර ස්විච්ගියර්වල විශ්වසනීයත්වය විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. ජල සැපයුම, බහිජ තෙල් වැනි මූලික උපයෝගිතා සේවා සහ අපනයන සැකසුම් කලාප වැනි කර්මාන්ත සඳහා සේවය සපයන එවැනි උපකේන්ද්‍රවල විශ්වසනීයත්වය, එවැනි ප්‍රධාන සේවා සහ කර්මාන්ත සඳහා අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම පිණිස වෙනත් විදුලි සැපයුම් විකල්ප තිබේදැයි තහවුරු කර ගැනීම සඳහා නව දෘෂ්ටි කෝණයකින් සලකා බැලිය යුතුය. තවදුරටත්, එවන් මාරු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් ලබාගනිමින් ජාල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා මාරු කළ යුතුව පවත්නා කල් ඉකුත් වෙමින් පවත්නා ජාල උපකරණ පවතී. ජනන සහ සම්ප්‍රේෂණ යන දෙවර්ග යේම ජාල තුළ අතිරික්තතාවයක් නොපවත්නා තත්ත්වයක එවන් කටයුතු සිදු කිරීම සඳහා අරමුදල් ලබාගැනීම යන අවශ්‍යය විදුලිය ඇණහිටීම් ලබාදීම බරපතල අභියෝගයකි. යන්ත්‍ර ක්‍රියාත්මකව නොපවත්නා අවස්ථාවන්හි සිදුවන ප්‍රමාදයන් සිදුවීමෙන් හෝ ආපදා තත්ත්වයක් ඉස්මතු කිරීමකින් තොරව කල් තබා නිරාකරණ ක්‍රියාමාර්ග ආරම්භ කළ හැකිවනු පිණිස කල්තබා දෝෂ සහගත තත්ත්වයන් පුරෝකථනය කිරීමේ හැකියාව ලබාදෙන වත්කම් කළමනාකරණ මූලධර්ම යොදාගැනීම මගින් ජාල උපකරණ ආශ්‍රිත අවදානම් යම්තාක් දුරට අවම කෙරේ.

තාක්ෂණික අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

ගෝලීය පාරිසරික බැඳීම් සාක්ෂාත් කරගැනීමේ අභියෝගය

"විදුලි කර්මාන්තය සඳහා වන සාමාන්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශය" මගින් ස්ථිර ධාරිතාවයේ ඕනෑම නව එකතු කිරීමක් පාරිසරිකව තිරසර බලශක්ති ප්‍රභවයන්ගෙන් විය යුතු බවට නියම කරන අතර, විශේෂයෙන් එතුළ නැවත-වායුකරණය කළ ද්‍රවීකෘත ස්වභාවික වායු (R-LNG) භාවිතය අවධාරණය කරයි. නැවත-වායුකරණය කළ ද්‍රවීකෘත ස්වභාවික වායු ශ්‍රී ලංකාව සඳහා ශක්‍ය විසඳුමක් ලෙස හඳුනාගෙන තිබුණද, පාවෙන ගබඩා ප්‍රති වායුකරණ ඒකක (FSRU) හරහා තරඟකාරී මිල ගණන් යටතේ රටට ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම පහසු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතියක් නොපවතී. පිරිවැය-ඵලදායීතාව ලබා ගැනීමට සහ ශ්‍රී ලංකාවේ ජාතිකව තීරණය කරන ලද දායකත්වයන්ට අනුකූල වීමට නම්, ස්වභාවික වායු සඳහා යටිතල පහසුකම් සහ සැපයුම් දාමය ස්ථාපිත කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී.

මානව සම්පත් අවදානම - කුසලතා පූර්ණ, අභිප්‍රේරිත කාර්ය බලකායක් පවත්වාගෙන යාමේ අභියෝග

නිපුණ ශ්‍රම බලකායක් යනු අස්පෘශ්‍ය වත්කමක් වන අතර එය ජාල උපකරණවල ඵලදායී නඩත්තුව සඳහා අත්‍යවශ්‍ය වේ. ජාතියට ගුණාත්මක සේවාවක් සැපයීම අපේක්ෂා කරන ලංවිම හි ප්‍රධාන ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සේවක අභිප්‍රේරණය වැදගත් වේ. එමෙන්ම, කම්කරු ආරවුල් වළක්වා ගැනීමේදී සේවක තෘප්තිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ලංවිම විසින් අඛණ්ඩ පුහුණු වැඩසටහන් හරහා නිපුණ ශ්‍රම බලකායක් පවත්වාගෙන යනු ලබයි. මෙම විශේෂඥතාව පවත්වාගෙන යනු පිණිස ධාරිතා සංවර්ධනය සහ සේවක අභිප්‍රේරණය සඳහා පුළුල් වැඩසටහන් පැවැත්වීමට උත්සාහ දරා ඇත. රටේ පවතින ප්‍රතිපත්ති සහ අහිතකර ආර්ථික තත්ත්වය නිපුණ ශ්‍රම බලකායක් රඳවා ගැනීම අභියෝගාත්මක කාර්යයක් බවට පත්කර ඇත. 2023 වසරේ පමණක් සේවකයින් 170 කට වැඩි සංඛ්‍යාවක් ආයතනයෙන් ඉල්ලා අස්වී ඇති අතර එමගින් ගැටලුවේ බරපතල බව පෙන්නුම් කරනු ලබයි.

ණය දීමේ නියෝජිතායතන වෙතින් එල්ලවන පීඩනය හේතුකොට ප්‍රමුඛතා ක්ෂේත්‍ර වෙතින් අරමුදල් ලබාගැනීමේ අවදානම

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 38 වන වගන්තියට අනුව, මණ්ඩලයේ සේවා සංවර්ධනය කිරීමේ පිරිවැයෙන් සාධාරණ ප්‍රමාණයක් පියවා ගැනීමට මණ්ඩලයේ ආදායම ප්‍රමාණවත් බව සහතික කිරීමේ වගකීම මණ්ඩලය වෙත පවරා තිබිණි. කෙසේ වෙතත්, එවැනි මූල්‍ය සුරක්ෂිත කිරීමකට ලංවිම ට පහසුකම් සැලසූ යාන්ත්‍රණය, එනම් ගාස්තු සහ අය කිරීම් නියම කිරීමේ බලතල, 2009 දී ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ලංවිම වෙතින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත මාරු කරන ලදී. ජාත්‍යන්තර අරමුදල් සුරක්ෂිත කළ නොහැකි ඒවා විශේෂ කොටගෙන තමන්ගේම අරමුදල් නොමැති වීම විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම සම්ප්‍රේෂණ/බෙදාහැරීම් ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා ද බලපාන්නාවූ පොදු ගැටලුවකි. විදුලි අංශයේ ආයෝජන තීරණ විදුලිය සඳහා ඇති ඉල්ලුම, වෙනස්වන රජයේ ප්‍රතිපත්ති, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා, සැපයුම් දාම ගැටලු, ව්‍යාපාරික අන්තර් සම්බන්ධතා මෙන්ම දේශගුණික ප්‍රතිපත්තිවල පීඩනය වැනි සංකීර්ණ සාධක කට්ටලයක් මගින් හැඩගස්වනු ලැබේ. ෆොසිල ඉන්ධන සහ රජයට අයත් උපයෝගිතා ව්‍යුහයන් වැනි කරුණු පිළිබඳ වෙනස්වන ගෝලීය දෘෂ්ටිකෝණ පිළිබිඹු කරමින් මූල්‍ය ආයතන ද ඔවුන්ගේ අරමුදල් ප්‍රතිපත්තිවලට අනුකූල වේ. ණය ගිවිසුම් හරහා කොන්දේසි අවධාරණය කිරීම මගින් ලංවිම ට සීමිත ණය ගැනීමේ අවකාශය පවා ප්‍රමුඛතා ක්ෂේත්‍ර වෙනුවට වැවැනි ණය දෙන ආයතන ණය දීමට කැමැත්තක් දක්වන්නාවූ ක්ෂේත්‍ර සඳහා යොදා ගැනීමට බල කෙරී ඇත.

පොදු අවධානය පිළිබඳ අවදානම සහ වෙනස්වන ප්‍රතිපත්ති පිළිබඳ අවදානම

රටේ මුළු බලශක්ති පරිභෝජනයෙන් විදුලියට අදාළ බලශක්ති ප්‍රතිශතය 14% ක් පමණි. කෙසේ වෙතත්, ඇතැම් විට ඉහළ වාණිජමය උනන්දුව හේතුවෙන්, ඉතිරි 86% ට වඩා විදුලි අංශය මාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ පාරිසරික බලපෑම් කණ්ඩායම්වල වැඩි අවධානයක් දිනා ගනී. විදුලි පද්ධතිය යනු අවබෝධ කර ගැනීමට ගැඹුරු අත්දැකීම් සහ නිරාවරණයක් අවශ්‍ය කරන ඉතා විශේෂ ක්ෂේත්‍රයක් වන අතර, එය බොහෝ විට සාමාන්‍ය මහජනතාවගේ අවබෝධතා මට්ටමින් ඔබ්බට විහිදෙන්නක් වේ. එමනිසා, උපයෝගිතා සැලසුම් සහ තීරණ පිළිබඳව මහජනතාව සහ මාධ්‍ය දැනුවත් කිරීම සහ ඒත්තු ගැන්වීම අභියෝගාත්මක කරුණක් වේ. දිගු කාලීන පෙර සූදානම් කාලය විදුලි ව්‍යාපෘතිවල ස්වභාවික ලක්ෂණයකි. එබැවින්, විදුලියට සම්බන්ධ ප්‍රතිපත්ති තීරණවල අසංගතතා සහ අවිනිශ්චිතතා හේතුකොට රටට සැලකිය යුතු ආර්ථික පාඩු ඇති විය හැකි අතර, විශේෂයෙන් හදිසි ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් පරිණත විදුලි ව්‍යාපෘති අවලංගු වීමේ තත්ත්වයනට මුහුණ දෙන අවස්ථාවන්හි එසේ සිදු වේ. මෙමගින් උපයෝගිතා සැලසුම්කරණය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු අභියෝග ඉස්මතු කරන අතර, උපායමාර්ගික සහ අඛණ්ඩ ප්‍රතිපත්ති රාමුවල අවශ්‍යතාව අවධාරණය කරනු ලබයි.

සයිබර් ආරක්ෂාව පිළිබ!ද අවදානම

ලංවිම ක්‍රමයෙන් තොරතුරු තාක්ෂණය කෙරෙහි නැඹුරු වී ඇත. සියලුම ශාඛා පාහේ ජාලගත වී අන්තර් සම්බන්ධ වී ඇත. මෙමගින් ඔවුන් බාහිර සයිබර් ප්‍රහාරයනට ලක්වීමේ ඉහළ අවදානම් තත්ත්වයක් ඇති කෙරෙනුයේ එක් ස්ථානයකට ඇතුළු වීමක් සිදු වුවහොත් එය ජාලය හරහා පැතිරිය හැකි බැවිනි.

ලංවිම වැනි විදුලි උපයෝගිතා ආයතන විසින් පොදුවේ භාවිතා කරන මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් සන්නිවේදනය සහ පාලන කටයුතු සඳහා පුළුල් ලෙස තොරතුරු තාක්ෂණය භාවිතා කර ඇත. කෙසේ වෙතත්, මෙම මෙහෙයුම් සහ පද්ධති බොහෝ විට හුදෙකලා ඒකක ලෙස ක්‍රියාත්මක වීමට නැඹුරුතාවයක් දක්වන අතර කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධති මෙන් නොව බාහිර සම්බන්ධතා අවම වේ. තවද, මෙහෙයුම් තාක්ෂණ පද්ධති බාහිරට සම්බන්ධවන විටදී ඒවාහි ප්‍රවේශ ද්වාර වශයෙන් අධික මිල සහිත පාර්ශ්ව ආරක්ෂක උපකරණ පවත්නා තත්ත්වයක් දක්නට ලැබේ. එබැවින්, ඒවා තුළට අනවසරයෙන් ඇතුළු වීම සහ පිටතින් ප්‍රහාරයනට ලක්වීම විෂයයෙහි පවත්නා අවදානම තරමක් අඩු මට්ටමක පවතී. කෙසේ වුවද, නිරතුරු සයිබර් ප්‍රහාර එල්ල වීමේ අවදානමක් පවතී. මෙය ප්‍රහාරකයන් විසින් ආරක්ෂක පද්ධතිවල පවත්නා දෝෂ තත්ත්වයන් ප්‍රයෝජනයට ගැනීම හේතුකොට සිදුවිය හැකි අතර, මනුෂ්‍ය දෝෂ සහ අත් වැරදි පැවතිය හැක. එබැවින්, ආරක්ෂාව අවදානමට ලක්වීමේ හැකියාව අවම කරනු පිණිස නිසි පරිදි සකසන ලද හා කළමනාකරණය කරන ලද උපකරණ මෙන්ම වඩාත් ශක්තිමත් තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය

අපගේ තිරසර ගමනේදී, අපගේ මෙහෙයුම් ආශ්‍රිත සියලු අංශවල පාරිසරික, ආර්ථික සහ සමාජීය තිරසර සංවර්ධන කුලුනු තුලනය කිරීමේ වැදගත්කම හඳුනාගනිමු. 2023 වසරේදී අපි පාරිසරික සමනය, විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය, පිරිවැය-ඵලදායී මෙහෙයුම්, අනාගත සැලසුම් සහ ඉලක්ක, නවෝත්පාදන සහ තාක්ෂණය සහ පාරිභෝගික සේවා සහ තෘප්තිය වැනි ප්‍රධාන ක්ෂේත්‍රවලට අවධානය යොමු කිරීමෙන් මෙම කුලුනු ප්‍රමුඛතාගත කර ඇත. මෙම කුලුනු අනාගත පරපුර සඳහා තිරසර අනාගතයක් ප්‍රවර්ධනය කිරීමේ අපගේ කැපවීම මෙහෙයවන මාර්ගෝපදේශ මූලධර්ම ලෙස ක්‍රියාත්මක වේ. උපායමාර්ගික මූලපිරීම් සහ නොසැලෙන කැපවීම තුළින් අපගේ ලෝකය, ප්‍රජාවන් සහ පාර්ශ්වකරුවන් ආශ්‍රිත යහපැවැත්ම සහතික කරමින් සමස්ත තිරසරබව ළඟා කර ගැනීමට අපේක්ෂා කරමු.



පාරිසරික තිරසරබව

හරිත අනාගතයක් කරා පියනගන අතර, පාරිසරික තිරසර පැවැත්ම සඳහා වූ අපගේ කැපවීම ස්ථිරව පවතී. කාබන් විමෝචනය අඩු කිරීමට සහ අපගේ පාරිසරික පාදසටහන අවම කිරීමට දරන අඛණ්ඩ උත්සාහයන්හිදී, අපගේ ගල්අඟුරු බලාගාර යටිතල පහසුකම් තුළ නවෝත්පාදන පියවර මාලාවක් ක්‍රියාත්මක කර ඇත. තාක්ෂණය, මෙහෙයුම් වැඩිදියුණු කිරීම් සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ උපායමාර්ගික මිශ්‍රණයක් හරහා විශ්වසනීය විදුලි සැපයුමක් සහතික කරමින් පාරිසරික බලපෑම අවම කිරීමේ සැලකිය යුතු දියුණුවක් පෙන්වීමට හැකිවීම පිළිබඳ ආඩම්බර වන්නෙමු.

දුහුවිලි සමනය සහ නිරීක්ෂණය

2023 දී, ලක්විජය විදුලි බලාගාරයෙහි ගල්අඟුරු අංගනයේ බටහිර මායිම දිගේ මීටර් 460 ක සහ දකුණු හා නැගෙනහිර මායිම් ආවරණය කරමින් මීටර් 1,183 ක සුළං බාධකයක් පවත්වා ගැනීමට සමත් විය. මෙම උපායමාර්ගික යටිතල පහසුකම් ආයෝජනය හේතුකොට අවට ප්‍රජාවන්ට දූවිලි විසිරීම ඵලදායී ලෙස අවම කරමින් ප්‍රශස්ත තත්ත්වයන් පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. අඛණ්ඩව තෙත් කිරීම, සමතලා කිරීම, සංහනන කිරීම (compaction) සහ ශාක ආවරණය ඇතුළු සූක්ෂ්ම භාවිතයන් හරහා, අළු අංගනය තුළ දූවිලි ජනනය සාර්ථකව පාලනය කරන ලදී. තවද, පියාසර අළු තරඟකාරී අලෙවිය, විවිධ නිෂ්පාදනවල යටි අළු භාවිතය සහ ගඩොල් නිෂ්පාදනයේදී බැහැර කරන ලද අළු නැවත භාවිතා කිරීම සඳහා නවෝත්පාදන ප්‍රවේශයන් දක්වා අපගේ තිරසර භාවිතයන් සඳහා වූ කැපවීම විහිදිණි. මෙම උත්සාහයන් තුළ පාරිසරික ආරක්ෂකත්වය සහ ප්‍රජා යහපැවැත්ම සඳහා වූ අපගේ කැපවීම අවධාරණය කෙරේ. S1 රූපය මඟින් ගල්අඟුරු අංගනයේ මීදුම් පිඹින යන්ත්‍ර ක්‍රියාකාරිත්වය සහ S2 රූපය මඟින් සිමෙන්ති නිෂ්පාදනය සඳහා දූවිලි (අළු)ප්‍රවාහනය දක්වා ඇත.




රූපය S1: ගල්අඟුරු අංගනයේ මීදුම් පිඹින යන්ත්‍ර ක්‍රියාකාරිත්වය.



රූපය S2: සිමෙන්ති නිෂ්පාදනය සඳහා දූවිලි (අළු) ප්‍රවාහනය.

විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය (ඉතිරි කොටස)

පසුගිය වසර හය පුරා ලක්විජය විදුලි බලාගාරයේ පියසර අලු කළමනාකරණ වැඩසටහනේ ප්‍රතිඵල රූපය S3 තුළ නිරූපණය කොට ඇත.



රූපය S3: ලක්විජය විදුලි බලාගාරයේ පාවෙන අලු කළමනාකරණ වැඩසටහනේ ප්‍රතිඵල.

ජල සත්කාරය හා නිරීක්ෂණය

2023 දී, ලක්විජය විදුලි බලාගාරයේ පසු පිරිපහදුව සහ අපජල ධාරා නැවත භාවිතා කිරීමේ උපායමාර්ග අවධාරණය කරමින් නවීන ජල පිරිපහදුව සහ නිරීක්ෂණ භාවිතයන් සඳහා වූ කැපවීම නොකඩවා පවත්වාගෙන යන ලදි. අපගේ කාර්මික අපජල පිරිපහදු පද්ධති, මලාපවහන පිරිපහදු පද්ධති සහ ගල්අඟුරු සහ අළු ජල පිරිපහදු පද්ධති හරහා, දූවිලි මර්දන කටයුතු සඳහා සහාය වීමට නැවත භාවිතා කළ හැකි පිරිපහදු කළ ජල ප්‍රතිදානය ඵලදායී ලෙස ජනනය කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ පාරිසරික නිරීක්ෂණ ඒකකය (EMU) මගින් පහසුකම් සැලසූ ජලයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය වසර පුරා ප්‍රමුඛ කටයුත්තක් විය. ඊට අමතරව, ජල සම්පත් මණ්ඩලය (WRB) සමඟ සහයෝගීතාවයෙන් ලක්විජය විදුලි බලාගාරය විසින් කාර්තුමය වශයෙන් සිදු කරන ලද අපගේ භූගත ජල නිරීක්ෂණ වැඩසටහන මගින් බලාගාර පරිශ්‍රය තුළ සහ ඒ අවට මෙම සාරවත් සම්පත තිරසර ලෙස භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම සහතික කරන ලදී. 2023 දී නිකුත් කරන ලද 2022 භූගත ජල වාර්තාව මගින් සැනසිලිදායක සොයාගැනීම් ඉදිරිපත් වූ අතර, විශේෂයෙන්ම බැර ලෝහ සහ කරදිය ආක්‍රමණය සම්බන්ධයෙන් වූ භූගත ජල ගුණාත්මකභාවය කෙරෙහි ලක්විජය විදුලි බලාගාරයේ මෙහෙයුම්වලින් අහිතකර බලපෑමක් නොමැති බව පෙන්නුම් කරන ලදී. මෙම ධනාත්මක ප්‍රවණතාව තුළ 2019 දී ක්‍රියාත්මක කරන ලද පොම්ප කිරීමේ රටාවන්හි සඵලතාව අවධාරණය කෙරේ.

සාගර පරිසර නිරීක්ෂණය

2023 දී, ලක්විජය විදුලි බලාගාරය විසින් කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සහ සාමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) වැනි කීර්තිමත් ශ්‍රී ලාංකික ආයතන සමඟ සහයෝගීතාවයෙන් සිය දැඩි පාරිසරික නිරීක්ෂණ උත්සාහයන් නොකඩවා පවත්වාගෙන යන ලදි. පුළුල් අධ්‍යයන සහ පර්යේෂණ හරහා මෙම ආයතන සමුද්‍රීය පරිසරය කෙරෙහි බලාගාරයේ බලපෑම ඇගයීමට ලක් කළ අතර, ජීවී සහ අජීවී යන දෙයාකාර සමුද්‍රීය සංරචක ආරක්ෂා කිරීම සහතික කරන ලදී. විශේෂයෙන්ම, බලාගාර පිටවුම අසල මත්ස්‍ය විවිධත්වය සාර්ථකව පවතින බව සොයාගැනීම් මඟින් පෙන්නුම් කෙරුණු අතර, එය සමුද්‍රීය සම්පත් වර්ධනයට ධනාත්මකව දායක විය. තවද, සිසිලන ජලය බැහැර කිරීම නිසා කොරල් පර කෙරෙහි සැලකිය යුතු අහිතකර බලපෑමක් නොමැති බව තක්සේරු කිරීම් තුළ හෙළි විය. 2023 සඳහා සාමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිසිලන ජලය බැහැර කිරීමේ බලපත්‍රය නිකුත් කිරීම තුළ පාරිසරික රෙගුලාසි සහ තිරසර භාවිතයන් සඳහා බලාගාරයේ අනුකූලතාව අවධාරණය කෙරේ.

පරිමණ්ඩිත වායු ගුණාත්මකභාව සහ අංගාර විමෝචන නිරීක්ෂණය

2023 දී ලක්විජය විදුලි බලාගාරය විසින් වායු ගුණාත්මකභාවය සහ අංගාර විමෝචන පිළිබඳ සවිස්තරාත්මක නිරීක්ෂණයක් සිදු කරන ලදී. කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදු කරන ලද කාර්තුමය සහ කාලීන නිරීක්ෂණ මගින් වසර පුරා සියලුම වායු ගුණාත්මක පරාමිතීන් අවසර ලත් මට්ටම්වලට වඩා පහළ මට්ටමක පැවතුණු බව අඛණ්ඩව පෙන්නුම් කරන ලදී. ඊට අමතරව, ජංගම ධූම වායු විශ්ලේෂක සමඟින් සතිපතා අභ්‍යන්තර පරීක්ෂා සහ අඛණ්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධති (CEMS) හරහා අඛණ්ඩ නිරීක්ෂණයන් සිදුකරන ලද අතර, මෑතකදී නිස්සාරණ වර්ගයේ අඛණ්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධති අංග ලක්ෂණ දුරස්ථව නිරීක්ෂණය කිරීම සඳහා ඒකකය 01 උත්ශ්‍රේණිගත කරන ලදි. තවද, 2018 වසරේදී ජය ශ්‍රී මහා බෝධිය අසල ආරම්භ කරන ලදුව මේ දක්වාද ක්‍රියාත්මකවන පරිමණ්ඩිත වායු ගුණාත්මකභාව නිරීක්ෂණ වැඩසටහන හරහා වාර්තා දොළහක් නිකුත් කෙරුණු අතර, එමගින් සියලු පරාමිතීන් හරහා අවසර ලබාදිය හැකි මට්ටම්වලට අනුගතව කටයුතු කෙරෙන බැව් සහතික කරන ලදි. ලක්විජය විදුලි බලාගාරයෙහි පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයන වාර්තාවේ (EIAR) 6.3.2.2 කොන්දේසියට අනුකූලව ස්ථිර වායු ගුණාත්මකභාව නිරීක්ෂණ මධ්‍යස්ථාන තුනක් පිහිටුවන



රූපය S4: පරිමණ්ඩිත වායු ගුණාත්මකතා නිරීක්ෂණ මධ්‍යස්ථානය

ලදී. වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් පත් කරන ලද වායු ගුණාත්මකභාවය පිළිබඳ විශේෂඥ කමිටුව මගින් මෙහෙයවනු ලබන මෙම මධ්‍යස්ථාන මගින් විවෘත මාර්ග විශේෂිත බාහිර වායු පද්ධති (DOAS) තාක්ෂණය භාවිතා කෙරේ. මෙම මූලපිරීම සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 476 ක් විය.

හඬ සහ කම්පන නිරීක්ෂණය

2023 දී මෙහෙයුම් අතරතුර අවසර ලත් සීමාවන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා ලක්විජය විදුලි බලාගාරය විසින් ශබ්ද සහ කම්පන මට්ටම් නිරීක්ෂණය කරන ලදී. වසර පුරා මට්ටම් දෙකම අවසර ලත් සීමාවන් තුළ පැවතුණු බව ප්‍රතිඵල මගින් තහවුරු විය. තවද, 2023-2024 සඳහා වයඹ පළාත් පරිසර අධිකාරියෙන් (PEA-NWP) පාරිසරික බලපත්‍ර ලබාගන්නා ලද අතර, එමගින් ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශ තුළ තිරසර පැවැත්ම සඳහා ලක්විජය විදුලි බලාගාරයෙහි කැපවීම හෙළි කෙරිණි. දැනට පවතින මූලපිරීම් සහ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවය හරහා විමෝචන, දූෂණය අඩු කිරීමේ සහ පෙව් විවිධත්වය සංරක්ෂණය කිරීමේ උත්සාහයන් නොකඩවා පවත්වාගනු ලබයි.

මුද්‍රිත පරිපථ පුවරු දෝෂ සහිත උපකරණ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය

එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) සමඟ සහයෝගීත්වයෙන් සහ ගෝලීය පරිසර පහසුකම් (GEF) ආයතනය විසින් අරමුදල් සපයන ලද ශ්‍රී ලංකාවේ PCB (පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල්) අපද්‍රව්‍ය සහ PCB අඩංගු හා දූෂිත උපකරණ පරිසර හිතකාමී හඬ කළමනාකරණය සහ බැහැර කිරීම සඳහා වූ ප්‍රධාන ව්‍යාපෘතියක් 2023 දෙසැම්බර් මාසයේදී ලංවිම විසින් ආරම්භ කරන ලදි. ස්ථායී කාබනික දූෂක (POPs) පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය සඳහා ශ්‍රී ලංකාවේ කැපවීමට අනුකූලව, පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් ආශ්‍රිත ආරක්ෂිත සහ පරිසර හිතකාමී කළමනාකරණය සහතික කිරීමේදී සැලකිය යුතු සන්ධිස්ථාන සපුරා ගැනීමට ව්‍යාපෘතියට හැකි විය.

ව්‍යාපෘතියේ ප්‍රධාන අදියරයන්:

තොග කළමනාකරණය: එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයෙහි සහාය සහිතව, පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් දූෂිත පරිනාමක සහ උපකරණ 31,000 ක පමණ තොග ලේඛනයක් ලංවිම විසින් මැනවින් සකස් කර පවත්වාගෙන යන ලදී. මෙයට පරිශීලක හිතකාමී මෘදුකාංග යෙදුමක් සංවර්ධනය කිරීම සහ පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් දූෂණය පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම සඳහා පිළිගත් රසායනාගාරයක් සමඟ සහයෝගීතාවය පවත්වාගෙන යාමද ඇතුළත් විය.

බැහැර කිරීම සහ ප්‍රතිස්ථාපනය: දෙවන අදියරේදී, දූෂිත උපකරණ ආරක්ෂිතව හසුරුවා ප්‍රතිස්ථාපනය කරන ලද අතර, පුහුණු කාර්ය මණ්ඩලය විසින් දූෂිත තෙල් අන්තර්මධ්‍ය තොග බහාලුම් (IBCs) වලට නිස්සාරණය කර නව තෙල් සමඟ උපකරණ නැවත පුරවන ලදී. අඩු සාන්ද්‍රණ පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් දූෂිත පරිනාමක නව තෙල් සමඟ නැවත පුරවන ලද අතර, අධික සාන්ද්‍රණයෙන් යුත් උපකරණ නම් කරන ලද සේවා සපයන්නෙකු හරහා බැහැර කරන ලදී.

බලපෑම සහ අනාගත සැලසුම්: ව්‍යාපෘතිය මගින් වැඩිදියුණු කරන ලද ආරක්ෂක පියවර, දියුණු රසායනාගාර උපකරණ අත්පත් කර ගැනීම සහ කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා ගොඩනැගීමේ පුහුණු වැඩසටහන් ඇතුළුව ලංවිම කෙරෙහි පරිවර්තනීය බලපෑම් ඇති කරන ලදි. ලංවිම හි පළමු පරිනාමක තෙල් පුනරුත්ථාපන පහසුකම ක්‍රියාත්මක කිරීම සාක්ෂාත් කර ගන්නා ලද අතර, එමගින් සැලකිය යුතු පිරිවැය ඉතිරි කිරීම් සිදු විය. ඉදිරිය විමසා බලන විටදී, පාරිසරික නායකත්වය සහ ආරක්ෂාව සඳහා වූ එහි කැපවීම පෙන්නුම් කරමින්, අනෙකුත් උපකරණ වර්ග ඇතුළත් කිරීම සඳහා තුරන් කිරීමේ උත්සාහයන් පුළුල් කිරීමට සහ පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් රහිත තත්ත්වයක් ළඟා කර ගැනීමට ලංවිම අපේක්ෂා කරයි.

ව්‍යාපෘති ප්‍රතිඵල ආශ්‍රිත සාරාංශය වගුව වගුව S1: ව්‍යාපෘති ප්‍රතිඵල සාරාංශය තුළ දක්වා ඇත.

වගුව S1: ව්‍යාපෘති අංශය සාරාංශය

අංශය	උපකරණ සංඛ්‍යාව	උපකරණ බර (මෙ.ටො.)	තෙල් බර (මෙ.ටො.)	නව තෙල් අවශ්‍යතාවය (මෙ.ටො.)
නැවත පිරවීම පිණිස පවත්නා මුද්‍රිත පරිපථ පුවරුව හානියට පත් තරාපැවි	147	426.4	107.1	135.2
බැහැර කිරීම පිණිස පවත්නා මුද්‍රිත පරිපථ පුවරුව හානියට පත් තරාපැවි	06	6.9	1.5	1.5
බැහැර කිරීම සඳහා පවත්නා (ශුද්ධ) මුද්‍රිත පරිපථ පුවරුව සහිත උපකරණ (සංශෝධිත)	33	16.9	7.7	-
එකතුව	186	450.2	116.4	137.2

ජලාශයන්හි ප්ලාස්ටික් දූෂණය වැළැක්වීම

ප්ලාස්ටික් බෝතල් සහ පොලිතීන් අඛණ්ඩව කාසල්රි ජලාශයේ අතු ගංගාවක් වන දික්ඔය වෙත ළඟා වන අතර එය ආසන්න නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ගැටළුකාරී තත්ව මතුකරයි. මෙම අපද්‍රව්‍ය ගලා ඒම හේතුවෙන් ජලාශයේ මතුපිට සැලකිය යුතු ප්ලාස්ටික් සුන්බුන් එකතුවීමක් සිදු වේ. ශ්‍රමදාන ක්‍රියාකාරකම් හරහා වාර්ෂික පිරිසිදු කිරීමේ උත්සාහයන් පැවතියදී වුව, මෙම දූෂණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සැලකිය යුතු අභියෝගයක්ව පවතී. පොලිතීන් අපද්‍රව්‍ය පැතිරීම අවම කිරීම සඳහා ගඟේ ප්‍රවේශ මාර්ගයේ උපායශීලීව පාවෙන බාධකයක් ස්ථාපනය කර ඇත. මෙම නවෝත්පාදන විසඳුම ප්ලාස්ටික් අපද්‍රව්‍ය රඳවා තබා ගැනීමට සහ ඉවත් කිරීමට උපකාරී වන අතර එමගින් කාසල්රි ජලාශයේ පරිසර පද්ධතියේ තිරසර බව වැඩි දියුණු කෙරේ.

ආර්ථික තිරසරබව

විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය

දැඩි මූල්‍ය නායකත්වය හරහා ආර්ථික තිරසර බව ස්ථාවරව පවත්වාගෙන යමින් වැඩි දියුණු කරන ලදී. උද්යෝගිමත් අයවැයකරණය, සරල කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ ක්‍රියාකාරී පිරිවැය පාලන පියවර ඇතුළු විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණ භාවිතයන් විසින්, විකසනය වන වෙළඳපොළ ගතිකයන් මධ්‍යයේ අපගේ මූල්‍ය සෞඛ්‍යය ආරක්ෂා කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කෙරිණි. වියදම් උනන්දුමත් ලෙස නිරීක්ෂණය කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම මගින්, අවදානම් අවම කිරීමට, ප්‍රත්‍යස්ථිතාව වැඩි දියුණු කිරීමට සහ දිගුකාලීන වර්ධනය සහ ස්ථාවරත්වය පිළිබඳ අපගේ ස්ථාවරය ශක්තිමත් කිරීමට අපට හැකි විය.

විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය (ඉතිරි කොටස)

පිරිවැය ඵලදායී මෙහෙයුම්

අපගේ වටිනාකම් දාමය පුරා ක්‍රියාවලීන් සරල කිරීමට, ඵලදායීතාව වැඩි දියුණු කිරීමට සහ අපතේ යාම් අවම කිරීමට අඛණ්ඩව අවස්ථා සොයන විටදී පිරිවැය-ඵලදායී මෙහෙයුම් සඳහා වූ අපගේ කැපවීම නොසැලී පැවතුණි. දියුණු මනු යටිතල පහසුකම් සහ සුහුරු ජාල තාක්ෂණයන් වැනි තාක්ෂණික නවෝත්පාදනයන් සඳහා ආයෝජනය කිරීම් මගින් අපට බලශක්ති බෙදාහැරීම ප්‍රශස්ත කරගනිමින්, හානි අවමකරගනිමින්, මෙහෙයුම් කාර්යක්ෂමතාවයද උපරිම කරගැනීමට හැකිවිය. තවද, සැපයුම්කරුවන් සහ පාර්ශවකරුවන් සමඟින් පවත්වාගෙන යන ලද ක්‍රමෝපායික හවුල්කාරිත්වයන් සහ ඒකාබද්ධ මූලාරම්භයන් හේතුකොට අන්තර් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසුණු අතර එමඟින් පිරිවැය අවම කරගනිමින් වෙළඳපල සමස්ත තරඟකාරිත්වය වැඩි වර්ධනය කෙරිණි.

අනාගත සැලසුම් සහ ඉලක්ක

තිරසර බව සඳහා වූ අප ගමනේදී අපි පුනර්ජනනීය බලශක්ති මිශ්‍රණය ප්‍රශස්ත කිරීම, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ විකාශනය වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා බෙදාහැරීමේ ජාල නවීකරණය කිරීම කෙරෙහි කැපවී සිටින්නෙමු. මෙයට පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා උපායමාර්ගික ආයෝජන, කාර්යක්ෂමතාව සහ පිරිවැය අඩු කිරීම සඳහා තාක්ෂණික නවෝත්පාදනයන් ප්‍රයෝජනයට ගැනීමද ඇතුළත් වේ. අපගේ මාර්ග සිතියමට විවිධ උත්පාදන මූලාශ්‍ර සුමටව ඒකාබද්ධ කිරීම සඳහා ශක්තිමත් සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධනය කිරීම හා ජාල ප්‍රත්‍යස්ථතාව ශක්තිමත් කිරීමද ඇතුළත් වේ. තවද, ජාල නම්‍යතාව වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ ප්‍රශස්ත භාර කළමනාකරණය සඳහා සුහුරු ජාල විසඳුම් යෙදවීම පිණිස මැදි වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා සංවර්ධන මූලපිරීම් සැලසුම් කරමින් සිටිමු. මෙම උත්සාහයන් තුළින්, විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සහ පාරිභෝගික අපේක්ෂාවන් ඉක්මවා යාමට අපේක්ෂා කරමු. තවද, ආයතනික පාලන මාර්ගෝපදේශයන්ට අනුකූලව, KPMG ආයතනය සමඟ සහයෝගීව 2024-2028 සඳහා විස්තීර්ණ ආයතනික සැලැස්මක් සකස් කර ඇත. මෙම සැලැස්ම මගින් තිරසර වර්ධනය සහ සේවා සැපයීමේ විශිෂ්ටත්වය සඳහා වූ අපගේ කැපවීම පිළිබිඹු කරමින් පැහැදිලි ඉලක්ක සහ උපායමාර්ග සනිටුහන් කරනු ලබයි.

පාරිසරික තිරසරබව

නවෝත්පාදනය සහ තාක්ෂණය

ලංවිම හි අපගේ තිරසර ගමනෙහිදී නවෝත්පාදන සහ තාක්ෂණය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. 2023 දී, දැනට පවත්නා ලංවිම බලශක්ති මනු අපගේ අභ්‍යන්තරව සංවර්ධිත CEB Head-End System (HES) සහ CEBAssist වේදිකාවට සුමටව ඒකාබද්ධ කරමින් සුහුරු මනුකරණ විසඳුමක් සංවර්ධනය කිරීමෙන් නවීකරණය දෙසට සැලකිය යුතු පියවර තැබුවෙමු. රත්මලානේ සිදු කරන ලද මූලික ව්‍යාපෘතියක් මගින් මනුකරණ කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාව වැඩිදියුණු කිරීමේදී මෙම විසඳුමේ සඵලතාව පෙන්නුම් කරන ලදී. තවද, අපගේ යල්පැන ගිය බිල්පත් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනිමින්, කැපවූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් යටතේ අභ්‍යන්තර සහ බාහිර සම්පත් මිශ්‍රණයක් භාවිතා කරමින් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර සංවර්ධන ක්‍රියා සැලැස්මක් සකස් කළෙමු. මෙම උපායමාර්ගික මූලපිරීම මගින් අපගේ බිල්පත් ක්‍රියාවලීන් සමකාලීන තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කරයි. තවද, නවෝත්පාදනය සඳහා වූ අපගේ කැපවීම 2023 දෙසැම්බර් මාසයේදී අපගේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් නිකුත් කරන ලද තීරණාත්මක තාක්ෂණික නිරීක්ෂණ වාර්තාවෙන් පිළිබිඹු වේ. මෙම වාර්තාව මගින් වහල මත සවිකරන සූර්ය පැනල සම්බන්ධතා උදෙසා අපගේ අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ ජාලයේ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ දක්වා ඇති අතර එය 2024 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම දුරදර්ශී පියවරයන් තුළ විකාශනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලීම සහ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර අපගේ ජාල යටිතල පහසුකම්වලට සුමටව ඒකාබද්ධ කිරීම සඳහා වූ අපගේ කැපවීමද අවධාරණය කෙරේ.

පාරිභෝගික සේවය සහ තෘප්තිය

ලංවිම තුළ සේවා ගුණාත්මකභාවය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වූ මූලපිරීම් මාලාවකින් මඟ පෙන්වනු ලබන පාරිභෝගික සේවය සහ තෘප්තිය සඳහා වූ අපගේ කැපවීම නොසැලී පවතී. 2023 මාර්තු මාසයේදී ලංවිම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා තරු ශ්‍රේණිගත කිරීමේ අත්පොතෙහි දෙවන සංස්කරණය ප්‍රකාශයට පත් කිරීම මගින් සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කෙරුණු අතර, සියලුම අංශ හරහා තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන් දියුණු කිරීමට මඟ පාදන ලදී. මෙම මූලපිරීම තුළ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම සහ නූතන අපේක්ෂාවන් සපුරාලීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලීන් ප්‍රශස්ත කිරීම සඳහා වූ කැපවීම පිළිබිඹු කෙරේ. 2023 දෙසැම්බර් 31 වන විට, බෙදාහැරීමේ අංශය හතර පුරා පාරිභෝගික සේවා මධ්‍යස්ථානවලින් 47% ඉක්මවූ ප්‍රමාණයක් තරු තුන මට්ටමට ළඟා වීමෙන් තරු ශ්‍රේණිගත කිරීමේ යෝජනා ක්‍රමයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. මෙම සාර්ථකත්වය මත පදනම්ව, මැදි වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා ජාලවල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම අවධාරණය කරන නිර්ණායක සමඟ සුදුසුකම් ලත් මධ්‍යස්ථානවල තරු හතර මට්ටමේ විගණනය ආරම්භ විය. මෙය සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ විකාශනය වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා වූ අපගේ කැපවීම තවදුරටත් පෙන්නුම් කරයි. තරු ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන්වල මෙම ප්‍රගතිය මගින් පාරිභෝගික තෘප්තිය සහ සේවා විශිෂ්ටත්වය සඳහා වූ අපගේ නොනවතින හඹා යෑම අවධාරණය කෙරේ.

තිරසර ජයග්‍රහණ සඳහා වූ දැනට පවතින කැපවීමේ කොටසක් ලෙස, අපි පාරිභෝගික සේවා ප්‍රමිතීන් ඉහළ නැංවීමට කැපවී සිටින්නෙමු. 2023 දී, කාර්යක්ෂමතාව, අනුකූලතාව සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා නිතර ඉල්ලුම් කරනු ලබන සේවාවන් සඳහා සම්මත අයදුම්පත් හඳුන්වා දුන්නෙමු. මෙම මූලපිරීම මගින් තිරසර ආකාරයෙන් වැඩිදියුණු කළ සේවා සැපයීම සඳහා අභ්‍යන්තර මෙහෙයුම් ප්‍රශස්ත කරමින් නූතන පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම විෂයයෙහි අපගේ කැපවීම අවධාරණය කෙරේ.



ආයතනික සමාජ වගකීම් වාර්තාව

හැඳින්වීම

ලංකා විදුලිබල මණ්ඩලය ලෙස, ජාතියේ ප්‍රමුඛ විදුලිබල උපයෝගිතා සැපයුම්කරු වශයෙන් වූ අපගේ කාර්යභාරය සහ පරිසරය හා සමාජය කෙරෙහි ඇති වගකීම් පිළිගන්නෙමු. විශ්වසනීය හා දැරිය හැකි මිලකට සේවා සැපයීමට පමණක් නොව, වගකීම් සහගත හා තිරසර ලෙස මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කැපවී සිටිමු. මෙම වාර්තාව මගින් 2023 වසර තුළ සිදු කරන ලද ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් සහ එමගින් පරිසරයට හා සමාජයට ඇති කළ බලපෑම විස්තර කෙරේ.

පාරිසරික මූලාරම්භයන්

නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාර පරිශ්‍රයේ රුක් රොපණය

2017 වසරේ සිට, නොරොච්චෝලේ පිහිටි ලංවිම ලක්විජය බලාගාරය විසින් පුත්තලම කලපු ප්‍රදේශයේ කඳුරු හෙවත් කඩොලාන පැල 10,000 ක් ඇතුළුව පැල 43,000 ක් පමණ රෝපණය කර ඇත. මෙම සාමූහික උත්සාහයන් තුළ පෙව විවිධත්වය සංරක්ෂණය කිරීම සහ ස්වභාවික වාසස්ථාන පවත්වාගෙන යාම සඳහා වූ කැපවීම ප්‍රකට කෙරේ.



රූපය CSR1: අවරෝධක කලාපයේ හා පුත්තලම කලපුවේ රුක් රෝපණ හා කඩොලාන රෝපණ කටයුතු

මඟ දෙපස රුක් රොපණය

මීට අමතරව, පාලවි - කල්පිටිය ප්‍රධාන මාර්ගය දිගේ රුක් රෝපණ කටයුතුද ලංවිම විසින් මෙහෙයවනු ලැබ ඇත. මෙම ක්‍රියාකාරකම් තුළ මාර්ග දෙපස ප්‍රදේශවල සොබා සෞන්දර්යය වැඩි දියුණු කිරීම, පරිසර සංරක්ෂණය සහ තිරසර නාගරික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කෙරී ඇත.

සමාජ මූලාරම්භයන්

පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම

සමාජ සුභසාධනය කෙරෙහි ලංවිම කැපවීම ඉලන්තාඩිය රජයේ සිංහල විද්‍යාලයේ අඩි 25' x 80' ප්‍රමාණයේ පාසල් ගොඩනැගිල්ලක ඉහළ මහල සම්පූර්ණ කිරීමෙන් පෙන්නුම් කෙරේ. මෙය රුපියල් මිලියන 12.5 ක මුළු වියදමකින් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය තුළ ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශය පහසු කිරීම, සමාජ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සහ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ සමස්ත යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා ඇති කැපවීම පෙන්නුම් කරයි. තවද, පණියාඩිය දෙමළ පාසලේ පන්ති කාමර ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු රුපියල් මිලියන 8 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය ප්‍රාථමික සිසුන් සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ ප්‍රදේශයේ විවිධ ජන කණ්ඩායම් අතර සමාජ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට සිදු කෙරේ.



රූපය CSR2: ඉලංතාඩිය රජයේ සිංහල පාසැලේ දෙමහල් ගොඩනැගිල්ල

ප්‍රජා ශාලා ඉදිකිරීම

රුපියල් මිලියන 6 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නාරක්කල්ලියහි ප්‍රජා ශාලාවක් ඉදිකිරීම තුළින් ප්‍රජා සංවර්ධනය විෂයගතව ලංවිම විසින් විශිෂ්ට කාර්යභාරයක් ඉටු කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රජා සමගිය සහ සමාජ සබඳතා වර්ධනය කිරීමට ඇති කැපවීම පෙන්නුම් කරන අතර, එය සෞඛ්‍ය සම්පන්න හා සජීවී සමාජ පරිසරයක් ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය වේ.



රූපය CSR3: නාරක්කල්ලිය ප්‍රජා ශාලාවක.

අවසාන වශයෙන්, පාරිසරික තිරසාරත්වය, සමාජ සංවර්ධනය සහ ප්‍රජා යහපැවැත්ම ඉලක්ක කරගත් ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ වගකීම් සඳහා ලං.වි.ම. හි කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. මෙම ක්‍රියාකාරකම් හරහා, පරිසරයට සහ සමාජයට අර්ථවත් හා චිරස්ථායී බලපෑමක් ඇති කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් වගකීම් සහගත ව්‍යාපාරික පරිචයන් සඳහා ඇති අපගේ කැපවීම තහවුරු කරමින් අප සේවය කරන ප්‍රජාවන්ගේ සමස්ත සුභසාධනය සඳහා දායක වන්නෙමු.




මෙහෙයුම් සමාලෝචනය

මූල්‍ය අංශය

මූල්‍ය අංශය

ලං.වි.ම. හි මූල්‍ය අංශය අදාළ ව්‍යාපාරයේ මුදල් අංශ කළමනාකරණය, එහි මූල්‍ය සෞඛ්‍යය සහතික කිරීම සහ උපායමාර්ගික තීරණ ගැනීම උදෙසා සහාය වීම සඳහා වගකිව යුතුවේ. මූල්‍ය අංශය ආයතනයේ මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමේදී, කාර්ය සාධනය ප්‍රශස්ත කිරීමේදී සහ මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. තිරසර වර්ධනය ඉදිරියට ගෙන යාම සහ මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා එහි කාර්යයන් අත්‍යවශ්‍ය වේ. මූල්‍ය අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පිළිබඳ සටහනක් පහත රූපයේ දැක්වේ.



රූපය F1: ප්‍රධාන කටයුතු පිළිබඳ දළ සැකැස්ම


සමාලෝචිත වර්ෂය

සැලකිය යුතු ලෙස සීමාකරණය වූ මුදල් ප්‍රවාහයකට මුහුණ දුන් ලං.වි.ම. විසින්, 2023 දී ගල් අඟුරු හා සම්බන්ධ සියලුම ගෙවීම් ලංකා බැංකුව (BOC) වෙත මාරු කිරීමෙන් තීරණාත්මක පියවරක් ගන්නා ලදී. මෙම උපායමාර්ගික පියවර තුළට ප්‍රධාන වශයෙන් බෙදාහැරීම් අංශය 4 සහ ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO) ට අදාළ එකතු කිරීම් වගකීම් ලංකා බැංකුව වෙත මාරු කිරීම ඇතුළත් වූ අතර, ඒ අනුව මේවන විට ලංකා බැංකුව විසින් ගල් අඟුරු ගෙවීම් හසුරුවනු ලබයි. ඒ අතරම, මහජන බැංකුවෙන් පෙර ලබාගත් ණාමක හෙවත් චක්‍රීය ගල් අඟුරු පහසුකම් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලදී. මෙම පියවර මගින් මහජන බැංකුව මත ලං.වි.ම. හි රඳා පැවැත්ම අඩු කරමින් ගල් අඟුරු ගනුදෙනු හා සම්බන්ධ ඉහළ අවදානම්වලට ආයතනය නිරාවරණය වීම අවම කරන ලදී.

වර්ෂය ආරම්භයේදී සැලකිය යුතු ලෙස විදේශ මුදල් ගෙවීම් ආශ්‍රිත පසුගාමී තත්ත්වයකට ලං.වි.ම. මුහුණ දුන්නේය. කෙසේ වුවද, කැපවූ උත්සාහයන් තුළින් මෙම පසුගාමී තත්ත්වය සාර්ථකව නිරවුල් කරන ලද අතර මූල්‍ය වර්ෂය තුළ අවශ්‍ය ණයවර ලිපි (LC) විවෘත කිරීම ආරම්භ කරන ලදී. මෙයට පෙර, ලං.වි.ම. වෙත මහජන බැංකුවෙන් රු. බිලියන 15 ක ණයවර ලිපි පහසුකමක් පැවති අතර එය 2023 දී රු. බිලියන 7.5 දක්වා අඩු කරන ලදී.

ලං.වි.ම. අර්ථසාධක අරමුදල කාර්ය සාධන උද්දීපනයන්

වසර පුරා කැළඹුණු සහ අවිනිශ්චිත සාර්ව ආර්ථික වාතාවරණයක් පැවතියදී වුව, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අරමුදල විසින් ශක්තිමත් කාර්ය සාධනයක් අත්පත් කර ගන්නා ලදි. එහි ආයෝජන කළඹ තුළ ප්‍රත්‍යස්ථිතාව වැඩි දියුණු කිරීම සඳහා වූ අධිෂ්ඨානශීලී කැපවීම, දැඩි අවදානම් කළමනාකරණ පිළිවෙත්, විචක්ෂණශීලී සහ විවේචනාත්මක ආයෝජන උපායමාර්ග සහ ඵලදායීතා වැඩිදියුණු කිරීම් සහ පිරිවැය අඩු කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව අනුගමනය කිරීම මෙම සාර්ථකත්වයට හේතු විය.



රූපය F2: 2023 අවසානය වනවිට අර්ථසාධක අරමුදල සංඛ්‍යාවලින්

2023 වසර පුරා පැවති ආර්ථික හා දේශපාලනික ගැටලු හේතුකොට ඇතිවූ අඛණ්ඩ බාධා මධ්‍යයේ, ලං.වි.ම. අර්ථසාධක අරමුදල විසින් විචල්‍යතාවයෙන් හා අවිනිශ්චිතතාවයෙන් සපිරි තවත් වසරක් පසු කරන ලදි. කෙසේ වුවද, මෙම බරපතල අභියෝගයන් පැවතියදීද, අරමුදල විසින් ප්‍රත්‍යස්ථිතාවයක් පෙන්නුම් කරමින් බාහිර බාධක සඵලදායී ලෙස කළමනාකරණය පිණිස එහි උපායමාර්ගික අවබෝධය සහ අනුවර්තනීය හැකියාව උපයෝගී කර ගන්නා ලදි. මෙම ප්‍රත්‍යස්ථිතාවය වාර්තාගත ඉහළ ලාභදායීත්වයක් බවට පරිවර්තනය වූ අතර, ස්ථායීතාවය පවත්වා ගැනීම සහ අවිනිශ්චිත කාලවලදී සියලුම සාමාජිකයින්ගේ මූල්‍ය යහපැවැත්ම සඳහා වූ අරමුදලේ නොසැලී කැපවීම අවධාරණය කරමින් සියලුම සාමාජිකයින් සඳහා වටිනාකම් නිර්මාණය කෙරිණි.


ඉහළ හානිකරණයන්ට මුහුණ දුන් නමුත් අරමුදල් පිරිවැය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබිඹු කරමින් පෙර බදු ලාභය 46% කින් වර්ධනය වී අරමුදලේ ඉහළම ලාභය වන රු. බිලියන 15.6 ක් දක්වා ඉහළ නැගිණි. කෙසේ වෙතත්, වඩා ඉහළ බදු ගෙවීම් හේතුවෙන් බදු පසු ලාභය 36% කින් රු. බිලියන 13.3 ක් දක්වා වර්ධනය විය. අරමුදලේ ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අනුපාතය ලෙස වූ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ලං.වි.ම අර්ථසාධක අරමුදල 2023 වසර සඳහා සිය ඉහළම ලාභාංශ අනුපාතය වන 16.1% අගය ප්‍රකාශයට පත් කිරීමට සූදානම් ව සිටී.


2023 වසර සඳහා අරමුදලේ බදු වියදම් 142.7% කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආයෝජන ආදායම වර්ධනය වීම හේතුවෙන් වසර සඳහා බදු ප්‍රමාණය වර්ධනය වූ පසුබිමක, මුළු බදු වගකීම රු. බිලියන 2.3 ක් වූ අතර එමගින් අරමුදලේ මූල්‍ය සෞඛ්‍යයට බලපෑමක් ඇති කෙරිණි.


2023 දී අරමුදලේ වත්කම් පදනම රු. බිලියන 87.2 ක් දක්වා 18% කින් වර්ධනය විය. අවදානම්-ප්‍රතිලාභ ගතිකයන් ප්‍රශස්ත කිරීමේදී අරමුදල විසින් තෝරාගත් ආයෝජන අවස්ථා පමණක් අනුගමනය කරන ලදි. පවතින මෙහෙයුම් තත්ත්වයන් සලකා බැලීමේදී ආයෝජන මුළු වත්කම්වලින් 76% ක් විය. මුළු වගකීම් 9.1% කින් පහත වැටුණු අතර, සාමාජික ශේෂයන් 6.4% කින් රු. බිලියන 79.4 ක් දක්වා ඉහළ නැගිණි.


2023 දෙසැම්බර් 31 වන විට අරමුදල සාමාජිකයින් 22,894 කගෙන් සමන්විත සක්‍රීය දායක පදනමකට හිමිකම් කීය. වසර පුරා අරමුදල වෙත ලබාදෙන ලද සමස්ත දායකත්වය රු. බිලියන 6.1 ක් වූ අතර, එම කාලය තුළ සාමාජික මුදල් ආපසු ගෙවීම් රු. බිලියන 10.1 ක් විය. අරමුදල 2023 වසර සඳහා සිය සාමාජිකයින්ට 16.2% ක සැලකිය යුතු ලාභාංශ අනුපාතයක් ප්‍රකාශයට පත් කරමින් එහි ඉහළම ලාභාංශ අනුපාතය ලබා ගැනීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වේ.


මූල්‍ය අංශය (ඉතිරි කොටස)















රූපය F3: සාමාජිකයන් වෙත වටිනාකම් සහ ආර්ථික අගය නිර්මාණයග


ලං.වි.ම. විශ්‍රාම වැටුප් අරමුදල

විශ්‍රාම වැටුප් අරමුදල 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12(ඡ) වගන්තියේ විධිවිධාන යටතේ 1994 ජනවාරි 1 වන දින ස්ථාපිත කරන ලදී. එය එහි භාරකරු වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් පත් කරනු ලබන කළමනාකරණ කමිටුවක් විසින් පාලනය කරනු ලබයි.

2023 වසර අවසානය වන විට විශ්‍රාමිකයින් සංඛ්‍යාව 8,534ක් වූ අතර, ඉන් 8,031 දෙනෙක් අරමුදලින් සක්‍රීයව ප්‍රතිලාභ හිමිකම් පෑහ. පහත රූප මගින් පසුගිය වසර පහ තුළ විශ්‍රාමිකයින්ගේ චලනය, මුදල් ප්‍රමාණයන් සහ 2023 වසර අවසානය වන විට ආයෝජන කළඹ සාරාංශ කර දක්වනු ලබයි. 2019 සිට 2022 දක්වා විශ්‍රාමිකයින් සංඛ්‍යාවේ ප්‍රතිශතක වර්ධනයෙහි සැලකිය යුතු ලෙස අඩු වීමක් සිදුවූ බව එමගින් පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, 2023 දී විශ්‍රාමිකයින් සංඛ්‍යාවේ වර්ධනයක් දක්නට ලැබිණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශ්‍රාම යාමේ වයස වසර 60 දක්වා ආපසු හැරවීමේ රජයේ ප්‍රතිපත්තිය ලං.වි.ම ට අදාළ වීමයි.







රූපය F4: විශ්‍රාම අරමුදල් විස්තර

තවද, පසුගිය වසර හතර තුළ ආයෝජනවලින් ලැබෙන ඵලදාව විශ්‍රාම වැටුප් වගකීම් පියවීමට ප්‍රමාණවත් වී නොමැති අතර, 2023 දී දායක මුදල්වල පහළ යාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. මෙම තත්ත්වයන් හේතුවෙන් අරමුදල විසින් අනුගමනය කරන ලද උපායමාර්ග නැවත ඇගයීමට ලක් කිරීම සහ එහි තිරසරභාවය සහතික කිරීම සඳහා නව උපායමාර්ග සංවර්ධනය කිරීමට පෙළඹවීමක් සිදුව ඇත.

මූල්‍ය සමාලෝචනය


ලංකා විදුලිබල මණ්ඩලය කාර්මික, වාණිජ සහ ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමට ශක්තිමත් ආර්ථික ප්‍රකෘතිය මධ්‍යයේ දැඩි කැපවීමකින් කටයුතු කර ඇත. පුනර්ජනනීය බලශක්ති අංශය වර්ධනය කිරීම සඳහා වසර පුරා සිදුකරන ලද සැලකිය යුතු දායකත්වය හේතුවෙන් තිරසර හා විශ්වසනීය ලෙස බලශක්තිය සැපයීමට විදුලිබල මණ්ඩලයට හැකි වී තිබේ.

මූල්‍ය කාර්ය සාධනය

ආදායම

සමාලෝචිත වර්ෂය තුළ විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 606.6 ක් දක්වා 97% ක ආදායම් වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, එය එහි වසර 54 ක කීර්තිමත් ඉතිහාසයේ සටහන් කරන ලද ඉහළම ආදායම වේ. වසර තුළ ඉහළ පෙළ වර්ධනය පිළිබිඹු කෙරෙනුයේ පිරිවැය-ආවරණය වන ගාස්තු ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති තීරණයට අනුව රජය විසින් සිදු කරන ලද අර්ධ වාර්ෂික ගාස්තු සංශෝධනය තුළිනි. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (PUCSL) 2023-02-15 දින සිට ක්‍රියාත්මක වන ඉහළ සංශෝධනයක් සහ 2023-07-01 දින සිට ක්‍රියාත්මක වන පහළ ගාස්තු සංශෝධනයක් සහිත අර්ධ වාර්ෂික ගාස්තු සංශෝධන ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත. රටේ වියළි කාලගුණික තත්ත්වයන් පැවති කාලවලදී දරන ලද පිරිවැය පියවා ගැනීම සඳහා විදුලිබල මණ්ඩලය 2023 ඔක්තෝබර් මාසයේදී අතුරු ගාස්තු සංශෝධනයක් ඉල්ලා සිටි අතර, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් 2023-10-20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ මිල සංශෝධනයකට අනුමැතිය ලබා දී ඇත.






රූපය FR2: ආදායම් සංයුතිය -2023

සාමාන්‍ය සැපයුම් සහ තොග සැපයුම්වලින් ලද ආදායම සමාන දායකත්වයක් ලබාදී ඇති අතර, එක් එක් කොටස 41% බැගින් වේ. පසුගිය වසරවල රටේ පැවති දැඩි කැළඹීම්, අවිනිශ්චිතතාව සහ අස්ථාවරත්වය මෙන්ම, නිරන්තර විදුලි බිඳවැටීම් හේතුවෙන් රටේ විදුලි ඉල්ලුම (තොග/සිල්ලර) වසර දෙකක් තිස්සේ ආසන්න වශයෙන් 2023/02/15 තෙක් වසරින් වසර 3% කින් පහත වැටී ඇත. 2023-02-15 දින සිට සංශෝධිත ගාස්තු ක්‍රියාත්මක කිරීමත් සමඟ විදුලිබල මණ්ඩලය විසින් රට තුළ අඛණ්ඩ විදුලි සැපයුමක් ආරම්භ කරන ලදී.

ශුද්ධ ලාභය / (අලාභය)

වසර තුළ ශුද්ධ ලාභය රුපියල් බිලියන 61.2 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම ලාභය වේ වසරින් වසර රුපියල් බිලියන 359.4 ක පාඩු අඩුවීමක් පෙන්නුම් කරමින් එම ලාභය 121% කින් ඉහළ ගොස් ඇත. 2023 වසරේදී පනවන ලද ඉහළ ගාස්තු සංශෝධන විශේෂයෙන්ම 2023 දුර්වල ජල විදුලි ජනන තත්ත්වය මධ්‍යයේ යෙදවුම් මිල ගණන්හි සැලකිය යුතු උච්චාවචනයන්ට මුහුණ දීමට විදුලිබල මණ්ඩලයට සහාය සාධකයක් බවට පත්වී ඇත.



රූපය FR3: මූල්‍ය කාර්ය සාධනය 2023/2022


වගුව FR1: 2022 ට සාපේක්ෂව 2023 මූල්‍ය කාර්ය සාධන සන්සන්දනය (රු. මිලියන)

	2023	2022-නැවත ප්‍රකාශිත	විචලනය (%)
විදුලිය අලෙවිය	606,627	308,457	97%
අනෙකුත් ආදායම්	33,810	12,975	161%
සෘජු ජනන පිරිවැය	(407,173)	(325,245)	25%
රජයේ ණය සමකොටස්වලට පරිවර්තනය හේතුවෙන් ඇතිවූ විනිමය අලාභය	-	(94,689)	-100%
අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක අලාභය	(3,154)	(11,059)	-71%

සමාලෝචිත වර්ෂය සඳහා විදුලි උත්පාදනය පසුගිය වසරට සාපේක්ෂව 2% ක පහත වැටීමක් පෙන්නුම් කර ඇති අතර, එය විදුලි ඉල්ලුමේ 3% ක අඩු වීමක් සමඟ සමපාත වේ.


අනෙකුත් විස්තීර්ණ ආදායම්

විදුලිබල මණ්ඩලයේ සමස්ත විස්තීරණ පාඩුව රුපියල් බිලියන 3.1 දක්වා අඩු වී ඇති අතර, විශ්‍රාම වැටුප් අරමුදල් බැරකම්වල ගණක අලාභය අඩු වීම හේතුවෙන් නිශ්චිත ප්‍රතිලාභ බැරකම් මත ගණක අලාභ අඩු වීම එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. 2022 වසරේ රුපියල් බිලියන 309 ක සමස්ත විස්තීර්ණ අලාභයක සිට විදුලිබල මණ්ඩලයේ මුළු විස්තීර්ණ ආදායම රුපියල් බිලියන 58 ක් දක්වා ඉහළ ගොස් ඇත.




රූපය FR4: ජනනය හා අලෙවිය (ගි.වො.පැ.)

2022 වසරට සාපේක්ෂව ජනන මුහුවේ සංයුතිය සුළු වශයෙන් වෙනස් වී ඇති අතර, සමාලෝචිත වසරේදී ජල විදුලි උත්පාදනයෙන් ලද දායකත්වය දුර්වල වී ඇත. ලක්විජය ගල්අඟුරු බලාගාර (LVPP) ඒකක නඩත්තු කටයුතු හේතුවෙන් විටින් විට ක්‍රියාවිරහිත වී ඇති අතර, ඒ අනුව උත්පාදිත ඒකක ප්‍රමාණය 10% කින් පහත වැටී ඇත. 2023 දී බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා විදුලිබල මණ්ඩලයේ තාප බලාගාර වැඩි වශයෙන් ක්‍රියාත්මක විය. ජනන මුහුවට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් ලැබුණු වැඩි දායකත්වය පසුගිය වසරට සාපේක්ෂව මූල්‍ය කාර්ය සාධනයට ධනාත්මකව බලපා ඇත. පසුගිය වසරට සාපේක්ෂව Net Plus/Net Accounting ක්‍රම වර්ධනය වීමත් සමඟ වහල මත සවිකරන සූර්ය බලශක්ති උත්පාදන සම්බන්ධතා සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය විය.



රූපය FR5: ජනන මුහුව - 2022/2023

පිරිවැය ව්‍යුහය



රූපය FR6: පිරිවැය ව්‍යුහය 2023/2022


විදුලිබල මණ්ඩලයේ පිරිවැය ව්‍යුහය තුල සෘජු ජනන පිරිවැය ඉහල අගයක් දරන ලද අතර, එය 2023 වසරේ උද්ධමනය හේතුවෙන් ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ ගල්අඟුරු මිල ඉහළ යාම මධ්‍යයේ රුපියල් බිලියන 325 සිට රුපියල් බිලියන 407 දක්වා වසරින් වසර 25% ක වැඩිවීමක් සටහන් කරමින් සමාලෝචිත වසරේ මුළු පිරිවැයෙන් 70.3% ක් විය. බලශක්ති උත්පාදනයේ 10% ක පහත වැටීමක් පැවතියදීත් 2023 දී පසුගිය වසරට සාපේක්ෂව ගල්අඟුරු වියදම්වල 17% ක පිරිවැය ඉහළ යාමක් පැහැදිලි විය. ඉන්ධන පිරිවැය 2022 ට සාපේක්ෂව රුපියල් බිලියන 68.9 සිට රුපියල් බිලියන 121 දක්වා 76% කින් ඉහළ ගොස් ඇති අතර, එතුළ වසරින් වසර 47% ක උත්පාදිත ඒකක ප්‍රමාණයේ ඉහළ යාමක් පිළිබිඹු කරයි. මෙහිලා භාණ්ඩ මිල ගණන් ඉහළ යාම සමඟ පොලී අනුපාත වැඩිවීම හේතුවෙන් විදුලිබල මණ්ඩලයේ ඉතිහාසයේ ඉහළම සෘජු උත්පාදන පිරිවැය සටහන් කෙරෙන අතර, විනිමය අනුපාත උද්ධමනය මෙහෙයුම් පිරිවැය කෙරෙහි ඇති බලපෑම අවම කර ඇත. වසර තුළ ක්‍රියාත්මක කරන ලද ගාස්තු සංශෝධන මෙම අභියෝගවලට මුහුණ දීමට සහ අඛණ්ඩ ශුද්ධ පාඩුව ශුද්ධ ලාභයක් බවට පත් කිරීමට විදුලිබල මණ්ඩලයට බෙහෙවින් උපකාරී විය. 2022 ට සාපේක්ෂව 2023 දී විනිමය අනුපාත උද්ධමනය සිදුවූ බලපෑම හරහා වසර තුළ විදුලිබල මණ්ඩලයේ පොදුකාර්ය වියදම් 29% කින් පහත වැටිණි.

සෘජු ජනන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යාම 2023 දී ජනනය සඳහා ඒකකයක පිරිවැය ඉහළ යාම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති අතර, එය 2022 දී කිලෝවොට් පැයකට රු. 24.65 ට සාපේක්ෂව 2023 දී කිලෝවොට් පැයකට රු. 29.18 (ප්‍රතිප්‍රකාශිත) අගයක් විය.

අවසන් පාරිභෝගිකයා වෙත අලෙවි කරන අවස්ථාවේදී, 2022 (ප්‍රතිප්‍රකාශිත) අගය වූ කි.වොට. පැයට රු. 36.16 අගයට සාපේක්ෂව 2023 දී ලං.වි.ම. ඒකක පිරිවැය රු. 40.92 අගයක විය. ඒ අනුව, සෘජු ජනන පිරිවැයද ඇතුළත් මෙහෙයුම් පිරිවැය පෙර මූල්‍ය වසර හා සාපේක්ෂව 10% කින් වර්ධනය විය.


ණය ගැනීම් සහ මූල්‍ය පිරිවැය

සමාලෝචිත වසර තුළ විදුලිබල මණ්ඩලයේ මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 59.9 ක් වූ අතර, ස්වාධීන විදුලි නිෂ්පාදකයින්ට ගෙවීම් සඳහා වූ ප්‍රමාද පොලිය 85% කින් ඉහළ යාම (රුපියල් බිලියන 12.1 ක්) හේතුවෙන් මෙසේ සිදු විය. පසුගිය හිඟ මුදල් පියවීමත් සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) ගෙවිය යුතු ප්‍රමාද පොලිය 37% කින් (රුපියල් බිලියන 3.3) අඩු විය. සමාලෝචිත කාලය තුළ පැවති ඉහළ පොලී අනුපාත ණය මත පොලී ගාස්තු ඉහළ යාමට දායක විය. පිරිවැය-ආවරණය වන ගාස්තුවක් නොමැති වීම සහ පෙර වසරවල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් හිඟ ණය ශේෂ එකතු කිරීමේ ක්‍රියාවලියේ බාධා ඇති වීම විදුලිබල මණ්ඩලයේ මුදල් ප්‍රවාහයේ ද්‍රවශීලතා ගැටළු තවදුරටත් වැඩි කරන ලද පසුබිමක, ස්වාධීන විදුලි නිෂ්පාදකයින් ඇතුළු ප්‍රධාන සැපයුම්කරුවන්ට ආශ්‍රිත ගාස්තු පියවීම් අවහිර කිරීම හේතුවෙන් ප්‍රමාද පොලිය තවදුරටත් ඉහළ ගොස් ඇත.



රූපය FR7: මූල්‍ය පිරිවැය විශ්ලේෂණය - 2022/2023 (රු. මිලියන)

2023 දී රුපියල් බිලියන 48.35 ක නව ණය ගැනීම් මධ්‍යයේ, පොලී අනුපාත ඉහළ යාම ද පිළිබිඹු කරමින් පොලී පිරිවැය 40% කින් රුපියල් බිලියන 36.9 දක්වා ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂයේදී මහ බැංකුව පොලී අනුපාත ඉහළ දැමූ අතර එය මූල්‍ය පිරිවැය කෙරෙහි ණය සෘණාත්මකව බලපා ඇත. විදුලිබල මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහළ නංවන ලද බැංකු අයිරා පහසුකම මූල්‍ය පිරිවැය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.




රූපය FR8: ණය ගැනීම්වලට සාපේක්ෂව මූල්‍ය පිරිවැය -2023/2022

මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)

මූල්‍ය තත්ත්වය

පැවති අභියෝගාත්මක මෙහෙයුම් පසුබිම මධ්‍යයේ වුව, වත්කම් රු. බිලියන 1,204 දක්වා 12% කින් වර්ධනය වෙමින් ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම ආශ්‍රිතව සිදු කෙරෙමින් පවත්නා ව්‍යාප්තිය මෙන්ම වර්ධිත කාරක ප්‍රාග්ධන තත්ත්වයද පිළිබිඹු කරන ලදී. වසර තුළ ජංගම නොවන වත්කම් සහ ජංගම වත්කම් පිළිවෙලින් 4% කින් හා 58% කින් වර්ධනය වූ අතර එයට ප්‍රධාන වශයෙන් දායකත්වය දක්වන ලද සාධක වූයේ දේපළ, පිරියත හා උපකරණ සහ වෙළඳ හා සෙසු ලැබිය යුතු දෑ වේ. තවද 2023 වර්ෂයේ සිදුවූ ගාස්තු ඉහළ නැංවීම හේතුකොට 2023 වසර සඳහා මුදල් හා මුදල් සමාන දෑ මෙන්ම වෙළඳ හා ලැබිය යුතු දෑ රු. බිලියන 50 කින් (63%) වර්ධනය විය. ලං.වි.ම. විසින් මුදල් රැස්කිරීම් ශක්තිමත් කරමින් ද්‍රවශීලතාවය පවත්වාගනු පිණිස බෙදාහැරීමේ අංශ පුරා ප්‍රායෝගික උත්සාහයන් ගෙන තිබිණි.



රූපය FR9: වත්කම් වර්ධනය - 2023/2022

පසුගිය වසරට සාපේක්ෂව දේපළ, පිරියත හා උපකරණ 4% කින් ඉහළ ගොස් ඇති අතර, එය විදුලිබල මණ්ඩලයේ මුළු වත්කම් පදනමෙන් 77% ක් නියෝජනය කරයි. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් මාර්ග සහ සිවිල් වැඩ සඳහා කරන ලද ආයෝජන මගින් සිදුවී ඇත. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ තුළද ප්‍රධාන වශයෙන් වෙළඳ ලැබිය යුතු දෑ හේතුවෙන් රුපියල් බිලියන 49.6 කට සමාන 63% ක සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණි. වී අනුව ජංගම වත්කම් විදුලිබල මණ්ඩලයේ මුළු වත්කම් පදනමෙන් 21% ක් විය. එය පසුගිය වසරේ 15% ක අගයේ සිට ඉහළ ගොස් ඇත. මීට අමතරව, 2023 දී ක්‍රියාත්මක කරන ලද ඉහළ ගාස්තු සංශෝධනය සහ රටේ පවතින අනෙකුත් සමාජ-ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සම්බන්ධිත පාර්ශව නොවන විදුලිය ණයගැතියන්' 46% කින් වර්ධනය විය.

2023 දී සාමාන්‍ය ලාභ රඳවා ගැනීම සහ රජයේ ප්‍රාග්ධන ඇතුළත් කිරීම හරහා විදුලිබල මණ්ඩලය විහි ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කරගෙන ඇත. මෑත වසරවල පිරිවැය-ආවරණය වන ගාස්තුවක් නොමැති වීමෙන් ඇති වූ අඛණ්ඩ පාඩු හේතුවෙන් විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන තත්ත්වය සහ අරමුදල් සැපයීමේ පැතිකඩ දුර්වල වී ඇත. කෙසේ වෙතත්, 2023 දී අර්ධ වාර්ෂික ගාස්තු සංශෝධන සහ අතුරු ගාස්තු සංශෝධනයක් හේතුවෙන් මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රුපියල් බිලියන 498 ක් දක්වා 60% කින් ඉහළ ගොස් ඇත. තවද, රජය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ගෙවීම් සඳහා අතිරේක සම කොටස් ආයෝජනයක් ලෙස රුපියල් බිලියන 126.27 ක් මාරු කර ඇත. වී අනුව 2022 දී 29% ක් වූ මුල් වත්කම් සඳහා වන ප්‍රාග්ධන සංයුතිය 2023 දී මුළු වත්කම්වලින් 41% ක් වී ඇත.

තවද මුළු වත්කම්වලින් 26% ක් ණය මගින් ප්‍රාග්ධනය කර ඇති අතර, ණය-සම කොටස් පරිවර්තනය හේතුවෙන් පසුගිය වසරේ 31% අගයේ සිට වැඩිදියුණුවක් පෙන්නුම් කරයි. විදුලිබල මණ්ඩලය ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා රුපියල් බිලියන 24.4 ක ණය ගැනීම් සමඟ කාරක ප්‍රාග්ධනය සඳහා තවත් රුපියල් බිලියන 24 ක් ණය ගැනීමත් සමඟ ණය-අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරිණි. වසර තුළ නව කාලීන ණය ලබා ගැනීම සිදු කළද, පිරිවැය- ආවරණය වන ගාස්තුවක් පැනවීමෙන් වැඩි දියුණු වූ මුදල් ගලා ඒම හේතුවෙන් කෙටි කාලීන ණය රුපියල් බිලියන 23 දක්වා 27% කින් අඩු විය.

තවද, මුළු බැරකම් වසරින් වසර 8% කින් රුපියල් බිලියන 706 දක්වා අඩු වී ඇති අතර, මුළු පොලී දරන ණය හා ණය ගැනීම් සම කොටස්වලට වඩා අඩු අගයක විය. මෙම බැරකම් අඩු වීම 2023 අවසානය වන විට විදුලිබල මණ්ඩලයේ ණය/සම කොටස් අනුපාතය අඩු වීමට දායක විය.

මූල්‍ය අනුපාත


අනුපාතය	2023	ප්‍රතිප්‍රකාශිත 2022
වත්කම් මත ප්‍රතිලාභ	5%	29
සම කොටස් මත ප්‍රතිලාභ	15%	-125%
සම කොටස්වලට ණය	63%	107%
කොටස් වලට වත්කම්	27%	31%
ජංගම අනුපාතය	0.83:1	0.43:1
ක්ෂණික අනුපාතය	0.44:1	0.25:1
පොළී ආවරණය	0.50	-0.26
ණය සේවා ආවරණ අනුපාතය	1.77	-3.78

Figure FR10: Financial Ratios


මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)

මූල්‍ය තත්ත්වය (උද්දීපනයන්)


සමස්ත වත්කම්




සමස්ත බැරකම් හා සම කොටස්



ජංගම නොවන වත්කම් සංයුතිය



ජංගම වත්කම් සංයුතිය



දස වසර සාරාංශය

පසුගිය වසර දහයක කාලය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල හා වත්කම් තත්ත්වය පහත දක්වා ඇත.

2023 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වසර සඳහා	2023 මි ලං.රු. මිලියන	2022 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2021 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2020 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2019 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2018 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2017 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2016 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2015 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2014 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2013 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන
මෙහෙයුම් ප්‍රතිඵලය											
ආදායම											
ආදායම	606,627	308,457	248,776	238,911	242,950	229,571	218,450	206,811	188,684	202,645	194,147
ගෘහස්ථ පාරිභෝගිකයන් වෙත සපයා දෙන ලද සහන	(0.1)	(1)	(196)	(5,908)	-	-	-	-	-	-	-
අලෙවි පිරිවැය	(506,966)	(444,625)	(266,596)	(276,938)	(322,521)	(251,964)	(260,273)	(222,097)	(168,781)	(213,646)	(165,509)
දළ ලාභය / (අලාභය)	99,661	(136,168)	(18,016)	(43,935)	(79,571)	(22,393)	(41,823)	(15,286)	19,903	(11,001)	28,638
අනෙකුත් ආදායම හා ලාභය	31,579	11,581	11,466	8,817	10,307	9,450	8,143	10,323	8,292	5,871	5,107
පරිපාලන වියදම්	(12,301)	(38,458)	(8,290)	(7,131)	(7,280)	(5,832)	(5,110)	(4,965)	(4,086)	(3,146)	(2,556)
මූල්‍ය ආදායම	2,231	1,394	1,131	1,338	1,751	1,466	1,194	1,049	434	304	1,677
මූල්‍ය පිරිවැය	(59,935)	(41,850)	(20,431)	(19,522)	(22,526)	(13,036)	(8,415)	(4,312)	(5,134)	(7,030)	(10,601)
ශුද්ධ මූල්‍ය පිරිවැයෙන් පසු ලාභය / (අලාභය)	61236	(203,501)	(34,139)	(60,433)	(97,319)	(30,345)	(46,011)	(13,191)	19,409	(15,002)	22,265
රජය පාර්ශ්වයෙන් ණය සම කොටස්වලට පරිවර්තනය කිරීමෙන් ඉස්මතුවන විහිමය අලාභය	-	(94,689)	-	-	-	-	-	-	-	-	-
ආදායම් බද්දට පෙර ලාභය / (අලාභය)	61,236	(298,189)	(34,139)	(60,433)	(97,319)	(30,345)	(46,011)	(13,191)	19,409	(15,002)	22,265
ආදායම් බදු වියදම්	-	-	-	(53)	(39)	(50)	(232)	(263)	(61)	(95)	
විලම්බිත බදු (අයකිරීම) / ආපසු හැරවීම	-	-	-	-	-	-	-	-	-	995	(1,326)
අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ආයුගණනක ලාභය/(අලාභය)	(3,154)	(11,059)	(505)	(8,678)	(64)	(1,541)	(1,338)	(1,003)	952	(3,183)	(39)
කාල පරිච්ඡේදයට අදාළ සමස්ත විස්තීර්ණ ආදායම/ අලාභය	58,082	(309,248)	(34,644)	(69,164)	(97,422)	(31,936)	(47,581)	(14,457)	20,300	(17,285)	20,900

2023 දෙසැම්බර් මස 31 වන දිනට	2023 මි ලං.රු. මිලියන	2022 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2021 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2020 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2019 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2018 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2017 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2016 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2015 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2014 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන	2013 (ප්‍රතිප්‍රකාශිත) මි ලං. රු. මිලියන
වත්කම්											
දේපළ, පිරියත හා උපකරණ	929,742	894,674	851,938	819,086	781,409	747,012	724,068	704,695	694,415	681,471	648,130
අස්පෘශ්‍ය වත්කම්	166	142	134	162	108						
අනු ආයතනයන්හි ආයෝජන	912	912	912	912	912	912	912	912	912	785	785
බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන	349	349	329	329	329	329	329	329	329	150	150
රක්ෂණ සංචිත අරමුදල් ආයෝජනය	15,111	12,460	10,658	9,981	8,997	8,070	7,246	6,496	6,036	5,653	5,250
සෙසු මූල්‍ය වත්කම්	6,079	5,783	7,700	8,859	9,951	10,204	8,912	8,983	3,848	2,291	-
සෙසු ජංගම නොවන වත්කම්	3,095	2,496	851	1,074	1,489	1,242	961	949	896	-	-
අලෙවිය සඳහා තබා ඇති ජංගම නොවන වත්කම්	0.076	0.076	0.076	0.076	0.076	0.076	0.655	1,022	1,025	1,023	1,021
ජංගම වත්කම්	248,921	157,733	131,446	116,617	110,576	102,338	89,065	80,968	69,391	72,662	91,423
සමස්ත වත්කම්	**1,204,374**	**1,074,548**	**1,003,967**	**957,020**	**913,771**	**870,107**	**831,494**	**804,354**	**776,852**	**764,035**	**746,759**
බැරකම්											
පොළියක් දරන ණය සහ ණය ගැනීම්	251,559	245,221	403,592	352,094	318,149	281,262	236,129	220,476	214,299	221,735	355,043
පාරිභෝගික තැන්පතු	17,081	16,720	16,300	15,641	15,014	14,311	13,557	12,753	11,484	10,458	9,722
ප්‍රතිපාදන සහ සෙසු විලම්බිත බැරකම්	36,809	33,001	21,615	20,121	10,482	10,038	8,622	7,262	6,116	6,572	3,236
රජයේ ප්‍රදාන	225	241	188	200	213	228	243	211	-	-	-
විලම්බිත ආදායම	-	-	-	-	-	-	-	-	71,696	66,292	60,343
කොන්ත්‍රාත් බැරකම්	107,622	102,613	99,518	95,771	89,746	86,335	82,564	77,628	-	-	-
විලම්බිත බදුකරණය	-	-	-	-	-	-	-	-	-	-	22,182
ජංගම බැරකම්	292,779	365,563	289,037	208,447	223,803	145,712	123,682	72,661	43,630	64,147	69,134
සමස්ත බැරකම්	**706,076**	**763,358**	**830,250**	**692,274**	**657,407**	**537,886**	**464,797**	**390,991**	**347,225**	**369,204**	**519,660**
සම කොටස්											
දායක ප්‍රාග්ධනය	991,430	865,159	413,055	391,731	323,194	302,695	302,695	302,695	302,228	289,038	121,708
සංචිත	48,204	44,077	41,223	39,254	37,110	34,881	32,783	30,283	28,463	27,434	25,999
රඳවාගත් ඉපැයුම්	(541,336)	(598,047)	(280,560)	(166,239)	(103,940)	(5,355)	31,219	80,385	98,936	78,359	79,392
සමස්ත සම කොටස්	**498,298**	**311,189**	**173,717**	**264,746**	**256,364**	**332,221**	**366,697**	**413,363**	**429,627**	**394,831**	**227,099**
සමස්ත සම කොටස් හා බැරකම්	**1,204,374**	**1,074,548**	**1,003,967**	**957,020**	**913,771**	**870,107**	**831,494**	**804,354**	**776,852**	**764,035**	**746,759**

අගය එකතු කිරීමේ ප්‍රකාශය

	2023 රු. මිලියන	2022 රු. මිලියන ප්‍රතිප්‍රකාශිත
එකතු කළ අගය		
ආදායම	**606,627**	308,457
අනෙකුත් ආදායම්	**31,579**	11,581
මූල්‍ය ආදායම	**2,231**	1,394
තෙවන පාර්ශවයන් විසින් සපයනු ලබන සම්පත් වල පිරිවැය	**(416,337)**	(277,272)
ආයතනය විසින් එකතු කරන ලද මුළු එකතු කළ අගය	**224,101**	44,161
අගය බෙදාහැරීම		
සේවකයින්ට වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වශයෙන්	**46,600**	44,980
රජයේ ආදායමට		
අනෙකුත් බදු	**23,863**	15,315
ප්‍රාග්ධනය ණය දෙන්නන්ට		
ණය මත පොළී	**59,935**	41,850
ප්‍රජාවට		
ආයතනික සමාජ වගකීම	**693**	784
වර්ධනය හා ව්‍යාපෘති සඳහා රඳවා ගත් අගය		
රඳවා ගත් අගය	**58,082**	(309,248)
ක්ෂය	**34,928**	34,004
ආයතනය විසින් බෙදා හරින ලද මුළු එකතු කළ අගය	**224,101**	44,161

ආයතනික පාලනය පිළිබඳ වාර්තාව

හැඳින්වීම

විනිවිදභාවයෙන් යුත් සහ ඵලදායී පාලන භාවිතයන් පවත්වාගෙන යාමේ අරමුණින්, ලංවිම විසින් 2023 මූල්‍ය වර්ෂය සඳහා සිය සම්පූර්ණ පාලන වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තාව තුළ අපගේ මෙහෙයුම්වල සියලු අංශ තුළ වගවීම, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ඉහළම ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට ඇති අපගේ කැපවීම ඇතුළත් කෙරේ.

පාලන රාමුව

ලං.වි.ම. හි පාලන රාමුව විනිවිදභාවය, ආචාරධාර්මික හැසිරීම සහ වගවීම වර්ධනය කිරීම සඳහා සූක්ෂම ලෙස නිර්මාණය කර ඇත. අපගේ රාමුවේ ප්‍රධාන සංරචක තුළට පහත අංග ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහිකව ආයතනයේ කටයුතු අධීක්ෂණය කරයි. කාර්ය සාධනය සමාලෝචනය කිරීම, උපායමාර්ගික දිශානතිය ස්ථාපිත කිරීම සහ කළමනාකරණ කණ්ඩායමට මඟපෙන්වීම සඳහා නිතිපතා රැස්වීම් පවත්වනු ලැබේ.

කළමනාකාරිත්වය

අපගේ කළමනාකරණ කණ්ඩායම මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ සහ කාර්යක්ෂම, ඵලදායී සහ විනිවිද පෙනෙන ආකාරයෙන් මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම දරයි. ඔවුන් කාර්ය සාධනය සඳහා වගකිව යුතු වන අතර තම ක්‍රියා සහ තීරණ තුළින් තිරසර වර්ධනයක් ඇති කිරීමට වගකීමෙන් කැපවී සිටිති.

ප්‍රතිපත්ති හා කාර්ය පරිපාටි

රාජ්‍ය ව්‍යවසායක් ලෙස අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා පැවරී ඇති වගකීම පිළිගනිමින්, ලංවිම සිය මෙහෙයුම් පාලනය කිරීම සඳහා විස්තීර්ණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්ති මගින් විදුලි සේවා සැපයීම තුළින් මහජනතාවගෙන් උපයන අරමුදල් ආරක්ෂිතව හැසිරවීම සහතික කරමින් නීතිමය අවශ්‍යතා සහ රෙගුලාසිවලට අනුකූල වීම උදෙසා වූ අපගේ නොසැලෙන කැපවීම අවධාරණය කෙරේ. අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයේදී, මහජන අරමුදල් සහ අපගේ සේවාවල විශ්වසනීයත්වය යන දෙඅංශයම ආරක්ෂා කරමින් අවදානම් ඵලදායී ලෙස හඳුනාගැනීම, ඇගයීම සහ අවම කිරීම සඳහා අපගේ ප්‍රතිපත්ති සූක්ෂම ලෙස සැලසුම් කර ඇත. දැඩි මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීමෙන්, අපගේ මූල්‍ය හෙළිදරව් කිරීම්වල විනිවිදභාවය සහ නිරවද්‍යතාව පවත්වා ගනිමින්, පාර්ශ්වකරුවන් අතර වගවීම සහ විශ්වාසය ශක්තිමත් කරමු.

තවද, ආචාරධර්මීය හැසිරීම අපගේ ආයතනික වටිනාකම්වල මූලික කරුණක් වේ. අපගේ ප්‍රතිපත්ති අපගේ සියලුම අන්තර්ක්‍රියා සහ මෙහෙයුම්වලදී අවංකභාවය, සාධාරණත්වය සහ ආචාරධාර්මික හැසිරීමේ ඉහළම වැදගත්කම අවධාරණය කරයි. මෙම ප්‍රමිතීන් පවත්වාගෙන යාම විශ්වසනීය රාජ්‍ය ව්‍යවසායක් ලෙස අපගේ කීර්තිනාමය ශක්තිමත් කිරීමට පමණක් නොව ආයතනය තුළ වගකීම් සහගත බවේ හා ගෞරවණීයත්වයේද සංස්කෘතියක් වර්ධනය කිරීමටද හේතු වේ.

මෙම ශක්තිමත් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම තුළින්, අත්‍යවශ්‍ය රාජ්‍ය ව්‍යවසායක් ලෙස විදුලිය කාර්යක්ෂම සහ ආරක්ෂිත ලෙස සැපයීම සහතික කරමින්, සේවා සැපයීමේ සෑම අංශයකම අවංකභාවයෙන්, විනිවිදභාවයෙන් සහ වගවීමෙන් යුතුව ක්‍රියා කිරීම උදෙසා වූ සිය කැපවීම ලංවිම යළි තහවුරු කරයි.

පාර්ශ්වකරු සහභාගිත්වය

අපි පාරිභෝගිකයින්, සේවකයින්, කොටස්කරුවන් සහ ප්‍රජාව ඇතුළු පාර්ශ්වකරුවන්ගේ ගැටලු සහ අපේක්ෂාවන් අවබෝධ කරගනු පිණිස ඔවුන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වන්නෙමු. පාර්ශ්වකරුවන්ගේ අභිලාශයන් ආමන්ත්‍රණය කරනු පිණිස විනිවිද පෙනෙන සහ විවෘත සන්නිවේදන මාර්ග පවත්වාගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණන කාර්ය සාධනය

අපගේ ආයතනික කාර්යසාධනය සහ පාලන භාවිතයන් ගැඹුරින් විමසා බැලීමේදී, අපගේ අභ්‍යන්තර විගණන කාර්යය විසින් ඉටු කරනු ලබන තීරණාත්මක කාර්යභාරය පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මූල්‍ය වර්ෂය පුරාවටම, අපගේ අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් අපගේ සියලු මෙහෙයුම් අංශවල විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව සහතික කරමින් ඉහළම ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට ඇති කැපවීම ස්ථිරව පවත්වාගෙන යන ලදී.

විගණනයේ අවධානය

2023 වසර පුරාවට, අපගේ විගණන කටයුතුවල ප්‍රධාන වශයෙන් ලංවිම තුළ ක්‍රියාත්මක කරන ලද පද්ධතිවල අඛණ්ඩතාව සහ සඵලතාව සහතික කිරීම සඳහා පද්ධති විගණන කෙරෙහි අවධානය යොමු විය. තවද, කළමනාකරණ පාලනයන්, ප්‍රසම්පාදන ක්‍රියාවලි, ගබඩා කළමනාකරණ පද්ධති, සහ ණයගැති මුදල් චකිතු කිරීමේ පද්ධති සවිස්තර නිරීක්ෂණයට සහ සමාලෝචනයට ලක් විය.

විගණන කටයුතු

2023 මූල්‍ය වර්ෂය තුළදී, අභ්‍යන්තර විගණන ශාඛාව විසින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්හි ශක්තිමත්භාවය සහ පාලනයන්හි සඵලතාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් විවිධ විගණන සිදු කරන ලදී. සිදු කරන ලද මුළු විගණන සංඛ්‍යාව පහත පරිදි බෙදී ගොස් ඇත:

රූපය CGR1: 2023 වසර තුළ ඉටු කරන ලද විගණනයන් පිළිබඳ විස්තර

වර්ගය	සංඛ්‍යාව
සාමාන්‍ය විගණන	12
පද්ධති විගණන	59
මණ්ඩල තොරතුරු	05
විශේෂ විමර්ශන	23
විගණන කමිටු වාර්තා	19
එකතුව	118

පාලන පිළිවෙත්

වර්ෂය තුළදී විවිධ අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන් පහසු කිරීම, විගණන කමිටු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, කල්වේලා ඇතිව ගිණුම් පිළියෙල කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තුළින් යහපාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට ලංවිම කැපවිය. විගණන ක්‍රියාවලියට සහාය වීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ රජයේ විගණක වෙත ඉල්ලා සිටි තොරතුරු සහ ලේඛන කඩිනමින් සපයන ලදී. සවිස්තරාත්මක සහ කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයන් සඳහා අවශ්‍ය පහසුකම්කරණය පිණිස අවශ්‍ය සම්පත් වෙන් කරන ලදි.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීමේදී ලංවිම කළමනාකාරිත්වය විසින් විගණන හා කළමනාකරණ කමිටුව වෙත සහාය දක්වන ලදි. වසර තුළදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් සූදානම් වීමේ රැස්වීම් තුනක් පවත්වන ලද අතර, ලංවිම හි මූල්‍ය කාර්යසාධනය සහ පාලන භාවිතයන් සමාලෝචනය කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහාය වීම සඳහා සවිස්තරාත්මක වාර්තා සකස් කරන ලදී. පාලනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ මත පදනම්ව පසුවිපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

ලංවිම කළමනාකාරිත්වය මෙහෙයුම් සහ පාලන භාවිතයන් පිළිබඳ තොරතුරු සහ අවබෝධයන් ලබා දීම සඳහා වෙනත් පාර්ලිමේන්තු කමිටුවලටද සහභාගී විය. නියාමන අනුකූලතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ ආයතනය ඵලදායී ලෙස සම්බන්ධීකරණය විය. ව්‍යවස්ථාපිත සහ නියාමන ගිණුම් අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව නියමිත වේලාවට පිළියෙල කරන ලද අතර, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණයේ ඉහළම නිරවද්‍යතා සහ අවංකභාව මට්ටම් පවත්වාගෙන යන ලදී.

නිගමනය

ආයතනික පාලනයේ ආදර්ශවත් ප්‍රමිතීන් පවත්වාගෙන යාමට ඇති කැපවීම තුළ ලංවිම නොසැලී සිටී. අපගේ පාලන රාමුව උනන්දුවෙන් ක්‍රියාත්මක කිරීම සහ අපගේ කළමනාකරිත්වයේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නොසැලෙන කැපවීම තුළින්, අපගේ මෙහෙයුම්වල සියලු අංශ තුළ විනිවිදභාවය, වගවීම, සහ කාර්යක්ෂමතාව පිළිබඳ පරිසරයක් නොකඩවා වර්ධනය කරන්නෙමු.


ITC RATNADIPA

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ

එන්. එස්. ඉලංගකෝන්

තනතුර	සභාපති
ධුර කාලය	2022 ජූනි මස 13 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	උපකරණ ශ්‍රේණිගතකරණය සහ මුහුදු ගුවන් යානා ශ්‍රේණිගතකරනය සම්බන්ධ ශ්‍රී ලංකාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේද සුදුසුකම් ලත් වාණිජ ගුවන් නියමුවෙකි. ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ මානව සම්පත් ඩිප්ලෝමාධරයෙකු වන ඔහු එක්සත් රාජධානියේ පශ්චාත් උපාධිධරයෙකුද වේ. රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේ ආයතනයන්හිද සභාපති, අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු වශයෙන් ව්‍යාපාර කළමනාකරණය විෂයයෙහි සහ මනා ආයතනික පාලන පරිචයන් හා කාර්ය පරිපාටි විෂයයෙහි වසර 16ක පළපුරුද්ද සහිත ඔහු අවංකත්වයේ සහ නිරවද්‍යභාවයේ ඉහළම ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන්නෙකි.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	සභාපති - සී./ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම සභාපති - සී./ස. ත්‍රිකුණාමලය විදුලිබල පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. ලංකා විදුලිබල පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ගැල්වනයිසර්ස් පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. ගල් අඟුරු පුද්ගලික සමාගම

ඩී. කේ. පී. යූ. ගුණතිලක

තනතුර	උප සභාපති
ධුර කාලය	2023 මැයි මස 10 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	ලං.වි.ම. ආශ්‍රිතව වසර 30කට වැඩි පළපුරුද්දක් සහිත සම්භාවනීය වෘත්තිකයෙකු වන ඔහු එක්සත් රාජධානියේ සහ ශ්‍රී ලංකාවේද වරලත් ඉංජිනේරුවරයෙකු වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ ආයතනයේ (FIET, UK) මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේද (FIE, SL) සාමාජිකයෙකු වේ. ඉංජිනේරු විද්‍යාපති උපාධිධරයෙකුද, ව්‍යාපාර පරිපාලනපති උපාධිධරයෙකුද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධරයෙකුද වන ඔහු කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත් ලාභියෙකුද (CIMA Adv Dip MA) වේ. එක්සත් ජනපදයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුද වන ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකුද වේ. ජාතියේ විදුලිබල යටිතල පහසුකම් බලගැන්වීමෙහි ලා සිය කැපවීම ප්‍රකට කරවමින් විදුලි බල රැහැන් සහ උපපොළ ඉදිකිරීම සම්බන්ධ පෘථුල අත්දැකීම්ද සහිතව ඔහු විසින් සිය වෘත්තීය ජීවිත කාලය තුළ විදුලි පද්ධති මෙහෙයුම් කටයුතු, නඩත්තු කටයුතු, පද්ධති සැලසුම් සහ උපයෝගිතා කළමනාකරණය සම්බන්ධයෙන්ද පුළුල් අවබෝධයක් ප්‍රකට කොට ඇත.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	අධ්‍යක්ෂ - සී./ස. ත්‍රිකුණාමලය විදුලිබල පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම

එම්. ආර්. වී. ආර් මීපුර

තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ධුර කාලය	2022 ජනවාරි මස 11 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයේ මුදල් සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනපති උපාධියක්ද සහිත සම්භාවනීය වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිධරයෙකුද වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකුද, රාජ්‍ය මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුද ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ සාමාජිකයෙකුද වේ. 2021-01-18 දින සිට 2021-07-21 දින දක්වා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්ද 2013-05-15 දින සිට 2019-01-20 දින දක්වා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති තීරණ) වශයෙන්ද සේවය කර ඇත. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ උපාය මාර්ගික තීරණ ගැනීම විෂයයන්හි ඔහුගේ සුවිශාල අත්දැකීම මෙම පත්වීම් තුළින් උද්දීපනය කෙරේ. දශක දෙකක් ඉක්මවා විහිදුණු වෘත්තීය ජීවිතයක් තුළ විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුළ ප්‍රධාන තනතුරු ගණනාවක් හොබවමින් ඔහු විසින් මූල්‍ය පාලනය, ආදායම් කළමනාකරණය, විගණන පිළිවෙත් සහ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි පෘථුල විශේෂඥතාවයක් ලබා ඇත.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ගැල්වනයිසර්ස් පුද්ගලික සමාගම අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගම

ආචාර්ය බී. විජයරත්න

තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ධුර කාලය	ජනවාරි මස 07 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	ඇමරිකා එක්සත් ජනපදයේ ආචාර්ය උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනපති උපාධියක්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විශේෂවේදී උපාධියක්ද ලබා ඇති සම්භාවනීය වෘත්තිකයෙකි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වශයෙන් රාජ්‍ය සේවයේ වසර 35 ඉක්මවූ අත්දැකීම් ලබා ඇත. ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට පෙර ඔහු යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් ධුරයද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරයද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් ධුරයද දැරිය.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ (ඉතිරි කොටස)

පී. පී. එන්. එම්. අබේසේකර

තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ධුර කාලය	2021 දෙසැම්බර් මස 24 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකුද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධරයෙකුද, අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ ඩිප්ලෝමාධරයෙකුද, සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත් ලාභියෙකුද, රාජ්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත් ලාභියෙකුද වන සම්භාවනීය වෘත්තිකයෙකි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වශයෙන් රාජ්‍ය සේවයේ වසර 22ක් ඉක්මවූ අත්දැකීම් සහිත ඔහු, අධිකරණ අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේද අතිරේක ලේකම්වරයෙකු වශයෙන්ද අත්දැකීම් ලත් අයෙකි. මෙයට අමතරව, ඔහු අමාත්‍යාංශ සහ රජයේ දෙපාර්තමේන්තු ගණනාවක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සහ අධ්‍යක්ෂ තනතුරුද දරා ඇත.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

මහාචාර්ය පී. බී. ආර්. දිසානායක

තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ධුර කාලය	2023 මාර්තු 23 දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	ශාස්ත්‍රාලීය කටයුතු, රාජ්‍ය අංශ නායනත්වය සහ වෘත්තීය සංවිධාන ආශ්‍රිත පෘථුල අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකි. මේවන විට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ඔහු, මෙයට පෙර (2017-2024) ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාවේ සභාපතිත්වය දැරූ අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කළ අයකි. ඔහුගේ රාජ්‍ය අංශ කාර්යභාරයන් අතරට ග්‍රාමීය මාර්ග සංවර්ධන, නාගරික සංවර්ධන සහ යටිතල පහසුකම් විෂයයනට අදාළ රාජ්‍ය අමාත්‍යාංශයන්හි ලේකම් තනතුරුද අයත් වේ. ජපානයේ එහිමි විශ්වවිද්‍යාලයෙන් (Ehime University) ලත් ආචාර්ය උපාධියක් සහ ඉංජිනේරුපති උපාධියක්ද සහිත ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයෙකුද වන අතර සිවිල් ඉංජිනේරු ආංශික කමිටුවේ සභාපතිත්වය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අංශාධිපති ධුරයද සහිතව ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේද කාර්ය භාරයන් ඉටුකර ඇත. ශ්‍රී ලංකාවේ ඉංජිනේරුමය ප්‍රමිතීන් ඉහළ නැංවීම, තිරසරභාවය සහ රාජ්‍ය සේවය කෙරෙහි වූ කැපවීමක්ද ඔහුගේ වෘත්තිය ජීවිතය තුළ පිළිබිඹු වේ.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - ජාතික විද්‍යා පදනම සභාපති සහ සමාරම්භක - Lego International Pvt Ltd සභාපති සහ සමාරම්භක - International Centre for Sustainable Built Environment (ICB) Pvt Ltd සභාපති සහ සමාරම්භක - Graduate Associate Professional (gap Pvt Ltd) සභාපති සහ සමාරම්භක - Wrangler Solutions (WSP Pvt Ltd) සමාරම්භක සහ අධ්‍යක්ෂ - Lanka AAC Pvt Ltd උප සභාපති - Chamber of Construction Industry (CCI), Sri Lanka

ඊ. එස්. ජී. එදිරිසිංහ

තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ධුර කාලය	2023 ජනවාරි 31 වන දින සිට
කුසලතාවය සහ පළපුරුද්ද	ඉමහත් සුදුසුකම් සහ පුළුල් අත්දැකීම් සම්භාරයකින් සන්නද්ධ සම්භාවනීය වෘත්තිකයෙකු වන මොහු මේවන විට ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) වශයෙන් කටයුතු කරයි. රජයේ සහ පුද්ගලික අංශයේ ආයතනයන් වෙත ලබාදෙන ලද සැලකිය යුතු දායකත්වයන් ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ කැපී පෙනේ. ඔහුගේ අධ්‍යාපනික පසුබිම කැලණිය විශ්වවිද්‍යාලයෙන් ලබාගත් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක්ද (2008), කොළඹ විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව ලබාගත් ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක්ද (1993), අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද යන සහතිකයන්ගෙන් සැදුම් ලද්දකි. රාජ්‍ය පරිපාලනය සහ සාමාන්‍ය කළමනාකරණය සම්බන්ධ සහතිකද (2004) ඇතුළත්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් ලබාගත් සහතික හරහා ඔහු සිය විශේෂඥතාවය තවදුරටත් ශක්තිමත් කරගත්තෙකි. මෙයට අමතරව, මහවැලි අධ්‍යාපන විද්‍යා පීඨයෙන් ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක්ද ලබාගෙන ඇති ඔහු ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණය සහ ජාතික ආපදා කළමනාකරණය පිළිබඳ (2002) පුහුණුවද ලබා ඇත. ඉහළ වගකීම් සහිත කාර්ය භාරයන් ඉටු කොට ලබාගත් අත්දැකීම් හා බද්ධව ඇති ඔහුගේ පෘථුල අධ්‍යාපනික පදනම විසින් ඔහු රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විශාරදත්වයක් සහිත නායකයෙකු බවට පත්කොට ඇත.
වෙනත් ආයතනයන්හි කාර්යභාරය	-

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2023 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳ 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 49 වන වගන්තිය ප්‍රකාර, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය (අධ්‍යක්ෂ මණ්ඩලය) සතුටට පත්වේ.

ප්‍රධාන කටයුතු

විදුලිය ජනනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, ඵලදායී ලෙස බෙදාහැරීම සහ අලෙවිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කටයුතු විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රටේ නීති රීතීනට පටහැනි කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

අනු ආයතන හා හවුල් ව්‍යාපාර

අනු ආයතන සහ හවුල් ව්‍යාපාර සතු ප්‍රධාන කටයුතු මූල්‍ය ප්‍රකාශන සටහන්හි පිටු අංක 93 හි දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කණ්ඩායම සතු ප්‍රධාන කටයුතුවල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදුව නොතිබිණි.

සමූහයේ ව්‍යුහයට සිදුවූ වෙනස්කම්

වසර තුළ සමූහයේ ව්‍යුහයට සිදුකරන ලද වෙනස්කම් මෙම වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සටහන් 12 සහ 13 හි 122 සිට 123 දක්වා පිටුවල දක්වා ඇත.

වසරේ කාර්ය සාධන සමාලෝචනය

පිටු අංක 12 සිට 13 දක්වා එන සභාපතිවරයාගේ පණිවිඩය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ/ කණ්ඩායමේ වාර්ෂික කාර්ය සාධනය අන්තර්ගත වේ. පිටු අංක 14 සිට 19 දක්වා වූ සාමාන්‍යාධිකාරිවරයාගේ සමාලෝචනය තුළ සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අන්තර්ගත වේ. පිටු අංක 70 සිට 74 දක්වා දක්නට ලැබෙන "මූල්‍ය සමාලෝචනය" ලෙස ශීර්ෂගත කොටස තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය සහ තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පිළිබඳ සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කෙරෙන්නාවූ මෙම වාර්තා වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් වේ.

දායක ප්‍රාග්ධනය

දායක ප්‍රාග්ධනය, 1969 අංක 17 දරන ලංවිම පනතට අනුව 1969 දී ලංවිම පිහිටුවීමේදී රජයේ විදුලිබල දෙපාර්තමේන්තුවෙන් (DGEU) ලංවිම විසින් පවරා ගන්නා ලද ශුද්ධ වත්කම්වල වටිනාකම සහ නිශ්චිත ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කරන ලද දායකත්වය නියෝජනය කරයි. දායක ප්‍රාග්ධනය පිළිබඳ විස්තර 128 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල අංක 22 සටහනෙහි දක්වා ඇත.

ණයකර නිකුතුව හා උපයෝජනය

2021 අප්‍රේල් වර්ෂය තුළදී, ලංවිම විසින් 9.35%ක ස්ථාවර කූපන් අනුපාතයකට සහ වසර 5 ක කල්පිරීමේ කාලසීමාව යටතේ ශ්‍රී ලං. රු. 100 නිකුත් කිරීමේ මිල සමඟින් ශ්‍රී ලං. රු. බිලියන 20ක් වටිනා ජ්‍යෙෂ්ඨ අනාරක්ෂිත ලැයිස්තුගත මුදවාගත හැකි ණයකර නිකුත් කරන ලදී.

ණයකර නිකුතුවෙන් (රුපියල් බිලියන 20) රැස් කරන ලද අරමුදල් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් (මුදල්වලින් 30% ක්) සහ අනෙකුත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන්ගෙන් (IPP) (අරමුදල්වලින් 70% ක්) ලබාගත් ණය පහසුකම් පියවීම සඳහා සම්පූර්ණයෙන්ම යොදා ගන්නා ලදී.

ණයකර වෙළඳාම් තොරතුරු

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වෙළඳ තොරතුරු	
ඉහළම මිල	88.66
අඩුම මිල	88.66
අවසන් වරට වෙළෙඳාම් කල මිල	88.66
වෙළෙඳාම් කල වූ ප්‍රමාණය	100
අවසන් වරට වෙළෙඳාම් කල කළ දිනය	2023 ජනවාරි 18

2023 වසර තුළ ආරම්භක ප්‍රසිද්ධ පිරිනැමුමක් හෝ අතිරේක සුරැකුම් නිකුතුවක් හරහා කිසිදු අරමුදලක් ලබා නොගන්නා ලදී.

ණය ශ්‍රේණිගතකරණය

2023 ජනවාරි මස 12 වන දින ලං.වි.ම. ජාතික දිගු කාලීන ශ්‍රේණිගතකරණය 'AA-(lka)' සිට 'B(lka), දක්වා පහත හෙළා ඇත. මෙම ශ්‍රේණිගතකරණ කාර්යය 2022 දෙසැම්බර් මස පළමුවැනි දින 'CCC' මට්ටමේ සිට 'CC' දක්වා ශ්‍රී ලංකා ස්වෛරී දිගු කාලීන දේශීය මුදල් නිකුතු ශ්‍රේණිගතකරණ මට්ටම පහත හෙළීමෙන් අනතුරුව සිදු කෙරිණි.

ආයතනික සමාජ වගකීම (CSR)

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ආයතනික සමාජ වගකීමට අදාළව සිදුකරන ලද කාර්යයන් ආයතනික සමාජ වගකීම් වාර්තාව' නම් වූ සිරසින් යුතුව පිටු අංක 63 හි දක්වා ඇත.

තිරසරභාවය

සමාජ, ආර්ථික හා පාරිසරික තිරසරභාවය පිළිබඳ නිසි සමබරතාවයක්ද පවත්වාගෙන යමින් ලං.වි.ම. සිය මෙහෙයුම් කටයුතු ඉටු කිරීමට කැපවිය. සමාජ, ආර්ථික හා පාරිසරික තිරසරභාවය සාක්ෂාත් කරගනු පිණිස වූ ලං.වි.ම. ප්‍රවේශය පිටු අංක 59 - 62 හි දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයෙහි ලා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

පවත්නා සැබෑ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි. අනු ආයතන සම්බන්ධයෙන් සලකා බලන කල, 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානයනටද අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කෙරේ.

විගණකවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ සහ 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 51 වැනි වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා ලංකා විදුලිබල මණ්ඩලයේ විගණකවරයා වේ. මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ 2023 දෙසැම්බර් 31 වන දිනට එහි අනුබද්ධිත ආයතන පිළිබඳ විගණකාධිපති වාර්තාව මෙම වාර්ථාවේ පිටු අංක 160 සිට 174 තෙක් දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහය සහ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (LKASs) අනුව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 93 සිට 110 දක්වා

පිටුවල දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැත.


මණ්ඩලය සමග සිදුකරන කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ අභිලාශයන්

මූල්‍ය ප්‍රකාශනවල 39.4 සටහනේ අනාවරණය කර ඇති ඒවා හැර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා අධ්‍යක්ෂවරුන්ට කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සඳහා සෘජු හෝ වක්‍ර අභිලාශයක් නොමැත.

පාරිශ්‍රමික කමිටුව

ලංකා විදුලිබල මණ්ඩලය පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කරන ලද රජයේ ආයතනයකි. ඒ අනුව පරිපාලන භාවිතයන් සහ පාලන ක්‍රියා පටිපාටි චක්‍රලේඛ, පනත් ආදිය මගින් පාලනය වේ. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක: PED 3/2015 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මත පදනම්ව ලංවිම අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය තීරණය කරනු ලබන බැවින් ලංවිම පාරිශ්‍රමික කමිටුවක් පැවැත්වීම අවශ්‍ය නොවේ. ඉහත සඳහන් චක්‍රලේඛය පහත https://www.treasury.gov.lk/web/public-enterprises-department-circular/section/2015 දරන ඒකීය සම්පත් නිශ්චායකය (URL) වෙත පිවිසීමෙන් නැරඹිය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් අනු-කමිටු පත්කරනු ලැබ ඇත.



සේවක දුක්ගැනවිලි කමිටුව

සේවක දුක්ගැනවිලි කමිටුව (EGC) යනු ලං.වි.ම. සේවකයන්ගේ පෞද්ගලික දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කරනු වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇති අනු කමිටුවකි.

දුක්ගැනවිලි කමිටුව ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකුගෙන් හා ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ගණනාවකගෙන්ද සමන්විත වේ.

2023 වසර සඳහා කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පහත දක්වා ඇත.

නම	ලං.වි.ම.හි දරන තනතුර	කමිටුවේ දරන තනතුර	බුර කාලය
ඩී.කේ.පී.යූ ගුණතිලක මහතා	ලං.වි.ම. උප සභාපති	සභාපති	2023 ජනවාරි මස සිට
ඊ.එස්.ජී. එදිරිසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2023 සැප්තැම්බර් මස සිට

සෙසු සාමාජිකයන් පහත පරිදි වේ;

නම	ලං.වි.ම.හි දරන තනතුර
ඉංජි. එච්.එම්.කේ.ජේ. වීරසූරිය මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - (වාණිජ හා ආයතනික-බෙ.අ. 2)
ඉංජි. ආර්.කේ.පී.එස්. ගුණතිලක මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයතික කටයුතු (ජනන අංශය)
ඉංජි. පී.ඒ.ජේ.පී.කේ. පෙරේරා මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)
ඩබ්.පී.ජී.සී.එස්. ජයලත් මිය	අතිරේක මුදල් කළමනාකරු (ආයතනික)
ඉංජි. ඩී.එම්.කේ.එම්. ප්‍රේමතිලක මහතා	ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති)
පී.ආර්. හඳපාන්ගොඩ මිය	මානව සම්පත් කළමනාකරු (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පිරිස් ශාඛාව)

කාරක සභාව 2023 වර්ෂය තුළ 05 වතාවක් නිල වශයෙන් රැස් වූ අතර ලංවිම සේවකයන්ගේ/හිටපු සේවකයන්ගේ පුද්ගලික දුක්ගැනවිලි 86ක් සමාලෝචනය කරන ලදී.

රැස්වීම්වල වාර්තා සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අතර පසුව සාමාන්‍යාධිකාරී/ලංවිම විසින් එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කිරීමට ඉක්මන් පියවර ගනු ඇත.

මණ්ඩලයේ ලේකම්වරයා මෙම අනු කමිටුවේ කැඳවුම්කරු වේ.

විනය අභියාචනා මණ්ඩලය

විනය අභියාචනා මණ්ඩලය යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවකි. ලංවිම සේවකයින්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස මෙම කමිටුව පිහිටුවා ඇත. කමිටුව 2023 මුදල් වර්ෂය තුළ නිල වශයෙන් 02 වතාවක් රැස්වී විනය කරුණු 11ක් මෙහෙයවා ඇත.

කමිටු රැස්වීම්වල වාර්තා අනුමැතිය පිණිස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලබන අතර, පසුව සාමාන්‍යාධිකාරී/ලංවිම විසින් එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගනු ඇත.

2023 වසර සඳහා කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

නම	ලංවිබ. / වෙනත් ආයතනයක දරන තනතුර	කමිටුවේ දරන තනතුර	බුර කාලය
ආචාර්ය බී. විජයරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සභාපති	2021 ඔක්තෝබර් 06 දින සිට
ඉංජි. ඩී.කේ.පී.යූ. ගුණතිලක මහතා	උප සභාපති	සාමාජික	2023 ජූනි 27 දින සිට
ජී.පී.එන්.එම්. අබේසේකර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2022 ඔක්තෝබර් 28 දින සිට
එල්.කේ.එස්.යූ. ධර්මකීර්ති මහතා	අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක	සාමාජික	2021 ඔක්තෝබර් 06 දින සිට
පී.එස්. පතිරත්න මහතා	විශ්‍රාමික අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්	සාමාජික	2018.12.07 දින සිට

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මෙම අනු කමිටුවේ කැඳවුම්කරු වේ.

විගණන කමිටුව

පාලක මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන කමිටුව, ආයතනයේ පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීමේ පුළුල් වගකීමක් දරයි. කමිටුව අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් අධීක්ෂණය කරන අතර අභ්‍යන්තර විගණනය සහ ව්‍යවස්ථාපිත විගණනය යන දෙ අංශයෙහිම කාර්යයන් අධීක්ෂණය කරයි.

සංයුතිය:

මූල්‍ය, විගණනය සහ අදාළ ක්ෂේත්‍රවල සැලකිය යුතු කුසලතා සහ පුළුල් පළපුරුද්දක් ඇති ස්වාධීන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. අභ්‍යන්තර විගණන ශාඛාවේ ප්‍රධානියා කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. මීට අමතරව, සාමාන්‍යාධිකාරී, මූල්‍ය කළමනාකරු සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයින් ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි වූහ.

2023 වර්ෂය සඳහා විගණන කමිටු සාමාජිකයින් පහත වගුවේ දක්වා ඇත.

නම	තනතුර	කමිටුවේ දරන තනතුර	බුර කාලය
එම්.ආර්.වී.ආර්. මීපුර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සභාපති	2022 ජනවාරි 11 සිට මේ දක්වා
ආචාර්ය බී. විජේරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2021 ජනවාරි 07 සිට මේ දක්වා
ආර්. වික්‍රමාරච්චි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2023 මැයි මස 30 දින දක්වා
ඊ.එස්.ජී. වීදිරසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2023 ජනවාරි මස 31 දින සිට
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාජික	2023 මාර්තු 23 දින සිට

විගණන කමිටුවේ කාර්යයන්:

මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචන කෙරෙහි අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණන සහ ව්‍යවස්ථාපිත විගණන යන දෙඅංශයෙන්ම ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සක්‍රීයව සමාලෝචනය කරන ලදී. ඔවුන්ගේ පුළුල් පළපුරුද්ද සහ ප්‍රවීණත්වය උපයෝගී කර ගනිමින් කමිටුව විසින් අවශ්‍ය අවස්ථාවලදී අමතර පාලනයන් සහ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරන ලදී.

මෙම ප්‍රවේශය අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම අරමුණු කරගත් අතර එමඟින් ආයතනය මුහුණ දෙන වංචා, දෝෂ සහ මෙහෙයුම් සහ මූල්‍ය අවදානම් ඇතිවීම සහ ඒවාහි බලපෑම අවම කෙරේ.

විගණන කමිටුව විසින් කඩිසර ලෙස අධීක්ෂණ කටයුතු සිදු කිරීම සහ උපාය මාර්ගික මග පෙන්වීම විෂයයෙහි එහි කැපවීම අවධාරණය කරමින් 2023 වර්ෂය තුළ විධිමත් රැස්වීම් හතරක් පවත්වන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම	2023 වසර තුළ විගණන කමිටු පැවැත්වූ දින			
	2023-02-28	2023-04-04	2023-09-15	2023-12-12
එම්.ආර්.වී.ආර්. මීපුර මහතා	✓	✓	✓	✓
ආචාර්ය බී. විජයරත්න මහතා	✓	✓	✓	✓
ආර්. වික්‍රමාරච්චි මහතා	✓			
ඊ.එස්.ජී. වීදිරසිංහ මහතා	✓	✓	✓	
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක මහතා	✓	✓	✓	

අවසාන වශයෙන්, අභ්‍යන්තර විගණන ශාඛාව සහ විගණන කමිටුව සාමූහිකව ආයතනික පාලන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහ මෙහෙයුම් ක්‍රියාවලීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. වගවීමේ සහ කාර්යක්ෂමතාවයේ සංස්කෘතියක් පෝෂණය කරමින් ඔවුන්ගේ සහයෝගී ප්‍රයත්නයන් නැගී එන අවදානම් සහ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ආයතනයේ ඔරොත්තු දීමේ හැකියාවට දායකත්වයක් ලබාදී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව (ඉතිරි කොටස)

කමිටුව මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කිරීම සඳහා ආයතනයේ සමස්ත රාමුව සමාලෝචනය කරයි. පවතින අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයක් සහ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරමින් කමිටුව 2023 වර්ෂයේදී සිව් වතාවක් රැස්වී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කළේ ඔවුන්ගේ පුළුල් අත්දැකීම් සහ විශේෂඥතාව භාවිතා කරමිනි.

ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ''LKAS) 24'' ප්‍රකාර අවශ්‍ය වන පරිදි ආශ්‍රිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අංක 39 සටහන තුළ විස්තර කර ඇත.

නීති සහ රෙගුලාසිවලට අනුගත වීම

අධ්‍යක්ෂවරුන් විසින් සිය දැනුම හා විශ්වාසය අනුව අදාළ කණ්ඩායම නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාවක නිරත වී නොමැති බව තහවුරු කරයි.

සිදු කිරීමට නියමිත නීති කෘත්‍යයන්

පොරොත්තු නඩු විභාග හේතුවෙන් පැන නගින අවිනිශ්චිත වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අංක 37.1 හි සඳහන් වේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයන්ට අදාළව ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇති බව මණ්ඩලය තහවුරු කරයි.

ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

මූල්‍ය වර්ෂයේ අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාලසීමාව තුළ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු ද්‍රව්‍යමය සිදුවීමක් මතු වී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

මෙහෙයුම් සම්පත් පවත්නා බව

මණ්ඩලයේ සම්පත් වැහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත්ය යන්න අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙය ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපාරයක්ය යන පදනමින් කටයුතු කර ඇත.

වාර්ෂික වාර්තාවේ අන්තර්ගතයන් ආශ්‍රිතව කොළඹ කොටස් වෙළඳපල ලැයිස්තුගතකරණ අවශ්‍යතා හා අනුගත වීම

ලැයිස්තුගත රීති අංකය	අනාවරණ අවශ්‍යතාවයන්	කොටුව / අදහස්	පිටු අංකය
7.6 (i)	මූල්‍ය වර්ෂය තුළ ආයතනයේ අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළ පුද්ගලයන්ගේ නම්	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	80-81
7.6 (ii)	වසර තුළ ආයතනයේ සහ එහි අනු ආයතනයන්හි ප්‍රධාන කටයුතු සහ එයට සිදුකරන ලද යම් වෙනස්කම් වේනම් ඒවා	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සහ විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල 12.1 සටහන	82,122
7.6 (iii)	ජන්ද බලය සහිත හා රහිත කොටස් වැඩිම සංඛ්‍යාවක් හිමි අයගේ නම් සහ ඔවුන් විසින් දරා සිටින කොටස් සංඛ්‍යාව හා එසේ දරා සිටින කොටස් ප්‍රතිශතය	අදාළ නොවේ	-
7.6 (iv)	මහජනතාව විසින් රඳවා ගැනීමේ ප්‍රතිශතය.	අදාළ නොවේ	-
7.6 (v)	එක් එක් මූල්‍ය වර්ෂයේ ආරම්භයේ සහ අවසානයේ එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කොටස් ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශයක්.	අදාළ නොවේ	-
7.6 (vi)	ආයතනයේ පුරෝකථනය කළ හැකි අවදානම් සාධකවලට අදාළ ප්‍රමාණාත්මක තොරතුරු.	අවදානම් කළමනාකරණ වාර්තාව	57 - 59
7.6 (vii)	ආයතනයේ සේවකයින්ට සහ කාර්මික සබඳතාවලට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ විස්තර.	වසර තුළ ප්‍රමාණාත්මක ගැටලු කිසිවක් සිදු නොවීය.	-
7.6 (viii)	ආයතනයේ ඉඩම් කොටස් සහ ආයෝජන දේපලවලට අදාළ ව්‍යාප්තිය, ස්ථාන, තක්සේරු කිරීම් සහ ගොඩනැගිලි ගණන.	වත්කම් කළමනාකරණ අංශය	50 - 51
7.6 (ix)	ආයතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස් ගණන	අදාළ නොවේ	-
7.6 (x)	කොටස් සුරැකුම්පත්වල එක් එක් පන්තියේ හිමිකරුවන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ මුළු වත්කම්වල ප්‍රතිශතය බෙදා හැරීමේ සැලසුම් සටහනක්.	අදාළ නොවේ	-
7.6 (xi)	අනුපාත සහ වෙළඳපල මිල තොරතුරු:		
	සැසඳිය හැකි රජයේ සුරැකුම්පත්වල පොලී අනුපාතය, ණය / කොටස් අනුපාතය, පොලී ආවරණය, කඩිනම් වත්කම් අනුපාතය	මූල්‍ය සමාලෝචනය	73
	වර්ෂය තුළ වෙළඳපල මිල සහ ඵලය (ඉහළම මිල / අඩුම මිල / අවසාන වෙළඳාම් කළ මිල	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	82
	ණය ශ්‍රේණිගත කිරීමට අදාළ යම් වෙනස්කමක් වේනම් එය	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	82
7.6 (xii)	වටිනාකම පොත් වටිනාකමට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, ආයතනයේ හෝ එහි අනුබද්ධිත ආයතනවල ස්ථාවර වත්කම්වල සහ ඉඩමේ වෙළඳපල වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම්.	අදාළ නොවේ	-
7.6 (xiii)	වසර තුළ ආයතනය පොදු නිකුතුවක්, හිමිකම් නිකුතුවක් සහ පුද්ගලික ස්ථානගත කිරීමක් හරහා අරමුදල් රැස් කර ඇත.	අදාළ නොවේ	-
7.6 (xiv)	එක් එක් සේවක කොටස් හිමිකාරීත්වය හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් තොරතුරු.	අදාළ නොවේ	-
7.6 (xv)	රීතිවල 7 වන වගන්තියේ 7.10.3, 7.10.5 (ඇ) සහ 7.10.6 (ඇ) අනුව ආයතනික පාලන භාවිතයන්ට අදාළ හෙළිදරව් කිරීම්.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	80-85
7.6 (xvi)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව කොටස්වලින් 10% හෝ ආයතනයේ මුළු වත්කම්වලින් 5% ඉක්මවන අදාළ පාර්ශ්ව ගනුදෙනු යන දෙකෙන් අඩු අගය.	විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන 39	155-156

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
ලාභ හෝ අලාභ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

	සටහන	සමූහය 2023	සමූහය 2022 ප්‍රතිප්‍රකාශිත	මණ්ඩලය 2023	මණ්ඩලය 2022 ප්‍රතිප්‍රකාශිත
ආදායම	4	679,864,385	374,626,062	606,627,159	308,457,234
ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා සහන	5	(113)	(765)	(113)	(765)
විකුණුම් පිරිවැය		(548,294,213)	(485,466,446)	(506,965,962)	(444,624,784)
දළ ලාභය / (අලාභය)		131,570,058	(110,841,149)	99,661,084	(136,168,315)
වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ	6	38,264,250	27,282,467	31,579,488	11,581,152
බෙදාහැරීමේ පිරිවැය		(193,590)	(288,296)	-	-
වෙනත් වියදම්		(9,476,759)	(8,565,929)	-	-
පරිපාලන වියදම්		(19,921,280)	(44,924,962)	(12,300,916)	(38,457,817)
මෙහෙයුම් ලාභය/ (අලාභය)		140,242,679	(137,337,869)	118,939,656	(163,044,980)
මූල්‍ය ආදායම	7.1	5,330,043	4,228,389	2,230,917	1,394,312
මූල්‍ය පිරිවැය	7.2	(66,720,448)	(46,801,012)	(59,934,893)	(41,849,854)
මූල්‍ය පිරිවැය-ශුද්ධ		(61,390,407)	(42,572,623)	(57,703,976)	(40,455,542)
බද්ධ ව්‍යාපාරයේ අලාභ කොටස	13	(8,760)	(6,373)	-	-
	-				
ශුද්ධ මූල්‍ය පිරිවැයට පසු ලාභ / (අලාභ)		78,843,514	(179,916,865)	61,235,680	(203,500,522)
ණය ස්කන්ධය බවට පරිවර්තනය වීම නිසා ඇතිවන විනිමය පාඩු	22.1	-	(94,688,683)	-	(94,688,683)
බදු පෙර ලාභය /(අලාභය)	8	78,843,514	(274,605,548)	61,235,680	(298,189,205)
ආදායම් බදු වියදම්	9.1	(5,355,752)	(1,827,397)	-	-
විලම්බිත බදු (ගාස්තු)/ ප්‍රතිවර්ථන	9.2	404,552	756,684	-	-
වර්ෂය තුල උපයන ලද ලාභය/(අලාභය)		73,892,315	(275,676,261)	61,235,680	(298,189,205)

විසර්ජනය

පරිපාලනයට හිමි අයිතිය	67,184,968	(286,992,611)
පාලනයට යටත් නොවන හිමිකම්	6,707,346	11,316,350
	73,892,315	(275,676,261)

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

		සමූහය		මණ්ඩලය	
	සටහන	2023	2022 ප්‍රතිප්‍රකාශිත	2023	2022 ප්‍රතිප්‍රකාශිත
වර්ෂය සඳහා ලාභ (අලාභය)		73,892,315	(275,676,261)	61,235,680	(298,189,205)
වෙනත් විස්තීරණ ආදායම්					
පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය		(3,407,804)	(10,948,707)	(3,154,172)	(11,058,850)
අයුගණක ලාභය/(අලාභය) මත විලම්භිත බදු වල බලපෑම		64,279	(34,876)	-	-
විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම්		(3,346,392)	8,307,720	-	
ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ)		2,754,759	411,257	-	-
ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් මත විලම්භිත බදු		(501,980)	(93,831)		
මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිතයේ වෙනස්වීම්		(914,879)	(3,172,261)		
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		68,540,298	(281,206,959)	58,081,508	(309,248,055)
විසර්ජනය					
පරිපාලනට හිමි අයිතිය		63,769,295	(295,973,740)		
පාලනයට යටත් නොවන හිමිකම්		4,771,003	14,766,781		
		68,540,298	(281,206,959)		

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

		සමූහය			මණ්ඩලය		
වත්කම්	සටහන	2023	2022 ප්‍රතිප්‍රකාශිත	ජනවාරි 1 දිනට 2022 ප්‍රතිප්‍රකාශිත	2023	2022 ප්‍රතිප්‍රකාශිත	ජනවාරි 1 දිනට 2022 ප්‍රතිප්‍රකාශිත
ජංගම නොවන වත්කම්							
දේපල පිරියත හා උපකරණ	10	993,182,643	928,207,459	872,427,093	929,741,640	894,673,623	851,903,328
අස්පෘශ්‍ය වත්කම්	11	570,863	509,747	513,347	166,018	141,626	133,997
පරිපාලිත සමාගම්වල ආයෝජන	12	-	-	-	911,813	911,813	911,813
බද්ධ ව්‍යාපාරවල ආයෝජන	13	30,544	39,304	25,677	348,606	348,606	328,606
ලැබිය යුතු මූල්‍ය කල්බදු	14	26,002,647	31,452,406	20,465,468	-	-	-
වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්	15	27,528,492	28,870,304	28,054,665	6,078,732	5,782,582	7,700,399
වෙනත් ජංගම නොවන වත්කම්	16	4,294,065	3,625,768	1,830,583	3,094,503	2,495,752	851,383
රක්ෂණ සංචිතවල ආයෝජන	17	15,111,471	12,460,350	10,657,598	15,111,471	12,460,350	10,657,598
මුළු ජංගම නොවන වත්කම්		1,066,720,725	1,005,165,338	933,974,431	955,452,782	916,814,352	872,487,124
විකුණුම් සඳහා ඇති ජංගම නොවන වත්කම්	18	76	76	76	76	76	76
ජංගම වත්කම්							
භාණ්ඩ තොග	19	110,388,129	76,310,878	74,986,599	97,213,145	67,026,536	63,926,113
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	20	126,589,356	122,392,233	82,740,177	120,183,688	65,896,565	54,695,953
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ	21	-	-	-	8,658,174	13,304,651	3,619,179
ලැබිය යුතු මූල්‍ය කල්බදු	14	412,282	688,914	825,121	-	-	-
වෙනත් ජංගම මූල්‍ය වත්කම්	15	29,546,670	25,575,581	29,922,547	2,958,920	2,358,209	2,601,739
මුදල් හා බැංකු ශේෂ	32	33,904,095	22,122,521	15,309,470	19,907,019	9,147,367	5,439,757
මුළු ජංගම වත්කම්		300,840,532	247,090,127	203,783,914	248,920,945	157,733,328	130,282,741
මුළු වත්කම්		1,367,561,333	1,252,255,542	1,137,758,421	1,204,373,803	1,074,547,756	1,002,769,941
ස්කන්ධය හා වගකීම්							
ප්‍රාග්ධනය හා ස්කන්ධය							
දායක ප්‍රාග්ධනය	22	991,430,291	865,159,371	413,054,569	991,430,291	865,159,371	413,054,569
සංචිත	23	71,624,608	63,975,736	59,080,516	48,203,517	44,077,094	41,222,600
රඳවාගත් ඉපැයීම්/(අලාභ)		(510,157,714)	(568,272,027)	(268,438,227)	(541,335,938)	(598,047,175)	(287,477,317)
මව් සමාගමේ කොටස් හිමියන්ට අදාළ හිමිකම්		552,897,185	360,863,080	203,696,858	498,297,870	311,189,290	166,799,852
පාලනයට යටත් නොවන හිමිකම		57,144,294	52,515,406	39,335,587	-	-	-
මුළු ස්කන්ධය		610,041,479	413,378,486	243,032,445	498,297,870	311,189,290	166,799,852
ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම්							
පොළී සහිත ණය හා ණය ගැනීම්	24	277,108,124	272,748,704	427,957,749	251,559,491	245,221,304	409,900,540
පාරිභෝගික තැන්පතු	25	17,080,993	16,719,938	16,299,865	17,080,993	16,719,938	16,299,865
ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම්	26	38,818,687	34,529,132	23,289,438	36,809,065	33,001,021	21,615,201
රාජ්‍ය ප්‍රදාන	27	717,603	718,372	491,359	224,894	240,578	188,347
හිවිසුම් ගත වගකීම්	28	113,049,979	108,215,342	104,566,763	107,622,267	102,613,051	99,518,157
විලම්භිත බදු	29	616,219	84,699	712,684	-	-	-
		447,391,605	433,016,187	573,317,858	413,296,711	397,795,892	547,522,110
ජංගම වගකීම්							
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	30	191,992,955	290,277,110	244,778,965	193,937,377	271,325,346	221,727,114
ගෙවිය යුතු ලාභාංශ		715,990	1,373,813	1,618,538	-	-	-
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල	31	-	-	-	33,682,665	5,706,618	5,706,616
පොළී සහිත ණය හා ණය ගැනීම්	24	112,276,326	110,989,797	71,042,881	63,888,414	87,259,844	59,743,483
ගෙවිය යුතු ආදායම් බදු		5,142,978	3,220,149	3,967,734	1,270,766	1,270,766	1,270,766
		310,128,249	405,860,869	321,408,118	292,779,222	365,562,574	288,447,979
මුළු ස්කන්ධ හා වගකීම්		1,367,561,333	1,252,255,542	1,137,758,421	1,204,373,803	1,074,547,756	1,002,769,941

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වගකීම දරයි මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ ,

සභාපති	අධ්‍යක්ෂක	සාමාන්‍යාධිකාරී	මුදල් කළමණාකරු

දිනය 11- 10 - 2024
කොළඹ

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

	සමූහය		මණ්ඩලය	
	2023	2022 ප්‍රතිප්‍රකාශිත	2023	2022 ප්‍රතිප්‍රකාශිත
මෙහෙයුම් කටයුතුවල වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය				
බදු පෙර ලාභ/(අලාභ)	78,843,515	(274,605,548)	61,235,680	(298,189,205)
ගැලපීම්				
ක්ෂය-වර්ෂය සඳහා අයවීම	37,385,427	35,918,650	34,928,235	34,004,239
ගැලපීම්	(22,285)	12,536		
පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම	(4,548,194)	(4,281,308)	(4,548,194)	(4,281,308)
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	(495,755)	(471,096)	(15,685)	(15,685)
ආයෝජන අදායම	(1,179,081)	(1,519,355)	-	-
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ)	(447,416)	58,394	(414,814)	25,654
කල්බදු පොලිය	6,685	10,747	6,685	10,747
මූල්‍ය පිරිවැය	66,713,762	46,790,269	59,928,208	41,839,107
යල්පැන ගිය භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන	866,900	(343,274)	865,136	(342,386)
මිල විචලනය සඳහා ප්‍රතිපාදන	(10,305,501)	(13,197,379)	(10,305,501)	(13,197,379)
ණයකරුවන් හානිකරණය වීම සඳහා ප්‍රතිපාදන	6,323,363	1,589,841	4,170,283	(1,578,762)
බොල් ණය කපාහැරීම	1,389,331	907,163	1,389,331	907,163
විද්‍යුත් වාහන ආරෝපණ ආදායම	(3,517)	(4,488)	(3,517)	(4,488)
බද්ධ ව්‍යාපාරවල කොටස් ලාභ/(අලාභ)	8,760	6,373	-	-
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	56,950	33,202	-	-
මූල්‍ය ආදායම	(4,141,814)	(2,702,202)	(2,230,916)	(1,394,313)
ලාභාංශ ආදායම	(2,070,058)	(516,129)	(877,507)	(274,221)
විදේශ මුදල් ලාභ හෝ අලාභ	(18,768,419)	147,754,427	(13,733,478)	144,062,716
ලැබිය යුතු මූල්‍ය කල්බදු සඳහා අදායම් ගැලපීම්	767,984	1,853,641	-	-
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම	2,045,456	1,655,664	1,688,012	1,380,133
විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය	174,174	(110,953)	174,174	(110,953)
කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය	1,503,387	863,216	1,503,387	863,216
ලාභාංශ මත රඳවා ගැනීමේ බදු වියදම්	131,626	-	131,626	
දේපල පිරියත සහ උපකරණ කපා හැරීම	2,636	-	2,636	
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)	154,237,916	(60,297,609)	133,893,781	(96,295,724)
භාණ්ඩ තොග (වැඩිවීම)/අඩුවීම	(24,488,261)	12,615,931	(20,591,243)	10,844,322
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	4,362,375	(40,494,675)	(56,289,747)	(19,323,187)
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	(99,611,637)	71,027,659	(51,357,374)	73,679,892
මෙහෙයුම් වලින් ජනිත මුදල්	34,500,393	(17,148,694)	5,655,416	(31,094,698)
ගෙවූ මූල්‍ය පිරිවැය	(66,627,645)	(45,408,340)	(59,928,208)	(40,467,431)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(1,344,710)	(1,271,929)	(1,208,315)	(942,210)
ගෙවූ ආදායම් බදු	(3,494,228)	(2,367,502)	-	-
මෙහෙයුම් කටයුතු වල යෙදවූ/කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	(36,966,190)	(66,196,465)	(55,481,106)	(72,504,338)
ආයෝජන කටයුතු වල (යෙදවූ) /කටයුතු වලින් ජනනය වූ ප්‍රවාහ				
දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	(103,515,844)	(90,242,299)	(70,477,485)	(77,900,802)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(76,970)	(57,075)	(76,970)	(57,075)
බද්ධ ව්‍යාපාරවල ආයෝජන	-	(20,000)	-	(20,000)
රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය	(2,651,120)	(1,802,752)	(2,651,120)	(1,802,752)
රක්ෂණ සංචිත අරමුදල මත ලද පොලි අදායම (Escrow)	2,754,729	1,523,707	2,754,729	1,523,707
මූල්‍ය වත්කම්වල ආයෝජන	896,393	1,425,188	-	-
පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම	-	67,500	-	-
ලද ලාභාංශ	1,938,432	957,041	745,881	715,133
ලද පොලී	3,550,448	3,417,261	727,529	531,097
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්	509,193	167,171	480,584	120,374
ගෙවූ ලාභාංශ	(1,964,614)	(5,990,339)	-	-
අයෝජන කටයුතු වල (යෙදවූ)/කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	(98,559,353)	(90,554,597)	(68,496,851)	(76,890,318)
මූල්‍ය කටයුතු වල (යෙදවූ) /කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්				
දායක ප්‍රාග්ධන ලැබීම්	126,270,920	80,000,000	126,270,920	80,000,000
පාරිභෝගික දායකත්වය	11,502,413	7,642,888	11,502,413	7,642,888
විදුලි වාහන සඳහා ඊ-කාර්ඩ් පෙර ගෙවීම්	3,972	4,488	3,972	4,488
ආර්ඒඑසීපී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම්	1,423	8,986	1,423	8,986
පාරිභෝගික තැන්පතු ආපසු ගෙවීම්	(153,864)	(341,275)	(153,864)	(341,275)
පාරිභෝගික තැන්පතු ලැබීම්	514,919	761,348	514,919	761,348
කල්බදු ණයකරු ශුද්ධ සංචරන/(කල්බදු ගෙවීම්)	(254,580)	(147,740)	(140,679)	(44,776)
පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලද මුදල්	84,350,738	103,686,181	51,047,908	78,997,829
පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම්	(72,185,511)	(47,772,310)	(50,236,608)	(35,705,960)
වරණීය කොටස් නිදහස් කිරීම	-	(1,657,331)	-	-
මූල්‍ය කටයුතු වල (යෙදවූ)/ කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	150,050,430	142,185,235	138,810,405	131,323,528
මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	14,524,887	(14,565,827)	14,832,449	(18,071,129)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ	(17,603,634)	(3,037,807)	(26,773,096)	(8,701,967)
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ	(3,078,747)	(17,603,634)	(11,940,647)	(26,773,096)

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සමුහය	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ක්ෂය සංචිත	වත්කම් ප්‍රතිස්ථාපන සංචිත
2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	413,054,569	19,669,107	26,000	88,526
කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම්				
2022 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	413,054,569	19,669,107	26,000	88,526
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	-	-	-	-
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය)	-	-	-	-
ඕසීඇයි ආයෝජන වල සධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ)	-	-	-	-
හුවමාරු තුල්‍ය සංචිත	-	2,779,173	-	-
මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිත				
මුළු විස්තීර්ණ ආදායම	-	2,779,173	-	-
ස්කන්ධය ලෙස පරිවර්තිත ණය	251,629,768	-	-	-
පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය	120,475,034	-	-	-
CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන	80,000,000	-	-	-
ක්ෂය සංචිතයට මාරුකිරීම්	-	-	1,000	-
පාරිභෝගිකයන්ගෙන් ලද පොළි	-	8,986	-	-
රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම	-	-	-	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම්	-	-	-	-
වත්කම් ප්‍රතිෂ්ඨාපන සංචිතය	-	-	-	-
සංවර්ධන සංචිත	-	-	-	-
අධිභාර	-	-	-	-
ලාභාංශ ගෙවීම් - ලෙකෝ	-	-	-	-
උප සමාගම් කොටස් නිකුත් කිරීම	-	-	-	-
ලාභාංශ ගෙවීම් - විල්ටවිල්	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	865,159,371	22,457,266	27,000	88,526
2023 ජනවාරි 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	865,159,371	22,457,266	27,000	88,526
වර්ෂය සඳහා ලාභ/(අලාභ)	-	-	-	-
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය)	-	-	-	-
ඕසීඇයි ආයෝජන වල සධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ)	-	-	-	-
හුවමාරු තුල්‍ය සංචිත	-	(1,092,764)	-	-
මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිත	-	-	-	-
මුළු විස්තීර්ණ ආදයම	-	(1,092,764)	-	-
ස්කන්ධය ලෙස පරිවර්තිත ණය	-	-	-	-
ආයෝජන සංචිත	-	-	-	-
රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම	-	-	-	-
CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන	126,270,920	-	-	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම්	-	-	-	-
ක්ෂය සංචිතයට මාරුකිරීම්	-	-	1,000	-
පාරිභෝගිකයන්ගෙන් ලද පොළි	-	1,423	-	-
අධිභාර	-	-	-	-
සංවර්ධන සංචිත	-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම	-	-	-	-
ලාභාංශ ගෙවීම් - ලෙකෝ	-	-	-	-
ලාභාංශ ගෙවීම් - විල්ටවිල්	-	-	-	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	991,430,291	21,365,925	28,000	88,526

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

ආයෝජන සංවිත	ස්වයං රක්ෂණ සංවිත	සාධාරණ අගය සංවිත	සංවර්ධන සංවිත	මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංවිත	රඳවාගත් ඉපයීම්	පාලනයට යටත් නොවන කොටස් හිමිකම	එකතුව
10,001,863	22,590,245	6,667,451	37,325	-	(261,521,211)	39,335,587	249,949,462
				-	(6,917,017)	-	(6,917,017)
10,001,863	22,590,245	6,667,451	37,325	-	(268,438,227)	39,335,587	243,032,445
-	-	-	-	-	(286,992,611)	11,316,350	(275,676,261)
-	-	-	-	-	(11,019,462)	35,769	(10,983,693)
-	-	171,547	-	-	-	145,879	317,426
-	-	-	-	-	-	5,528,547	8,307,720
-	-	-	-	(912,497)	-	(2,259,764)	(3,172,261)
-	-	171,547	-	(912,497)	(298,012,073)	14,766,781	(281,207,069)
-	-	-	-	-	-	-	251,629,768
-	-	-	-	-	-	-	120,475,034
-	-	-	-	-	-	-	80,000,000
-	-	-	-	-	(1,000)	-	-
-	-	-	-	-	-	-	8,986
-	1,523,707	-	-	-	-	-	1,523,707
-	1,320,803	-	-	-	(1,320,803)	-	-
-	-	-	-	-	-	-	-
-	-	-	2,500	-	(2,500)	-	-
-	-	-	-	-	(511,782)	(461,498)	(973,280)
-	-	-	-	-	14,359	14,280	28,639
-	-	-	-	-	-	67,500	67,500
-	-	-	-	-	-	(1,207,244)	(1,207,244)
10,001,863	25,434,755	6,838,998	39,825	(912,497)	(568,272,027)	52,515,406	413,378,486
10,001,863	25,434,755	6,838,998	39,825	(912,497)	(568,272,027)	52,515,406	413,378,486
-	-	-	-	-	67,184,968	6,707,346	73,892,314
-	-	-	-	-	(3,261,625)	(81,901)	(3,343,526)
-	-	1,203,205	-	-	-	1,049,572	2,252,777
-	-	-	-	-	-	(2,253,627)	(3,346,391)
-	-	-	-	(264,490)	-	(650,388)	(914,878)
-	-	1,203,205	-	(264,490)	63,923,344	4,771,003	68,540,298
-	-	-	-	-	(3,676,500)	-	-
3,676,500	-	-	-	-	-	-	-
-	2,754,729	-	-	-	-	-	2,754,729
-	-	-	-	-	-	-	126,270,920
-	1,369,269	-	-	-	(1,369,269)	-	-
-	-	-	-	-	(1,000)	-	-
-	-	-	-	-	-	-	1,423
-	-	-	-	-	(34,344)	(49,525)	(83,869)
-	-	-	-	-	-	-	-
-	-	-	-	-	(11,118)	(22,499)	(33,617)
-	-	-	-	-	(716,800)	-	(716,800)
-	-	-	-	-	-	(70,091)	(70,091)
13,678,363	29,558,753	8,042,203	39,825	(1,176,987)	(510,157,714)	57,144,294	610,041,479

විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

මණ්ඩලය	දායක ප්‍රාග්ධන	අනෙකුත් ප්‍රාග්ධන සංචිත	ආර්.එච්.සී.පී. සංචිත	ණය නිදහස් කිරීමේ සංචිතය	ක්ෂය සංචිතය	ස්වයං රක්ෂණ සංචිතය	රඳවාගත් ඉපයීම්	එකතුව
2021 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	413,054,569	165,446	1,009,797	17,447,062	26,000	22,574,295	(280,560,300)	173,716,869
කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම්							(6,917,017)	(6,917,017)
2022 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	413,054,569	165,446	1,009,797	17,447,062	26,000	22,574,295	(287,477,317)	166,799,852
වර්ෂය සඳහා ලාභ /(අලාභ)	-	-	-	-	-	-	(309,248,054)	(309,248,054)
CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන	80,000,000	-	-	-	-	-	-	80,000,000
පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය	120,475,034	-	-	-	-	-	-	120,475,034
ස්කන්ධය ලෙස පරිවර්තිත ණය	251,629,768	-	-	-	-	-	-	251,629,768
රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම	-	-	-	-	-	1,523,707	-	1,523,707
ක්ෂය සංචිතයට මාරුකිරීම්	-	-	-	-	1,000	-	(1,000)	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම්	-	-	-	-	-	1,320,803	(1,320,803)	-
පාරිභෝගිකයින්ගෙන් ලද පොළී	-	-	8,986	-	-	-	-	-
2022 දෙසැම්බර් මස 31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	865,159,371	165,446	1,018,783	17,447,062	27,000	25,418,805	(598,047,175)	311,189,293
2023 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	865,159,371	165,446	1,018,783	17,447,062	27,000	25,418,805	(598,047,175)	311,189,293
වර්ෂය සඳහා ලාභ /(අලාභ)	-	-	-	-	-	-	58,081,507	58,081,507
CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන	126,270,920	-	-	-	-	-	-	126,270,920
රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම	-	-	-	-	-	2,754,729	-	2,754,729
ක්ෂය සංචිතයට මාරු කිරීම්	-	-	-	-	1,000	-	(1,000)	-
ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම්	-	-	-	-	-	1,369,269	(1,369,269)	-
පාරිභෝගිකයින්ගෙන් ලද පොළී	-	-	1,423	-	-	-	-	1,423
2023 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	991,430,291	165,446	1,020,206	17,447,062	28,000	29,542,803	(541,335,938)	498,297,870

පිටු අංක 93 සිට 159 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

1.0 ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

1969 අංක: 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත. "කෙසේ වෙතත්, 2024 ජුනි 27 දින සහතික කරන ලද 2024 අංක 36 දරන පනතේ විධිවිධාන අනුව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී."

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (මණ්ඩලය) සහ එහි සියළුම අනුබද්ධ සමාගම් වලින් සමන්විත වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

මණ්ඩලය

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, සඵලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

1.3.1 පරිපාලිතයන්

අ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිල දී ගැනීම හා එසේ මිලදී ගත් විදුලිය ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුවේ පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහාශ්‍රිත හා කාර්මික පාරිභෝගිකයන්ට සිල්ලරට විකිණීමයි. කණ්ඩායමේ උපපරිපාලිත සමාගම් විදුලි මීටර නිෂ්පාදනය හා වෙළඳාම ඇතුළුව විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ නිරතව සිටිති.

ආ) සීමාසහිත එලට්එල් හෝල්ඩින්ස් සමාගම

වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ සමූහයට අයත් සමාගම්හි ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගික ආයෝජනයන් සිදු කිරීමයි.මෙම පරිපාලිතයන් විදුලි උත්පාදනය ,බලශක්ති උත්පාදනයට අදාළ යටිතල පහසුකම් සැපයීම, තාරාපැවි සහ පෝෂක කුළුණු නිෂ්පාදනය කිරීම සහ ගැල්වනයිස් කිරීමේ කටයුතු වල නිරත වෙති.

ඇ) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා ගෙන්දගම් ප්‍රමාණය අඩු උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

ඈ) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ කටයුතු වල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලිබල බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම, මීටර් පෙට්ටි නිෂ්පාදනය කිරීම සහ මණ්ඩලයේ අවශ්‍යතා සඳහා මිනිස් බල සේවා සැපයීමයි.

කෙසේ වෙතත්, වත්මන් වර්ෂය තුළ සමාගම මීටර් ආවරණ නිෂ්පාදනය සඳහා වන ව්‍යාපෘතියක නිරත වී ඇත. ඒ සඳහා සමාගම ගලිගමුව ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක් ඉදිකර දැනට වාණිජ කටයුතුවල නිරතව සිටී.

1.3.2 බද්ධ ව්‍යාපාරය

සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික පද්ධතියට විදුලිබලය උත්පාදනය කර විකිණීමේ අරමුණ සහිතව සමාගම ස්ථාපිත කරන ලදී. සමාගම මේ වන විට ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා ඇතත් සාම්පූර්හි මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති බලාගාරය පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

1.4 පරිපාලකය සහ මණ්ඩලයෙහි අවසන් භාරකාරිත්වය

මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව ශ්‍රී ලංකා ආණ්ඩුව, ලංකා විදුලිබල මණ්ඩලයේ මවු අස්ථිත්වයත් අවසන් පාලන පාර්ශවයත් වනු ඇත.

1.5 නිකුතුව සඳහා බලය පැවරුනු ලැබූ දිනය

2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2024.02.19 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව අනුමැතිය ලබාදී ඇත.

2.0 පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ අගයමත ගනනය කරනු ලබන මූල්‍ය වත්කම් වන, ආදායම් ප්‍රකාශනය තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හා විස්තීරණ අදායම තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හැරුනු විට සමුහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය වෙතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන අතර වෙනත් අගයන් හැර අනෙක් සියලුම විටිනාකම් ලඟම ඇති දහස දක්වා (රු. 1000) දක්වා වටයා ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් පෙර කාලයට සාපේක්ෂව සංසන්දනාත්මක තොරතුරු සපයයි. මීට අමතරව, පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සිදුවන වෙනස් වීමකදී හෝ පෙර කාලච්ඡේදයට බලපෑම් ඇති වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීම අවශ්‍ය වන විට, සමූහය විසින් පූර්ව කාලසීමාව ආරම්භය වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ අතිරේක ප්‍රකාශයක් ඉදිරිපත් කරයි. සටහන 34 හි දක්වා ඇති හේතු නිසා 2022 ජනවාරි 01 දිනට අතිරේක මූල්‍ය ප්‍රකාශයක් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරේ.

2.2 අනුකූලතා ප්‍රකාශනය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සමන්විත වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ අදායම් ප්‍රකාශනය මූල්‍ය තත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සකස් කරනු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූලවය

2.3 අඛණ්ඩ පැවැත්ම

අඛන්ඩ පැවැත්මක් ලෙස සමූහය නොකඩවා පවත්වා ගෙන යෑමේ සමූහයේ හැකියාව ගැන අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරුවක් කර තිබෙන අතර, පහත සඳහන් කරුණු හැර ඈවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු නැවැත්වීමට ඔවුහු අදහස් නොකරයි.

අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙලදනවි සමාගම

සීමාසහිත හෙලදනවි සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්සන් කරන ලද 2003 මැයි මස 09 දිනැති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් මස 08 දින ඉකුත් වී තිබුණි. ආයතනයේ දෘෂ්ඨි කෝණය අනුව ගිවිසුම කල් ඉකුත්වීමත් සමග ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑම ගැන සැළකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවයක් තිබේ.

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමේ ආයතනයේ හැකියාව ගැන වාර්තා කරන දිනය වන විට තක්සේරුවක් අධ්‍යක්ෂකවරුන් විසින් කර තිබෙන අතර, ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන පවත්වා ගෙන යෑමට අස්ථිතියට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් තිබෙන බව ඔවුහු තීරණය කර තිබේ. එම නිසා හෙලදනවි සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුව කටයුතු කිරීම උචිත නොවේ.

අඛණ්ඩ පැවැත්ම - ලංකා ඉන්ඩස්ට්‍රයල් ප්‍රඩක්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම

2015 නොවැම්බර් මස 01 දින සිට මෙහෙයුම් නවත්වා සීමාසහිත වල් ටී වල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම වෙත සිය මෙහෙයුම් පැවරීමට අධ්‍යක්ෂකවරුන් තීරණයකර තිබේ. එම නිසා සීමාසහිත වල් ටී වල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුගමනය කර නොමැත.

අඛණ්ඩ පැවැත්ම ශ්‍රී ලංකා එනජීස් එච්. ආර් (පුද්ගලික) සමාගම

මෙම සමාගමේ බහුතරයක් වූ මිනිස්බල සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථීර සේවකයින් ලෙස පත් කරන ලද අතර එම තීරණයත් සමග මෙම සමාග මේ ආදායම විශාල ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් වාර්තාකරන දිනය වන විට සමාගම සමඟ කුමක් කිරීමට අදහස් කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් කිසිදු තීරණයක් ගෙන නැති අතර ඈවර කිරීමට කිසිදු අදහසක් නොමැති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම උදෙසා බලපෑමක් නොමැත්තේය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.4 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ ඉදිරිපත් කිරීමකට හා වර්ථමාන වර්ෂය සමග සැසඳීමට හැකිවන පරිදි පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර ඇත.

2.5 ඒකාබද්ධ කිරීමේ පදනම

සමූහයේ සහ එහි පරිපාලිතයන්හි 2023 දෙසැම්බර් මස 31 දිනට අදාළ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට හෝ ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ආයෝජකයා කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව තුළින් ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව යන සාධක මත පාලනය බලය ලබා ගත හැකිය. විශේෂයෙන් සමූහය සතුව පහත දැක්වෙන බලය ඇති විට පමණක් ආයෝජක පාලනය කෙරෙයි.

- ආයෝජක සම්බන්ධයෙන් අයිතියක් තිබේ නම් (එනම්, ආයෝජකගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීමට ප්‍රවර්තන හැකියාව ලැබෙන පවත්නා අයිතීන්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා අදාල විචල්‍ය ප්‍රතිලාභ වලට අනාවරනය හෝ අයිතීන් ආවේදනය කිරීම සම්බන්ධයෙන් වන අයිතීන්
- එහි ලාභයන්ට බලපෑම් කිරීම සඳහා ආයෝජක කෙරෙහි සමූහයට ඇති හැකියාව

  සාමාන්‍යයෙන් ඡන්දය දීමේ බහුතර අයිතීන් තිබීම මගින් පාලනයක් පවත්වා ගෙන යා හැකි බවට පූර්ව නිගමනයක් පවතී. මෙම පූර්ව නිගමනය තහවුරු කිරීමට සහ ආයෝජකයෙකු සතු ඡන්දය දීමේ හෝ වෙනත් සමාන අයිතිවාසිකම් බහුතරයට වඩා අඩු ප්‍රමාණයක් සමූහයට ඇති විට පහත දක්වා ඇති සියළු සාධක සැලකිල්ලට ගනීමින් අයිතිය පිළිබඳ තක්සේරුවක් සිදුකල යුතුය
- වෙනත් ඡන්ද හිමියන් සමග වන ආයෝජකගේ ගිවිසුම් ගත විධිවිධාන
- වෙනත් ගිවිසුම්ගත විධිවිධාන තුලින් පැන නගින අයිතීන්
- සමූහයේ ඡන්ද අයිතීන් හා විභව්‍ය ඡන්ද අයිතීන්

පරිපාලිතයන්ගේ තොරතුරු පහත දැක්වේ.

පරිපාලිත සමාගමේ නම	සංස්ථාගත කරන ලද රට	ආයතනය සතු ප්‍රතිශතය
සීමාසහිත එල්ටීවිල් හෝල්ඩින්ග්ස් (LTL)	ශ්‍රී ලංකාව	63%
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO)	ශ්‍රී ලංකාව	55.2%
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC)	ශ්‍රී ලංකාව	60%
සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම (SLE)	ශ්‍රී ලංකාව	100%
බද්ධ ව්‍යාපාරයේ නම	**සංස්ථාගත කරන ලද රට**	**ආයතනය සතු ප්‍රතිශතය**
සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම (TPCL)	ශ්‍රී ලංකාව	50%

සීමාසහිත එල්ටීවිල් හෝල්ඩින්ස් සමාගමේ පහත සඳහන් උප පරිපාලිත සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කර ඇත.

පරිපාලිත සමාගමේ නම	සංස්ථාගත කරන ලද රට
සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම	සිංගප්පූරුව
සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම	බංගලාදේශය
සීමාසහිත ලක්දනවි බංගලා පවර් සමාගම	බංගලාදේශය
සීමාසහිත ලක්දනවි සමාගම (ශාඛා කාර්යාලය)	බංගලාදේශය
සීමාසහිත ලක්දනවි සමාගම (ශාඛා කාර්යාලය)	නේපාලය
සීමාසහිත මැකරිගාඩි හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම	නේපාලය
සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච් ගියර් (පුද්ගලික) සමාගම	ඉන්දියාව
ෆෙනී ලංකා පුද්ගලික සමාගම	බංගලාදේශය
ඉන්ෆාරා හා ඉංජිනේරු (පුද්ගලික) සමාගම	බංගලාදේශය

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මාස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ස් සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යන සමාගම් වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වුවද එම සමාගම්වල දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ පරමාර්ථය මත විගණක වරුන් විසින් සහතික කර පිලියෙල කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල මුළු ලාභ/අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශන වල ඇතුළත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකරුවන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී, බාහිර කොටස්කරුවන්ට අදාළ ලාභ හෝ අලාභ අනුපාතිකයන් පාලනයට යටත් නොවන හිමිකමයන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වල සියලු වත්කම් හා වගකීම්, මූල්‍ය තත්ත්ව පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාගම්වල බාහිර කොටස් හිමියන්ට අදාළ වත්කම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පාලනයට යටත් නොවන හිමිකම් ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ඉවත් කරණු ලැබේ.

පාලනය ගිලිහීයාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදු වන වෙනස් වීමක් ස්කන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරණු ලැබේ. පරිපාලිත සමාගමක පාලනය සමූහයෙන් ගිලිහී ගියහොත්, එය

- පරිපාලිත සමාගමෙහි (කීර්තිනාමය ද ඇතුළු) වත්කම් සහ වගකීම් තවදුරටත් ගිණුම්වල හඳුනා නොගනියි
- පාලනයට යටත් නොවන හිමිකම් හී ධාරණ අගය ගිණුම්වල හඳුනා නොගනියි
- ස්කන්ධය තුල වාර්ථා කර නොගෙන ඇත. සමුච්චිත පරිවර්ථන වෙනස්කම් තවදුරටත් ගිණුම්වල හඳුනා නොගනියි
- ලද ප්‍රතිශ්ධාවේ සාධාරණ අගය ගිණුම්වල හඳුනා ගනියි
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනා ගනියි
- ලාභ/අලාභයන්හි අතිරික්ත/ඌණතා හඳුනා ගනියි
- වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හඳුනා ගෙන ඇති මව් සමාගමේ කොටස් සුදුසු පරිදි ලාභ/අලාභ යටතේ හෝ රඳවාගත් ඉපැයීම් යටතේ නැවත වර්ගීකරණය කිරීම

පාලනයට අදාල අංග තුනෙන් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් තිබේ දැයි කරුණු හා හේතූන් මගින් පෙන්නුම් කරන්නේ නම්, ආයෝජක පාලනය කරනවා ද නැද්ද යන්න සමූහය විසින් නැවත තක්සේරු කරණු ලබයි. පාලිත සමාගම ඒකාබද්ධ කිරීම ඇරඹෙනුයේ පාලිතය කෙරෙහි සමූහය විසින් පාලනය ලබා ගන්නා විට වන අතර, පාලිත සමාගම කෙරෙහි පාලනය සමූහයට අහිමි වන විට එය නවතී. සමූහය විසින් පාලනය ලබා ගන්නා දිනයේ සිට සමූහය විසින් පාලිත සමාගම පාලනය කිරීම නවතිනතෙක්, වසර තුළදී ලබාගත් හෝ බැහැර කළ පාලිත සමාගමක වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වේ.

පාලනයේ නිරත නොවන පාර්ශවයට ඌන ශේෂයක් තිබුන ද, ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සෑම අංගයක්ම ආරෝපණය කරනුයේ

සමූහයේ මව් සමාගමේ සම කොටස් දරන්නන් හා පාලනය නොකරන පාර්ශවයන් මතය. ඒකාබද්ධ කිරීමේදී සමූහය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ නම්, සමූහයේ සාමාජිකයින් අතර ගනුදෙනු වලට අදාළ වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම්, වියදම් හා මුදල් ප්‍රවාහ ගැන මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය විට ගලපනු ලැබේ. පාලනයේ අහිමිවීමකින් තොරව පරිපාලිත සමාගමේ අයිතිවාසිකම් ලැදියාවේ වෙනසක් ගිණුම් ගත කරනුයේ ස්කන්ධ ගනුදෙනුවක් වශයෙනි.

පාලිත සමාගමක් සම්බන්ධයෙන් පාලනය සමූහය වෙතින් ගිලිහී ගියහොත්, එය විසින් අදාළ වත්කම් (කීර්ති නාමය ඇතුලුව), වගකීම්, පාලනය නොවන ලැදියාවන් හා සමකොටස් වල වෙනත් අංගයන් පිළිගනු ලබන අතර, ලාභයක් හෝ පාඩුවක් වශයෙන් වූ ඕනෑම ප්‍රතිපලයක් ලාභයක් හෝ පාඩුවක් වශයෙන් පිළිගනු ලැබේ. රඳවා ගන්නා යම් ආයෝජනයක් සාධාරණ වටිනාකමක් මත පිළිගනු ලැබේ.

2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් සෑම වසරක් සඳහාම මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ වේ.

2.6.1 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

මණ්ඩලය සිය මූල්‍ය තත්වය ප්‍රකාශනයෙහි වත්කම් හා බැරකම් ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව ඉදිරිපත් කරයි. පහත අවස්ථාවන්හීදී වත්කමක් ජංගම වත්කම් ලෙස හඳුනාගනී.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී උපලබ්ධි කිරීමට විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන වත්කම්
- වෙළඳාම සඳහා තබා ඇති වත්කම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ධි කර ගැනීමට අපේක්ෂා කෙරෙන වත්කම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් පසු හුවමාරු කිරීමට හෝ වගකීමක් පියවීමට භාවිතා කිරීමට හෝ අපේක්ෂා නොකරන මුදල් හෝ මුදල් හා සමාන දෑ

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත

පහත අවස්ථාවන්හීදී වගකීමක් ජංගම වගකීමක් ලෙස හඳුනාගනී.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී ගෙවා නිදහස් කිරීමට අපේක්ෂා කරන වගකීම්
- වෙළඳාම සඳහා තබා ඇති වගකීම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත ගෙවා නිදහස් කල යුතු වගකීම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් වත් වගකීම් පියවීම කල් දැමීමට හැකියාවක් නොමැති වගකීම්

අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

විලම්භිත බදු වත්කම් සහ වගකීම් ජංගම නොවන වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

2.6.2 ව්‍යාපාර සංයෝජනය, පාලනය යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම හා කීර්තිනාමය

ව්‍යාපාර සංයෝජනය අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා විටක කලින් පැවති ඕනෑම හිමිකම් අයිතියක් විය ලබා ගත් දින පවතින සාධාරණ අගයෙන් නැවත මනිනු ලබන අතර එයින් ලැබෙන ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් පිළිගනු ලැබේ.

ව්‍යාපාර සංයෝජනයන්, අත්පත් කරගැනීමේ ක්‍රමය මත ගිණුම්ගත කරයි. අත්පත් කරගැනීමේ පිරිවැය, අත්පත් කරගන්න දිනට, සාධාරණ අගය මත ගණනය කරන ලද මාරු කල පිරිවැයත් අත්පත් කරගන්නගේ පාලනයට යටත් නොවන හිමිකමෙහිත් එකතුව වේ. සෑම ව්‍යාපාර සංයෝජනයක් සඳහාම, පාලනය කල නොහැකි හිමිකමේ වටිනාකම සාධාරණ අගයට හෝ අත්පත් කරගන්නා සතු හදුනාගත හැකි වත්කම් වලට සමානුපාතික අගයකට අනුව මැනීමට, සමූහයට තීරණය කල හැකිය. අත්පත් කර ගැනීම්දී දරනු ලබන පිරිවැය පරිපාලන වියදම් යටතට ඇතුළත් කෙරේ.

සමූහය ව්‍යාපාරයක් අත්පත් කර ගත් විට, එය සතු මූල්‍ය වත්කම් හා වගකීම් ගිවිසුමේ කොන්දේසි, ආර්ථික තත්වයන් සහ අත්පත් කර ගත් දිනයේදී අදාළ කොන්දේසි වලට අනුකූලව සකස් කරගන්නා ලද උපකල්පන මත සුදුසු පරිදි වර්ගීකරණය සහ තක්සේරුකිරීම් කරනු ලැබේ.

කීර්තිනාමය ආරම්භයේදී පිරිවැයට මනිනු ලබන අතර එය හඳුනා ගතහැකි වත්කම් හා දරන ලද වගකීම් වල ශුද්ධ අගයට වඩා පාලනයට යටත් හිමිකමෙහි හා මාරු කරනලද ප්‍රතිලාභයෙහි එකතුවට වඩා වැඩි වූ වටිනාකමයි. අත්පත් කරගත් ශුද්ධ වත්කම් වල සාධාරණ අගය ගෙවනලද අගයට වඩා වැඩිනම්, එම ලාභය ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ව්‍යාපාරය අත්කර ගැනීමෙන් ලබාගත් ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකම ගෙවන ලද අගයට වඩා වැඩි නම්, සමූහය විසින් අත්පත් කරගත් සියළුම වත්කම් නිවැරදිව හඳුනාගෙන තිබේ දැයි නැවත තක්සේරු කරනු ලබන අතර වගකීම් භාරගෙන සියළු දේ මැන බැලීම සඳහා භාවිතා කල ක්‍රියාපටිපාටිය නැවත සමාලෝචනය කරයි. නැවත තක්සේරු කිරීම මඟින්ද ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකමට මාරු කරන ලද සමස්ථ වටිනාකමට වඩා වැඩිපුර ඇත්නම්,එය ලාභය ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ.

මූලික හදුනාගැනීමෙන් පසු, කීර්තිනාමය මැනීම සඳහා පිරිවැයෙන් සමුච්චිත හාණිකරන පාඩු අඩුකරනු ලැබේ. හාණිකරන පරීක්ෂාව සිදුකිරීමේදී අත්පත් කරගත් තැනැත්තාගේ වෙනත් වත්කම් හෝ වගකීම් එම එක් එක් ඒකකයන් සඳහා පවරා නැතත්, ව්‍යාපාර සංයෝජනයක් තුළින් ලබා ගත් කීර්තිනාමය, අත්පත් කර ගත් දිනයේ සිටම, සංයෝජනයේ ප්‍රතිලාභ ඇති සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක සඳහා වෙන් කරනු ලැබේ.

මුදල් උත්පාදන ඒකකයක් සඳහා කීර්තිනාමය වෙන්කර ඇති විටක එම ඒකකය තුළ ඇති මෙහෙයුම් කොටසක් බැහැර කරනු ලැබුවහොත්, බැහැර කිරීමේ ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී මෙහෙයුම් ඒකකයට අදාළ කීර්තිනාම කොටසද ධාරණ අගයට ඇතුලත් කරනු ලබයි. මෙම තත්වය තුළ බැහැර කළ කීර්තිනාමයේ වටිනාකම මනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුමේ අගය හා මුදල් උත්පාදන ඒකකයේ රඳවා ගත ප්‍රමාණයේ වටිනාකමට සාපේක්ෂවය.

2.6.3. බද්ධ ව්‍යාපාරවල ආයෝජන

බද්ධ ව්‍යාපාරයක් යනු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් සම්බන්ධයෙන් බද්ධ පාලන අයිතිවාසිකම් ඇති බද්ධ සංවිධාන වර්ගයකි. බද්ධ පාලනයක් යනු අදාල ක්‍රියාකාරකම් ගැන විලබෙන්නාවූ තීරණ සම්බන්ධයෙන් පාලනය බෙදා හදා ගන්නා පාර්ශවයන් අතර ඒකමතික කැමැත්තක් අවශ්‍ය වන්නාවූ ගිවිසුම්ගත එකඟතාවයක් පවතින සංවිධානයක් වේ. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සාමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලය හා සීමාසහිත NTPC සමාගම අතර වූ බද්ධව පාලනය වන ආයතනයකි. බද්ධ පාලනය පිලිබඳ තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු පරිපාලිත සමාගම් පාලනය කෙරෙහි ගනු ලබන තීරණයට සමානය.

සිය බද්ධ ව්‍යාපාරයේ මණ්ඩලයේ ආයෝජන ගණනය කරනුයේ සමකොටස් ක්‍රමවේදය යොදා ගනිමිනි.සමකොටස් ක්‍රමවේදය යටතේ බද්ධ ව්‍යාපාර ආයෝජන මුලදී හදුනාගන්නේ පිරිවැය මතය. අත්පත් කර ගැනීමේ දිනයේ සිට පවතින්නා වූ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්වලින් මණ්ඩලයේ කොටස් වල වෙනස්කම් හදුනා ගැනීම පිණිස ආයෝජනයේ ධාරණ වටිනාකම ව්‍යාපාරයට අදාළව (carrying amount) ගලපනු ලැබේ.බද්ධ ව්‍යාපාරයට අදාල කීර්ති නාමය ආයෝජනයේ ධාරණ වටිනාකමෙහි අඩංගු අතර අඩු කිරීම සඳහා තනි තනිව පරීක්ෂා නොකරේ.බද්ධ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලවල මණ්ඩලයේ කොටස අදායම් ප්‍රකාශයේ පිලිඹිබු වේ. ආයෝජකයාගේ වෙනත් විස්තීරණ අදායම් වෙනස්කම් මණ්ඩලයේ වෙනත් විස්තීරණ අදායම් කොටස් වශයෙන් ඉදිරිපත් කෙරේ.

මෙයට අමතරව බද්ධ ව්‍යාපාරයේ සමකොටස් වල සෘජුව හදුනාගන්න වෙනසක් සිදුව ඇත්නම් සමකොටස් වල වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශයේ වෙනස්වීම්වලට සිය කොටස මණ්ඩලය විසින් අදාල පරිදි හදුනා ගනී. බද්ධ ව්‍යාපාරය ගැන වූ උනන්දුවේ ප්‍රමාණය කොතෙක්ද යත් මණ්ඩලය හා බද්ධ ව්‍යාපාරය අතර වූ ගනුදෙනු වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ හා පාඩු ඉවත්කරනු ලැබේ. මණ්ඩලයට අදාල බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස ලාභ හෝ පාඩු ලාභ අලාභ හා සුළු කොටස් හිමියන්ගේ බද්ධ ව්‍යාපාරයට ඇති ලැදියාව නියෝජනය කරමින් ලාභ පාඩු ප්‍රකාශණයේ මුහුණත පෙන්නුම් කරයි.

2.6.4 විදේශ විනිමයන් පරිවර්ථනය විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන්

අ) ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල

සමුහයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙන්නේ ආයතනයේ ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මුදල් වශයෙන් සැලකෙන ''ශ්‍රී ලංකා රුපියල්'' වලිනි.

ආ) ගනුදෙනු හා ශේෂයන්

විදේශ විනිමය ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ගනුදෙනු සිදු වන දිනයන්හි බල පවත්නා විනිමය අනුපාත යොදා ගනිමින් ව්‍යවහාරික මුදලින් වාර්තා කරයි. විදේශ මුදල් වල සඳහන් මුදල් වත්කම් හා බැරකම් වාර්තා කරන දිනයේදී පවතින ස්ථානීය අනුපාතයට අනුව නැවත ව්‍යවහාර මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් ලාභ හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ.

චෙතිහාසික පිරිවැය අනුව විදේශ මුදල් වලින් මනිනු ලබන මුදල් නොවන අයිතමයන් මුල් ගනුදෙනු සිදු වූ දිනයේ පැවති විනිමය අනුපාත උපයෝගී කරගනිමින් පරිවර්තනය කෙරේ. මුදල් නොවන අයිතමයන්හි පරිවර්තනයෙන් මතුවන ලාභය හෝ අලාභය පරිවර්තනන වෙනස ඇති කිරීමට හේතු වූ අයිතමයේ ලාභය හෝ අලාභය සමඟ පිළිගැනේ (වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභ ප්‍රකාශය තුළින් ලාභ හෝ පාඩු පිළිගත් අයිතමයන්හි පරිවර්තවන වෙනස්කම්) නැතහොත් පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභයෙන් හෝ අලාභය තුළින් ද පාඩු පිළිගැනේ).

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වගන්තියේ 06 වන උපවගන්තිය යටතේ විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රාග්ධනය හා ණය මත පොලිය සම්බන්ධයෙන් විනිමය උච්චාවචන වලින් ඇති වන ලාභ හෝ පාඩු ලංකා විදුලිබල මණ්ඩලය ගිණුම් ගත නොකෙරෙනුයේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන බැවිනි. ආපසු ගෙවිය යුතු නොපියවූ ණය තක්සේරු කරනුයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ පැවති එකඟ වූ විනිමය අනුපාතය මතය.

ඇ) විදේශ මෙහෙයුම්

විදේශ මෙහෙයුම් ලෙස සැලකෙන විදේශයන්හී ක්‍රියාත්මක පරිපාලිත සමාගම් සහ හවුල් ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය සහ ආදායම් ප්‍රකාශය වාර්තා කරන දිනට අදාළ විනිමය අනුපාතය සහ වාර්ෂික හුවමාරු අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

පරිවර්ථනය තුලින් මතුවන හුවමාරු වෙනස්කම් සෘජුවම වෙනත් විස්තීර්ණ ආදායමට හදුනාගනු ලැබේ. විදේශීය ආයතනයක් බැහැර කිරීමේදී එම විදේශීය මෙහෙයුමට අදාළව අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හදුනාගෙන ඇති සමුච්චිත අගය ආදායම් ප්‍රකාශනයට හදුනාගනු ලැබේ.

2.6.5 බදුකරණය

අදාළ කාලසීමාව සඳහා බදු, වියදම්, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු වලින් සමන්විත වේ.

වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට අරෝපණය කළ හැකි වෙනසක් වෙනත් විස්තීර්ණ ආදායම් වල ද සෘජුව හඳුනා ගනු ලබන අතර අනෙකුත් බදු ලාභ අලාභ ප්‍රකාශනයට හඳුනාගනී.

අ) ප්‍රවර්තන බදු

පවත්නා හා පෙර කාලසීමාවන් සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් ගෙන් ලැබීමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මතය. මුදල් ප්‍රමාණය ගණන් බැලීමට යොදා ගන්නා බදු අනුපාතය හා බදු නීතිය වනුයේ සමාගම ක්‍රියාත්මක හා බදු වලට යටත් ආදායම් ජනනය කරනු ලබන රටේ පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ ප්‍රමාණවත් ලෙස පන වන ලද ඒවාය. හිමිකම් වලදී සෘජුව හඳුනා ගත් අයිතම වලට අදාළ ප්‍රවර්තන ආදායම් බදුහිමිකම් හඳුනා ගන්නේ හිමිකම් වලදී මිස ආදායම් ප්‍රකාශය තුළ නොවේ.

අදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ 2018 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන වලිහි සංශෝධන අනුව බදුකරණය සඳහා ගැලපීම් කරනලද ගිණුම්කරණ ලාභය මතය.

ආ) විලම්බිත බදුකරණය

වත්කම් හා බැරකම් වල බදු පදනම් අතර පැහැනගින තාවකාලික වෙනස් වීම් හා මූල්‍ය වාර්තා වල ඔවුන්ගේ ධාරණ වටිනාකම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත.

ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක හෝ බැරකමක මුල් හඳුනා ගැනීමකදී විලම්බිත ආදායම් බදු වගකීම් හට ගන්නා අවස්ථාවක ද ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදු වන අවස්ථාවකදී ද හැර ගිණුම්කරණ ලාභය හෝ බදු වලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් විලම්බිත ආදායම් බදු බැරකම් පැන නැගීමේදී හැර බදුවලට යටත් සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලැබීම සහ ගනුදෙනු කරන ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කල හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

අඩු කළහැකි සියලුම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිතයට නොගත් බදු වත්කම් හා භාවිතයට නොගත් බදුපාඩු සඳහා බදුවලට යටත් ලාභ තිබීමේ හැකියාවක් පවතින තාක් විලම්බිත ආදායම් බදු වත්කම් පිළිගනු ලැබේ. මෙයින් අඩු කළහැකි තාවකාලික වෙනස්කම් හා භාවිතයට නොගත් බදු බැර හා භාවිතයට නොගත් බදු පාඩුවල ඉදිරියට ගෙනයෑම් උපයෝගී කර ගත හැකි වනුයේ එය ව්‍යාපාරික සංයෝජනයක නොවන ගනුදෙනුවකදී ගනුදෙනු කාලය තුළදී හා එම ගනුදෙනු කාලය තුලදී ගිණුම්කරණ ලාභය හෝ බදුවලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් නොකළ යුතු ගනුදෙනුවකදි වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීම තුළින් පැන නගින අඩු කළහැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්බිත ආදායම් බදු වත්කම්ය.

විලම්බිත බදු වත්කම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් වාර්තා කරණ සෑම දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර විලම්බිත ආදායම් බදුවත්කම මුලුමනින්ම හෝ අඩක් වශයෙන් යොදා ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු වලට යටත් ලාභයක් තිබේ දැයි තවදුරටත් හැකි නොවනතාක් ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල, ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ආයෝජන තුළින් ඇති වන තාවකාලික වෙන්සකම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී ප්‍රත්‍යාවර්ති නියම කිරීම් හැර අනෙකුත් තාවකාලික වෙනස්කම් පාලනය කළ හැකි අතර එම තාවකාලික වෙන්ස්වීම් නුදුරු අනාගතයේදී ප්‍රත්‍යාවර්තනය නොවනු ඇත.

වාර්තා කරනු ලබන සෑම දිනයකදීම හඳුනා නොගත් විලම්බිත ආදායම් බදු වත්කම් නැවත අගයන අතර අනාගත බදුවලින් විලම්බිත ආදායම් බදුවත්කම් ආපසු ලබා ගැනීමට යටත් ලාභ වලින් ඉඩ ලැබෙන බව හඳුනා ගැනෙයි.

පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාර වල ලැදියාවන්ට සම්බන්ධ අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගැනෙන්නේ නුදුරු අනාගතයේදී තාවකාලික වෙනස්වීම් ආපසු හැරීමේ හා තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදුයටතේ ලාභයක් ලැබීමේ හැකියාවක් තිබෙනතාක් පමණි.

විලම්බිත ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ වත්කම උපලබ්ධි වන හෝ බැරකම නිරවුල් කරණු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතයන් (හා බදු නීති) පදනම් වූ බදු අනුපාත මතය. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ස්කන්ධ ප්‍රාග්ධනයට සෘජුව පිළිගන්නා ලද අයිතම වලට පාදක ගනුදෙනුවට සහ සම්බන්ධව අදාළ විලම්බිත බදු පිළිගනු ලැබේ. ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදුබැරකම් වලට හිලව් කිරීමට නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් හා විලම්බිත බදු අදාළ වන්නේ බදු වලට යටත් එම ආයතනයට හා එම බදුකරණ බලධාරියාටම නම් විලම්බිත බදු වත්කම් හා විලම්බිත බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්හීත බදු වත්කම් වල ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරෙන අතර, විලම්හීත බදු වත්කම් වලින් කොටසක් හෝ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ

සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට නොහැකි වන තරමට අඩු කෙරේ.

හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් වාර්තාකරන සෑම දිනකම නැවත තක්සේරු කෙරෙන අතර අනාගත බදු අය කළ හැකි ලාභ මඟින් විලම්භිත බදු වත්කම් ආපසු ලබා ගැනීමට ඉඩ සැලසෙන තරමට පිළිගැනේ.

වත්කම් උපලබ්ධි වීම තහවුරු වූ විට හෝ වගකීම පියවන අවස්ථාව පැමිණිවිට එට වාර්තාකරණ දිනය වන විට බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ බදු නීති) මත පදනම්ව විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලැබේ.

ලාභාංශ ආදායම මත බදු

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී පරිපාලිත සමාගම් වලින් ලාභාංශ ආදායම සඳහා වන බද්ද වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

විකුණුම් බද්ද

පහත දෑ හැරුනු විට ආදායම්, වියදම් සහ වත්කම් විකිණුම් බදු වලින් පසු හඳුනා ගෙන ඇත.

වත්කමක් හෝ සේවාවක් මිලට ගැනීමේදී ගෙවිය යුතු විකුණුම් බද්ද බදු අධිකාරියෙන් අය කර ගත නොහැකි නම්, වත්කම් හෝ වියදම් අයිතමය අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි කොටසක් ලෙස විකුණුම් බද්ද පිළිගනු ලැබේ.

ඇතුළත් කළ විකුණුම් බද්ද සමඟ ලැබිය යුතු හා ගෙවිය යුතු දේ සඳහන් කළ විට.

බදු අධිකාරියෙන් අය කර ගත හැකි හෝ ගෙවිය යුතු විකුණුම් බද්දේ ශුද්ධ මුදල මුල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ලැබිය යුතු හෝ ගෙවිය යුතු කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

2.6.6 භාණ්ඩ තොග

යල්පැන ඇති හා මන්දගාමී චලනය වන අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු තොග තක්සේරු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත ශුද්ධ උපලබ්ධි වටිනාකම අවසන් කිරීමේ හා විකිණීම කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කළ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකිණිය හැකි මිල ගණන්ය. භාණ්ඩ දැනට ඇති ස්ථානයට ගෙන ඒමට හා වත්මන් තත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදි ගනනය කෙරේ.

ලංකා විදුලිබල මණ්ඩලය

වැඩි වශයෙන් පාවිච්චියට ගන්නා හා වාර්ෂික මිල ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ තක්සේරු කරනුයේ බෙදාහැරීම් අංශවල සම්මත මිල අනුව වන අතර පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් වීවා (ජනන හා සම්ප්‍රේෂණ අංශවල)ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කෙරෙන ක්‍රමය මතය. එසේ වුවද සම්මත මිල අනුව තක්සේරුකර තිබෙන භාණ්ඩ වල උපලබ්ධි ලාභය මගින් දක්වා ඇති පිරිවැය පහත හෙළීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය විසින් සලසා ඇත.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ	-	බර තබන ලද සාමාන්‍යය පදනමින් තත්‍ය පිරිවැය මත
මාර්ගස්ථ තොග හා වෙනත් තොග	-	සත්‍ය පිරිවැය මත
අමු ද්‍රව්‍ය	-	බර තැබූ මිළ ක්‍රමය මත සත්‍ය පිරිවැය
නිමි භාණ්ඩ සහ කෙරිගෙන යන වැඩ	-	සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය දල භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ සාමාන්‍ය ක්‍රියාකාරී ධාරිතාව මත පදනම්ව සමානුපාතිකව අවශෝෂණය කරන ලද ස්ථාවර හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය ද මත

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් සමාගම

අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලබන්නේ	-	ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට
නිමිභාණ්ඩ හා නිමකෙරෙමින් ඇති භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය දල සුදුසු අනුපාතයකට අවශෝෂණය කරන ලද ස්ථාවර පොදුකාර්ය පිරිවැය ද මත
පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස්	-	ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට
මාර්ගස්ථ තොග	-	සත්‍ය පිරිවැය මත

2.6.7 දේපල, පිරියත හා උපකරණ

අ) හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත සහ උපකරණ ගිණුම් සඳහා හඳුනාගනු ලබන්නේ වත්කමට ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් හා වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණි.

ආ) මිනුම්කිරීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් වූයේ නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැය වටිනාකමටය. දේපල, පිරියත හා උපකරණ වල උපාංග කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය හා පිළිගැනීමේ නිර්නායක සපුරා තිබේ නම් දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් ය. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන විට ප්‍රතිස්ථාපිත වූ කොටසේ ශුද්ධ පොත් වටිනාකම සමූහය විසින් හඳුනා නොගන්නා

අතර එයට අදාළ ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය වීම් සහිත වන කොටස පමණක් හඳුනා ගැනේ. එලෙසම ප්‍රධාන පරීක්ෂණයක් ඉටු කළ විට පිළිගැනීමේ නිර්නායක සපුරාලන්නේ නම් එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් සියළුම නඩත්තු සහ අළුත්වැඩියා වියදම් ලාභ/අලාභ ප්‍රකාශනය තුල හඳුනාගැනේ.

දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය නැවත අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන සිද්ධීන් හෝ තත්වයන් ඇතිවන විට ඒ සඳහා හාණිකරන පරීක්ෂාවන් සිදුකරනු ලැබේ.

ඇ) දැනට සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වාර්තා කරන දිනට අවසන් කර නොමැති ස්ථාවර වත්කම් හා සම්බන්ධව සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්නුම් කෙරෙන අතර එය පිරිවැය අනුව දක්වා ඇත. මෙම කාර්යයන් අවසන් වූ පසු අදාළ වත්කම් දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කෙරේ.

ඈ) හඳුනා ගත් වත්කම් පොත් වලින් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු විය නොහැකි අවස්ථාවක දී හෝ බැහැර කිරීමකදී පොත් වලින් ලියා හැරීම සිදු කෙරේ. වත්කම් පොත් වලින් ලියා හැරීමේදී මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (වත්කම ඉවත්කිරීමේ ශුද්ධ අගය සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස මෙම ලාභය හෝ අලාභය ලෙස ගණනය කෙරේ) අදාල වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් වේ.

ඉ) ක්ෂය

සින්නක්කර ඉඩම් හැර සෙසු දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල රේඛීය ක්‍රමයක් උපයෝගී කරගනිමින් ගණනය කර එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තුල ඒවායේ වටිනාකම් ලියා හැරීම ක්ෂය වීම් වේ. 2.6.7 යටතේ විස්තර කර ඇති පරිදි වත්කම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විට හෝ වත්කම පොත් වලින් ඉවත් කිරීමට තීරණය කර ඇතිවිට යන සිදුවීම් දෙකෙන් පෙර ඇති වන සිදුවීම් දින සිට වත්කම් සඳහා ක්ෂය කිරීම නතර වේ.

වත්කම් වල සඵල ආයුකාල ඇස්තමේන්තු කරනුයේ පහත දැක්වෙන අයුරිනි:

ලංකා විදුලිබල මණ්ඩලය

සින්නක්කර ගොඩනැගිලි හා බදුඉඩම් හා ගොඩනැගිලි	වසර 40
සිවිල්වැඩ:	
වාන් දොරටු හා වේලි	වසර 100
වානේ ජලනල හා කොටු දොර	වසර 40
උප පොල හා ස්විච්චි අංගනය	වසර 35
උත්පාදන යන්ත්‍ර:	
පිරියත ඇතුලු විදුලි බලාගාර (ජලවිදුලි)	වසර 35
පිරියත ඇතුලු විදුලි බලාගාර (තාප)	වසර 25
පිරියත ඇතුලු විදුලි බලාගාර (ඩීසල්)	වසර 12-15
පිරියත ඇතුලු විදුලි බලාගාර (ගෑස් ටර්බයින්)	වසර 12
පිරියත ඇතුලු විදුලි බලාගාර (ගල් අඟුරු)	වසර 30
පිරියත ඇතුලු විදුලි බලාගාර (සුළං)	වසර 20
සම්ප්‍රේෂණ මාර්ග කි.වෝ. 220, කි.වෝ. 132, කි.වෝ. 66	වසර 35
බෙදා හැරීමේ මාර්ග	
අධි සැරයට්බහන් - 33	වසර 50
අධි සැරයට්බහන් - 132	වසර 50
අධි සැරයට්බහන් - 11	වසර 40
අධි සැර උඩිස් රැහැන්	වසර 35
අඩු සැර භූගත	වසර 40
අඩු සැර උඩිස් රැහැන්	වසර 35
අඩු සැර පෝෂණ කණුව	වසර 35
පාරිභෝගික උප පොල	වසර 35
අධිසැර ස්විච්චිපන්න	වසර 35
ප්‍රාථමික හා ජාලක උප පොල	වසර 35
සේවා නඩත්තු- පොදු කාර්යන්	වසර 35
සේවා ගාස්තු භූගත	වසර 40
SCADA(මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ	වසර 15
මෝටර් වාහන- මගී ප්‍රවාහනය - වීල් දෙක හෝ තුන	වසර 15
මෝටර් වාහන- මගී ප්‍රවාහනය - වෙනත්	වසර 14
බර වාහන	වසර 20
මෝටර් බෝට්ටු	වසර 07
යන්ත්‍ර හා මෙවලම්	වසර 05
කාර්යාලීය උපකරණ	වසර 05-15
ලීබඩු හා සවිකිරීම්	වසර 05
සුර්යපැනල	වසර 10-25

සීමාසහිත එල්ටිඑල් හෝල්ඩිංස් සමාගම	
ගොඩනැගිලි	වසර 25-50 අධික
පිරියත හා යන්ත්‍ර	වසර 8 - 20 අධික
බලාගාරය	වසර 10-20 අධික
කම්හල් උපකරණ	වසර 10 අධික
විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ	වසර 10 අධික
ගිනිනිවීමේ උපකරණ	වසර 10 අධික
කාර්යාලීය උපකරණ	වසර 03 - 10 අධික
ලීබඩු හා සවිකිරීම්	වසර 03 - 10 අධික
මෝටර් වාහන	වසර 4 අධික
මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් තත්‍ය භාවිතය	තත්‍ය භාවිතය
සූර්ය බල පිවී බලාගාර	වසර 15 අධික
සීමා සහිත ලංකාවිදුලි (පුද්)සමාගම	
ගොඩනැගිලි බදු ඉඩම්	වසර 40
යටිතල පහසුකම් සැපයීම	
පලාත් පාලන ආයතන හා ලංවිම වෙතින් භාරගත් උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන්	වසර 10
ලෙකෝ සමාගමෙන් ඉදි කළ උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන්	වසර 20- 25
මෝටර් වාහන	වසර 5- 20
පරිඝණක	වසර3 - 5
කාර්යාල උපකරණ	වසර3 - 7
පිරියත හා යන්ත්‍ර	වසර 3-4
පිරියත හා යන්ත්‍රෝපකරණ - පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය - (UOM)	වසර 20
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්)සමාගම	
ලීබඩු හා සවිකිරීම්	වසර 05
උපකරණ	වසර 04
මෝටර් වාහන	වසර 04
පරිඝණක	වසර 04
කල්බදු වැඩි දියුණු කිරීම	වසර 02
ජාල පද්ධති	වසර 02
ශ්‍රී ලංකා එනජීස් (පුද්) සමාගම	
ගොඩනැගිලි	වසර 20
බලාගාර හා යන්ත්‍රෝපකරණ	වසර 20
ලී බඩු උපකරණ හා මෙවලම්	වසර 5
මෝටර් වාහන	වසර 5
කාර්යාල උපකරණ	වසර 5
පරිඝණක	වසර 5
ඉන්පෙක්ෂන් මොඩියුලින් යන්ත්‍ර	වසර 5
සූර්ය කෝෂ පද්ධතිය	වසර 10
සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම	
ඉඩම් හා සංවර්ධනය	වසර 20
ලීබඩු හා සවිකිරීම්	වසර 05
උපකරණ	වසර 05
පරිඝණක	වසර 03

අවසන් වරට වාර්තා කිරීමේ දිනයේ සිට වත්කම් වල වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ක්ෂය වීමේ ක්‍රමවල සැලකිය යුතු වෙනසක් සිදු වන බවට ඉඟියක් තිබේ නම් ඒවා නැවත සමාලෝචනය කර, සුදුසු නම්, ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ.

ඊ) ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ. ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීමට සූදානම් වීම පිණිස ආවශ්‍යවම සැලකිය යුතු කාල සීමාවක් ගත වෙන යෝග්‍ය වන වත්කම් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ හැකි පොදු හා නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් සාරානුකූලව ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීම පිණිස සාරානුකූලව සූදානම් කෙරෙන තුරු එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකුත් ණය ගැනීමේ සියලුම පිරිවැය, වියදම් දරන ලද කාලසීමාව තුළ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

සුදුසුකම් ලත් වත්කම් සඳහා ලබාගත් ණය එම වත්කම් සඳහා වැයවන තෙක් තාවකාලිකව ආයෝජනය කිරීමෙන් උපයනු ලබන ආදායම ප්‍රාග්ධනිත කිරීමට සුදුසුකම් ඇති පිරිවැයෙන් අඩුකර දක්වයි.

2.6.8 විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම්

වාර්ථා ගත වටිනාකමල අඛන්ඩව භාවිතා කිරීමට වඩා මුලික වශයෙන්ම විකිණීම මගින් අයකර ගනී නම්, සමුහය විසින් ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරයි. අපහරණය සඳහා වර්ගීකරණය කර ඇති එකී ජංගම නොවන වත්කම්ල ඒවායේ පොත්වල අගය හා සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කල පසු අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරේ. මුල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම් හැර වත්කමක් ඉවත් කිරීම සඳහා සෘජුවම දැරිය යුතු වර්ධක පිරිවැය විකිණීමේ පිරිවැය වේ.

කළමනාකරණය (අධ්‍යක්ෂක මණ්ඩලය) විසින් ප්‍රධානය කරනු ලබන අනුමැතිය මත ඉහල විකුණුම් සම්භාවිතයක් ඇති යන නිර්ණායක මත සහ වත්කම එහි වර්තමාන තත්වය තුළ වහාම විකිණීමට හැකිය යන නිර්දේශය මත විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සම්පූර්ණ කිරීමට ගන්නා ක්‍රියාමාර්ග වලින් විකිණීමේදී සැලකිය යුතු වෙනස්කම් සිදුකිරීමක් හෝ විකිණීමේ තීරණය ඉවත් කර ගැනීමක් නොහැකි වීම දැක්වේ. වත්කම් විකිණීමේ සැලැස්මට කළමනාකාරිත්වය කැපවිය යුතු අතර වර්ගීකරණය කළ දින සිට මාස හයක් ඇතුළත විකිණීම අවසන් කිරීමට අපේක්ෂා කළ යුතුය.

විකිණීම සඳහා වර්ගීකරණය කිරීමෙන් පසු දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන අත්හිටුවයි. විකිණීම සඳහා වර්ගිකරණය කල වත්කම් සහ වගකීම් මුල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම අයිතිමයන් වශයෙන් වෙනමම දක්වනු ලැබේ.

බැහැර කිරීම

මණ්ඩල තීන්දුවෙන් "විකිණීමට තිබෙන වත්කම්" ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මාස හයක් ඇතුළත විකිණීමට අපොහොසත් වුවහොත් නැවත එම වත්කම් දේපල පිරියත සහ උපකරණ (PPE) යටතේ වර්ගීකරණය කලයුතු අතර නවතා ඇති ක්ෂය ගැලපීම් කාලානුරූපව නැවත අයකල යුතුය.

2.6.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් වටිනාකම අඩු වන බවට වාර්තාකරණ සෑම දිනයකදීම එසේ වන බවට යම් සංඥාවක් තිබේ දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් සංඥාවක් තිබේ නම්, එම වත්කම හෝ මුදල් ජනන ඒකකය සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. වත්කමේ ධාරණ අගයට වඩා නැවත අයකර ගත හැකි අගය අඩුවන ප්‍රමාණයෙන් හානිකරන අලාභ හදුනාගනු ලබයි. නැවත අයකර ගත හැකි අගය යනු වත්කම විකිණීමට යන පිරිවැය හා පාවිච්චියේදී එහි අගය අඩු කර වත්කමක් හෝ මුදල් ජනනය කරණ ඒකකයක් යන දෙකෙන් වැඩිවටිනාකමක් ඇති සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කළ විට ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකෙන් වඩා වැඩි අගයටය. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීම පිණිස, මුදල් වල කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව හා වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු අයකර ගැනීමට පෙර වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්, ඒවායේ වත්මන් අගය දක්වා වට්ටම්කරණු ලැබේ.

හාණිකර අලාභ තක්සේරු කිරීමේ අරමුණින් සමස්ථ මණ්ඩලය වෙනම මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැලකේ.

අබණ්ඩ මෙහෙයුම් වල හාණිකර අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී හඳුනා ගැනේ.

පෙර හඳුනාගත් හාණිකරන අලාභය ආපසු හැරවිය හැක්කේ අවසන් වරට හඳුනාගත් හාණිකරන අලාභය හඳුනා ගත් දා සිට ආපසු අයකර ගත හැකි වත්කම් නිශ්චය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි.එය එසේ නම් වත්කම් වල ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණය දක්වා වැඩි කෙරේ. එම වැඩි කළ මුදල කලින් වසර වල වත්කම් සඳහා වූ අඩුපාඩු පාඩු හඳුනා නොගත්තේ නම් අවප්‍රමාණය වීමේ ශුද්ධ අගය තීරණය කරන ලද ධාරණ අගයට වඩා වැඩි විය නොහැක. ලාභ හෝ පාඩු ප්‍රකාශ තුළ එවැනි ආපසු හැරවීමක් පිළිගැනේ.

2.6.10 කල්බදු

කොන්ත්‍රාත්තුවක් අරම්භයේදී, මණ්ඩලය විසින් එම කොන්ත්‍රාත්තුව හෝ එම කොන්ත්‍රාත්තුව තුල කල්බදු ගිවිසුමක් තිබේ ද යන්න තක්සේරු කරයි. මුල්‍ය වටිනාකමකට හුවමාරුවක් වශයෙන් යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ අයිතිය යම් කොන්ත්‍රාත්තුවක් මඟින් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්තුව කල් බද්දක් ලෙස හඳුනා ගැනේ. මෙසේ හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් හෝ එම කොන්ත්‍රාත්තුවෙහි අඩංගු කරුණු මඟින් ලබා දී ඇත් දැයි තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි අර්ථ දැක්වීම භාවිතා කරයි.

2.6.10.1 බදුකරු ලෙස සමූහය

කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකමින් යුත් කල්බදු වත්කම් හැර සෙසු කල්බදු සඳහා සමූහය තනි පිළිගැනීමක් සහ මිනුම් ප්‍රවේශයක් භාවිතා කරයි. භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන කල්බදු ගෙවීම් සහ භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මත සමූහය විසින් බදු වගකීම් හඳුනා ගනී.

භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්

සමූහය විසින් භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් එවා ප්‍රයෝජනයට ගත හැකි විට හදුනා ගනී.

භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හාණිකරණ අලාභ හා නැවත තක්සේරු කරන ලද බදු වගකීම් ගැලපීමෙන් පසුවේ.ආරම්භයේ දීම භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, බදුකරුවන් විසින් ලබා දුන් යම් දිරිගැන්වීම් අඩු කිරීමෙන් පසු ආරම්භක කල් බදු වගකීම, ආරම්භක සෘජු පිරිවැය සහ වත්කම් නවීකරණය කිරීම සඳහා බැඳීම් වලින් සමන්විත වේ. භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් කෙටි කාල සීමාවට හෝ පාදක වූ වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.මෙම වත්කම් හාණිකරන පරීක්ෂවට යටත්වේ.

සමූහය සතු භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත්වේ.

කල්බදු වගකීම්

කල්බදු ආරම්භ කරන දිනයේදී, කල්බදු කාලය තුළදී ගෙවිය යුතු සම්පූර්ණ ගෙවීම් වල වර්තමාන වටිනාකම අනුව සමූහය විසින් කල්බදු වගකීම් හදුනාගනු ඇත. කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, කල්බදු ගිවිසුමේ ඇති පොලී අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, කල්බදු ආරම්භක දිනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය මණ්ඩලය භාවිතා කරයි. ආරම්භක දිනයට පසුව, පොලිය එකතු වීම පිළිබිඹු කිරීම සඳහා කල්බදු වගකීම් ප්‍රමාණය වැඩි කරන අතර බදු ගෙවීම් සඳහා ගෙවීම් අඩු කෙරේ. ඊට අමතරව, ස්ථාවර කල්බදු ගෙවීමේ ද්‍රව්‍යයේ වෙනසක් හෝ වත්කම් මිලදී ගැනීම සඳහා වූ තක්සේරුවේ වෙනසක් ඇත්නම් කල්බදු වගකීම් දරන ප්‍රමාණය නැවත මනිනු ලැබේ. සමූහයේ කල්බදු වගකීම් පොලී දරණ ණය සහ ණය ගැනීම් යටතේ ඇතුළත් වේ.

2.6.10.2 සමූහය බදු කරු ලෙස - එල්ටීඑල්

මෙහෙයුම් කල්බදු

වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙසින් නොපවරන ජලවිදුලි, වායු බල හා තාප බල බලාගාර වර්ග කරනුයේ මෙහෙයුම් කල්බදු වශයෙනි. සියලුම බලාගාර වලින් ලැබෙන ආදායම් බලශක්ති නිපැයුම මත ආදායම් ප්‍රකාශයේ පිළිගැනෙන්නේ බදු දුන්

වත්කම් වලින් ඉපදෙන භාවිතයේ ප්‍රතිලාභ අඩු වන කාල රටාව වැඩියෙන් නියෝජනයවන කාල සීමාවේ බලශක්ති නිපැයුම මතය. බදු ආදායම ඉපයීමේදී දරන ලද ක්ෂයවීම් ඇතුලු පිරිවැය වියදමක් වශයෙන් පිළිගැනේ. ක්ෂයවීම යටත් බදු වත්කම් වල ක්ෂය වීමේ ප්‍රතිපත්තිය සමානවත්කම් සඳහා සමූහයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට ගැලපේ.

මූල්‍ය කල්බදු

පහත සඳහන් නිර්නායකයන්ගෙන් සෑහීමකට පත්වීම හේතුවෙන් සීමාසහිත රාජ් ලංකා විදුලිබල සමාගම හා බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය සහ සීමාසහිත ලක්දනවි බංගලා පවර් සහ බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය අතර ඇති විධිවිධාන IFRIC 4- එකඟවීමට කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම සහ "ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු" යටතේ කල්බදු ලෙස ගිණුම් ගත කළ යුතුය යන විෂය පථයට අයත් බව සමූහයේ අදහසයි.

- විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම යටතේ ඇති විධිවිධානය සපුරාලීම රඳා පවතින්නේ බංගලාදේශයේ හි පිහිටි සමූහයේ නිශ්චිත බලාගාරයේ සුවිශේෂි භාවිතය මතය.
- බලාගාරය ක්‍රියාත්මක කිරීමට හෝ බලාගාරයේ සමස්ත නිෂ්පාදනය පාලනය කරන අතරම එය තීරණය කරන ආකාරයට බලාගාරය ක්‍රියාත්මක කිරීම අන් අයට යොමු කිරීමට බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලයට අයිතියක් ඇත.
- සමාගමේ විදුලි බලාගාරය මඟින් උත්පාදනය කරන ලද විදුලිබල නිමැවුම, බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය හැර වෙනත් පාර්ශවයකට ලබාගත නොහැකි අතර බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය විසින් ගෙවනු ලබන ඒකකයකට ධාරිතා ගාස්තුව නිමැවුම මත පදනම් නොවේ.

සමූහයේ විදුලි බලාගාරයේ නෛතික හිමිකාරිත්වයට අනුපාතික සියලු අවදානම් සහ ප්‍රතිලාභ බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය වෙත මාරු කර ඇති හෙයින් සී/ස රාජ් ලංකා සමාගම හා සීමාසහිත ලක්දනවි බංගලාපවර් සමාගම බදුකරු ලෙසත්, බංග්ලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය බදුගන්නා ලෙසත් ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු යටතේ මූල්‍ය කල්බදු ලෙස ගිණුම්ගත කෙරේ.

2.6.11 අස්පෘශ්‍ය වත්කම්

හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් සහ වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.වෙන් වෙන් වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේ පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ අත්කර ගන්නා දිනයේදී ඒවායේ පවත්නා සාධාරණ වටිනාකමය. මූලික හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ සමුච්චිත හානිකරණයක් වෙතොත් අදාළ පරිදි පාඩු අඩු කර අස්පෘශ්‍ය වත්කම් පිරිවැය ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනිත කළ සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තරිකව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරන අතර වියදම දරන ලද වසරේ ආදායම් ප්‍රකාශයේ අදාළ වියදම පිළිඹිඹුවේ.

ක්‍රමක්ෂය/හානිකරණය

අස්පෘශ්‍ය වත්කම් වල සඵල ආයුකාලය තක්සේරු කරනුයේ පරිමිත හෝ අපරිමිත වශයෙනි.

පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් ඒවායේ සඵල ආර්ථික ආයුකාලය ඔස්සේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට ලක් විය හැකිබවට සංඥාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම හානිවූ ලෙස තක්සේරු කෙරේ. පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය ක්‍රමවේදය හා ක්‍රමක්ෂය කාලසීමාව අවම වශයෙන් වාර්තා කරන සෑම කාලසීමාවකදීම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත සඵල ජීව කාලයේ වෙනස් වීම් හෝ වත්කමෙහි ඇතුළත්ව තිබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව ගිණුම් ගත කරනුයේ අදාළ පරිදි ක්‍රමක්ෂය ක්‍රමවේදය හෝ ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීමෙන් වන අතර ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ආයු කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම් වල කාර්ය භාරයට අනුකූල වියදම් ප්‍රභේදයන් යටතේය.

මණ්ඩලය

වසර 5 ක ප්‍රයෝජනවත් ජීව කාලයක් සඳහා මෘදුකාංග ක්‍රමක්ෂය කර ඇති අතර බලපත්‍රය සඳහා ගිවිසුම් තුළ නියම කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

එල්ටීඑල් හොල්ඩින්ගස් සමාගම

පරිගණක මෘදුකාංග අත්පත් කර ගත් හා සංවර්ධනය කළ දින සිට වසර 4 ක් වැනි කාලයක් තුළදී ක්‍රමක්ෂය කර ඇත.

ලංකා විදුලි (පුද්) සමාගම

පරිගණක මෘදුකාංග බලපත්‍ර වසර 5 ක ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

තාක්ෂණික දැනුම ගිවිසුම් කාලය වන වසර 15 දක්වා ක්‍රමක්ෂය කර ඇත. අසීමිත සඵල ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකෙරෙන අතර තනි තනි ව හෝ මුදල් ජනනය කරන ඒකකයේ මට්ටමින් හානි කරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙනුයේ අසීමිත ජීව කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතීදැයි යන්න තීරණය කිරීමටයි. එසේ නොමැතිනම් ජීවකාලය අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා අනාගතය සඳහා බලපවත්න පරිදි වෙනස් කෙරේ.

හඳුනාගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් පොත් වලින් ලියා හැරීම

අස්පෘශ්‍ය වත්කමක් පිළිගැනීම තුළින් පැන නගින ලාභ හෝ පාඩු මනින්නේ බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කම් වල ඉදිරියට ගෙනයන ප්‍රමාණය අතර වෙනස වශයෙන් වන අතර වත්කම පිළිගැනීමෙන් බැහැර කළ විට එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

2.6.12. මූල්‍ය වත්කම් හා වගකීම්

2.6.12.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

මූලික වශයෙන් හඳුනාගැනීමේ දී, මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI), හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ආදී වටිනාකම් මත වර්ගීකරණය කෙරේ.

මූල්‍ය වත්කමක් (එය සැළකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව වෙළඳ ලැබිය යුතු නම්) හෝ මූල්‍ය වගකීම් මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින්, එය අත්පත් කර ගැනීම හෝ නිකුතුව සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් එක්වූ පසු ගනුදෙනු පිරිවැය වේ.

සැළකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ණයක් මුලින් මනිනු ලබන්නේ ගනුදෙනු වලිනි.

පසුකාලීන මිනුම්කරණය

- පසු කාලීන මිණුම්කරනය සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත;
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්(ණය උපකරණ)
- සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිවක්‍රීකරණය කිරීමත් සමඟ විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්(ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබයි:

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණ ඇතිව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොළිය සහ වාරිකය වීම

ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත (ඊඅයිආර්) ක්‍රමය උපයෝගී කරගනිමින් පසුව මනිනු ලබන අතර එය හානිකර පරීක්ෂාවන්ට යටත්වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කළ විට හෝ හානිකරණයට ලක්වූ විට ලාභ හෝ අලාභය ලාභය හා පාඩු ප්‍රකාශනයට හඳුනා ගැනේ.

සමූහයේ ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් සඳහා වෙළඳ ලැබීම්, සේවකයින්ට ණය, සම්බන්ධිත පාර්ශවයන්ට ණය සහ වෙනත් මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් අනෙකුත් ආයෝජන ඇතුළත් වේ.

විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් විස්තීර්ණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම යන අරමුණු දෙක සහිතව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොළිය සහ වාරිකය වීම

විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන ණය උපකරණ සඳහා පොළී ආදායම, විදේශ විනිමය නැවත ඇගයීම සහ හානිකරණ පාඩු හෝ ආපසු හැරවීම් ලාභ හෝ අලාභය ප්‍රකාශනයට හඳුනාගනු ලබන අතර මිණුම්කරණය ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම් සඳහා සිදුකරන ආකාරයට සිදුකරනු ලබයි.ඉතිරි සාධාරණ අගයන් වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. ආපසු හැරවීමේදී, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් සමුච්චිත සාධාරණ අගය වෙනස් වීම ලාභයට හෝ අලාභයට ප්‍රකාශයට ගැලපුම් කෙරේ.

විස්තීර්ණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)

මූලික හඳුනාගැනීමෙන් පසු, SLFRS - 3 යටතේ වෙළඳාම සඳහා හෝ අසම්භාව්‍ය සලකා බැලීම් ලෙස සිය ආයෝජන වර්ගීකරණය කිරීමට සමූහයට තෝරා ගත හැකිය. මෙහිදි ණය උපකරණයෙන් උපකරණය පදනම මත මෙම වර්ගීකරණය තීරණය වේ.

මෙම මූල්‍ය වත්කම් වල ලාභ හා පාඩු කිසි විටෙක ලාභ හෝ අලාභය ප්‍රකාශයට ප්‍රතිවක්‍රීකරණය නොකෙරේ. මූල්‍ය වත්කම් වල පිරිවැයෙන් කොටසක් නැවත අය කර ගැනීමක් ලෙස සමූහයේ ප්‍රතිලාභ ලැබෙන විට හැර, ගෙවීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ අලාභ ප්‍රකාශයේ ලාභාංශ වෙනත් ආදායමක් ලෙස හඳුනා ගනු ලබන අතර, පෙර කී ලැබීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී. එසේම මෙම මූල්‍ය වත්කම් හානිකරණ පරීක්ෂාවන් සඳහාද යටත් නොවේ.

මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහය සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කළ විට පමණක් සමූහය සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලැබේ. සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම්, සාධාරණ අගය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් ගළපන හෝ සාධාරණ අගය ලාභයෙන් හෝ අලාභයෙන් ගළපනු ලැබූ මූල්‍ය වත්කම් නැවත

වර්ගීකරණය කරන්නේ නම්, නැවත වර්ගීකරණය කරන ලද දිනයේ සිට ඉදිරියට ගැළපුම් කිරීම සිදු කරයි. සමූහය කලින් හඳුනාගත් කිසිදු ලාභයක්, අලාභයක් (හානිකරන ලාභයක් හෝ අලාභයක් ඇතුළුව) හෝ පොළිය නැවත ලබා නිවැරදි නොකරයි.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සාධාරණ අගය ලාභඅලාභ හිණුම තුලින් ගළපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍යමය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනු ලැබේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. කෙසේ වෙතත්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් ඉවත්කර නැවත වර්ගීකරණය කරන දිනයේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ගැලපුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කළ දිනයේදී මනිනු ලබන්නේ එය සැම විටම ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කල ආකාරයෙනි. මෙම ගැලපීම අනෙකුත් විස්තීර්ණ ආදායමට බලපාන නමුත් ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති බැවින් එය නැවත වර්ගීකරණය කිරීමක් ලෙස නොසැලකේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ලාභ අලාභ තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මැනීම අඛණ්ඩව සිදු කෙරේ. අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදී කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය නැවත වර්ගීකරණය කරන දිනයේදී නැවත වර්ගීකරණය කිරීමේ ගැලපීමක් ලෙස ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

ආ) බැහැර කිරීම

හඳුනා ගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත් පත් වලින් ඉවත් කරනුයේ පහත අවස්ථාවලදීය:

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය අවසන් වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් මාරුකර තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලක් මත තෙවන පාර්ශ්වයකට ලැබී ඇති මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් භාර ගෙන තිබෙන විට සහ පහත කරුණු දෙකෙන් එකක්:

අ) වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හරවත් ලෙස මාරු කර තිබෙන විට හෝ

(ආ) සමූහය විසින් වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ තබා ගැනීමක් නොකර වත්කමේ පාලනය මාරු කර තිබෙන විට

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් පවරා තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලකට එළඹ තිබෙනවිට හා වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් නොකර වත්කමේ පාලනය ද මාරු කර නොතිබෙන විට ඒ ගැන සමාගම පවත්වා ගෙනයන අඛණ්ඩ සම්බන්ධයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා වගකීම් පිළිඹිඹු වන පදනමක් මත මනිනු ලැබේ.

ඇප ප්‍රතිඥාවක ස්වභාවයක් ගන්නා මාරු කරන ලද වත්කම කෙරෙහි වූ අඛණ්ඩ සහභාගීත්වය මනිනුයේ වත්කමේ මුල්ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

2.6.12.2 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබෙන බවට වාර්තා කරන සෑම දිනයකදීම සමූහය විසින් එම වත්කම් අගැයීමට ලක් කෙරේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයවී තිබෙන බවට සළකනු ලබන්නේ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිද්ධියක හෝ සිද්ධි කීපයක ප්‍රතිඵලයක් වශයෙන් (දරණ ලද පාඩු සිද්ධියක්) වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් ඇති කළ විටය. පාඩු සිද්ධියෙන් ඇති කරන වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු හානිකරණය වන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබේ නම් පමණි. ණය කරුවන් හෝ ණය කරුවන් සමූහයක් සැළකිය යුතු අන්දමින්

මුදල් දුෂ්කරතා, ණය නොගෙවීම් හෝ පොළිය හෝ ප්‍රාග්ධන ගෙවීම් වල දී අදාළ පැහැර හැරීම් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන්ව ස්තූහංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ප්‍රවේශ වීමේ භව්‍යතාවයක් සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් අති වීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීම ද (එනම් හිඟවීම් වල වෙනස්වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් අතපසුවීම් සමග සම්බන්ධතාවක් ඇති බව) හානිකරන සාක්ෂි වලට අයත් විය හැකිය.

සමූහය විසින් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන උපකරණ හැර අනෙකුත් සියලුම ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා දීමනාවක් හදුනාගනී. ණය අලාභ සඳහා පදනම් වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් සහ සමූහය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන්හි වෙනස මූලික ඵලදායි පොලී අනුපාතයට වට්ටම් කිරීමෙනි. අපේක්ෂිත මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූලව සිදුවන ණය වැඩිදියුණු කිරීම් හෝ ඇප තැන්පතු විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් ඇතුළත් වේ.

අපේක්ෂිත ණය අලාභ අවස්ථා දෙකකදී හදුනා ගැනේ

මූලික හදුනාගැනීමෙන් පසු ණය අවදානමේ සැළකිය යුතු වර්ධනයක් සිදු නොවූ ණය සඳහා, අපේක්ෂිත ණය අලාභය ලබා දෙනුයේ ඉදිරි මාස 12 තුළදී (මාස 12 ක ඊසීඑල්) සිදුවිය හැකි පැහැර හැරීම් හේතුවෙන් සිදුවන ණය අලාභ සඳහා ය.

මූලික හදුනාගැනීමෙන් පසු ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩි වී ඇති ණය සඳහා, ගෙවීම් පැහැර හැරීමේ කාලය නොසළකා, ඉතිරි නිරාවරණ කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් අවශ්‍ය වේ.

වෙළඳ ලැබීම් සහ කොන්ත්‍රාත් වත්කම් සඳහා සමූහය අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී සරල ක්‍රමය අනුගමනය කරයි. එම නිසා සමූහය ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරන අතර ඒ වෙනුවට එක් එක් වාර්තාකරණ දිනයේදී ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභ මත පදනම් වූ අලාභ දීමනාවක් හඳුනා ගනී. සමූහය විසින් ඓතිහාසික ණය අලාභ අත්දැකීම් සඳහා ආර්ථික පරිසරය සම්බන්ධ ඉදිරි සාධක ගලපන ලද ප්‍රතිපාදන ආකෘතියක් ස්ථාපිත කර ඇත.

2.6.12.3 මූල්‍ය බැරකම්

මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

SLFRS 9 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් වල වර්ග කිරීම සමූහය විසින් තීරණය කරණු ලබන්නේ මුල් හඳුනා ගැනීමේදීය.

සියලුම මූල්‍ය බැරකම් මුලදී හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය හා අතමාරු සහ වෙනත් මූල්‍ය බැරකම් වලට අදාළව ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙහි අඩංගුය.

පසුකාලීන මිනුම්කරණය

පහත දැක්වෙන පරිදි මූල්‍ය බැරකම්වල මිනුම් රඳා පවතිනුයේ වර්ග කිරීම මතය.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම් පසුව සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ''වෙනත් වගකීම්'' ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ඇත.

බැහැර කිරීම

මූල්‍ය බැරකමක් පොත්පත් වලින් ඉවත් කරනුයේ අදාළ වගකීම යටතේවූ බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විටය.

2.6.12.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනුයේ හඳුනා ගත් වටිනාකම් දැනට බලාත්මක නීතිමය අයිතියක් හා ශුද්ධ පදනමක් මත වත්කම් උපලබ්ධි කර බැරකම් පියවීම සමගාමීව සිදු කිරීමෙන් ශුද්ධ වටිනාකම පියවීමේ අභිප්‍රායක් තිබෙන විට පමණි.

2.6.12.5 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සමූහය විසින් සෑම වාර්තාකරන දිනයකදීම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන මූල්‍ය වත්කම් හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් මිණුම් කරනය සිදුකරනු ලබයි

සාධාරණ අගය වනුයේ මිණුම්කරන දිනයේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීමෙන් ලැබෙන හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිලයි.

සාධාරණ අගය මැනීම පදනම් වන්නේ වත්කම් විකිණීමේ හෝ වගකීම පැවරීමේ ගනුදෙනුව

- වත්කම් හෝ වගකීම් සඳහා ප්‍රධාන වෙළඳපොලකදී
- ප්‍රධාන වෙළඳපොලක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත්ම වාසිදායක වෙළඳපොලේදී සිදුවන බවට ඇති උපකල්පනය මතය.

වත්කම් හෝ වගකීම් වල සාධාරණ අගය මනිනු ලබන්නේ වෙළෙඳපොළ සහභාගි වන්නන් තම ආර්ථික යහපත සඳහා ක්‍රියාකරන බව උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් භාවිතා කරන උපකල්පන උපයෝගී කරගනිමිනි.

අදාළ තත්ත්වයනට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම ලෙස භාවිතා කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදීම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය භාවිතා කරයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුම්කරණය සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ අගය මත ගිණුම්කරණය කර ඉදිරිපත් කරන සියලුම වත්කම්

හා වගකීම් පහත සඳහන් පරිදි සාධාරණ වටිනාකම් ධූරාවලියකට අනුව වර්ගීකරණය කෙරේ.

1 වන මට්ටම — සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය ව නියමවූ වෙළඳපොලේ මිල ගණන් (වෙනස්කම් සිදු නොකළ)

2 වන මට්ටම — සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු කිරීමේ ක්‍රම

3 වන මට්ටම — සාධාරණ අගය මැනීමේදී සැළකිය යුතු අවම මට්ටමේ යෙදවුම් නිරීක්ෂණය කළ නොහැක තක්සේරු කිරීමේ ක්‍රම.

සමුහය විසින් එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදී. පුනරාවර්තන පදනමින් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගන්නා වත්කම් හා වගකීම්, ධූරාවලියේ මට්ටම් අතර ස්ථාන මාරුවීම් සිදුවී ඇත්ද යන්න වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් තීරණය කරනු ලබයි. (සාධාරණ අගය මැනීමට සැළකිය යුතු අවම මට්ටමේ යෙදවුම් සමස්තයක් ලෙස පදනම් කර)

වෙනත් විස්තීර්ණ ආදායම තුළින් මනිනු ලබන මිල නියම නොකළ මූල්‍ය වත්කම් වැනි පුනරාවර්තන සාධාරණ අගයන් මැනීම සඳහා වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමූහයේ කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීම් සඳහා, සමූහයේ වත්කම් හා වගකීම් කාණ්ඩයන්, වත්කම් හෝ වගකීම් වල ස්වභාවය, ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව තීරණය කර ඇත.

2.6.13 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් සමූහයට ප්‍රවර්තන බැඳීම් (නීතිමය හෝ සම්ප්‍රයුක්තව) තිබෙන විට ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරන සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතී නම් සහ බැඳියාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් වන්නේ නම් මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිත වූ ආදායම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයන් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නියම කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කිරීමේ දී කාලයත් සමග ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

2.6.14 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳියාව

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එකට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගෙන තිබෙන බැරකම වන්නේ, සැලසුම් කළ වත්කම් වල සාධාරණ අගය අඩු කර, පිළිනොගත් පැරණි සේවා පිරිවැය වෙනුවෙන් ගැලපීම් සහිතව, වාර්තා කරනු ලබන කාල සීමාව අවසානයේ තිබුණු අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගයයි. ස්වාධීන අයුතුකාරයින් විසින් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කරති. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගය තීරණය වන්නේ ඉහල ප්‍රමිති ව්‍යාප්ත සංයුක්ත බැඳුම් කර වෙළඳපලක් ශ්‍රී ලංකාවේ නොමැති නිසා, ඇස්තමේන්තු කළ අනාගත මුදල් පිටත ප්‍රවාහ රජයේ බැඳුම්කර වල පොලී අනුපාතය යොදා ගනිමින් වට්ටම් කිරීමෙනි. රජයේ බැඳුම්කර නාමනය කෙරෙණුයේ අදාළ විශ්‍රාම වැටුප් බැරකමේ නියමයන්ට සමාන වන පරිදි කල්පිරිය යුතු ප්‍රතිලාභ ගෙවනු ලබන්නා වූ ව්‍යවහාර මුදල් වලිනි.

ආයුගණක ලාභ හා පාඩු, ඒවා පැන නගින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් වල ක්ෂණිකව හඳුනාගැනේ.

නිශ්චිත කාල සීමාවක් (පැවරුම් කාල සීමාව) තුළ සේවයේ යෙදී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මේ වෙනස්වීම් කොන්දේසි සහගත නොවන්නේ නම්, අතීත සේවා පිරිවැය ආදායම් ප්‍රකාශනයට වහාම හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී, අතීත සේවා පිරිවැය පැවරුම් කාලය ඔස්සේ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභ ගණන අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මගින් අර්ථ නිරූපණය කෙරෙයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම සමන්විත වන්නේ 1983 අංක 12 දරණ පණතෙන් ප්‍රතිපාදිත පාරිතෝෂිකයෙනි. පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභයන්හි ප්‍රවර්තන අගය සමූහය විසින් මනිනු ලබන අතර එම අගය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය(PUB) මත පාදක වූ ආයු ගණක තක්සේරු ක්‍රමවේදය භාවිතයට ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයු ගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා අරමුදල් බාහිරව ලබා නොගැනේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අනෙකුත් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේ.

අර්ථ දැක්වූ දායකත්ව සැලැසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවානියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලැබීමට සේවකයෝ සුදුසුකම් ලබති. ලංකා විදුලි බල මණ්ඩලය් සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 3% ක් සමූහය විසින් අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදලට දායකවේ.

2.6.15 ස්වයං රක්ෂණ සංචිතය

සෑම වසරකදීම වසර අවසානයේ දළ වශයෙන් නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම් වලින් 0.1% ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ස්වයං රක්ෂණ සංචිතයකට මාරු කරයි. ලංකා විදුලිබල මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ වල පාඩු හා හානි රක්ෂණ සංචිතයට හර කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් සපුරා ගන්නේ බැංකුවක වෙනම ගිණුමක ආයෝජනය කර තිබෙන මුදල් වලිනි.

2.2.16 රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදාන මූලික වශයෙන්ම සාධාරණ අගයට හඳුනා ගැනෙන අතර, එකී ප්‍රදාන ලැබෙනු ඇති බවට සාධාරණව තහවුරු කොට ඇති විටක, එකී ප්‍රදාන ආශ්‍රිත කොන්දේසි වලට සමාගම අනුගතවනු ඇත. සමූහය විසින් දරන ලද වියදම් සඳහා වන්දියක් වශයෙන් එකී ප්‍රදාන ලැබෙන අවස්ථාවක ලාභ අලාභ ප්‍රකාශයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ ආදායම හඳුනා ගන්නා ලද එකී කාලපරිච්ඡේදය සඳහා ක්‍රමානුකූල පදනම මත අනෙකුත් ආදායම් වශයෙන් හඳුනා ගැනේ. වත්කම් පිරිවැය වශයෙන් සමූහයට ගෙවන ලද ප්‍රධාන එකී වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමානුකූල පදනම මත ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

2.2.17 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන වෙනත් දේ ලෙස විග්‍රහ කර ඇත්තේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා ඉක්මනින් හා පහසුවෙන් මාස තුනක් හෝ ඊට අඩු කාලයකදී නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි හා අගය වෙනස් වීම පිළිබඳව අල්ප අවදානමකට ලක් වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්ය.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් වලට සමානදේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ ප්‍රමාණයෙන් සමන්විත වේ.

2.2.18 පාරිභෝගිකයන් සමඟ වූ ගිවිසුම වලින් ලද ආදායම්

පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් වශයෙන් සමූහය අපේක්ෂා කරන වටිනාකමට පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීමේ දී සමූහය විසින් ආදායම හඳුනාගනු ලැබේ.

ඒ අනුව සමූහය පහත පරිදි ආදායම හඳුනා ගනියි.

අ) විදුලි විකිණුම්

විදුලිය /සේවා සහ භාණ්ඩ අලෙවිය සපයන ලද සේවා සම්බන්ධතාවයන් හරහා පාරිභෝගිකයන් විසින් විදුලිය පාරිභෝජනය කිරීමේදී විදුලිය අලෙවි කිරීමේ ආදායම සමූහය විසින් හඳුනාගනියි. අයකිරීම් කාණ්ඩය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගැසට් කරන ලද ගාස්තු මත පදනම්ව ආදායම හඳුනාගන්නා මිල තීරණය කරනු ලැබේ.

නිමැවුම් ක්‍රමය භාවිතා කරමින් කාර්ය සාධන වගකීම් වල ප්‍රගතිය සමූහය මැන බලයි. ප්‍රතිදාන ක්‍රමය මඟින් පිළිගත් ආදායම පදනම් වන්නේ පාරිභෝගිකයා වෙත මාරු කරන ලද වටිනාකම් සෘජුවම මැනීම මත ය. ඒ අනුව, බෙදා හරින ලද විදුලිබල ධාරිතාවය මත පදනම්ව, සමූහය මාසිකව පිරිවැටුම වාර්තා කරයි.

ආ) පාරිභෝගික දායකත්වය

සමූහය විසින් සපයන ලද වත්කමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා විසින්, සමස්ත කාලය පුරා විදුලිය පරිභෝජනය කිරීමේ දී සමාන්තරව ලබාගැනීම සහ පරිභෝජනය සිදුකරන බැවින්, විදුලිය සැපයීම උදෙසා වූ වත්කම් සකස් කිරීම සඳහා පාරිභෝගිකයා වෙතින් ආරම්භයේ දී ලැබෙන ප්‍රතිෂ්ඨාව සමස්ත කාලය පුරාම හඳුනාගනු ලැබේ. එබැවින් ලැබෙන ප්‍රතිෂ්ඨාව වත්කමේ වලදායී ජීවිත කාලය පුරා ආදායම වශයෙන් හඳුනාගනු ලැබේ.

ඇ) විද්‍යුත් වාහන ආරෝපණ ආදායම

මණ්ඩලය විසින් පිහිටුවන ලද විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථානවලදී, පාරිභෝගිකයා විසින් තම වාහන ආරෝපණය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන විදුලිය සඳහා මණ්ඩලය විසින්ම සපයන ලද පෙර ගෙවුම් කාඩ්පත් මඟින් ගෙවීමේ දී, වාහන ආරෝපණයෙන් පසුව ආදායම හඳුනාගනු ලැබේ.

ඈ) ගිවිසුම් වගකීම

සමූහය වෙත දැනටමත් ප්‍රතිශ්ඨාවක් ගෙවා ඇති පාරිභෝගිකයකු වෙත සේවාව ලබාදීම සඳහා වූ බැදීම ගිවිසුම් වගකීමක් වේ. එබැවින් විද්‍යුත් වාහන ආරෝපණය සඳහා වූ විද්‍යුත් කාඩ්පතෙහි ඉතිරිව පවතින පෙර ගෙවුම් ශේෂය සහ සේවා සම්බන්ධතාවයන් සඳහා වූ පාරිභෝගික ගෙවීම්වල ක්‍රමක්ෂය නොවූ අගය සමූහයේ ගිවිසුම්ගත වගකීම් ලෙස සැලකේ.

2.6.19 මූල්‍ය ආදායම හා වියදම

ඵලදායී පොළී අනුපාතය (ඊඅයිආර්) උපයෝගී කරගනිමින් පොළී ආදායම හෝ වියදම ගණනය කරන අතර එය ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, සුදුසු පරිදි මූල්‍ය වත්කමේ වටිනාකමට වට්ටම්කර වත්කම් සඳහා වූ පොළී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ.

2.6.20 ලාභාංශ

ලාභාංශ ආදායම් හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලබා ගැනීමට කොටස්කරුවන්ට ඇති අයිතිය තහවුරුවූ පසුය.

2.6.21 වෙනත් මෙහෙයුම් ආදායම් සහ වියදම්

ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් පැනනගින ආදායම් ස්වභාවයකින් යුත් ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම් ගත කර තිබෙනුයේ, වත්කම්වල ධාරක ගණන හා ආශ්‍රිත විකිණුම් වියදම්, බැහැර කිරීම්වලට අදාළ ලැබීම්වලින් අඩු කළ පසුවය.

වෙනත් ආදායම් සහ වියදම්

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

2.6.22. වියදම් හඳුනාගැනීම

විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම (පීපීඒ) මත පැන නගින වියදම් ඇතුළුව වියදම්, ආදායම අතර වූ සෘජු නිශ්චිත සම්බන්ධතාවන් මත පදනම්ව වියදම් විස්තිර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමටත්, ව්‍යාපාරය කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාමටත් දරන වියදම් ලාභ හෝ අලාභය ප්‍රකාශයට හඳුනාගනී.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂකවරුන්ගේ අදහස වන්නේ "වියදම් කියාත්මක කිරීමේ ක්‍රමය" සාධාරණ ලෙස මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ අංගයක් වන අතර එබැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බවයි.

3. සැළකිය යුතු ගිණුම්කරණ උපකල්පන, තීන්දු හා ඇස්තමේන්තු

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වාර්තා කිරීමේ කාලය අවසානයේදී ආදායම, වියදම, වත්කම්, වගකීම් සහ අවදානම් වගකීම් හෙළිදරව් කිරීමේ ප්‍රමාණයට බලපෑම් කළ හැකි විනිශ්චය, තක්සේරු කිරීම් සහ උපකල්පනයන් කළමණාකරණයන් විසින් තීරණය කළ යුතුය.

ඇස්තමේන්තු සහ තීන්දු අබණ්ඩව ඇගයීමට ලක් කෙරෙන අතර ඒ සඳහා වෙතිහාසික අත්දැකීම් සහ වෙනත් සාධක සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් පදනම්වේ.

මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිලිබඳ අවිනිශ්චිත භාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදයන්හි වත්කම් හෝ බැරකම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇති විය හැක. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් විවිධ ගැනීම් සිදුකළ යුතුය. කළමනාකරණයේ මූල්‍ය ප්‍රකාශන වල පිළිගත් ප්‍රමාණයන් කෙරෙහි ඉතාමත් වැදගත් බලපෑමක් ඇති කළ හැකි යැයි තක්සේරු කර ඇති ඒවා පහත සාකච්ඡා කර ඇත.

අලුත් කිරීමේ හා අවසන් කිරීමේ කොන්ත්‍රාත් වල කල්බදු කාලය තීරණය කිරීම - සමූහය බදුකරු වශයෙන් කල්බදු ගිවිසුමක අවලංගු කළ නොහැකි කාල සීමාව සමූහය විසින් තීරණය කරනු ලබන අතර, මෙහිදී යම් කාල සීමාවක් සහිතව බදු ගෙවීම සාධාරණ යැයි නිශ්චිත නම් හෝ බදු නොගැහීම සඳහා ආවරණය කරන ලද කාල සීමාව සාධාරණ ලෙස ක්‍රියාත්මක නොවන බව සහතික නම් කල්බදු කාලය දීර්ඝ කිරීමේ විකල්පයක් මඟින් මෙය ආවරණය කෙරේ.

දිගු කිරීම සහ අවසන් කිරීමේ විකල්ප ඇතුළත් බදු ගිවිසුම් කිහිපයක් සමූහය සතුව ඇත. කල්බදු අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක කළ යුතුද නැද්ද යන්න සාධාරණද යන්න තක්සේරු කිරීමේදී සමූහය තම විනිශ්චය ක්‍රියාත්මක කරයි. එනම්, එය අලුත් කිරීම හෝ අවසන් කිරීම සිදු කිරීම සඳහා ආර්ථික දිරිගැන්වීමක් ඇති කරන අදාළ සියළුම සාධක සලකා බලයි. ආරම්භක දිනට පසු, සමූහය විසින් පාලනය කළ යුතු සැළකිය යුතු සිදුවීමක් හෝ තත්වයේ වෙනසක් සිදු වුවහොත් බදු දීමේ කාලය නැවත තක්සේරු කරන අතර අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය භාවිතා නොකිරීමට බලපායි.

තවද අවසන් කිරීමේ විකල්පයන්ගෙන් ආවරණය වන කාල වකවානු බදු කාල සීමාවේ කොටසක් ලෙස ඇතුළත් කරනුයේ ඒවා ක්‍රියාත්මක නොකිරීම සාධාරණ ලෙස තහවුරු වූ විට පමණි.

මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සටහන්ව තිබෙන මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වල සාධාරණ අගය ක්‍රියාත්මක වෙළඳපල වලින් ලබාගත නොහැකි විට, ඒවායේ සාධාරණ අගය තීරණය කරනුයේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය ඇතුලු තක්සේරු ක්‍රම ශිල්ප යොදා ගනිමිනි. නිරීක්ෂණය කළ හැකි වෙළඳපල වලින් මෙම ක්‍රම වලට අදාළ යෙදවුම් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, මෙසේ කිරීම ඵලදායි නොවන විට සාධාරණ අගයන් ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍ය වේ.

ද්‍රවශීලතා අවදානම හා වෙළඳපලේ පවත්නා අවිනිශ්චිත භාවය වැනි සළකා බැලීමේ නිර්ණායකයන් (considerations) විනිශ්චයන්ට ඇතුළත්ය. මෙම සාධක සම්බන්ධයෙන් වන උපකල්පනයන්හි වෙනස්වීම් මගින් මූල්‍ය උපකරණ වල වාර්තා කළ සාධාරණ අගයට බලපෑමක් ඇති කළ හැකිය.

මූල්‍ය නොවන වත්කම් වල හානි විමෙන් සිදුවන පාඩු සමාලෝචනය කිරීම

වත්කම් වලට හානි සිදුවී තිබේ දැයි සමූහය විසින් තීරණය කරණු ලබන්නේ හානි පිළිබඳ සමාලෝචනයක් කිරීමෙනි. මේ සඳහා මුදල් ජනනය කරන ඒකක වල පාවිච්චියේදී අගය (value in use) ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. පාවිච්චියේදී අගය ඇස්තමේන්තු කිරීම සඳහා මුදල් ජනනය කරන ඒකක වලින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වල ඇස්තමේන්තුවක් කළමනාකරණය විසින් සකස්

කිරීමද, අදාළ මුදල් ප්‍රවාහ වල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරා ගැනීමද අවශ්‍යය. මෙම තක්සේරුව අනුව අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ හා වට්ටම් අනුපාත පිළිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කිරීම අපේක්ෂිත බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයක් ගනී.

වෙළඳ හා වෙනත් ලැබියයුතු අයිතම හානිකරණයෙන් සිදු වන පාඩු

තනි තනිව ඇගයීමට ලක් කර හානි වීමේ අවදානමක් නොමැති බව සොයා ගත් වෙළඳ හා වෙනත් ලැබිය යුතු අයිතම සහ තනිව වැදගත් නොවන ලැබිය යුතු අයිතම ඉන්පසු සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩ අනුව, අදාළ ප්‍රතිඵල තවම ප්‍රත්‍යක්ෂ නොමැති විෂය මූලික සාක්ෂි තිබෙන සිදුව ඇති පාඩු සිද්ධි සඳහා වෙන් කිරීම් කළ යුතු දැයි තීරණය කිරීම පිණිස සාමූහිකව තක්සේරු කරනු ලැබේ. ලැබිය යුතු එකතුවෙන් ලැබෙන (හිඟ මුදල් මට්ටම්, ණය උපයෝගී කර ගැනීම් යනාදී) දත්ත, අවදානම් සංකේන්ද්‍රණයේ ප්‍රතිඵල හා ආර්ථික දත්ත (විරැකියා මට්ටම්, නිශ්චල දේපළ මිල දර්ශක, රටට අදාළ අවදානම හා විවිධ තනි කාණ්ඩායම් වල කාර්ය සාධනය ඇතුලු) සම්බන්ධයෙන් තීන්දු සාමූහික තක්සේරුව විසින් සැළකිල්ලට ගනු ලැබේ.

අයබදු

සීමාසහිත පවන් දනවි (පුද්ගලික) සමාගම	උප පරිපාලිත	විදුලිබලය මිලදී ගැනීම	126,841	396,904
සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම	උප පරිපාලිත	භාණ්ඩ මිලදී ගැනීම	1,860,569	263,294
සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම	පරිපාලිත	ශ්‍රී ලංකා එනජීස් පුද්ගලික සමාගමේ සාමාන්‍යාධිකාරිවරයාගේ වේතන ප්‍රතිපූර්ණය කිරීම	21,966	3,838
සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම	පරිපාලිත	භාණ්ඩ හා සේවා ලැබීම	825,000	
සීමාසහිත කුඩලගමුව මිහිහයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම	උප පරිපාලිත	විදුලිබලය මිලදී ගැනීම	114,778	109,203
දැදුරු ඔය මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම	උප පරිපාලිත	විදුලිබලය මිලදී ගැනීම	69,794	106,153

39.3 සමූහයේ අනෙකුත් සමාගම් අතර සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගණුදෙනුවේ ස්වභාවය	එල්ටීඑල් හෝල්ඩින්ස් සහ පරිපාලිතයන්	ලංකා විදුලිබල සමාගම හා අනුබද්ධිත ආයතන	2023	2022
ලංකා විදුලි සමාගම වෙත භාණ්ඩ හා සේවා විකිණීම	1,286,970	-	1,286,970	387,412
මෙහෙයුම් හා නඩත්තු සේවා	7,645,630	-	7,645,630	4,844,749

39.4 සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ කරන ගනුදෙනු

මණ්ඩලයේ කාර්යයන් සැලසුම් කිරීම,මෙහෙයවීම හා පාලනය කිරීම සඳහා බලය හා වගකීම තිබෙන පුද්ගලයන් මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය ලෙස නිර්වචනය කෙරේ. මණ්ඩලයේ එම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරියා අයත් වේ.

ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ආසන්න පවුල්වල සාමාජිකයන් (CFMs) වේ නම් එයද පහත සඳහන් හෙළිදරව් කිරීම මඟින් සැලකිල්ලට ගනු ලැබේ.

	සමූහය		මණ්ඩලය	
අ) ප්‍රධාන කළමනාකරණය සඳහා ගෙවීම්	2023	2022	2023	2022
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	145,590	137,434	2,498	3,580
පශ්චාත් - රැකියා ප්‍රතිලාභ	-	12,960	-	-
අධ්‍යක්ෂක ගාස්තු	34,500	-	-	-
	180,090	150,394	2,498	3,580

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

40. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

40.1 විශ්ලේෂණය

සමූහය සිය මූල්‍ය උපකරණ භාවිතයේදී පහත සඳහන් අවදානම් වලට නිරාවරණය වේ.

ණය අවදානම
ද්‍රවශීලතා අවදානම
වෙළඳපල අවදානම

ඉහත දැක්වූ එක් එක් අවදානමට සමූහය නිරාවරණය වීම, සමූහයේ අරමුණු හා අවදානම් මැන දැක්වීම සහ කළමනාකරණය හා සමූහය විසින් ප්‍රාග්ධන කළමනාකරණය සඳහා වූ කාර්ය පරිපාටි හා කාර්ය ක්‍රම ගැන තොරතුරු මෙම සටහනෙන් ඉදිරිපත් කෙරේ.

40.2 අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමේ හා සළල අධීක්ෂණයේ සමස්ථ වගකීම රඳා පවතිනුයේ, අධ්‍යක්ෂක මණ්ඩලය මතය. සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටි ස්ථාපිත කරනුයේ සමූහය විසින් මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වයන් හඳුනා ගෙන විශ්ලේෂණය කිරීමට, උචිත අවදානම් සීමාවන් හා පාලක නියම කිරීම, අවදානම් හා සීමාවන්ට අනුකූලවීම හා පසු විපරම් සඳහාය.

සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටිවලට අනුකූලව කළමනාකරණය විසින් පසුවිපරම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබන අතර සමූහය විසින් මුහුණපානු ලබන අවදානම් වලට අදාළව අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණ භූමිකාවට සහාය ලබා දෙයි.

40.3 ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය වගකීමට සම්බන්ධව බැඳීමක් ඉටු කිරීමට අපොහොසත්වීම තුළින් මූල්‍ය කළමනාකරණයක එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට මූල්‍ය පාඩුවක් ඇති කිරීමේ අවදානමයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ණය ප්‍රතිපත්තිය පහත දැක්වේ.

බිල්පත් පියවීම සඳහා තොග පාරිභෝගිකයන්ට දින 15 ක ණය කාලසීමාවක් ලබා දෙන අතර ඉන්පසුව සැපයුම විසන්ධි කිරීමේ නිවේදනයක් නිකුත් කර නිවේදනයේ දින සිට වැඩිමනත් දින 10 ක් ලබා දේ. එයට අවනත නොවන්නේ නම් සැපයුම විසන්ධි කරනු ඇත.

බිල්පත් පියවීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයන්ට දින 30 ණය කාල සීමාවක් ලබා දෙනු ඇත. මෙයින් අනතුරුව රතු නිවේදනයක් නිකුත් කර වැඩිමනත් දින 10 ක් ලබා දෙයි. දින 40 කින් පසුව එයට අවනත නෙවන්නේ නම් සැපයුම විසන්ධි කිරීම පිණිස විසන්ධි කිරීමේ නියෝගයක් නිකුත් කරනු ඇත.

එක් එක් පාරිභෝගිකයාගේ ණය සුදුසුකම් සැලකිල්ලට ගනිමින් පහසුකම් ලබා දීමට පෙර ණය ලබා දීමේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරනු ලැබේ. සළල පාලනය හා කාලීනව ණය ආපසු ලබා ගැනීම පිණිස ණයකරුවන්ගේ ණය වටිනාකමේ අනුව සිදු කෙරෙන විශ්ලේෂණයකින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිඵලදායී ණය පාලන ක්‍රියාවලියක් සමූහය විසින් ක්‍රියාවට නංවා ඇත.

40.4 ද්‍රවශීලතා අවදානම

පැන නගින අවස්ථාවන්හිදීම සිය බැඳීම් සපුරාලීම පිණිස ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොතිබීම නිසා සමූහයේ ද්‍රවශීලතා අවදානම් අවස්ථාවන් ඇතිවේ. ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුගේ විශ්වාසය පළුදු වීම තුළින් සමූහයේ තරඟකාරී තත්වය දුර්වල කරමින් ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් නොතිබීම සමූහයේ මෙහෙයුම්වලට අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන උපාය මාර්ගික්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එමගින් ලැබිය යුතු දෑ ඉතා සමීපව අධීක්ෂණය කර කාල පරාසය අවම කර ගැනීමට කටයුතු කෙරේ. විකුණුම්කරුවන් ප්‍රවේශමෙන් ඇගැයීම හා ප්‍රසම්පාදන උපාය මාර්ග තුළින් ලබා ගැනීම තහවුරු කරනු ලබන අතර උපරිම ණය කාල සීමාවක් ලබාගැනීමෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනේ.

මෙහෙයුම් හා වෙනත් මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෙටි හා මධ්‍ය කාලීන මූල්‍ය උපකරණයන්හි ආයෝජනය කිරීම මගින් සමූහය විසින් සිය ද්‍රවශීලත්වය පවත්වා ගෙන යයි. සහනදායී පොළී අනුපාත මත අයිරා සීමාවන් වැඩි කර ගැනීම පිණිස බැංකුව සමග වන කතිකාවන් තුළින් කෙටි කාලීන ද්‍රවශීලතා ගැටළු ලිහිල් කරගනු ලැබේ. ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා වත්කම් නොතිබීම තුළින් සමූහයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑමක් ඇති කල හැකි අතර එමගින් ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුවන්ගේ විශ්වාසය පළුදු වී තරඟකාරිත්වය දුර්වල විය හැකිය.

40.5 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු වෙළඳපල මිල ගණන්වල වෙනස්වීම් නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්හි සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවධානම, මුදල් අවධානම හා පොළී අනුපාත අවධානමෙන් සමන්විත වේ. වෙළඳපොල අවධානමෙන් බලපෑමට ලක්වන මූල්‍ය උපකරණවලට පොළී සහිත ණය ගැනීම්, තැන්පතු හා විකිණීමට තිබෙන ආයෝජන ඇතුළත් වේ.

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

40.5.1 විදේශීය ව්‍යවහාර මුදල් අවදානම

ව්‍යාපාර සමූහයට අයත් ආයතනයන් හී භාවිතයේ පවත්නා අදාල ව්‍යවහාර මුදල් වලට ඇතුලත් නොවන යම් ව්‍යාවහාර මුදලකින් සිදු කෙරෙන විකුණුම් / මිලදී ගැනීම් වලදී සමූහය ව්‍යවහාර මුදල් අවදානමට අනාවෘතවේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් හෝ යුරෝ ව්‍යවහාර මුදල් මගින් නියම කෙරේ. යම් කාලපරාසයක් තුල සිදුවන විනිමය අනුපාත ගනුදෙනුවලට එරෙහිව අභ්‍යන්තර වශයෙන් ආරක්ෂක පියවර ගනිමින් එම ව්‍යාපාර සමූහය විසින් ව්‍යවහාර මුදල් කෙරේ ඇති අවධානම අවම කෙරේ. ගෙවීම් කිරීමට අවශ්‍ය වන එසේ ගෙවීමට සිදුවන විට එම ගෙවීම සිදු කිරීම සඳහා උපයෝගී කර ගැනීම පිණිස අනාගත ගෙවීම් වලට සමාන වන මුදල් ප්‍රමාණයක් කෙටිකාලීන ආදායම් උත්පාදන මෙවලම් වලට යොදනු ලබයි.

40.5.2 පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු වෙළඳපල පොලී අනුපාතයන්හි වෙනස්වීම නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් අදාළ වන්නේ පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දීර්ඝ කාලීන ණය බැඳීම්වලටය. සමූහය විසින් ලබාගන්නා ණය මුදල්වල පොලී අවදානම සමූහය මගින් කළමනාකරණය කරනුයේ, ස්ථාවර හා පාවෙන පොළී අනුපාත වලින් සම්මිශ්‍රණයවූ ණය ලබාගැනීමේ මෙන්ම තැන්පතු ද පවත්වා ගෙන යාමෙන් වන අතර එමගින් වෙළඳපොල පොළී අනුපාත උච්චාවචනයන් ආවරණය කෙරේ. පොලී අනුපාතයන් අවම කිරීම පිණිස රජයේ ආයතනයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාසිදායක පොලී අනුපාත සඳහා බැංකුව සමග කතිකාවත් පවත්වයි.

41 සාධාරණ අගය

වර්තමාන ගණුදෙනුවකදී මිනුම්කරණ දිනයට පෙළඹවීමකින් හෝ බලහත්කාරයෙන් තොරව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර මූල්‍ය වත්කම් පැවරීමට හෝ වගකීම් බේරුම් කිරීමට ගෙවන වටිනාකම මඟින් මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය සමන්විත වේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රම සහ උපකල්පන භාවිතා කරන ලදී:

අ) මුදල් හා මුදල් සමාන දෑ, වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු, බැංකු අයිරා සහ අනෙකුත් ජංගම වගකීම් වල පවතින කෙටිකාලිනව කල් පිරීම් ස්වභාවය හේතුවෙන් ඒවා ධාරණ අගයට මිනුම් කිරීමට කළමණාකරණය කටයුතු කරන ලදී.

ආ) පොලී අනුපාත, නිශ්චිත අවධානම් සාධක, එක් එක් ගනුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතියේ අවදානම වැනි සාධක මත පදනම්ව සමූහය විසින් දිගු කාලීන ස්ථාවර අනුපාත යටතේ සහ විචල්‍ය අනුපාත යටතේ ලැබිය යුතු දේ අගයකරනු ලැබීය. එසේ කරනු ලැබූ ඇගයීම මත පදනම්ව ලැබිය යුතු දේවල අපේක්ෂිත අලාභ සඳහා දීමනා සැලකිල්ලට ගනී. ඒ අනුව 2023 දෙසැම්බර් 31 වන විට, එවැනි ලැබිය යුතු දේ, සහ ශුද්ධ දීමනාවල ධාරණ අගය ඒවායේ ගණනය කරන ලද සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවීය.

41.1 සාධාරණ අගයට මිණුම්කරණය කරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර

සාධාරණ අගයට මිණුම්කරණය කරන ලද පහත දැක්වෙන මූල්‍ය කාර්යසාධන පත්‍ර සමූහය සතුවේ.
වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 15)
ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සාධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 15)

41.2 සාධාරණ අගයට මිණුම්කරණය නොකරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගයට මිණුම්කරණය කර දක්වා නොමැති මූල්‍ය කාර්යසාධනපත්‍ර වල ධාරණ අගය හා සාධාරණ අගය අතර සැසඳීමක් පහතින් දක්වා ඇති අතර එහි ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගයට සමාන වන කාර්ය සාධන පත්‍රවල වල තොරතුරු ඇතුලත් නොවේ. තවද මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගයද මේ සඳහා සැළකිල්ලට ගෙන නොමැත.

	ධාරණ අගය		සාධාරණ අගය	
	2023	2022	2023	2022
නැවත ගෙවිය යුතු තැම්පතු	146,791	127,828	146,791	127,828
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	12,756,781	17,798,879	12,756,781	17,798,879
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් වල ආයෝජන	6,113,944	5,616,938	6,113,944	5,616,938
වෙනත් තැන්පතුවල ආයෝජනය	13,282	71,399	13,282	71,399
සමාගම් නිලධාරීන්ට ණය	10,157,450	9,077,306	10,157,450	9,077,306
පාරිභෝගිකයන්ට ණය	102,050	283,404	102,050	283,404
ණයකර සඳහා ආයෝජනය කිරීම	-	55,034	-	55,034
	29,290,298	33,030,789	29,290,298	33,030,789

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

41.3 සාධාරණ අගය ධුරාවලිය

ලයිස්තුගත මිල ගණන් හෝ නිරීක්ෂණය කළ හැකි මිල කරන ක්‍රමයන් භාවිතා කරමින් සාධාරණ අගයන් තීරණය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම් හෝ වලංගු කිරීම් ලබා ගනී. ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳ මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වයන් තුළ, සමූහය මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා වඩාත් අදාළ හා විශ්වාසදායක යැයි සැලකෙන තොරතුරු වලට වැඩි බරක් ලබා දෙමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

පහත දැක්වෙන අනුපිළිවලට සාධාරණ අගය නිර්ණය කරනු ලබයි

පියවර 1	:	සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලවල ලයිස්තුගත මිල ගණන් (සකස් නොකළ)
පියවර 2	:	වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල හැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම
පියවර 3	:	වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල නොහැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

2023 දෙසැම්බර් 31 දින වන විට සමූහය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුල සාධාරණ අගයට හඳුනාගෙන ඇති මූල්‍ය උපකරණ පහත පරිදිවේ.

සාධාරණ අගයට මිණුම් කරන ලද වත්කම්	තක්සේරු දිනය	2023	පියවර 1	පියවර 2	පියවර 3
වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්					
ලයිත්තුගත නොකරන ලද ස්කන්ධ ප්‍රග්ධනය	31 දෙසැම්බර් 23	18,097,768	-	-	18,097,768
ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සාධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්					
ප්‍රාග්ධන සුරකුම්පත් වල ආයෝජන	31 දෙසැම්බර් 23	77,994	77,994	-	-
සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම්					
සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම්	31 දෙසැම්බර් 23	-	-	-	-

සාධාරණ අගය විස්තීර්ණ ආදායම තුලින් ගලපනු ලබන මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ විස්තර

ලංකා විදුලි(පුද්ගලික) සමාගම

ලයිස්තුගත නොකල කොටස් වල ආයෝජනවල සාධාරණ වටිනාකම වෙළඳපල බහුවිධ ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කර ඇත. මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරයේ අපේක්ෂිත අනාගත ඉපයීම් සුදුසු ගුණිතයක් භාවිතයෙන් ගුණාකර එය ව්‍යාපාරයේ වටිනාකම ලෙස ප්‍රාග්ධණීතකරයි. සමාගම පොළී හා බදු පෙර ලාභය ඉපැයීමේ පදනම ලෙස භාවිතා කරයි. වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ සාධාරණ වටිනාකම සමාලෝචනය කිරීමේදී එක හා සමාන ව්‍යාපාර ස්වභාවයක් ඇති ආයතන අධ්‍යනය කිරීමට අවධානය යොමු කරන ලදී. එහිදී ආසියානු කලාපයේ පොසිල ඉන්ධන භාවිතා කරමින් විදුලිය සැපයීමට සම්බන්ධ ලැයිස්තුගත සමාගම් විශ්ලේෂණය කරන ලද අතර මෙහෙයුම් වල ස්වභාවය සහ ආයතනවල විශාලත්වය මත පදනම්ව මෙම තක්සේරු කිරීම් සිදුකරන ලදී.

වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) ලිමිටඩ් හි සුළු කොටස් අයිතියක් පැවතීම හේතුවෙන් කළමනාකරණයට ව්‍යාපාරයේ අභ්‍යන්තර තොරතුරු සඳහා සෘජුවම ප්‍රවේශ විය නොහැක. කෙසේ වෙතත්, කර්මාන්තයේ ස්වභාවය සහ බලශක්ති මිලදී ගැනීමේ හිවිසුමේ පොදු ලක්ෂණ සලකා බැලීමේදී, වත්කම් හා වගකීම්වල වෙළඳපල වටිනාකම් 2023 දෙසැම්බර් 31 දිනට වාර්තා කර ඇති ධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ. සමාගම වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමේ සම කොටස් අයිතියෙන් 18.8% ක් හිමිකරගෙන ඇත.

එල්ටිඑල් හොල්ඩින්ස් සාමාගම

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ලයිස්තුගත නොකරන ලද සාමාන්‍ය කොටස්වල සාධාරණ අගයන් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා පුරෝකථනය කල මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතය ආදිය පිළිබඳ උපකල්පන කළමණාකරණය විසින් සිදුකරනු ලැබේ. පරාසයක් තුළ ඇති විවිධ ඇස්තමේන්තු වල සම්භාවිතාව සාධාරණ ලෙස තක්සේරු කරමින් කළමනාකරණය ඇස්තමේන්තුගත සාධාරණ ආයෝජනය වටිනාකම් නිර්ණය කරනු ලැබේ. (පියවර 3)

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පී.ඩබ්ලිව්.ආර්/ඒ/සී.ඊ.බී/සී.එෆ්.ඒ/1/23/20 මෙහි අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 දෙසැම්බර් 31

සභාපති

ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් යෙනතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ (''මණ්ඩලය'') සහ එහි පරිපාලිත සමාගම්වල (''සමූහය'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. එල්.ටී.එල් හෝල්ඩින්ස් ලිමිටඩ් හා එහි පරිපාලිත සමාගම් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මාගේ වාර්තාවේ ඡේද අංක 1.2.1 සහ 1.2.2 හි විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි.

1.2.1 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එල්.කේ.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

(අ) එල්.කේ.ඒ.එස් 1 – මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) ප්‍රමිතියේ 15 වැනි වගන්තිය අනුව මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ නිර්වචනය සහ හඳුනාගැනීමේ නිර්ණායකවලට පටහැනිව වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම වූ රු. මිලියන 54.44 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි.

(ii) ප්‍රමිතියේ 69 වැනි වගන්තියට පටහැනිව, තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට රු. මිලියන 448.66 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය වෙනත් ණය ගැතියන් යටතේ ද, රු. මිලියන 424.19 ක් වූ තොග ගැලපුම් ගිණුමේ බැර ශේෂය වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ද පෙන්වා තිබුණි. තවද, ඉහත තොග ගැලපුම් ශේෂයන් අතුරින් තොග හිඟයට අදාළ රු. මිලියන 138.52 ක් වූ හර ශේෂය සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 128.1 ක් වූ බැර ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ නිරවුල් නොවී පැවතුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) එල්.කේ.ඒ.එස් 2 – තොග සහ එල්.කේ.ඒ.එස් 16 – දේපළ, පිරියත හා උපකරණ

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් වකතුව රු. මිලියන 3,166.1 ක් සහ රු. මිලියන 15,897.9 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, වකතුව රු. මිලියන 5,592.4 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, එම කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) එල්.කේ.ඒ.එස් 8 – ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

(i) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වැනි වගන්තියට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 08 අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. මිලියන 214,809 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පසුගිය වර්ෂය සඳහා වාර්ෂික නියාමන බද්ද ලෙස රු. මිලියන 209.68 ක මුදලක් අය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 167.25 ක් පමණක් ගිණුම්ගත කර තිබුණු අතර රු. මිලියන 42.43 ක වෙනස ප්‍රමිතියේ 41 සහ 42 වගන්තිවලට අනුව අතීතයානුයෝගීව ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආරම්භක රඳවා ගත් ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) එල්.කේ.ඒ.එස් 12 – ආදායම් බදු

2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැහැර හරින ලද බදු වාර්තාවට අනුව, 2015/2016 තක්සේරු වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා ආයතනික ආදායම් බදු, උපයන විට ගෙවන බදු සහ වකතු කළ අගය මත බදු සඳහා බදු සහ දඩ වශයෙන් ගෙවිය යුතු මුදල් පිළිවෙලින් රු. මිලියන 36.62 ක්, රු. මිලියන 665.11 ක් සහ රු. මිලියන 97.5 ක් විය. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් අභියාචනා ඉදිරිපත් කර තිබුණද වර්ෂය අවසානය වන විටත් එම බදු සඳහා අවසන් තීරණයක් ලැබී නොතිබුණි. එසේ වුවද, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 12) 88 වැනි වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි.

(ඉ) එල්.කේ.ඒ.එස් 21 – විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම්වල බලපෑම්

වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2021 ඔක්තෝම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2021 නොවැම්බර් 16 දිනැති අංක 21/1920/317/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ අනපේක්ෂිත ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ඒ.ජ.ඩො මිලියන 38.612 ක හිමිකම් මුදල ගෙවීමට තීරණය වූ අතර මෙම ව්‍යාපෘතිය හරහා මණ්ඩලයට ලැබෙන ආදායම සැලකිල්ලට ගෙන එම අතිරේක ගෙවීම මණ්ඩලය විසින් ගෙවිය යුතු වේ. තවද, සියයට 50 ක් මුලින් ගෙවීමටත් ඉතිරි සියයට 50 දෝෂ වගකීම් කාලය අවසන් වූ පසු ගෙවීමටත් තීරණය විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ ගිණුම් පොත්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු ප්‍රමාද ගාස්තුවෙන් සියයට 50 ට සමාන රු. මිලියන 6,227.3 ක මුදලක් පමණක් ගිණුම්ගත කර තිබූ අතර, එල්.කේ.ඒ.එස් 37 හි 14 වන වගන්තියට අනුව ඉතිරි ඒ.ජ.ඩො මිලියන 19.306 සඳහා වර්ෂය අවසන් වන විටත් කිසිදු ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) එස්.එල්.එෆ්.ආර්.එස් 09 – මූල්‍ය සාධන පත්‍ර

(i) වෙළඳ ණය ගැතියන්ගේ අපේක්ෂිත ණය පාඩු හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, විවිධ ණය ගැතියන්, පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් ඇතුළු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා එවැනි ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 213.49 ක් සහ රු. මිලියන 118.54 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පිළිවෙලින් බෙදාහැරීමේ අංශය 01 සහ 04 හි හිඟව පැවතුණි. කෙසේ වෙතත්, පිළිවෙළින් රු. මිලියන 102.01 ක සහ රු. මිලියන 59.87 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. තවද, බෙදාහැරීමේ අංශ 02 සහ 03 හි පිළිවෙලින් රු. මිලියන 142.37 ක් සහ රු. මිලියන 107.99 ක් වූ වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පවතින හිඟ ශේෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේම, වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතින රු. මිලියන 341.32 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා

නොගෙන රු. මිලියන 74.35 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ii) 2016/17 තක්සේරු වර්ෂයේ සිට 2019/20 තක්සේරු වර්ෂය දක්වා ගෙවන ලද රු. මිලියන 3,914 ක් වූ ආර්ථික සේවා ගාස්තුවේ (ඊ.එස්.සී) හිමිකම් කිව හැකි අවුරුදු දෙකක කාල සීමාව සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉක්මවා තිබුණි. කෙසේවෙතත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට රු. මිලියන 3,914 ක හානිකරණ ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඊ.එස්.සී හි ලැබිය යුතු ශේෂය ප්‍රමිතියේ විධිවිධාන අනුව මූල්‍ය වත්කම්වල නිර්වචනය සපුරාලන්නේ නැති බව නිරීක්ෂණය විය.

1.2.1.2 ගිණුම්කරණ අඩුපාඩු

(i) මණ්ඩලයේ අභ්‍යන්තර තක්සේරු කණ්ඩායම විසින් ලබා දෙන ලද තක්සේරුව අනුව, 2016 වර්ෂයේදී බෙදාහැරීමේ අංශය 04 හි ආයතනික අංශයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් සමාලෝචිත වර්ෂය සඳහා වන ගිණුම් පොත්වල රු. මිලියන 826.6 ක් තොගවලට සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්වලට පිළිවෙලින් හර සහ බැර කර තිබුණි. කෙසේ වෙතත්, එම ට්‍රාන්ස්ෆෝමර්වල අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර, තොරතුරු නොමැතිකම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) තොග සමීක්ෂණ මණ්ඩලය විසින් කරන ලද සමීක්ෂණයෙන් 2023 සැප්තැම්බර් 15 වන දිනට පැරණි ගල් අඟුරු තොගය ගණනය කර තිබුණි. 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය ඉහත ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය භාවිතයෙන් මනිනු ලැබූ අතර, ඩෙෆ් ගල් අඟුරු (deaf coal) තොගය, ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය ඉක්මවීම හේතුවෙන් තාප ගල් අඟුරු තොගය ඍණ මෙට්‍රික් ටොන් 14,964.71 ක් විය. එබැවින්, 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය අවම වශයෙන් ශූන්‍ය ලෙස සැලකිය යුතුය. ඒ අනුව, ගල් අඟුරු බංකර්වල පැවති ගල් අඟුරු තොග සහ ගොඩබාන ලද නව ගල් අඟුරු තොග සලකා බැලීමෙන් පසු තාප ගල් අඟුරු තොග හිඟය මෙට්‍රික් ටොන් 9,286.37 ක් ලෙස ගත යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් ගල් අඟුරු තොගයේ ඍණ ශේෂය සලකා බලා සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට රු. මිලියන 1,778.6 ක් වටිනා මෙට්‍රික් ටොන් 24,251 ක තාප ගල් අඟුරු තොග හිඟයක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, විගණනය මඟින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගල් අඟුරු තොගය රු. මිලියන 924.3 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) තුන්වන සහ සිව්වන කාර්තුව සඳහා ඒකාකාර මිල ජාතික ගාස්තු ගැලපීම් (UNT) ඇස්තමේන්තු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලෙකෝ) වෙත කරන ලද බලශක්ති විකුණුම් ආදායම රු. මිලියන 1,120.1 කින් අඩුවෙන් දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) සම්පූර්ණ කරන ලද රු. මිලියන 18,230 ක් වටිනා කාර්යයන් 8,574 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරිගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට සහ රඳවා ගත් ඉපැයීම්වලට එමඟින් ඇති කරන බලපෑම, තොරතුරු නොමැතිකම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, සිදු කරන ලද අභ්‍යු පරීක්ෂණයට අනුව, ඉදිකිරීම් සියල්ල දැනටමත් අවසන් කර මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද බෙදාහැරීමේ අංශය 04 හි ඉදිකිරීම් අංශයේ (දකුණු පළාත 2) රු. මිලියන 2.98 ක් වටිනා කාර්යයන් දෙකක්, ජා-ඇල ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලයට වැය කළ රු. මිලියන 113.99 ක් සහ ගොඩනැගිලි තුනක් ඉදිකිරීම සඳහා හා කතරගම වීදි ආලෝකකරණය සඳහා වැය කළ රු. මිලියන 135.61 ක් වර්ෂය අවසන් වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉහත කෙරිගෙන යන වැඩ ශේෂයන් අතුරින්, රු. මිලියන 40.15 ක් වූ අමාත්‍යාංශ අරමුදල් යොදවා සිදු කරන ලද කාර්යයන්, වසර 5 කට වැඩි කාලයක් තිස්සේ බෙදාහැරීමේ අංශය 04 හි පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර ඒවා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) නිරවුල් කිරීමෙන් තොරව කාර්යයන් 122 කට අදාළ අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 03 හි මුළු කෙරිගෙන යන වැඩ ශේෂය රු. මිලියන 93.7 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(vi) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හයක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරිගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, මෙම වාහනවල පිරිවැය ඒ වන විටත් අදාළ ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් කර තිබුණද මෙම වාහන හය සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ (අදියර II) තවත් වාහන 11 ක් මණ්ඩලයට පවරා ගැනීමට සහ භාරකාරත්වය තබා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(vii) විමර්ශනය කර නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව රු. මිලියන 113.87 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ ගිණුම් පොත්වල පැවතුණි. බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 129.52 ක් වූ මුළු

මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 34.56 ක් වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ සැපයුම්කරුවන් සතුව පවතින තොග නියෝජනය කර තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 02 හි රු. මිලියන 432.3 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 142.61 ක් හෙවත් සියයට 33 ක් ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම වෙත නිකුත් කර තිබූ (කි.ග් 918,830) භාවිතා කළ නොහැකි ඇලූමිනියම් තොගයේ වටිනාකම නියෝජනය කරන අතර ආසන්න වශයෙන් වසර 2 ක කාලයක් තිස්සේ පැවතුණි. කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් 23 දිනැති අංක 2021/GM/40/DCC චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව එම වටිනාකම එම සමාගමෙන් මණ්ඩලයට ලැබිය යුතු ශේෂයක් ලෙස හිඟුම්ගත කර නොතිබුණි.

(viii) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ලක්විජය බලාගාරය ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 සැප්තැම්බර් 13 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, වර්ෂයේ ලාභයට එරෙහිව අය කිරීමෙන් තොරව 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 167.62 ක මුදල කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවතුණි.

(ix) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ මණ්ඩලය සතු වාහන 03 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(x) රු. මිලියන 34,386.77 ක් වටිනා වේලි වැඩ මහවැලි සංකීර්ණයේ දේපල පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

1.2.1.3 නොසැසඳු වෙනස්කම්

(i) බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් මහජන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, රු. මිලියන 5,444.76 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය රු. මිලියන 5,494.76 ක් වූ අතර එම නිසා රු. මිලියන 50 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, විදුලිබල සැපයුමේ චිරස්ථායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, ඒ.ජ.ඩො 57,338,901 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය ඒ.ජ.ඩො 57,989,633 ක් වූ අතර එම නිසා ඒ.ජ.ඩො 650,732 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 308.1 ක් විය. කෙසේ වෙතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ලැබිය යුතු ශේෂය රු. මිලියන 3,529.6 ක් වූ අතර රු. මිලියන 3,221.5 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට හිඟව පැවතුණි. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 185.41 ක මුදලක් බලපෑමට ලක් වූ තනි තනි ණයගැති හිඟුම් විමර්ශනය කර ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන හිඟුම්, වෙනත් වගකීම් හිඟුම් ආදිය වෙත මාරු කර තිබුණි.

(iv) 2023 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන හිඟුමේ රු. මිලියන 378.39 ක හර ශේෂයක් සහ රු. මිලියන 2,204.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 230.07 ක හර ශේෂයන් සහ රු. මිලියන 465.81 ක බැර ශේෂයන් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන හිඟුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, මූලස්ථානයේ රු. මිලියන 12.75 ක් වූ හඳුනා නොගත් ආරම්භක හර ශේෂය වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පැවතුණු බවත් බස්නාහිර පළාත දකුණ (ii) සහ සබරගමුව පළාතේ රු. මිලියන 95.27 ක් වූ ආරම්භක බැර ශේෂය වසර 01 කට වැඩි කාලයක් තිස්සේ එම හිඟුමේ පැවතුණු බවත් නිරීක්ෂණය විය.

(v) 1998 සිට 2023 දක්වා කාලය තුළදී ණයගැතියන්ගෙන් එකතු කරන ලද රු. මිලියන 75.27 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව අවිනිශ්චිත හිඟුමට ඇතුළත් කර තිබුණි.

(vi) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සිදුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 39 කින් (රජයේ සෞඛ්‍ය අංශයේ ආයතන 35 ක් ඇතුළුව) ලැබිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් රු. මිලියන 159.47 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ආයතන සමඟ ශේෂයන් සැසඳීමට කටයුතු කර නොතිබුණි.

1.2.1.4 නොසැසඳු වෙනස්කම්

රු. මිලියන 39.8 ක කල්බදු ණය හිමියන්ගේ ශේෂ තහවුරු කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(i) රු. මිලියන 1,728.36 ක් වූ නොසැසඳු සම්බන්ධිත පාර්ශව හර ශේෂ සහ රු. මිලියන 812.7 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් වෙනත් ණය ගැතියන් සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) මණ්ඩලයේ හා ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (පාරිතෝෂික) ගණනය කිරීම සඳහා භාවිතා කරන වට්ටම් අනුපාතය සහ කාර්ය මණ්ඩල පිරිවැටුම සම්බන්ධයෙන් ආයුගණක තක්සේරුවේ උපකල්පනවල වෙනස්කම් නිරීක්ෂණය විය.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

(iii) එස්.එල්.එෆ්.ආර්.එස් 9 ප්‍රමිතයෙහි 5.5.15 (අ) ඡේදයට අනුව සමාගම විසින් රු. මිලියන 1,553 ක් වූ වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iv) ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ කල්පිත ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 14,904.63 ක් වූ සියයට 10 ක අංකිත මිල සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබූ අතර පසුව, එම මුදල ණයගැතියන්ට දුන් වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි නියම කර ඇති විධිවිධානවලට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සහ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ඉහත ගැලපීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

(v) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ 5.5 ඡේදයට අනුව, ගනුදෙනු හෝ වෙනත් සිදුවීම්වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම, ආදායම් සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකම එකවර හඳුනා ගැනීමට හේතු විය හැක. ආදායම සහ ඒ ආශ්‍රිත වියදම් එකවර හඳුනා ගැනීම සමහර විට ආදායම සමඟ වියදම් ගැලපීම ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2017 සිට 2023 යන කාලපරිච්ඡේදය සඳහා (2021 හැර) සූර්ය බලශක්තිය මිලදී ගත් පිරිවැය වූ රු. මිලියන 4,658.2 ක් අදාළ වර්ෂවල විකුණුම් පිරිවැය ලෙස හඳුනා ගැනීම වෙනුවට, සමාගම විසින් එම පිරිවැය මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස හඳුනාගෙන තිබුණු අතර මිලදී ගත් සූර්ය බලශක්තියේ විකුණුම් ආදායම අදාළ වර්ෂවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම්, වර්ෂය සඳහා ලාභය සහ ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 2,819.6 කින්, රු. මිලියන 1,838.6 කින් සහ රු. මිලියන 4,658.2 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(vi) 2023 දෙසැම්බර් 31 දිනට විවිධ සේවා සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 5,777.8 ක් වූ අතර, මෙම ශේෂය අතරින්, රු. මිලියන 5,770.6 ක් ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළදී බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. එම රු. මිලියන 5,770.6 ක ශේෂයෙන්, 2017 සිට 2023 දක්වා කාලය සඳහා ශුද්ධ ගිණුම්කරණ සහ ශුද්ධ ප්ලස් ක්‍රම භාවිතා කරමින් බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා ලංවිම වෙතින් ලැබිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයෙන් ලද ශේෂ තහවුරු කිරීම අනුව, සමාගමට ගෙවිය යුතු ශේෂයක් නොමැති බව මණ්ඩලය තහවුරු කර තිබුණි. තවද, ශුද්ධ ගිණුම්කරණ සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් විදුලිය මිලදී ගැනීම සඳහා පාර්ශව දෙක අතර විධිමත් ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගත නොහැකි වූ අතර, ඉහත ලැබිය යුතු ශේෂය සඳහා සමාගම රු. මිලියන 5,300.9 ක හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන වගන්තියට අනුව, වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට කාණ්ඩ 04 කට අදාළව රු. මිලියන 11,114.4 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම්, ප්‍රමිතිවලට අනුව අවශ්‍ය පරිදි සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(viii) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ඇන්ට් ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හා ලෙකෝ ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) සමාගමේ හි මූල්‍ය ප්‍රකාශන අතර ආදායම්, විකුණුම් පිරිවැය, වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු මුදල් ආදි ශේෂයන් සම්බන්ධයෙන් පිළිවෙළින් රු. මිලියන 398.7 ක සහ රු. මිලියන 50 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොර

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු (කෙටුම්පත් වාර්ෂික වාර්තාව) මත මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය සහ සමූහය විසින් මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ වීවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මණ්ඩලයේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්

මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදි. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අප වගකිව යුතුය. මාගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ ජේද අංක 1.2.1.1 (අ)(i),(ii), (ආ)(i), (ඇ)(i), (ඊ)(i), 1.2.1.2 (iv),(v),(vi),(viii),(ix), 1.2.1.3 (ii),(iii),(iv),(v), 1.2.2 (iv),(v),(vi),(vii) හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සමඟ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය	නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 2,957.3 ක් වූ ගිගාවෝට් 27.31 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.
(ආ) 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත	
(i) 3.5 වගන්තිය	2020 සිට 2023 දක්වා රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 286.66 ක් මණ්ඩලයට ප්‍රතිපූරණය කළ යුතුය. ඊට අමතරව, 2014 සිට 2023 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද ශ්‍රී ලංකා එනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස රාජකාරී කරන නිලධාරියෙකුගේ වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 24 ක මුදලක් දරා තිබුණි.

(ii) 7.7 වගන්තිය	අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2024 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.
(ඇ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනතේ (V) වන කොටසෙහි 17 වගන්තිය	2022 වර්ෂයේ සිට්වන කාර්තුවේ සිට 2023 අගෝස්තු දක්වා ලංකා විදුලි සමාගම විදුලිය සැපයීමේදී අය කරන ලද රු. මිලියන 1,224.1 ක සමාජ ආරක්ෂණ දායක බදු (SSCL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2024 මැයි මාසය අවසන් වන විටත් ගෙවා නොතිබුණි.
(ඈ) 2023 පෙබරවාරි 07 දිනැති අංක 23/0199/601/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ගරු නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අංක 198/2024 සහ 254/2024 දරන අධිකරණ නඩු දෙකක් සඳහා බාහිර නීතිඥයෙකුගේ සේවය ලබාගෙන තිබුණි. පසුව, සේවා කාලය සඳහා රු. මිලියන 7.6 ක ඉන්වොයිසි මණ්ඩලය වෙත යොමු කර තිබුණි. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් මාසය තුළදී නීතිමය ගාස්තු ලෙස ඉන්වොයිස් කරන ලද රු. මිලියන 7.6 ක මුදල අමාත්‍ය මණ්ඩලයේ තීරණයේ සඳහන් පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.3 **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

(අ) ''ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම'' යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ දීමනා වර්ග 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළදී රු. 507.47 ක් ගෙවා තිබුණි.

(ii) වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 10 තුළදී නිලධාරීන් 517 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 99.85 ක් ගෙවා තිබුණි.

(iii) සිදු කරන ලද අහඹු පරීක්ෂණයට අනුව, තනතුරකට පත් කරන ලද නිලධාරීන්ට එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දීමනා ද ගෙවනු ලබන බව නිරීක්ෂණය විය.

(iv) එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් ලබාගෙන ඇති දේපල ණය සඳහා අය කරන ලද පොලියෙන් 2/3 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. 2013 සිට 2023 දක්වා ප්‍රතිපූරණය කරන ලද පොලී මුදල රු. මිලියන 16,789.5 ක් විය.

(ඇ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018 සිට 2021 යන වර්ෂයන් තුළදී මෙගාවොට් 2,032 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීම ඇතුළත් කර තිබුණු නමුත් මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව, 2023-2042 සඳහා අනුමත කරන ලද අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2023 දී මෙගාවොට් 607 ක මුළු ධාරිතාවකින් යුත් බලාගාර ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට මෙගාවොට් 185.6 ක බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව උත්පාදනය බලාගාර ක්‍රියාත්මක කිරීම ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස අඩු වූ අතර අඩු පිරිවැයකින් යුත් විදුලි බලය

සැපයීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 108.29 ක් වූ රු. මිලියන 2,957.3 ක් වටිනා ගිගාවොට් පැය 27.31 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි. සාපේක්ෂව, ඒකකයක සමස්ත සාමාන්‍ය පිරිවැය සහ වෙස්ට් කෝස්ට් බලාගාරයෙන් මිලදී ගත් විදුලිය සඳහා සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු. 40.92 ක් සහ රු. 68.29 ක් විය.

(ඈ) කෙටි කාලීන පදනම මත මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදනය කිරීම.

(i) 2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සමනලවැව ජලාශයෙන් වාරිමාර්ග සඳහා ජලය මුදා හැරීම සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර තිබූ අතර මාස 4 සිට 6 දක්වා කාලය සඳහා මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදනය කිරීමට අනුමත කර තිබුණි. මෙය අනුගමනය කරමින්, මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් (PUCSL) 2023 අගෝස්තු 18 වන දින සිට අතිරේක මෙගාවොට් 100 ක ධාරිතාවක් ප්‍රසම්පාදනය කිරීමට අවසර ලබා දී තිබුණි. මණ්ඩලය විසින් එස් පවර් මාතර (මෙගාවොට් 23.75) සහ එස් පවර් ඇඹිලිපිටිය (මෙගාවොට් 93) සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 116.75 ක් වූ මුළු ප්‍රසම්පාදනය මුලින් අනුමත කළ සීමාව ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදනය කරන ලද ජනන ධාරිතාව, අනුමත ජනන ධාරිතාව ඉක්මවා යාම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 09 දිනැති අංක PUC/LIC/2023/TL/21 දරන ලිපිය) සහ සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(5) වගන්තියට අනුව PUCSL අනුමැතිය සඳහා කෙටුම්පත් විදුලි මිලදී ගැනීමේ ගිවිසුම ඉදිරිපත් කිරීම වෙනුවට මණ්ඩලය සහ එස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම අතර අත්සන් කරන ලද විදුලි මිලදී ගැනීමේ ගිවිසුම PUCSL වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 02 දිනැති අංක PUC/LIC/2023/TL/17 දරන ලිපිය) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(7) වගන්තිය යටතේ ඉහත අතිරේක විදුලි මිලදී ගැනීම් සඳහා PUCSL හි අනුමැතිය ලබා දී නොතිබුණි. ඒ අනුව, සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ විදුලිය ජනනය කිරීම සඳහා වූ බලපත්‍රය එස් පවර් මාතර බලාගාරයට සහ එස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට PUCSL විසින් නිකුත් කර නොතිබුණි.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) මණ්ඩලයේ මූලස්ථානය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව මුලින් 2012 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන්, එය 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 කට නැවත ප්‍රදානය කරන ලද අතර, නිම කිරීමේ දිනය 2023 අගෝස්තු 15 ලෙස නියම කර තිබුණි. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 14 වන දින, විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි. 2023 ජූලි 31 වන දින වන විට, කොන්ත්‍රාත්කරු 2023 අගෝස්තු මාසයේදී වැඩ අත්හිටුවා තිබුණද, කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. 2023 ඔක්තෝබර් 16 වන දින අඩු කරන ලද වැඩ විෂය පථයක් සඳහා ප්‍රමාණවත් නිම කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.2 ක් පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද රු. මිලියන 1,484.9 ක් නිෂ්ක්‍රීය විය.

(ආ) 1988 දී මණ්ඩලයේ ප්‍රධාන ජනන සැලැස්මේ හඳුනාගත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. මුලින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරන ලද අතර, මූලික වියදම් සඳහා රු. මිලියන 1.3 ක් වැය කිරීමෙන් පසුව එය මණ්ඩලයට මාරු කර තිබුණි. 2021 සැප්තැම්බර් 30 වන විට, මණ්ඩලය මූලික කටයුතු සඳහා රු. මිලියන 301.19 ක් වියදම් කර තිබුණද, අවසානයේ ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 7 ක කුඩා ජල විදුලි බලාගාර දෙකක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නැවත පැවරීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ වියදම් අනාර්ථික වීමට මෙම තීරණය හේතු වූ අතර, මෙම වියදම් අයකර ගැනීමට හෝ ඒවා නිසි ලෙස ගිණුම්ගත කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.

(ඇ) 2000 වර්ෂයේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක පිරිවැයට ඉඩම් 18 ක් මිලදී ගෙන තිබුණු අතර 2023 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. එම ඉඩම් අතරින් රු. මිලියන 36.48 ක් වටිනා ඉඩම් 4 ක් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 04 හි ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, නියදි විගණන පරීක්ෂණයට අනුව, අදාළ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර වර්ෂ 6 ක් ඉක්මවී තිබුණද, ඉඩම් දහයක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2022 අංක 16 දරන විදුලිබල (සංශෝධන) පනතට අනුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත නව ජනන බලාගාරයක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද දැන්වීමක් මත ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අදාළ නොවේ. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළදී SLSEA වෙතින් මණ්ඩලයට ලද එකතුව මෙගාවොට් 598 ක ධාරිතාවයකින් යුතු ව්‍යාපෘති අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 4 ක ධාරිතාවයක් සහිත බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඉ) හදිසි විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා සිටින විට දකුණු පළාතේ විදුලිබල පද්ධතියේ පවතින විදුලිබල ජනනයේ සීමාවන් සහ සම්ප්‍රේෂණ ජාලයේ සීමාවන් මණ්ඩලය විසින් 2016 වසරේ සිට ඉස්මතු කර තිබුණි. කෙසේවෙතත්, වසර 02 ක සහ මාස 07 ක ප්‍රමාදයක් සහිතව දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත 2022 අප්‍රේල් 20 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ හොරණ - පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය සහ 2021 අප්‍රේල් 01 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ - නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 51.15 ක් සහ සියයට 59 ක් විය. තවද, කොත්මලේ - නව පොල්පිටිය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.

(ඊ) නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය මිලදී ගැනීම් සහ ඉන්ධන මිලදී ගැනීම් (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව) සඳහා ප්‍රමාද පොළිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු. මිලියන 16,320 ක් සහ රු. මිලියන 5,620.6 ක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ණය වාරික ආපසු ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී පැහැර හැරීමේ පොලිය ලෙස රු. මිලියන 10.33 කට සමාන මුදලක් ද දරා තිබුණි.

(උ) අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව හදිසි විදුලි මිලදී ගැනීම්, 2016 දී මණ්ඩලයේ ස්ථිර සේවකයින් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීම, මණ්ඩලයේ සේවකයින්ට අනවසර ප්‍රතිලාභ ගෙවා තිබීම හෝ ගෙවීම් කිරීම වැනි කරුණු හේතුවෙන් තෙල්, ගල් අඟුරු සහ අමතර කොටස් මිලදී ගැනීම, විදුලිබල මිලදී ගැනීම් සඳහා ගෙවීම සහ මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා කෙටි කාලීන ණය සහ දිගු කාලීන ණය ලබා ගැනීමට මණ්ඩලයට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළදී පොලී වියදම් ලෙස මණ්ඩලයට රු. මිලියන 36,873.4 ක් දැරීමට සිදු විය.

(ඌ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණු අතර මෙම ධාරිතාවය අතරින් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 102 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(එ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා 2000 වර්ෂයට පෙර වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. 2007 ට පෙර අනුමත කර ඇති NCRE ව්‍යාපෘති සඳහා පමණක් වර්තමානයේදී මෙම ගාස්තු අදාළ වන අතර දැනට NCRE ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක වේ. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. 2020 ජනවාරි 16 දිනැති අංක ඩීජිඑම්/එස්වයිසී/ටීසීඑච්/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව නව බලාගාරද ඇතුළුව ජල විදුලි බලාගාරයක තථ්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2023 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 25.09 ක් සහ වියළි කාලය සඳහා රු. 28.46 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ජලවිදුලි ඒකකයක සාමාන්‍ය පිරිවැය රු.3.52 ක් විය. 2022 අගෝස්තු 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් තිබියදීත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වළකාලන ලද පිරිවැය ක්‍රමය මත පදනම් වූ කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) එකතුව රු. මිලියන 32,719.06 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන්, සැලසුම් කළ නිම කිරීමේ දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 26 සිට 70 දක්වා පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් පළමු දිර්ඝ කිරීම තුළදී එම ව්‍යාපෘති නිම කර නොතිබුණු බවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට භෞතික ප්‍රගතිය සියයට 60 සිට සියයට 99.7 දක්වා පරාසයක පැවති බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

(ඔ) ඉදිකිරීම, අයිතිය සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 ක සූර්ය උද්‍යාන පහසුකම සංවර්ධනය කිරීම සහ ටර්න්කී පදනම මත කිලෝවොට් 132 ධාරිතාවයක් සහිත සම්ප්‍රේෂණ පහසුකම ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2023 අගෝස්තු 16 වන දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) මෙම සමූහයේ එක් සමූහ හවුල්කරුවකු (තෝරාගත් ලංසුකරු) මූල්‍ය ශක්‍යතාවය (යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ලේඛනවල පළවන වෙළුමේ අංක 4.2.1, 4.2.2, 4.2.3 (i) සහ (ii) වගන්ති) යටතේ ඇති සියලුම නිර්ණායකයන්ට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘති කමිටුව (PC) එම සමූහ හවුල්කරුගේ මූල්‍ය හැකියාවන්හි නිරීක්ෂණය වූ අනුකූල නොවීම් බැහැර වීමක් ලෙස සටහන් කර තිබුණි.

(ii) සමූහයෙන් ඉල්ලා සිටි පැහැදිලි කිරීම් සඳහා ලද ප්‍රතිචාරය සලකා බැලීමෙන් පසු, සමූහය RFP හි පළවන වෙළුමේ 4.2 වගන්තියේ දක්වා ඇති මූල්‍ය ශක්‍යතා අවශ්‍යතා සපුරා නොමැති බවත් එය බැහැර වීමක් බවත් ව්‍යාපෘති කමිටුවේ අදහස විය. කෙසේ වෙතත්, 2023 මාර්තු 22 දිනැති ව්‍යාපෘති කමිටුවේ වාර්තාව මගින් ඉහත සඳහන් කළ මූල්‍ය ශක්‍යතා බැහැර වීම් ධනාත්මකව සලකා බලා, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 7.61 ක ගාස්තුවක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩො මිලියන 1.25 ක අර්ධ වාර්ෂික ගෙවීමක් උපරිම පිළිගත හැකි අගයන් ලෙස එකඟ කර ගැනීම සඳහා සමූහය සමඟ සාකච්ඡා කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි. එසේ නොමැති නම්, දැනට ක්‍රියාත්මක RFP ක්‍රියාවලිය අවසන් කර මෙම ව්‍යාපෘතියට නව RFP ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි.

(iii) සමූහය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම පිළිවෙලින් කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 12.2 ක් සහ ඒ.ජ.ඩො. මිලියන 1.67 ක් (යෝජිත සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම ඒ.ජ.ඩො. මිලියන 25.58 ක් විය.) විය. සූර්ය උද්‍යාන පහසුකමට ඇතුළත් කර තිබූ සම්ප්‍රේෂණ පහසුකම් පිරිවැය ඉවත් කරමින් සමූහය විසින් 2023 මැයි 03 වන දින වෙනම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. සංශෝධිත යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො. ශත 8.15 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම ඒ.ජ.ඩො. මිලියන 3.31 ක් විය. ඒ අනුව, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම ඒ.ජ.ඩො. මිලියන 50.81 ක් පමණ විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම ඒ.ජ.ඩො. මිලියන 27.3 ට වඩා අඩු විය යුතුය.) සියයට 86 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(iv) 2023 මැයි 17 දිනැති ලිපියට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 8.00 ක් ලෙස සහ සම්ප්‍රේෂණ පහසුකමේ විෂය පථයේ යම් වෙනස්කම් සහිතව සම්ප්‍රේෂණ පහසුකම සඳහා අර්ධ වාර්ෂික ගෙවීම ඒ.ජ.ඩො මිලියන 2.29 ක් ලෙස සංශෝධනය කිරීමට සමූහය අවසන් වශයෙන් එකඟ වී තිබුණි. එබැවින්, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම ඒ.ජ.ඩො මිලියන 35.13 ක් විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 29 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(v) ආනයන බදු නිදහස් කිරීම හෝ ප්‍රතිපූරණය කිරීම පිළිබඳව RFP හි සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනිමින් එය තීරණය කළ යුතු බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබියදී සහ එවැනි කොන්දේසි RFP හි සඳහන් කර නොමැති විටදී සම්ප්‍රේෂණ පහසුකම සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 8.1.3 (iv) (b) වගන්තියට අනුව, ව්‍යාපෘති සමාගම විසින් යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ද්‍රව්‍ය ආනයනය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ගෙවිය යුතු රේගු හා අනෙකුත් ආනයන බදු, තීරුබදු, අය බදු සහ ගාස්තුවලින් (වැට් සහ SSCL ඇතුළුව) නිදහස් කිරීම් ලබා දී නොමැති නම්, අංක 5.3.4 වගන්තියට අනුව ප්‍රතිපූරණ ඉන්වොයිසියක් ඉදිරිපත් කිරීම මගින් බදු, තීරුබදු, අය බදු සහ ගාස්තු (SSCL ඇතුළුව) ප්‍රතිපූරණය කර ගැනීමට ව්‍යාපෘති සමාගමට අයිතියක් ඇත. තවද, ඒ.ජ.ඩො මිලියන 3.27 ක් වූ රේගු නිශ්කාශනය (CUSDEC) මත ඇස්තමේන්තුගත රේගු බදු සහ අනෙකුත් අය බදු සැලකිල්ලට ගැනීමෙන් පසු සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම ඒ.ජ.ඩො මිලියන 39.96 ක් විය) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 46 කින් තවදුරටත් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(vi) 2023 මැයි 15 වන දින පැවති රැස්වීමේදී, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 8.00 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩො මිලියන 2.29 ක අර්ධ වාර්ෂික ගෙවීමක් යටතේ කොන්ත්‍රාත්තුව සමූහයට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) තීරණය කර තිබුණි. 2023 ජූලි 17 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමූහයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව විසින් CANC වෙත කිසිදු නිර්දේශයක් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, සූර්ය උද්‍යාන පහසුකම සඳහා පිළිගත් ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා පිළිගත් අර්ධ වාර්ෂික ගෙවීම, 2023 අප්‍රේල් 27 දිනැති වාර්තාව මගින් ව්‍යාපෘති කමිටුව විසින් නිර්දේශ කරන ලද සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 7.62 ක උපරිම පිළිගත හැකි ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩො මිලියන 1.994 ක උපරිම පිළිගත හැකි අර්ධ වාර්ෂික ගෙවීම ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(vii) මෙවැනි ප්‍රසම්පාදනයක් සඳහා RFP දෙකක් ඉදිරිපත් වීම සහ තාක්ෂණික ඇගයීම සහ මූල්‍ය ඇගයීම සඳහා RFP එකක් පමණක් සලකා බැලීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කළ පරිදි තරඟකාරිත්වයක් නිර්මාණය වී නොතිබුණි. එබැවින්, සූර්ය උද්‍යාන පහසුකම සහ සම්ප්‍රේෂණ පහසුකම යන දෙකටම වඩාත් වාසිදායක මිලක් ලබා ගැනීමේ අවස්ථාව මණ්ඩලයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. තවද, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 7.12.1 වගන්තියට අනුව ඵලදායී තරඟකාරිත්වයක් නොමැතිකම පැහැදිලිව පෙනෙන විට ලද සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණය කළ හැකි බව නිරීක්ෂණය විය.

(ඕ) 2023 මාර්තු 07 වන දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ ඒකකය ස්ථාපිත කර තිබූ අතර, එහි මෙහෙයුම්වලින් මාස 8 කට පසු, 2023 ඔක්තෝබර් 31 දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එහි ක්‍රියාකාරකම් අත්හිටුවීමට තීරණය කර තිබුණි. මෙම කෙටි කාලය තුළ, විදුලි පරිභෝජනය අඩු කිරීමේ සහ ඉල්ලුම කළමනාකරණය කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි නිසි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර බාහිර සංවිධාන 03 ක් හරහා රු. මිලියන 14.33 ක් වැය කරමින් වීඩියෝ 18 ක් සකස් කර තිබුණි. තවද, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව, මෙම වීඩියෝ සජීවීව පටිගත කිරීමෙන් තොරව පරිගණක සජීවිකරණය මගින් නිෂ්පාදනය කර තිබුණි. එබැවින්, ඉහත කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන් විසින් දක්වා ඇති පරිදි ඇත්ත වශයෙන්ම සිදු නොකළ ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය රු. මිලියන 6.4 ක් ගෙවා තිබුණි.

(ක) 2021 දී ක්‍රියාත්මක කරන ලද මන්නාරම සුළං විදුලි ජනන ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 15.2 ක් වැය කර තිබූ අතර එය අනාවර්තක වියදමක් ලෙස නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු. මිලියන 70,019.1 ක් විය. ඒ අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,181 ක් මාස 06 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. තවද, රු. මිලියන 2,252.2 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් වෙළඳ ණයගැතියන් සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනය රු. මිලියන 4,625.9 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) ඉහත මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 2,773.3 ක් අවසන් කරන ලද ණයගැති ශේෂයක් (අක්‍රීය ණය ගැතියන්) ලෙස වර්ගීකරණය කර මාරු කර තිබූ අතර එයින් රු. මිලියන 1,106.6 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය.

(ii) බෙදාහැරීමේ අංශවල අවසන් කරන ලද ණයගැතියන් අතරින්, වසර 3 කට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 1,983.3 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 927.8 ක් බෙදාහැරීමේ අංශ 01 හි අවසන් කරන ලද ණයගැතියන් නියෝජනය කරයි.

(iii) සම්බන්ධතා 41,441 ක් සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත 02) හි රු. මිලියන 104.39 ක් වූ අවසන් කරන ලද සාමාන්‍ය සැපයුම් ණයගැතියන් අතරින්, වසරකට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 33.65 ක් අයවිය යුතුව පැවතුණි. තවද, ඉහත සම්බන්ධතා අතරින් රු. මිලියන 10.98 ක් සම්බන්ධතා 13,549 කට අදාළව බැර ශේෂ ලෙස පැවතුන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ DCC/COM/03/2009 දරන චක්‍රලේඛය අනුව ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව, පෙර හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව අවසන් කරන ලද ගනුදෙනුකරුවන්ට නව සම්බන්ධතා ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(iv) 2023 ඔක්තෝබර් 31 දිනට නැගෙනහිර, උතුර සහ සබරගමුව පළාත්වල හිඟ ණයගැතියන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියදි විගණන පරීක්ෂණයට අනුව, බිල්පත් වටිනාකම රු. 50,000 ඉක්මවූ සහ වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින ගනුදෙනුකරුවන් 357 දෙනෙකුගෙන් රු. මිලියන 39.65 ක හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(v) නියදි විගණන පරීක්ෂණයට අනුව, දීර්ඝ කාලයක් තිස්සේ රු. මිලියන 12.21 ක හිඟ විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 46 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අවසන් කරන ලද (අක්‍රීය) ණය ගැතියන් ලෙස වර්ගීකරණය කර තිබුණි. අයකර ගැනීමෙන් තොරව එයින් රු. මිලියන 11.66 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර රු. මිලියන 5.29 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ අනෙකුත් ණයගැතියන්ගේ ශේෂය රු. මිලියන 24,327.1 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයේදී විදුලි සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 256.91 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 70.14 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. තවද, බෙදාහැරීමේ අංශය 01 ට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පූජනීය ස්ථානවලින් රු. මිලියන 42.5 ක් අයවිය යුතුව පැවතුණි. තවද, හම්බන්තොට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සම්බන්ධයෙන්, තාවකාලික සම්බන්ධතා සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් 2010 අප්‍රේල් 26 වන දින අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට පටහැනිව ආරක්ෂක තැන්පතුවක් හෝ ඇස්තමේන්තුගත ගාස්තුවක් ලබා ගැනීමෙන් තොරව සමහර තාවකාලික සම්බන්ධතා ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(ii) 2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණයගැතියන් තුළ ඇතුළත් කර ඇති විවිධ ණයගැතියන්ගෙන් රු. මිලියන 3,261.9 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 677.59 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ සහ රු. මිලියන 329.38 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. වසර පහකට වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු ශේෂයන් අතරින්, රු. මිලියන 14.34 ක්, රු. මිලියන 155.61 ක් සහ රු. මිලියන 2.66 ක් පිළිවෙලින් පාරිභෝගික බල්බ ණය, ආයතන සඳහා තාවකාලික විදුලි සැපයීම සහ 2013 වර්ෂයේදී කොළඹ නගර ආදායම් කවුන්ටරයේ සිදු වූ මුදල් හිඟයෙන් ලැබිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) සියලුම බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ වත්කම් කළමනාකරණ අංශයට අදාළව එකතුව රු. මිලියන 65.81 ක් වූ තොග හිඟයක් වසරකට වැඩි කාලයක් තිස්සේ විවිධ ණයගැතියන් තුළ පැවතුණු අතර, එම තොග හිඟය අතරින් රු. මිලියන 34.15 ක් ජනන අංශයේ ලක්විජය බලාගාරයට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. තවද, ඉහත තොග හිඟය අතරින්, රු. මිලියන 31.66 ක් වගකිවයුතු නිලධාරීන් සමඟ හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 2.8 ක තොග අලාභ සඳහා පමණක් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(iv) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසම්කරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 98 කින් රු. මිලියන 435.52 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 153.03 ක් සහ රු. මිලියන 83.41 ක් අයකර ගැනීමෙන් තොරව පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී හානිකරණ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 110.5 ක් පමණක් වෙන් කර තිබුණි.

(v) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වසර හයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි.

(vi) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 241.72 ක් අයවිය යුතුව පැවතුණි. එයින්, කොළඹ නගර පළාත විසින් රජයේ ආයතනවලට ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 189.67 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් 2013/14 තක්සේරු වර්ෂය සඳහා වන උද්දේශිත ලාභාංශ (deemed dividend) බදුවලට අදාළව රු. මිලියන 1,270.8 ක් දේශීය අදායම් දෙපාර්තමේන්තුවට පියවා නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාවට අනුව, 2022 වර්ෂයෙදී ගත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් විදුලිය ජනනය නොකර රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවල ජලය මුදා හැරීම හේතුවෙන් අතිරේක පෞද්ගලික විදුලිය මිලදී ගැනීම සඳහා මණ්ඩලයට ආසන්න වශයෙන් රු. මිලියන 262.6 ක පාඩුවක් දැරීමට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2022 ජූලි 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බවත්, වාර්තාව 2022 නොවැම්බර් 16 සහ 2022 දෙසැම්බර් 08 දින ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය එම වාර්තාව ප්‍රතික්ෂේප කර 2023 පෙබරවාරි 22 දින නව කමිටුවක් පත් කර තිබුණි. කමිටුව 2023 නොවැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට තම වාර්තාව ඉදිරිපත් කර තිබුණද, කමිටුව විසින් කරන ලද නිර්දේශ 2024 මැයි මස අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉහත කමිටු දෙකෙහි සාමාජිකයින් සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 1.23 ක මුදලක් ගෙවා තිබුණි.

(ඉ) කෙටුම්පත් සාමූහික ගිවිසුමේ විධිවිධානවලට අනුව, 2021 මැයි 10 දිනැති 21/0786/318/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2021 ජූනි 15 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව, මණ්ඩලය 2021 වර්ෂයේදී සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, 2020 ට සාපේක්ෂව 2021 දී කාර්ය මණ්ඩල වියදම් රු. මිලියන 9,629.9 කින්, 2022 දී රු. මිලියන 6,725.9 කින් සහ 2023 දී රු. මිලියන 8,354.7 කින් පමණ වැඩි වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) රු. මිලියන 3,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත බහාලූම්ගත ජංගම ඩීසල් ජනක යන්ත්‍ර මිලදී ගැනීම සහ කොන්ත්‍රාත් වටිනාකම වන රු. මිලියන 2,373.32 න් සියයට 10 ක අත්තිකාරමක් ද ඇතුළුව 2023 අගෝස්තු 31 වන දිනට මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදල පිළිබඳ කාර්ය සාධන විගණන වාර්තාවේ පහත නිරීක්ෂණ ඇතුළත් වේ. වාර්තාව 2023 ඔක්තෝබර් 13 වන දින පාර්ලිමේන්තුවට සභාගත කරන ලදි.

(i) ඉහත ජනක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව (TEC) හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් අනුමත කල ලංසු ලේඛණ ලංසුකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගෙන අවස්ථා දෙකකදී අතිරේක වෙනස් කිරීම් සිදු කර තිබුණි. ලංසු ලේඛණවල පැවති යන්ත්‍රවල ගුණාත්මකභාවය ආරක්ෂා කරන කොන්දේසි ලංසුකරුවන් කල ඉල්ලීම පරිදි වෙනස් නොකරන ලෙස තාක්ෂණික කමිටුව ප්‍රසම්පාදන කමිටුව වෙත දන්වා තිබුණි.

(ii) තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ තිබියදීත්, සාරානුකූල ප්‍රතිචාර දක්වන ලංසුකරු නොවන ලංසු ලේඛනවල විශේෂ කොන්දේසිවල 23(b) සහ 23(d) වගන්තිවල අවශ්‍යතා සපුරා නොමැති සහ ජනක යන්ත්‍රවලට යොදන ඉන්ධනවල තිබිය යුතු සල්ෆර් ප්‍රතිශතයට අනුකූල නොවන ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(iii) ජනක යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී, සැලසුම් සහගත නොවන බිඳවැටීම් (Forced Outage), ඉන්ධන සහ ලිහිසි තෙල් නොමැතිකම සහ තාක්ෂණික දෝෂ ආදිය හේතුවෙන් ජනක යන්ත්‍ර සැලකිය යුතු පැය ගණනක් ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය. තාක්ෂණික දෝෂ හේතුවෙන්, 2019, 2021, 2022 සහ 2023 වසර තුළදී පිළිවෙළින් පැය 52,452 ක්, පැය 36,120 ක්, පැය 57,320 ක් සහ පැය 35,345 ක් ජනක යන්ත්‍ර ක්‍රියාත්මක වී නොතිබුණි. තවද, 2020 සිට 2023 දක්වා කාලය තුළදී දරන ලද මුළු අලූත්වැඩියා පිරිවැය සහ අමතර කොටස්වල පිරිවැය පිළිවෙලින් රු. මිලියන 245.71 ක් සහ රු. මිලියන 591.88 ක් විය.

(iv) තාක්ෂණික දෝෂ හේතුවෙන් යන්ත්‍ර වරින් වර බිඳවැටීම්වලට ලක් වූ අතර සමහර ජනක යන්ත්‍ර දිගු කාලයක් අක්‍රියව පැවතුණි. 2023 නොවැම්බර් 13 වන දින සිදු කරන ලද පරීක්ෂාවට සහ විගණනයට ලද තොරතුරුවලට අනුව, මතුගම වැඩබිමේ 2022 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී, කොළොන්නාව වැඩබිමේ 2022 ජුනි මාසයේදී සහ මතුගම සහ හම්බන්තොට වැඩබිමේ 2023 අගෝස්තු මාසයේදී එම යන්ත්‍රවල බලාගාර ලබා ගැනීමේ සාධකය (plant availability factor) සියයට 80 කට වඩා අඩුවෙන් පැවති බව නිරීක්ෂණය විය.

(උ) එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි විගණනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ, රාජ්‍ය සමාගම්වල විගණනය විගණකාධිපතිවරයාගේ විෂය පථයට ඇතුළත් වූ අතර, එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි සහ එහි පරිපාලිත සමාගම්වල විගණනයට අදාළව, එල්.ටී.එල් ට්‍රාන්ස්ෆෝමර්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් හි සේවක සංගමය, වෙනත් පුද්ගලයින් දෙදෙනෙක් සමඟ ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අධිකරණ නඩුවක් මඟින් සහ H.D. චමින්ද සහ තවත් 15 දෙනෙකු විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද තවත් අධිකරණ නඩුවක් මඟින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි ව්‍යවස්ථාපිත විගණනයට එරෙහිව 2020 ජූලි 10 වන දින අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. එසේ තිබියදීත්, 2022 ඔක්තෝබර් 10 දිනැති අධිකරණ නියෝගයෙන් එම බාධාව ඉවත් කරන ලද අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයාට පවරා ඇති විධිවිධානවලට අනුකූලව මාගේ මඟ පෙන්වීම යටතේ එම සමාගමේ විගණනය සිදු කළ හැකිව තිබුණි. කෙසේ වෙතත්, ඒ අවස්ථාවේදී, එම සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී පත් කරන ලද විගණකවරුන් ඉවත් කිරීම සඳහා පැවැත්වීමට යෝජනා කරන ලද විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට එරෙහිව වාණිජ මහාධිකරණයෙන් ලබාගත් අතුරු නියෝගය උපුටා දක්වමින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි විගණනය සිදු කිරීමට මාගේ කාර්ය මණ්ඩලයට බාධා කර තිබුණි. ඉහත කරුණු හේතුවෙන්, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම සමාගමේ විගණනය මාගේ මඟ පෙන්වීම යටතේ සිදු කිරීමට නොහැකි විය.

(ii) 2024 ජනවාරි 01 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2024 පෙබරවාරි 01 වන දින පැවති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හිඟ මුදල්වලින් කොටසක් පියවීම සඳහා එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සියයට 63 ක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 28 ක් විදුලිබල මණ්ඩලය විසින් පැවරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, 2024 පෙබරවාරි 07 වන දින එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් විසින් රු. බිලියන 26.08 ක ප්‍රතිෂ්ඨාවකට කොටස් 919,517,200 ක් වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 72 වන වගන්තියට අනුව ප්‍රතිලෝම කොටස් දැරීම් (crossholding) සම්බන්ධයෙන් ගරු. නීතිපතිවරයාගෙන් නීතිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. තවද, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණවල උපදෙස් පරිදි මණ්ඩලය විසින් එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ එහි පරිපාලිත සමාගම් වෙත ඇති සියලූම වගකීම් පියවා නොතිබුණි.

(iii) අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කොටස් හුවමාරු ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ කොටස් උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති සම්පූර්ණ අනුමැතිය භාණ්ඩාගාරයට දැනුම් දී නොතිබුණි.

(iv) තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ශේෂයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා සවිස්තරාත්මක වැඩ පත්‍රිකා සහිත මූල්‍ය ප්‍රකාශනවල මෘදු අනුවාදය විගණනය සඳහා ලබා දී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට පිළිතුරු

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

තොරතුරු සහිතයි.

1.2 **මතය සඳහා පදනම**

තොරතුරු සහිතයි.

1.2.1 **එකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

තොරතුරු සහිතයි.

1.2.2 **මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එල්.කේ.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

(අ) එල්.කේ.ඒ.එස් 1 – මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) **ප්‍රමිතියේ 15 වැනි වගන්තිය අනුව මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ නිර්වචනය සහ හඳුනාගැනීමේ නිර්ණායකවලට පටහැනිව වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම් වූ රු. මිලියන 54.44 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි.**

''වාර්තා කිරීමේ ආයතනයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ ආදායම සහ වියදම්, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 4.1 (ආ) ඡේදයේ සඳහන් වේ. අරමුදලේ ඊතිවල අංක 20 (1) වගන්තියට අනුව, නිවාස ණය පරීක්ෂා කිරීම සම්බන්ධ වියදම් හැර, අරමුදලේ සියලුම පරිපාලන වියදම්, ලංවිම විසින් දරනු ලබන අතර, මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිට (1969 නොවැම්බර් 01 සිට) ක්‍රියාත්මක විය. එබැවින්, අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොවේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (2021-03-29 දිනැති යොමු අංකය: AFM(IM)/DFM (අර්ථසාධක සහ විශ්‍රාම වැටුප් අරමුදල) /Adm/2021/01) ලංවිම විසින් අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් දැරීමේ වර්තමාන ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට තීරණය කළ අතර, අදාළ කාරණය නිවැරදි කර ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. ලංවිම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී මෙය නිවැරදි කරනු ලැබේ. තවද, අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරනු ලබන වියදම්වලට අදාළව, ලංවිම මූල්‍ය ප්‍රකාශනවල (සටහන අංක 7.1 බලන්න) සහ අර්ථසාධක අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

(ii) **ප්‍රමිතියේ 69 වැනි වගන්තියට පටහැනිව, තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට රු. මිලියන 448.66 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය වෙනත් ණය ගැනියන් යටතේ ද, රු. මිලියන 424.19 ක් වූ තොග ගැලපුම් ගිණුමේ බැර ශේෂය වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ද පෙන්වා තිබුණි. තවද, ඉහත තොග ගැලපුම් ශේෂයන් අතරින් තොග හිඟයට අදාළ රු. මිලියන 138.52 ක් වූ හර ශේෂය සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 128.1 ක් වූ බැර ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ නිරවුල් නොවී පැවතුණි.**

2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති තොග ශේෂය තථ්‍ය භෞතික සත්‍යාපනය මත පදනම්ව ලබාගෙන ඇත. විෂමතා විසඳන තෙක් සත්‍යාපිත තොග වටිනාකම සහ ලෙජර වටිනාකම අතර වෙනස තොග ගැලපුම් ගිණුමේ හඳුනාගෙන ඇත.

අපගේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සහ වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා, සත්‍යාපන ක්‍රියාවලියේදී හඳුනාගත් කිසියම් තොග අතිරික්තයක් වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් යටතේ සටහන් කරන අතර, කිසියම් තොග හිඟයක් අනෙකුත් ණයගැතියන් යටතේ සටහන් කරයි. මෙම ප්‍රවේශය මගින් මූල්‍ය ප්‍රකාශන අපගේ තොග සහ අදාළ මූල්‍ය තත්ත්වයන්හි සත්‍ය තත්ත්වය සාධාරණ ලෙස නියෝජනය කරන බව සහතික කෙරේ.

අවශ්‍ය නම්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ.

(ආ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් එකතුව රු. මිලියන 3,166.1 ක් සහ රු. මිලියන 15,897.9 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, එකතුව රු. මිලියන 5,592.4 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, එම කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

එල්.කේ.ඒ.එස් 2 - තොග ප්‍රමිතියේ ඡේද අංක 25 අනුව, FIFO හෝ හරිත සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් තොගවල පිරිවැය පැවරිය යුතුය. ආයතනයක් සමාන ස්වභාවයක් සහ ආයතනයට භාවිතයට ඇති සියලුම තොග සඳහා පිරිවැය සූත්‍රය භාවිතා කළ යුතුය. ඒ අනුව, ලංවිම එහි තොග අගය කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරන අතර ජනන, සම්ප්‍රේෂණය, වත්කම් කළමනාකරණ සහ ව්‍යාපෘති අංශයේ ශ්‍රම පිරිවැය වාර්තා කිරීම සඳහා සත්‍ය පිරිවැය භාවිතා කරන අතර එය 2023 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩවලින් සියයට 83 ක්, දේපල පිරියත සහ උපකරණවලින් සියයට 57 ක් සහ ලංවිම තොගවලින් සියයට 43 ක් වේ. එබැවින්, දේපල පිරියත සහ උපකරණ, තොග සහ කෙරිගෙන යන වැඩවලින් වැඩි කොටසක් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිරිවැයට ඉදිරිපත් කෙරේ.

කෙසේ වෙතත්, සංකීර්ණාත්වය සහ තොගවල විශාල ප්‍රමාණය හේතුවෙන්, ලංවිම බෙදාහැරීමේ අංශ සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කරයි.

එල්.කේ.ඒ.එස් 02, තොගවල ඡේද අංක 25 මගින් ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට අවසර දී ඇත. (''ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, සම්මත පිරිවැය ක්‍රමය වැනි තොගවල පිරිවැය මැනීමේ තාක්ෂණික ක්‍රම භාවිතා කළ හැකිය''). ද්‍රව්‍යවල මිල වෙනස්වීම් නොසලකා ඕනෑම ප්‍රදේශයක සෑම පාරිභෝගිකයෙකුටම සම්මත පිරිවැය පදනමක් තිබිය යුතු වීම, ලංවිම විසින් තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට තවත් හේතුවක් වේ. **"ගාස්තු සඳහා ක්‍රමවේදය" සඳහා වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මගින් ද "එක් එක් බලපත්‍රලාභියා මෙහෙයුම් සිදුකරනු ලබන ප්‍රදේශවල විදුලි සැපයුම් සේවා සැපයීම සඳහා භාවිතා කරන සියලුම ද්‍රව්‍ය සඳහා සම්මත මිල ගණන් ගණනය කළ යුතුය"** යනුවෙන්ද අර්ථ දක්වා ඇත.

කෙසේ වෙතත්, ද්‍රව්‍ය සහ අනෙකුත් ගාස්තුවල මිල ඉහළ යාම හේතුවෙන් විචල්‍යයන් ඇති විය හැකි බව පිළිගැනේ. නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති අවස්ථාවක, සම්මත පිරිවැය සහ සත්‍ය පිරිවැය අතර වෙනස එම ප්‍රකාශයේ ඇති විචලන ගිණුම්වල පිළිබිඹු වන අතර ප්‍රතිඵල හිලව් වනු ඇත.

තවද, එල්.කේ.ඒ.එස් 02 (21 වන ඡේදය) අනුව තොග මැනීම සඳහා වන සම්මත පිරිවැය ක්‍රමය වර්තමාන තත්ත්වයන් මත පදනම්ව නිතිපතා සමාලෝචනය සහ සංශෝධනයට යටත්ව නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව, සත්‍ය මිල සහ සම්මත මිල අතර පරතරය අවම කර ගැනීම සඳහා ද්වි වාර්ෂිකව සම්මත මිල ගණන් සමාලෝචනය කරන ලෙස මිල කමිටුවට උපදෙස් දී ඇත.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, බරිත සාමාන්‍ය තොග තක්සේරු ක්‍රමය සමඟ ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ලංවිම යෙදී සිටී. ලංවිම ERP ක්‍රමය හඳුන්වා දීමත් සමඟ මෙම ගැටළු ඉවත් වනු ඇත.

තවද, ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් සඳහා පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීමට වෙන්කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

පොදු කාර්ය අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ ප්‍රාග්ධන හෝ නඩත්තු කාර්යයන්ට අදාළව සෘජු ලෙස ආරෝපණය කළ හැකි පොදු කාර්ය භාවිතා කර එම කාර්යයන්ට අවශෝෂණය කිරීමෙන් වේ.

(ඇ) එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

(i) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වැනි වගන්තියට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 08 අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. මිලියන 214,809 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

''වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්'' වෙනස්කම් ගිණුම්ගත කළ යුතු බව එල්.කේ.ඒ.එස්

16 හි 51 වන ඡේදය මගින් නියම කරයි. එබැවින්, භාවිතයේ පවතින වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තීරණය කිරීම කළමනාකරණයේ විෂය පථයට අයත් වේ. ලංවිම හි වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ වාර්ෂික සමාලෝචනය ප්‍රායෝගික නොවන සැලකිය යුතු කටයුත්තකි. තවද, ලංවිම රු. බිලියන 955 ක වත්කම් පදනමක් ඇති සංවිධානයක් වන අතර විදුලි බලාගාර සහ සම්ප්‍රේෂණ මාර්ග වැනි ප්‍රධාන වත්කම් සංරචකවල සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම පහසු සහ ප්‍රායෝගික නොවේ. එල්.කේ.ඒ.එස් 16 හි 69 වන ඡේදයට අනුව, සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති සහ තවමත් භාවිතයේ පවතින වත්කම් සඳහා හෙළිදරව් කිරීම අවශ්‍ය වන අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 12.11 මගින් ලංවිම විසින් එය නිසි ලෙස ඉටු කර ඇත.

2021 වර්ෂයේදී ලංවිම මෝටර් රථවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර සංශෝධනය කර ඇති අතර, ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර ඇත.

2023.12.31 දිනට ගිණුම් පොත්වල සටහන් කර ඇති ජනන අංශයේ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් රු. බිලියන 118.4 ක් විය. ජනන අංශය මගින් පරිපාලනය කරනු ලබන බලාගාර ස්වභාවයෙන්ම සුවිශේෂී හා සංකීර්ණ වේ. ජනක යන්ත්‍රවල ආර්ථික ආයු කාලය මුල් නිෂ්පාදකයාගේ නිර්දේශය මත පදනම්ව ලබාගෙන ඇත. ලංවිම බලාගාර සහ ජනක යන්ත්‍ර හොඳින් නඩත්තු කර ඇති බැවින් ඒවා මුල් නිෂ්පාදකයාගේ අපේක්ෂිත ආයු කාලය ඉක්මවා ක්‍රියාත්මක වේ.

සම්ප්‍රේෂණ අංශයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ කොටුමා උපපොළවල් වැනි සම්පූර්ණයෙන්ම ක්ෂය වූ ප්‍රධාන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය බොහෝ දුරට තීරණය කරනු ලබන අතර, ලංවිම හි ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ අදාළ වත්කම්වල අනුකූල තාක්ෂණික සාධක මත ක්ෂයවීම් ගිණුම්ගත කරයි. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සම්ප්‍රේෂණ මාර්ග සහ කොටුමා උපපොළවල් හොඳින් නඩත්තු කර ඇති බැවින්, ඒවා ක්ෂය විය හැකි ආයු කාලය ඉක්මවා ක්‍රියාත්මක වේ. අනෙක් අතට, ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවසන් වූ පසු ක්ෂය වීම වෙනුවට ඉහළ නඩත්තු පිරිවැයක් සමඟ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා එම වත්කම් භාවිතා කරයි. තවද සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා රු. බිලියන 216 ක වත්කම් පදනමක් ඇති අංශයක් වන අතර සම්ප්‍රේෂණ මාර්ග සහ කොටුමා උපපොළවල් වැනි ප්‍රධාන වත්කම්වල සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම පහසු සහ ප්‍රායෝගික නොවේ.

කෙසේ වෙතත්, ඉදිරියට යමින්, සියලුම වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන බවටත්, ඇස්තමේන්තුවල සිදුවන කසියම් වෙනසක් එල්.කේ.ඒ.එස් 8 ට අනුකූලව හඳුනා ගන්නා බවටත් අපි සහතික කරනු ඇත.

(ii) **ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පසුගිය වර්ෂය සඳහා වාර්ෂික නියාමන බද්ද ලෙස රු. මිලියන 209.68 ක මුදලක් අය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 167.25 ක් පමණක් ගිණුම්ගත කර තිබුණු අතර රු. මිලියන 42.43 ක වෙනස ප්‍රමිතියේ 41 සහ 42 වගන්තිවලට අනුව අතීතයානුයෝගීව ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආරම්භක රඳවා ගත් අලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.**
එල්.කේ.ඒ.එස් 08 ට අනුව ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනස යනු වත්කමක හෝ වගකීමක හෝ වත්කමක ආවර්තිතා පරිභෝජනයේ ධාරණ අගයේ ගැලපීමක් වන අතර එය වත්කම් සහ වගකීම් හා සම්බන්ධ වර්තමාන තත්ත්වය හෝ අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ සහ බැඳීම් තක්සේරු කිරීමේ ප්‍රතිඵලයකි. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් නව තොරතුරු හෝ නව සංවර්ධනය හේතුවෙන් සිදුවන අතර ඒ අනුව වැරදි නිවැරදි කිරීමක් නොවේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සඳහා ඉදිරිකාලීන ව්‍යවහාරය සඳහා ප්‍රමිතිය අවසර දෙයි. 2022 මූල්‍ය වර්ෂයේදී, වාර්ෂික නියාමන බද්ද රු. මිලියන 167.25 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද අනුමත කර ඇත. කෙසේ වෙතත්, 2023 දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වචන ලද ඉන්වොයිසිය අනුව ඉතිරි වාර්ෂික නියාමන බද්ද ගෙවීමට අනුමත කර ඇත. එබැවින්, මෙය ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ, එබැවින්, ඉදිරිකාලීන ව්‍යවහාරය සඳහා ප්‍රමිතියෙන් අවසර දෙනු ලැබේ.

තවද, එය වැරැද්දක් ලෙස සලකනු ලැබුවද, අතීතානුයෝගීව ව්‍යවහාරය හෝ නැවත ප්‍රකාශනය සඳහා එම කාල සීමාව තුළ කළමනාකාරිත්වයේ අදහස පිළිබඳ උපකල්පන අවශ්‍ය වේ. 2022 සඳහා කළමනාකාරිත්වයේ අදහස රු. මිලියන 167.25 ක ඇස්තමේන්තුව අනුමත කිරීම මගින් පෙන්නුම් කර ඇත. එබැවින්, වැරැද්දක් නිවැරදි කිරීම සඳහා අතීතානුයෝගීව නැවත ප්‍රකාශනය කිරීම ප්‍රායෝගික නොවේ.

(ඇ) එල්.කේ.ඒ.එස් 12 – ආදායම් බදු

2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පැහැර හරින ලද බදු වාර්තාවට අනුව, 2015/2016 තක්සේරු වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා ආයතනික ආදායම් බදු, උපයන විට ගෙවන බදු සහ එකතු කළ අගය මත බදු සඳහා බදු සහ දඩ වශයෙන් ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු. මිලියන 36.62 ක්, රු. මිලියන 665.11 ක් සහ රු. මිලියන 97.5 ක් විය. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් අභියාචනා ඉදිරිපත් කර තිබුණද වර්ෂය අවසානය වන විටත් එම බදු සඳහා අවසන් තීරණයක් ලැබී නොතිබුණි. එසේ වුවද, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 12) 88 වැනි වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි.

බදු වර්ගය	පිළිතුර
ආයතනික ආදායම් බදු	මෙම රු. මිලියන 36.62 ක මුදල 2015/2016 තක්සේරු වර්ෂය සඳහා වන දඩ මුදලකි. ලංවිම වාර්තාවලට අනුව මෙම මුදල සඳහා තක්සේරු වාර්ත්වක් ලංවිම වෙත ලැබී නොමැත. කෙසේ වෙතත්, මෙය RAMIS පද්ධතියේ දක්වා බැවින්, 2015/2016 තක්සේරු වර්ෂය සඳහා ආයතනික ආදායම් බදු සඳහා අඩුවෙන් ගෙවීමක් සිදු කර නොමැති නිසා දඩය නිදහස් කරන ලෙස ඉල්ලා ලංවිම 2022 ජනවාරි 07 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ලිපියක් යවා ඇත. ලංවිමට කාර්තුමය ආයතනික ආදායම් බදු වගකීමට වඩා ආර්ථික සේවා ගාස්තු බැර පැවති බැවින්, ආයතනික ආදායම් බදු ගෙවීම, ආර්ථික සේවා ගාස්තු බැරවලට වෙරෙහිව කපා හැර ඇත.
එකතු කළ අගය මත බදු	ලංවිම සහ සැපයුම්කරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමෙන්තුවට සපයන ලද උපලේඛනවල ඉන්වොයිස් අංක නොගැලපීම නිසා එකතු කළ අගය මත බද්දෙහි විවාදිත මුදලක් ඇති වී ඇති අතර උපලේඛනවල ඇති නොගැලපීම් නිවැරදි කිරීම සඳහා ලංවිම විසින් අභියාචනා ඉදිරිපත් කර ඇත. එකතු කළ අගය මත බදු අභියාචනා ලේඛන සහ එය දේශීය ආදායම් දෙපාර්තමෙන්තුවට ලද බවට වන දන්වීම දැනටමත් විගණක වෙත ඉදිරිපත් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමෙන්තුව මෙම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටී.
උපයන විට ගෙවන බදු	2015/16, 2016/17, 2017/18, 2018/19 යන තක්සේරු වර්ෂ සඳහා ලංවිම විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අතර මෙම විවාදිත ශේෂයන් ගෙවීම් සැසඳීම් ගැටළු නිසා ඇති වී ඇත. ගෙවීම් පත්‍රිකාවල කාලපරිච්ඡේද කේතය, TIN අංකය හෝ ගෙවීම් වර්ග කේතය හි වැරදි හේතුවෙන් RAMIS පද්ධතිය තුළ සමහර උපයන විට ගෙවන බදු ගෙවීම් හඳුනාගෙන නොමැති අතර ලංවිම දැනටමත් අදාළ ලේඛන ඉදිරිපත් කර ඇති අතර මෙම විෂමතා ඉවත් කිරීමට ඉල්ලීමක් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමෙන්තුව මෙම ගැටළු නිවැරදි කිරීමට සහ අදාළ කාල පරිච්ඡේද සඳහා ගෙවීම් හඳුනා ගැනීමට කටයුතු කරමින් සිටී. එබැවින්, උපයන විට ගෙවන බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමෙන්තුව වෙත සත්‍ය වශයෙන් ගෙවිය යුතු මුදලක් නොමැත. සත්‍යාපනය සඳහා අවශ්‍ය ලියකියවිලි දැනටමත් විගණනයට ඉදිරිපත් කර ඇත.

එල්.කේ.ඒ.එස් 12 හි 88 වන වගන්තියට අනුව, ආදායම් බදු ගිණුම්කරණ ක්‍රමය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් ඇති විට, බදු අධිකාරිය නිශ්චිත බදු ගිණුම්කරණ ක්‍රමය පිළිගැනීමට ඉඩ තිබේද යන්න ආයතනයක් විසින් තීරණය කළ යුතුය. එය සිදුවිය නොහැකි නම්, ආයතනය එහි බදු සම්බන්ධ ගිණුම්වල අවිනිශ්චිතතාවය පිළිබිඹු කළ යුතු අතර එය සුදුසු පරිදි හෙළි කළ යුතුය.

මෙම අවස්ථාවේ දී, සලකා බලනු ලබන බදු සහ දඩ මුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවලට යටත් වේ. මෙම අභියාචනා සඳහා අවසාන තීරණයන් ලැබීමට නියමිත අතර, මෙම මුදල් ගෙවිය යුතු බවට තවමත් තහවුරු කර නොමැත. මෙම මුදලට වෙරෙහිව කටයුතු කිරීමට සාධාරණ හේතු ඇති බව ලංවිම විශ්වාස කරන අතර, අභියාචනාවල ප්‍රතිඵලය මෙම වගකීම් ආපසු හැරවීමට හේතු විය හැක. අවශ්‍ය නම්, විනිවිදභාවය සහතික කිරීම සඳහා අප විසින් පසුකාලීන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදු කරනු ඇත.

(ඉ) එල්.කේ.ඒ.එස් 21 – විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම්වල බලපෑම්

වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2021 ඔක්තෝම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2021 නොවැම්බර් 16 දිනැති අංක 21/1920/317/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ අනපේක්ෂිත ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ඒ.ජ.ඩො මිලියන 38.612 ක හිමිකම් මුදල ගෙවීමට තීරණය වූ අතර මෙම ව්‍යාපෘතිය හරහා මණ්ඩලයට ලැබෙන ආදායම සැලකිල්ලට ගෙන එම අතිරේක ගෙවීම මණ්ඩලය විසින් ගෙවිය යුතු වේ. තවද, සියයට 50 ක් මුලින් ගෙවීමටත් ඉතිරි සියයට 50 දොෂ වගකීම් කාලය අවසන් වූ පසු ගෙවීමටත් තීරණය විය.

කෙසේ වෙතත්, මණ්ඩලයේ ගිණුම් පොත්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී මුළු ප්‍රමාද ගාස්තුවෙන් සියයට 50 ට සමාන රු. මිලියන 6,227.3 ක මුදලක් පමණක් ගිණුම්ගත කර තිබූ අතර, එල්.කේ.ඒ.එස් 37 හි 14 වන වගන්තියට අනුව ඉතිරි එ.ප.ඩො මිලියන 19.306 සඳහා වර්ෂය අවසන් වන විටත් කිසිදු ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2024 ඔක්තෝබර් මාසයේ ගිණුම් පිළියෙල කිරීම අතරතුර ව්‍යාපෘති අංශයේ ගිණුම් පොත්වල වගකීම සටහන් කර ඇත. කෙසේ වෙතත්, අධික ප්‍රමාද ගාස්තුව අඩු කිරීමට/ඉවත් කිරීමට අදාළ බලධාරීන් හරහා කොන්ත්‍රාත්කරු සමඟ නැවත සාකච්ඡා කිරීම නිර්දේශ කර ඇත.

(ඊ) එස්.එල්.එෆ්.ආර්.එස් 09 – මූල්‍ය සාධන පත්‍ර

(ඝ) වෙළඳ ණය ගැතියන්ගේ අපේක්ෂිත ණය පාඩු හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, විවිධ ණය ගැතියන්, පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් ඇතුළු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා එවැනි ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 213.49 ක් සහ රු. මිලියන 118.54 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පිළිවෙලින් බෙදාහැරීමේ අංශය 01 සහ 04 හි හිඟව පැවතුණි. කෙසේ වෙතත්, පිළිවෙළින් රු. මිලියන 102.01 ක සහ රු. මිලියන 59.87 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 02 සහ 03 හි පිළිවෙලින් රු. මිලියන 142.37 ක් සහ රු. මිලියන 107.99 ක් වූ වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් තිස්සේ පවතින හිඟ ශේෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේම, වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතින රු. මිලියන 341.32 ක් වූ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා නොගෙන රු. මිලියන 74.35 ක හානිකරණ ප්‍රතිපාදන පමණක් සලසා තිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

අංශය	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	වසර 1 සිට 5 දක්වා වයස් කාණ්ඩය තුළ ඇති රු. මිලියන 213.49 ක් වූ හිඟ අනෙකුත් ලැබිය යුතු මුදල්වලින්, රු.මිලියන 106.42 ක් බෙදාහැරීමේ අංශය 01 හි ආයතනික කාර්යාලයට අදාළ වේ. ඉහත ශේෂයන් සඳහා රු. මිලියන 102.01 ක ප්‍රතිපාදන සලසා ඇත. අනෙකුත් ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හැකියාව විශ්ලේෂණය කිරීමෙන් පසුව අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අවශ්‍ය නිශ්චිත ප්‍රතිපාදන සැලසීමට පළාත්වලට උපදෙස් දෙනු ලැබේ. රු. මිලියන 341.32 ක් වූ වසර 5 කට වැඩි අනෙකුත් ලැබිය යුතු මුදල්වලින්, රු. මිලියන 206.72 ක් බෙදාහැරීමේ අංශය 01 මගින් නියෝජනය කරයි. ප්‍රධාන වශයෙන් පූජනීය ස්ථානවලින් සහ විවිධ ණයගැති ශේෂයෙන් කොටසක් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.
බෙදාහැරීමේ අංශය 02	මෙය 2024 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත. 2024 වර්ෂයේදී දිර්ඝකාලීන හිඟ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා සියයට 100 ක නිශ්චිත ප්‍රතිපාදනයක් සලසා ඇත. (පූජනීය ස්ථාන. මහින්ද චින්තනය, ගාස්තු රහිත සේවා සම්බන්ධතාවය) කෙසේ වෙතත්, පූජනීය ස්ථානවල සහ මහින්ද චින්තනයේ හිඟ ශේෂයන් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙය දැනට ලංවීම හි විගණන සහ කළමනාකරණ කමිටුවට යොමු කර ඇත.
බෙදාහැරීමේ අංශය 03	2024 මැයි මාසයේදී පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් ගිණුම්වලට සිදු කර ඇත. චක්‍රලේඛයට අනුකූලව ණය අවදානම වැඩිවීම සහ ශේෂයන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සාධාරණ ඇගයීමකින් පසු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට පියවර ගනු ලැබේ.
බෙදාහැරීමේ අංශය 04	වසර පහකට වැඩි අනෙකුත් ණයගැතියන්ගේ ශේෂය රු. 224,357,266 ක් වේ. හානිකරණය සඳහා නිශ්චිත ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව, 2023.12.31 දිනට අනෙකුත් ණයගැතියන්ගේ හානිකරණ ප්‍රතිපාදනය රු. 71,387,481 ක් වේ.

(ii) 2016/17 තක්සේරු වර්ෂයේ සිට 2019/20 තක්සේරු වර්ෂය දක්වා ගෙවන ලද රු. මිලියන 3,914 ක් වූ ආර්ථික සේවා ගාස්තුවේ (ර්.එස්.සී) හිමිකම් කිව හැකි අවුරුදු දෙකක කාල සීමාව සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉක්මවා තිබුණි. කෙසේවෙතත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට රු. මිලියන 3,914 ක හානිකරණ ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ර්.එස්.සී හි ලැබිය යුතු ශේෂය ප්‍රමිතියේ විධිවිධාන අනුව මූල්‍ය වත්කම්වල නිර්වචනය සපුරාලන්නේ නැති බව නිරීක්ෂණය විය.

හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්මවා ඇති බැවින් සහ හිමිකම් කිව හැකි කාල සීමාව තුළ ලංවීම බදු අය කළ හැකි අලාභ ලබා ඇති බැවින් ආදායම් බදු වගකීම් ගණනය කිරීම සඳහා ආර්ථික සේවා ගාස්තුව බදු බැරක් ලෙස හිමිකම් පෑ නොහැක. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මෙම මුදල අය කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව දැනටමත්

අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර 2023 දී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සලකා බලා ඇත. තවද, 2023 මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන ද සලසා ඇත. විගණන කමිටුවේ නිර්දේශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නියෝග කර ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2024 ජූලි මාසයේදී විගණන කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබූ අතර විගණන කමිටුව ඔවුන්ගේ අනුමැතිය ලබා දී ඇත. විගණන කමිටු රැස්වීම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තහවුරු කරන ලද රැස්වීම් වාර්තාව ලැබීමෙන් පසු, මෙම මුදල් මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අය කරනු ඇත.

1.2.1.2 ගිණුම්කරණ අඩුපාඩු

(i) මණ්ඩලයේ අභ්‍යන්තර තක්සේරු කණ්ඩායම විසින් ලබා දෙන ලද තක්සේරුව අනුව, 2016 වර්ෂයේදී බෙදාහැරීමේ අංශය 04 හි ආයතනික අංශයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් සමාලෝචිත වර්ෂය සඳහා වන ගිණුම් පොත්වල රු. මිලියන 826.6 ක් තොගවලට සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්වලට පිළිවෙලින් හර සහ බැර කර තිබුණි. කෙසේ වෙතත්, එම ට්‍රාන්ස්ෆෝමර්වල අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබූ අතර, තොරතුරු නොමැතිකම හේතුවෙන් එමඟින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

රු. මිලියන 826.6 ක ශේෂය 2023.01.01 දිනට රු. මිලියන 405.43 ක් වූ ආරම්භක ශේෂයෙන් සහ රු. මිලියන 421.17 ක් වූ 2023 වර්ෂය සඳහා වන ශේෂයෙන් සමන්විත වේ. රු. මිලියන 421.17 ක් වූ 2023 වර්ෂය සඳහා වන ශේෂය අතරින්, රු. මිලියන 205.92 ක් 2024 දී නිරවුල් ඇත.

ට්‍රාන්ස්ෆෝමර්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් නිවැරදි ට්‍රාන්ස්ෆෝමර් අංකය සහ SIN අංකය හඳුනා ගැනීම මඟින් ඉවත් කළ හැකිය. ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට පෙර නිවැරදි ට්‍රාන්ස්ෆෝමර් හඳුනා ගැනීම සඳහා අදාළ ඒකකවලින් නිවැරදි තොරතුරු කැඳවයි.

(ii) තොග සමීක්ෂණ මණ්ඩලය විසින් කරන ලද සමීක්ෂණයෙන් 2023 සැප්තැම්බර් 15 වන දිනට පැරණි ගල් අඟුරු තොගය ගණනය කර තිබුණි. 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය ඉහත ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය භාවිතයෙන් මනිනු ලැබූ අතර, ඩෙෆ් ගල් අඟුරු (deaf coal) තොගය, ගණනය කළ පැරණි ගල් අඟුරු තොගය ඉක්මවීම හේතුවෙන් තාප ගල් අඟුරු තොගය සෘණ මෙට්‍රික් ටොන් 14,964.71 ක් විය. එබැවින්, 2023 සැප්තැම්බර් 15 වන දිනට ගල් අඟුරු අංගනයේ පැවති තාප ගල් අඟුරු තොගය අවම වශයෙන් ශූන්‍ය ලෙස සැලකිය යුතුය. ඒ අනුව, ගල් අඟුරු බංකර්වල පැවති ගල් අඟුරු තොග සහ ගොඩබාන ලද නව ගල් අඟුරු තොග සලකා බැලීමෙන් පසු තාප ගල් අඟුරු තොග හිඟය මෙට්‍රික් ටොන් 9,286.37 ක් ලෙස ගත යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් ගල් අඟුරු තොගයේ සෘණ ශේෂය සලකා බලා සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට රු. මිලියන 1,778.6 ක් වටිනා මෙට්‍රික් ටොන් 24,251 ක තාප ගල් අඟුරු තොග හිඟයක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, විගණනය මඟින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගල් අඟුරු තොගය රු. මිලියන 924.3 කින් අඩුවෙන් දක්වා තිබුණි.

වාර්ෂික ගල් අඟුරු සත්‍යාපනය සඳහා තාප ගල් අඟුරු පමණක් සලකා බලයි. තාප ගල් අඟුරු සහ ඩෙෆ් ගල් අඟුරු එක හා සමාන බැවින් ඒවා භෞතිකව වෙන්කර හඳුනා ගැනීමට ක්‍රමයක් නොමැත. ඩෙෆ් ගල් අඟුරු තොග මට්ටම, ගණනය කිරීමේ අරමුණ සඳහා පමණක් සලකා බලයි. මෙම නිශ්චිත දිනයේ (2023.09.15), බංකර්වල ඉතිරිව ඇති ගල් අඟුරු සහ යාත්‍රා අංක 369 න් ගොඩබාන ලද ගල් අඟුරු හේතුවෙන් තාප ගල් අඟුරු තොග ශේෂය මෙට්‍රික් ටොන් 27,171.39 දක්වා රැස් වී තිබුණි. කෙසේ වෙතත්, මෙට්‍රික් ටොන් 14,964.71 ක් වූ ඩෙෆ් ගල් අඟුරු සෘණ ශේෂය නැවත පිරවීම හේතුවෙන් මෙම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 12,206 දක්වා පහත වැටුණි. එබැවින්, තාප ගල් අඟුරුවල නිශ්චිත භෞතික ශේෂය මෙට්‍රික් ටොන් 12,206 ක් විය. 2023.09.15 දිනට තාප ගල් අඟුරුවල පොත් ශේෂය මෙට්‍රික් ටොන් 36,457.76 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරන ලද තාප ගල් අඟුරු තොග හිඟය මෙට්‍රික් ටොන් 24,251.08 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගල් අඟුරු තොගය අඩුවෙන් දැක්වීමක් සිදු වී නොතිබුණි.

(iii) තුන්වන සහ සිව්වන කාර්තුව සඳහා එකාකාර මිල ජාතික ගාස්තු ගැලපීම් (UNT) ඇස්තමේන්තු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලංකා විදුලි (පුද්ගලික) සමාගම (ලෙකෝ) වෙත කරන ලද බලශක්ති විකුණුම් ආදායම රු. මිලියන 1,120.1 කින් අඩුවෙන් දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙතින් තීරණ ලේඛන ලබා ගැනීමෙන් පසු UNT ගැලපීම් සිදු කරනු ලබයි. මේ දක්වා කිසිදු කාර්තුවක් සඳහා UNT තීරණ ලේඛන ලැබී නොමැති බැවින්, නිල ලේඛන ලැබෙන තුරු සඳහන් කරන ලද වැරැද්ද නිවැරදි කළ නොහැක.

(iv) සම්පූර්ණ කරන ලද රු. මිලියන 18,230 ක වටිනා කාර්යයන් 8,574 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට සහ රඳවා ගත් ඉපැයීම්වලට එමඟින් ඇති කරන බලපෑම, තොරතුරු නොමැතිකම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, සිදු කරන ලද අභ්‍යුපරීක්ෂණයට අනුව, ඉදිකිරීම් සියල්ල දැනටමත් අවසන් කර මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණද බෙදාහැරීමේ අංශය 04 හි ඉදිකිරීම් අංශයේ (දකුණු පළාත 2) රු. මිලියන 2.98 ක වටිනා කාර්යයන් දෙකක්, ජා-ඇල ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලයට වැය කළ රු. මිලියන 113.99 ක් සහ ගොඩනැගිලි තුනක් ඉදිකිරීම සඳහා හා කතරගම විදි ආලෝකකරණය සඳහා වැය කළ රු. මිලියන 135.61 ක් වර්ෂය අවසන් වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉහත කෙරීගෙන යන වැඩ ශේෂයන් අතුරින්, රු. මිලියන 40.15 ක් වූ අමාත්‍යාංශ අරමුදල් යොදවා සිදු කරන ලද කාර්යයන්, වසර 5 කට වැඩි කාලයක් තිස්සේ බෙදාහැරීමේ අංශය 04 හි පවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර එවා පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

අංශය	වසර 02 ට වැඩි කෙරීගෙන යන වැඩ ශේෂය රු.	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	2,066,940,237.00	බෙදාහැරීමේ අංශය 01 කාර්යයන් 8,575 ක් අතරින්, 2023.12.31 දිනට කාර්යයන් 1,693 ක් කෙරීගෙන යන වැඩවල පැවති අතර එහි වටිනාකම රු. බිලියන 2.06 ක් වේ. මෙම මුදලින්, කොළඹ වරාය නගර ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 14.95 ක් තවමත් ක්‍රියාත්මක කරමින් පවතී. 2024.04.30 දිනට කෙරීගෙන යන වැඩවල වයස් විශ්ලේෂණය මත පදනම්ව, ඉහත කාර්යයන් සංඛ්‍යාව 612 ක් දක්වා අඩු කර ඇති අතර එහි වටිනාකම රු. බිලියන 1.40 ක් වේ. විස්තර පහත පරිදි වේ. පළාත / 2024.04.30 දිනට කාර්යයන් සංඛ්‍යාව / 2024.04.30 දිනට වටිනාකම කොළඹ වරාය නගර ව්‍යාපෘතිය / 60 / 585 NWP / 244 / 241 NWP2 / 116 / 90 NCP / 165 / 226 NP / 17 / 139 PHM / 10 / 104 **එකතුව / 612 / 1,385** ඉහත කරුණුවලට අමතරව, සම්පූර්ණ කරන ලද කාර්යයන් නිතිපතා වත්කම්වලට මාරු කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් යෙදී සිටී.
බෙදාහැරීමේ අංශය 02	6,014,858,874.00	බෙදාහැරීමේ අංශය 02 හි වසර 02 කට වඩා වැඩි කාලයක් තිස්සේ කෙරීගෙන යන වැඩ ශේෂයන් ලෙස දක්වා ඇති රු. 6,014,858,874.00 ක පිරිවැයක් සහිත කාර්යයන් 4,014 ක්, සම්පූර්ණ කරන ලද කාර්යයවල වටිනාකම ලෙස සලකා ඇති අතර වත්කම්වලට මාරු කර නොමැත. ඉහත වයස් කාණ්ඩ යටතේ කෙරීගෙන යන වැඩ වර්ගීකරණය කර ඇතත්, තෙවන පාර්ශවයන්ගේ විරෝධතා, මාර්ග නිෂ්කාශන නොලැබීම, පාරිභෝගිකයාගේ අවශ්‍යතා වෙනස් කිරීම වැනි විවිධ හේතූන් මත ඒවා සැබවින්ම සම්පූර්ණ කර නොමැති බැවින් කෙරීගෙන යන වැඩ යටතේ පෙන්විය යුතු සම්පූර්ණ කර නොමැති කාර්යයන් පවතින බව නිරීක්ෂණය වේ. 2024.10.31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය තුළදී, පෙර වසරවලට අදාළව රු. මිලියන 3,897 ක පිරිවැයක් සහිත කාර්යයන් සම්පූර්ණ කර වත්කම්වලට මාරු කර ඇත. තවද, ජා-ඇල ප්‍රදේශ ඉංජිනේරු කාර්යාලයේ ඉදිකිරීම් පිරිවැය දැනටමත් 2024 අප්‍රේල් මාසයේදී වත්කම්වලට මාරු කර ඇත.
බෙදාහැරීමේ අංශය 03	4,181,306,283.00	සියලුම පළාත් සහ ආයතනික අංශයේ වසර දෙකකට වැඩි කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ශේෂයන්, බෙදාහැරීමේ අංශය 03 ට අදාළව වසර දෙකකට වැඩි කාර්යයන් 1,913 අතරින්, රු. මිලියන 1,816 ක වටිනාකමකට කාර්යයන් 1,217 ක් (සියයට 64) 2024 ඔක්තෝබර් අවසානයෙදී නිරවුල් කර ඇත.

අංශය	වසර 02 ට වැඩි කෙරිගෙන යන වැඩ ශේෂය රු.	පිළිතුර
බෙදාහැරීමේ අංශය 04	5,981,560,493.00	බස්නාහිර පළාත දකුණ 1 බස්නාහිර පළාත දකුණ 1 විසින් කාර්යයන් නිම කිරීමේ වාර්තා ලද වහාම සම්පූර්ණ කරන ලද කාර්යයන් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කරනු ලබයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ කෙරිගෙන යන වැඩ නිරීක්ෂණය කිරීම සඳහා අදාළ ඒකක ප්‍රධානීන් සහ ගණකාධිකාරී වියදම් අතර අබණ්ඩ රැස්වීම් පවත්වනු ලබයි. දකුණ පළාත 1 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ කෙරිගෙන යන වැඩ නිරීක්ෂණය කිරීම සඳහා අදාළ ඒකක ප්‍රධානීන් සහ ගණකාධිකාරී වියදම් අතර අබණ්ඩ රැස්වීම් පවත්වනු ලබයි. අදාළ ඒකක ප්‍රධානීන් වෙත යොමු කල පසු ගණකාධිකාරී වියදම් විසින් එම කාර්යය අවසන් කිරීමේ ලේඛන සම්පූර්ණයෙන් නිමවූ කාර්යයක් ලෙස සලසා පද්ධතිය යාවත්කාලීන කරනු ලබයි.. දකුණ පළාත 2 ප්‍රධාන ඉංජිනේරු - ඉදිකිරීම්, ප්‍රධාන ඉංජිනේරු - බෙදාහැරීමේ නඩත්තුව, ප්‍රාදේශීය ප්‍රධාන ඉංජිනේරුවන් සහ ගණකාධිකාරී (වියදම්) කෙරිගෙන යන වැඩ අඩු කිරීම සඳහා අබණ්ඩව කටයුතු කරන අතර, මාසික ප්‍රගති රැස්වීම්වලදී ප්‍රගතිය සමාලෝචනය කරයි. PHM මගින් නිවැරදි නිම කිරීමේ වාර්තා ලද පසු ප්‍රාග්ධන කාර්යයන් වත්කම් වෙත මාරු කරනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධනිත කිරීම කඩිනම් කරන ලෙස සහ ප්‍රගතිය දැනුම් දෙන ලෙස අදාළ අංශයට දැනුම් දීමට මූල්‍ය අංශය විසින් කටයුතු කර ඇත.

(v) **නිරවුල් කිරීමෙන් තොරව කාර්යයන් 122 කට අදාළ අසාමාන්‍ය බැර ශේෂයන් තිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 03 හි මුළු කෙරිගෙන යන වැඩ ශේෂය රු. මිලියන 93.7 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

අංශය	වටිනාකම	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	16,691,385	2023 දෙසැම්බර් 31 වන දිනට බෙදාහැරීමේ අංශය 01 හි කෙරිගෙන යන වැඩ ගිණුම රු. මිලියන 16.7 කින් අඩුවෙන් දක්වා තිබුණි. 2023 වර්ෂයේ ද්‍රව්‍ය ආපසු එවුම් සහ හිතකර මිල විචලනය හේතුවෙන් මෙය ප්‍රධාන වශයෙන් සිදුවී ඇත. එවැනි ශේෂයන් නිරවුල් කිරීමට අදාළ ගණකාධිකාරිවරුන්ට උපදෙස් දී ඇත.
බෙදාහැරීමේ අංශය 02	63,159,908	කෙරිගෙන යන වැඩ ගිණුමට කරන ලද බොහෝ බැර සටහන්, ආපසු ලබා දෙන කාර්යයන්වල ඉතිරි ද්‍රව්‍යවල වටිනාකම හෝ විවිධ හේතූන් මත කාර්යයන් අවලංගු කිරීම හේතුවෙන් ආපසු ලබා දෙන ලද ද්‍රව්‍යවල පිරිවැය නියෝජනය කරයි.
බෙදාහැරීමේ අංශය 03	13,840,594	බැර ශේෂයට ප්‍රධාන හේතුව ද්‍රව්‍ය චලනයන්හි මිල වෙනසයි (මිල විචලනය). මෙම සියලු ශේෂයන් දැන් නිරවුල් කර ඇත.
එකතුව	**93,691,887**	

(vi) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (අදියර ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හයක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරිගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, මෙම වාහනවල පිරිවැය ඒ වන විටත් අදාළ ව්‍යාපෘතියේ පිරිවැයට ඇතුළත් කර තිබුණද මෙම වාහන හයක් සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ (අදියර i) තවත් වාහන 11 ක අයිතිය පවරා ගැනීමට නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

කොන්ත්‍රාත්කරු සහ ලංවිම අතර ලිපි හුවමාරු කිහිපයක් සිදු වූ බැවින්, එම වාහනවල අයිතිය පවරා ගැනීමට ලංවිම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පැවසිය නොහැක. දැනට ලංවිම නඩු පැවරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මෙම කාරණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ප්‍රධාන නීති නිලධාරියා විසින් 2024 ඔක්තෝබර් 03 වන දින නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවෙන් වැඩිදුර මඟ පෙන්වීමක් බලාපොරොත්තුවෙන් සිටී.

(vii) විමර්ශනය කර නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව රු. මිලියන 113.87 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ ගිණුම් පොත්වල පැවතුණි. බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 129.52 ක් වූ මුළු මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 34.56 ක් වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ සැපයුම්කරුවන් සතු පවතින තොග නියෝජනය කර තිබුණි. තවද, බෙදාහැරීමේ අංශය 02 හි රු. මිලියන 432.3 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය අතුරින්, රු. මිලියන 142.61 ක් හෙවත් සියයට 33 ක් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම වෙත නිකුත් කර තිබූ (කි.ග් 918,830) භාවිතා කළ නොහැකි ඇලූමිනියම් තොගයේ වටිනාකම නියෝජනය කරන අතර ආසන්න වශයෙන් වසර 2 ක කාලයක් තිස්සේ පැවතුණි. කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් 23 දිනැති අංක 2021/GM/40/DCC චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව එම වටිනාකම එම සමාගමෙන් මණ්ඩලයට ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

අංශය	වසර 01 ට වැඩි ශේෂය රු.	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	75,828,344.00	රු. මිලියන 34.56 ක ශේෂය, බෙදාහැරීමේ අංශය 01 හි සැපයුම්කරුවන් වෙත වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින තොගය නියෝජනය කළ බවට එකඟ වේ. 2022 වර්ෂයේදී වසර 5 ට වැඩි වයස් කාණ්ඩයේ පැවති මෙම මුදල රු. මිලියන 60.38 ක් වූ අතර රු. මිලියන 25.82 ක් නිරවුල් කිරීමෙන් පසු එම මුදල රු. මිලියන 34.56 ක් දක්වා අඩු විය. මේ සම්බන්ධයෙන් සමහර ලේඛනගත සාක්ෂි සොයා ගැනීමට අපහසු වන අතර ලේඛනගත සාක්ෂි ලබා ගත් පසු එවැනි ශේෂයන් නිරවුල් කරනු ඇත.
බෙදාහැරීමේ අංශය 02	36,084,837.00	රු. 1,302,425 ක ශේෂය, පිරිසකසන ලද ඇලූමිනියම් දඬු (fabricated Aluminium Rods) ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා එනර්ජීස් වෙත භාර දෙන ලද භාවිතා කළ නොහැකි ඇලූමිනියම් තොග නියෝජනය කරයි. ඉහත සඳහන් කරුණු හැරුණු විට, රු. මිලියන 36 න්, වසර 4-5 ක් පැරණි රු. මිලියන 1.3 ක් 2024 ජුනි මාසයේ ගිණුම්වල නිරවුල් කරන ලද අතර ඉතිරි රු. මිලියන 33.4 ට අදාළ ටෙන්ඩර්ස් P&D ශාඛාව වෙත යොමු කරන ලද අතර, බෙදාහැරීමේ අංශය 02 හි P&D ශාඛාව විසින් කටයුතු සිදු කරමින් සිටී.
බෙදාහැරීමේ අංශය 03	77,128.00	සබරගමුව සහ බස්නාහිර පළාත දකුණ 2 මෙම ගැටළුව සබරගමුව සහ බස්නාහිර පළාත දකුණ 2 ට අදාළ වේ. වසරකට වැඩි ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගනු ඇත.
බෙදාහැරීමේ අංශය 04	1,876,506.00	බස්නාහිර පළාත දකුණ 1 බස්නාහිර පළාත දකුණ 1 විසින් දීර්ඝ කාලීන හිඟ මාර්ගස්ථ තොග නිරවුල් කර ඇති අතර ගිණුම් පොත් යාවත්කාලීන කිරීමට පියවර ගනු ඇත. දකුණ පළාත 2 දැනටමත් නිරවුල් කර ඇත.
එකතුව	**113,866,815**	

(viii) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාරය ව්‍යාජති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ එකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 සැප්තැම්බර් 13 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, වර්ෂයේ ලාභයට එරෙහිව අය කිරීමෙන් තොරව 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 167.62 ක මුදල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවතුණි.

විගණකවරුන් විසින් පැහැදිලි කරන ලද පරිදි, ව්‍යාපෘතිය වසා දැමීමේ තීරණය රජය සතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය තවමත් ලැබීමට නියමිතය.

(ix) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ මණ්ඩලය සතු වාහන 03 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

මෙම කාරණය දැනට විසඳා ඇත. මෙම වාහන තුනේ වටිනාකම දැනටමත් 2024 අප්‍රේල් මාසයේ ගිණුම්වලට ගෙන ඇත.

(x) **රු. මිලියන 34,386.77 ක් වටිනා වේලි වැඩ මහවැලි සංකීර්ණයේ දේපල පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

පිරිවැය මධ්‍යස්ථානය	බලාගාරය	විස්තරය	වත්කම්වල වටිනාකම රු.
831.00	වික්ටෝරියා විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	9,287,094,251.25
		වේලි වැඩ	5,125,656,824.00
		එකතුව	**14,412,751,075.25**
832.00	කොත්මලේ විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	11,712,155,418.43
		වේලි වැඩ	10,374,925,875.87
		එකතුව	**22,087,081,294.30**
833.00	උකුවෙල විදුලි බලාගාරය	ටේල් රේස් වැඩ	65,534,014.42
		උමං මාර්ග වැඩ	1,965,525,213.05
		වේලි වැඩ	550,353,662.58
		එකතුව	**2,581,412,890.05**
834.00	බෝවතැන්න විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	1,867,251,703.63
		ටේල් රේස් වැඩ	101,574,971.11
		එකතුව	**1,968,826,674.74**
835.00	රන්දෙණිගල විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	1,735,715,967.72
		වේලි වැඩ	11,011,007,493.48
		එකතුව	**12,746,723,461.20**
836.00	රන්ටැඹේ විදුලි බලාගාරය	ටේල් රේස් වැඩ	2,075,133,740.94
		වේලි වැඩ	7,075,885,264.60
		එකතුව	**9,151,019,005.54**
837.00	නිල්ලඹේ විදුලි බලාගාරය	ප්‍රවේශ ඇල	347,258,744.71
		වේලි වැඩ	248,957,723.10
		එකතුව	**596,216,467.81**
මුළු එකතුව			**63,544,030,868.89**

මණ්ඩලය දැනටමත් නිල්ලඹේ වේල්ල අත්පත් කරගෙන ඇති අතර එය ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සම්පූර්ණයෙන්ම බලාගාරය විසින් සිදු කරයි.

කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ බලාගාරවලට අදාළ අනෙකුත් සියලුම වේලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එහි පනත මගින් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරයි. නමුත් ජලාශවල සිට විදුලිය ලබාගැනීම දක්වා වූ ජල මාර්ග පමණක් මණ්ඩලය විසින් අත්පත් කරගෙන ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සම්පූර්ණයෙන්ම අදාළ බලාගාරය විසින් සිදු කරයි. රු. බිලියන 63.5 අතරින් එවැනි වත්කම්වල වටිනාකම් පහත පරිදි වේ.

පිරිවැය මධ්‍යස්ථානය	බලාගාරය	විස්තරය	වත්කම්වල වටිනාකම රු.
831.00	වික්ටෝරියා විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	9,287,094,251.25
832.00	කොත්මලේ විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	11,712,155,418.43
833.00	උකුවෙල විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	65,534,014.42
		උමං මාර්ග වැඩ	1,965,525,213.05
834.00	බෝවතැන්න විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	1,867,251,703.65
		ටේල් රේස් වැඩ	101,574,971.11
835.00	රන්දෙණිගල විදුලි බලාගාරය	උමං මාර්ග වැඩ	1,735,715,967.72
836.00	රන්ටැඹේ විදුලි බලාගාරය	ටේල් රේස් වැඩ	2,075,133,740.94
		එකතුව	**28,809,985,280.57**

ඒ අනුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් රඳවා ගත් වත්කම්වල වටිනාකම් පහත වගුවේ දැක්වේ.

පිරිවැය මධ්‍යස්ථානය	බලාගාරය	විස්තරය	වත්කම්වල වටිනාකම රු.
831.00	වික්ටෝරියා විදුලි බලාගාරය	වේලි වැඩ	5,125,656,824.00
832.00	කොත්මලේ විදුලි බලාගාරය	වේලි වැඩ	10,374,925,875.87
833.00	උකුවෙල විදුලි බලාගාරය	වේලි වැඩ	550,353,662.58
835.00	රන්දෙණිගල විදුලි බලාගාරය	වේලි වැඩ	11,011,007,493.48
836.00	රන්ටැඹේ විදුලි බලාගාරය	වේලි වැඩ	7,075,885,264.60
		එකතුව	**34,137,829,120.53**

මෙම කරුණ සාකච්ඡා කිරීම සඳහා අප විසින් 2024.06.24 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වූ අතර, 2023 වර්ෂයේදී වේලිවල පිරිවැය ඔවුන්ගේ ගිණුමට ගෙන ඇති බව එහිදී අනාවරණය විය. එබැවින්, සංවිධාන දෙකෙහිම ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කමිටුව තීරණය කර ඇත.

1.2.1.3 නොසැසඳු වෙනස්කම්

(i) **බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් මහජන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, රු. මිලියන 5,444.76 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය රු. මිලියන 5,494.76 ක් වූ අතර එම නිසා රු. මිලියන 50 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, විදුලිබල සැපයුමේ විරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද බැංකු ශේෂ තහවුරු කිරීම අනුව, එ.ජ.ඩො 57,338,901 ක හිඟ මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, එය එ.ජ.ඩො 57,989,633 ක් වූ අතර එම නිසා එ.ජ.ඩො 650,732 ක වෙනසක් නිරීක්ෂණය විය.**
සටහන් කර ගෙන ඇති අතර එය දැනටමත් මූල්‍ය ප්‍රකාශනවල ගලපා ඇත. අධීක්ෂණය මගින් 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද පළමු ආපසු ගෙවීම ව්‍යාපෘති ණය පොලිය ලෙස ගිණුම්ගත කර ඇත.

(ii) **සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 308.1 ක් විය. කෙසේ වෙතත්, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ලැබිය යුතු ශේෂය රු. මිලියන 3,529.6 ක් වූ අතර රු. මිලියන 3,221.5 ක වෙනසක් නිරීක්ෂණය විය.**
ලංවිම ගිණුම්වලට අනුව, 2023.12.31 දිනට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය රු.308,055,533.63 ක් විය. කෙසේ වෙතත්, කලින් කලට ගනු ලබන ඒකපාර්ශ්වික තීරණ මත පදනම්ව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංවිම වෙතින් ලැබිය යුතු ලෙස ඉහළ වටිනාකමක් වාර්තා කර ඇත.

2020 දෙසැම්බර් 31 දින දක්වා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු ශේෂය සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුම්වල අනුරූප ලැබිය යුතු ශේෂය සැසඳීම සිදු කර ඇත.

2020.12.31 දිනෙන් පසු වෙනසට හේතු.

- ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අනුමත කරන ලද ඒකපාර්ශ්වික තීරණයක් මත පදනම්ව, ලංවිම විසින් නිතිපතා කරනු ලබන ගෙවීම්වලින් ප්‍රමාද පොලී අයකර ගැනීමට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, ලංවිම ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ තීරණයට එකඟ වී නොමැති අතර ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ තීරණය ඉල්ලා අස්කර ගන්නා ලෙස කිහිප වතාවක්ම ඉල්ලා ඇත.
- ලංවිම හි ගිණුම්වල, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිතිපතා කරනු ලබන ගෙවීම්වලින් හිඟ වටිනාකම් පියවා ඇති අතර, ඉතිරි මුදල මත ප්‍රමාද පොලී ගණනය කර ගෙවනු ලබයි.
- අවස්ථා කිහිපයකදී ඉන්ධන මාරු කිරීම්වලින් ලද ප්‍රමාණය පිළිබඳ ආරවුල්
- 2022 දී මෙට්‍රික් ටොන් 10,000 ක නැප්තා හුවමාරුවේ මිලකරණ ආරවුල.

කෙසේ වෙතත්, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශේෂයේ විස්තර සමඟ ගෙවීම් සම්බන්ධ සියලුම ලියකියවිලි ලබා ගත හැක. ගැටළු විසඳීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් අනුව වෙනස්කම් අවම කිරීමට කටයුතු කරනු ඇත.

(iii) **බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට හිඟව පැවතුණි. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 185.41 ක මුදලක් බලපෑමට ලක් වූ තනි තනි ණයගැති ගිණුම් විමර්ශනය කර ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන ගිණුම්, වෙනත් වගකීම් ගිණුම් ආදිය වෙත මාරු කර තිබුණි.**

මුල් වටිනාකම රු. මිලියන 423.76 ක් වූ ණයගැති ශේෂයන් අතරින් රු. මිලියන 185.41 ක මුදලක්, 2018 අගෝස්තු 17 දිනැති AFM(DD1)/Acct(A)MI)/ ආදායම් ණය ගැනියන් /2018 දරන ලිපිය මත පදනම්ව ඩීඩී03 හි අතිරේක මූල්‍ය කළමනාකරුගේ ශාඛාවේම බිල්පත් සහ ලෙජර පද්ධතිය සැසඳීමෙන් පසුව ලෙජර් ශේෂය සමඟ එම ශාඛාව වෙත මාරු කර ඇත. 2002 වර්ෂයේ සිදුවූ විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී මෙම මුදල මාරු කර ඇත.

ඉහත දක්වා ඇති කරුණුවලට වැඩිමනක් වශයෙන්, ශේෂය මාරු කිරීම බලපැවැත්වීම සඳහා කිසියම් ශේෂයක් තම අංශවලට අයත් දැයි පරීක්ෂා කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය අතිරේක මූල්‍ය කළමනාකරුවන් වෙත ද දැනුම් දෙනු ලබයි.

(iv) **2023 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 378.39 ක හර ශේෂයක් සහ රු. මිලියන 2,204.57 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 230.07 ක හර ශේෂයන් සහ රු. මිලියන 465.81 ක බැර ශේෂයන් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, මූලස්ථානයේ රු. මිලියන 12.75 ක් වූ හඳුනා නොගත් ආරම්භක හර ශේෂය වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පැවතුණු බවත් බස්නාහිර පළාත දකුණ (ii) සහ සබරගමුව පළාතේ රු. මිලියන 95.27 ක් වූ ආරම්භක බැර ශේෂය වසර 01 කට වැඩි කාලයක් තිස්සේ එම ගිණුමේ පැවතුණු බවත් නිරීක්ෂණය විය.**

<table>
<tr><th>අංශය</th><th>නොසැසඳු මුදල (රු. මිලියන)</th><th>පිළිතුර</th></tr>
<tr><td>බෙදාහැරීමේ අංශය 01</td><td></td><td>
<table>
<tr><th>අදාළ එකකය</th><th>නොසැසඳු මුදල (රු. මිලියන)</th><th>පිළිතුර</th></tr>
<tr><td>ආයතනික කාර්යාලය</td><td>4.29 Mn</td><td>2023 දෙසැම්බර් මාසයේ අඟුරු වූ චෙක්පත් මෙම මුදල සඳහා හේතු වී ඇත. මෙම මුදල දැන් නිරවුල් කර ඇත.</td></tr>
<tr><td>කොළඹ නගරය</td><td>(12Mn)</td><td>කැලැන්ඩර මාසයේ සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයින්ගේ සහ තොග සැපයුම් පාරිභෝගිකයින්ගේ මුදල් එකතු කිරීමේ චක්‍රය හේතුවෙන් මෙම බැර ශේෂය ඇති වී ඇත. ඒ අනුව, එකතු කිරීමේ පාලන ගිණුම්වල ශේෂය රු. 3,727, 977.37 ක් වූ අතර එයට 2022/12/30 සහ 2022/12/31 දින එකතු කිරීමේ මුදල ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, ආදායම් මෙහෙයුම් කමිටුවේ මාර්ගෝපදේශ අනුව තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.</td></tr>
<tr><td>වයඹ පළාත 1</td><td>(32Mn)</td><td>ගිණුම් ශේෂය මත පදනම්ව මාසික සැසඳීම් සිදු කරයි.</td></tr>
<tr><td>වයඹ පළාත 2</td><td>(231Mn)</td><td>වර්ෂය තුළදී තොග සැපයුම් ගිණුම්වලට සහ සාමාන්‍ය සැපයුම් ගිණුම්වලට අදාළව එකතු කිරීමේ පාලන ගිණුමේ බැර ශේෂය පිළිවෙලින් රු. 181,972,722.25 ක් සහ රු. 40,232,430.98 ක් නිරවුල් කර ඇත.</td></tr>
<tr><td>උතුරු මැද පළාත</td><td>(196Mn)</td><td>2011 වර්ෂයේදී නොසැසඳු පද්ධති ගැලපීමක් ඇත. ආරම්භක ගැලපීම් පිළිබඳව තොරතුරු තාක්ෂණ (MITFIN) අංශයෙන් දුරකථනය හරහා විමසීමක් කරන ලද අතර තොරතුරු සහිත ලිපියක් යොමු කළ යුතුව ඇත.</td></tr>
<tr><td>උතුරු මැද පළාත</td><td>(112Mn)</td><td>බිල්පත් කාලපරිච්ඡේදයේ සහ එකතු කිරීමේ කාලපරිච්ඡේදයේ වෙනස හේතුවෙන් එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂය පසුගිය කාලපරිච්ඡේදයට අදාළ වේ.</td></tr>
</table>
</td></tr>
</table>

අංශය	නොසැසඳු මුදල (රු. මිලියන)	පිළිතුර
බෙදාහැරීමේ අංශය 02		සටහන් කර ගෙන ඇත. ගිණුම සැසඳීමට දැනටමත් කටයුතු කර ඇති අතර එය ක්‍රියාත්මක කරමින් පවතී.
බෙදාහැරීමේ අංශය 03		2023 වර්ෂය සඳහා අවසන් ගිණුම් සමඟ සැසඳීම දැනටමත් ලබා දී ඇත. තවද, බස්නාහිර පළාත දකුණ 2 සහ සබරගමුව පළාතේ දීර්ඝ කාලීන හිඟ නොසැසඳු ශේෂයන් සඳහා හේතු විමර්ශනය කර ඒ අනුව ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.
බෙදාහැරීමේ අංශය 04		2023 ජුනි මාසයේ සිට, PIV චකතු කිරීම්, සාමාන්‍ය සැපයුම් සහ තොග සැපයුම් සඳහා සෑම පළාතකම වෙනම චකතු කිරීමේ පාලන ගිණුම් 03 ක් පවත්වාගෙන යනු ලබයි. එමඟින් සැසඳීම් ලබා ගත හැකි අතර ඒවා නිරීක්ෂණය කරනු ලබයි. පෙර කාල පරිච්ඡේදය සඳහා තනි ගිණුමක් පවත්වාගෙන ගිය අතර මෙම ගිණුම නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
ප්‍රධාන කාර්යාලය		බොහෝ නඩු නිරවුල් කිරීමට දැනටමත් පියවර ගෙන ඇති අතර ඉතිරි ශේෂය 2024 දී නිරවුල් කරනු ඇත.

(v) 1998 සිට 2023 දක්වා කාලය තුළදී ණයගැතියන්ගෙන් එකතු කරන ලද රු. මිලියන 75.27 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි.

මුලින්ම නිවැරදි පාරිභෝගික ගිණුම හඳුනා ගැනීමට හෝ එම මුදල ආදායමට අය කළ යුතුද යන්න තීරණය කිරීමට ලංවිමට නොහැකි වන මුදල් සම්බන්ධයෙන් අවිනිශ්චිත ගිණුම භාවිතා කරනු ලබයි.

පාරිභෝගික පැමිණිලි ලද පසු අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීම සිදු කරනු ලබයි. පාරිභෝගිකයින් නිවැරදි ගිණුම් අංක ලබා දුන් පසු, අදාළ මුදල් ඔවුන්ගේ ගිණුම් වෙත මාරු කරනු ලබයි. තැපැල් කාර්යාල වැනි චකතු කිරීමේ නියෝජිතයන් හරහා කරන ලද ගෙවීම් මගින් බොහෝ අවිනිශ්චිත ගෙවීම් ඇති වේ. ගණකාධිකාරී (ආදායම්) ඒකක විසින් අවිනිශ්චිත ලැයිස්තුව සමීපව නිරීක්ෂණය කර නිතිපතා නිරවුල් කිරීම් සිදු කරයි. චකතු කිරීමේ නියෝජිතයින්ගෙන් විස්තර ලබා ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂයෙන්, වයඹ පළාත 1 හි සහ වයඹ පළාත 2 හි නියෝජිත බිල්පත් චකතු කිරීම්වල පිළිවෙලින් රු. 789,094.54 ක් සහ රු. 790,000 ක් නිරවුල් කර ඇත. උතුරු පළාතට අදාළව වර්ෂය තුළදී රු. 811,546.33 ක් නිරවුල් කර ඇත. තැපැල් කාර්යාල, මහජන බැංකුව සහ ලංකා බැංකුව වැනි නියෝජිතයන් හරහා සිදු වූ වැරදි ගෙවීම් හඳුනාගෙන නිවැරදි කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටී.

(vi) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සිදුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 39 කින් (රජයේ සෞඛ්‍ය අංශයේ ආයතන 35 ක් ඇතුළුව) ලැබිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් රු. මිලියන 159.47 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ආයතන සමඟ ශේෂයන් සැසඳීමට කටයුතු කර නොතිබුණි.

විස්තර	ලංවිම වාර්තාවලට අනුව ශේෂය රු.	ආයතනයේ වාර්තාවලට අනුව ශේෂය රු.	වෙනස රු.
ජනාධිපති ලේකම් කාර්යාලය	25,695,167	858,061	24,837,106
අගමැති කාර්යාලය	37,031,054	1,166,352	35,864,701
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව	14,267,184	9,724,184	4,543,000
විදුලිබල අමාත්‍යාංශය	24,985,801	-	24,985,801
ශ්‍රී ලංකා නාවික හමුදාව	4,476,457	-	4,476,457
එකතුව			**94,707,065**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (W&AS) වාර්තාවලට අනුව, ලංවිම ලෙජරයේ දක්වා ඇති ශේෂයන් නිවැරදි ය. කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ආයතන සමඟ ශේෂයන් සැසඳීමට පියවර ගනු ඇත. රජයේ විගණක හරහා මෙම සියලුම රාජ්‍ය ආයතනවලින් ශේෂ තහවුරු කිරීම ලබා ගැනීමට පියවර ගනු ඇත.

1.2.1.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු. මිලියන 39.8 ක කල්බදු ණය හිමියන්ගේ ශේෂ තහවුරු කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
කල්බදු ණයහිමියන් පිළිබඳ ශේෂ තහවුරු කිරීම හැකි ඉක්මනින් ලබා දීමට පියවර ගනු ඇත.

1.22 **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

(i) **රු. මිලියන 1,728.36 ක් වූ නොසැසඳූ සම්බන්ධිත පාර්ශව හර ශේෂ සහ රු. මිලියන 812.7 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් වෙනත් ණය ගැතියන් සහ වෙනත් ගෙවිය යුතු මුදල් යටතේ ගිණුම්ගත කර තිබුණි.**
පරිපාලිත ශේෂයන් සමඟ ඇති පරතරය පැහැදිලිව සසඳා අවම කර ගැනීමට සහ ගිණුම් අවසන් කිරීමේ චක්‍රලේඛවල දක්වා ඇති මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමට මූල්‍ය අංශය විසින් අදාළ ඒකක වෙත උපදෙස් ලබා දී ඇත.

ii) **මණ්ඩලයේ හා ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (පාරිතෝෂික) ගණනය කිරීම සඳහා භාවිතා කරන වට්ටම් අනුපාතය සහ කාර්ය මණ්ඩල පිරිවැටුම සම්බන්ධයෙන් ආයුගණක තක්සේරුවේ උපකල්පනවල වෙනස්කම් නිරීක්ෂණය විය.**

		2023	2022
වට්ටම් අනුපාතය	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව	13%	18%
	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව	9%	9%
වට්ටම් අනුපාතය	ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව		18%
	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව		11.5%
වයස අවුරුදු 54 දක්වා කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව		3%
	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව		1%

එය යතුරු ලියන දෝෂයක් වන අතර එය නිවැරදි කරනු ඇත.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

(iii) **එස්.එල්.එෆ්.ආර්.එස් 9 ප්‍රමිතයෙහි 5.5.15 (අ) ඡේදයට අනුව සමාගම විසින් රු. මිලියන 1,553 ක් වූ වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.**
එස්.එල්.එෆ්.ආර්.එස් 9 හි 5.5.15(අ) ඡේදයේ දක්වා ඇති පරිදි, රු. මිලියන 1,553 ක් වූ වසරකට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතින වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති වීම සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණය අපි පිළිගනිමු.

එස්.එල්.එෆ්.ආර්.එස් 9 අනුව ආයතන විසින් වෙළඳ ලැබිය යුතු මුදල් ඇතුළුව ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ දීමනාව (ECL) හඳුනා ගැනීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රමිතියට අනුව, ECL දීමනාව තීරණය කිරීම ඓතිහාසික, වත්මන් සහ ඉදිරි දැක්ම සාධක ඇතුළුව අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයකින් තොරව ලබා ගත හැකි සාධාරණ සහ සහාය දැක්විය හැකි තොරතුරු මත පදනම් විය යුතුය.

වසරකට වැඩි වෙළඳ ලැබිය යුතු මුදල්වලින් සියයට 99 ක් ලංවිම වෙතින් අයවිය යුතු වන අතර මෙම ශේෂයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් එකතු කළ හැකි ය. තවද, 2024 නොවැම්බර් දක්වා මෙම ශේෂයන්ගෙන් සමහරක් දැනටමත් පියවා ඇත. වත්මන් සහ පුරෝකථනය කරන ලද ආර්ථික තත්වයන්, ලංවිම හි වගකීම් ඉටු කිරීමේ හැකියාවට බලපාන කිසිදු සැලකිය යුතු අහිතකර වෙනසක් නොමැති බව යෝජනා කරයි. එබැවින්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනයක් හඳුනා ගැනීම අවශ්‍ය නොවන බවට වන නිගමනයට සමාගම විසින් එස්.එල්.එෆ්.ආර්.එස් 9 යටතේ විළඹ වී ඇත. සමාගම විසින් මෙම ලැබිය යුතු මුදල්වල තත්ත්වය නිරීක්ෂණය කිරීම දිගටම කරගෙන යන අතර ඉදිරි මූල්‍ය වර්ෂයේදී තත්වයන් වෙනස් වුවහොත් ප්‍රතිපාදන සඳහා අවශ්‍යතාවය නැවත තක්සේරු කරනු ඇත.

ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා වෙළඳ ණය ගැනියන්ට අදාළ අපේක්ෂිත ණය අලාභ සඳහා වෙතිහාසික, වත්මන් සහ ඉදිරි දැක්ම සාධක විශ්ලේෂණය කිරීමෙන් පසු ප්‍රතිපාදන සඳහා ඇති අවශ්‍යතාවය තක්සේරු කිරීමට සමාගමට දැනුම් දීමට ලංවීම අවශ්‍ය පියවර ගනු ඇත.

(iv) **ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වට්නාකම නිශ්චය කිරීමේ කල්පිත ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වට්නකමට එකතු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 14,904.63 ක් වූ සියයට 10 ක අංකිත මිල සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබූ අතර පසුව, එම මුදල ණයගැතියන්ට දුන් වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි නියම කර ඇති විධිවිධානවලට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සහ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ඉහත ගැලපීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.**

ලංවීම වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී සියයට 10 ක රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලංකා ගල්අඟුරු සමාගම වෙත නියෝගයක් ලබා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ ව්‍යුහය තීරණය කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියාට අනුව, ලංවීමට ලැබෙන ඉන්වොයිසි මත වැට් බද්ද සඳහා වන මූලික අගය රේගු අරමුණු සඳහා වන අගයට වඩා අඩු විය නොහැක. ආදායමට රු. මිලියන 14,904.63 ක් වූ සියයට 10 ක අංකිත මිල ඇතුළත් කිරීම සහ ණය ගැනියන්ට වට්ටම් හා විකුණුම් පිරිවැය ලෙස එය පසුව ගැලපීම සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණය අපි පිළිගනිමු. එස්.එල්.එෆ්.ආර්.එස් 15 හි සන්දර්භය සහ විශේෂිත තත්වයන් යටතේ අපි පහත පැහැදිලි කිරීම් සපයන්නෙමු.

එස්.එල්.එෆ්.ආර්.එස් 15 ප්‍රකාරව ආදායම හඳුනා ගැනීම

එස්.එල්.එෆ්.ආර්.එස් 15 යටතේ, භාණ්ඩ හෝ සේවා මාරු කිරීම වෙනුවෙන් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව මත පදනම්ව ආදායම හඳුනා ගනී. ආදායම තෙවන පාර්ශවයන් වෙනුවෙන් එකතු කරන ලද මුදල් බැහැර කළ යුතු බවත් ආයතනය විසින් සපුරාලන තථ්‍ය කාර්ය සාධන බැඳීම් පිළිබිඹු කළ යුතු බවත් ප්‍රමිතිය අවධාරණය කරයි.

මෙම අවස්ථාවේදී, සියයට 10 ක අංකිත මිල වැට් බදු පදනම තීරණය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කරන ලද කල්පිත ගැලපීමක් විය. මෙම අංකිත මිල ගනුදෙනුකරුවන්ගෙන් ලද හෝ ලැබිය යුතු අමතර ප්‍රතිෂ්ඨාවක් නියෝජනය නොකරන අතර, එය කිසිදු අතිරේක කාර්ය සාධන බැඳීම් මාරු කිරීමක් පිළිබිඹු නොකරයි.

සියයට 10 ක අංකිත මිල සඳහා ගිණුම්කරණ ක්‍රමය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල වීම සඳහා, සමාගම සියයට 10 ක අංකිත මිල ඇතුළත් කිරීමට ආදායම ගලපා ඇත. පසුව, මෙම මුදල ණය ගැනියන්ට වට්ටම් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට විරෙහිව ගලපා ඇත. මෙම ප්‍රවේශය බදු අනුකූලතා අවශ්‍යතා සමඟ පෙළගැස්වීම සහතික කරන අතර, ආදායම සහ විකුණුම් පිරිවැය යන දෙකම එකම ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා ඇති බැවින් ලාභදායිතාවයට ඇති ශුද්ධ බලපෑම ශූන්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොකිරීම

මෙම ගැලපීම මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව හෙළිදරව් කර නොමැති බව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, ගැලපීම නියාමන අධිකාරියක් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) විසින් නියම කර ඇති අතර එය සමාගමේ ශුද්ධ ලාභයට බලපෑමක් නොමැති බැවින්, ගැලපීම හෙළිදරව් කිරීම ප්‍රමාණාත්මක නොවන ලෙස සැලකේ. ඉදිරියට යමින්, විනිවිදභාවය සහ එස්.එල්.එෆ්.ආර්.එස් 15 ට සහ අනෙකුත් අදාළ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු හෙළිදරව් කිරීම් අප විසින් ඇතුළත් කරනු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අප විසින් මෙම ගිණුම්කරණ ක්‍රමය නැවත තක්සේරු කරන අතර පැහැදිලිතාව සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා පසුකාලීන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් කරනු ඇත.

(අ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

(i) **මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ 5.5 ඡේදයට අනුව, ගනුදෙනු හෝ වෙනත් සිදුවීම්වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම, ආදායම් සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකම එකවර හඳුනා ගැනීමට හේතු විය හැක. ආදායම සහ ඒ ආශ්‍රිත වියදම් එකවර හඳුනා ගැනීම සමහර විට ආදායම සමඟ වියදම් ගැලපීම ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2017 සිට 2023 යන කාලපරිච්ඡේදය සඳහා (2021 හැර) සූර්ය බලශක්තිය මිලදී ගත් පිරිවැය වූ රු. මිලියන 4,658.2 ක් අදාළ වර්ෂවල විකුණුම් පිරිවැය ලෙස හඳුනා ගැනීම වෙනුවට, සමාගම විසින් එම පිරිවැය මණ්ඩලයෙන්**

ලැබිය යුතු ලෙස හඳුනාගෙන තිබුණු අතර මිලදී ගත් සූර්ය බලශක්තියේ විකුණුම් ආදායම අදාළ වර්ෂවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම්, වර්ෂය සඳහා ලාභය සහ ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 2,819.6 කින්, රු. මිලියන 1,838.6 කින් සහ රු. මිලියන 4,658.2 කින් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, විදුලිය මිලදී ගැනීමේ බලපත්‍රය තනිකරම ලංවිම සතු වේ. ලෙකෝ වෙත කිසිදු විදුලි ජනන ප්‍රභවයකින් විදුලිය මිලදී ගත නොහැක. එබැවින්, ලෙකෝ මුලින් පාරිභෝගිකයාට ගෙවන අතර පසුව ලංවිම වෙතින් ප්‍රතිපූරණය ඉල්ලා සිටී. මෙම ක්‍රියාවලිය අමාත්‍යාංශය සමඟ වන එකඟතාවයකි. එබැවින්, ලංවිම මෙම පිරිවැය ලෙකෝ වෙත ප්‍රතිපූරණය කළ පසු, විදුලි පරිභෝජනය මත පදනම්ව ලෙකෝ වෙත ඉන්වොයිස් කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලිය ලංවිම විසින් තවමත් ආරම්භ කර නොමැත.

තවද, ලංවිම සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ පැවති සාකච්ඡාවලින් පසුව, ලංවිම විසින් මුදල් ආපසු ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව, 2022 වර්ෂය සඳහා ඒකාකාර මිල ජාතික ගාස්තු ගැලපීමක් (UNT) ලෙස 2024 මැයි මාසයේ ඔවුන්ගේ බලශක්ති බිලෙන් අඩු කිරීමෙන් ලංවිම විසින් රු. 1,544,458,302 ක් ප්‍රතිපූරණය කර ඇත. එබැවින්, මෙම කාරණය නුදුරු අනාගතයේ දී විසඳනු ඇතැයි අපි විශ්වාස කරයි.

(ii) **2023 දෙසැම්බර් 31 දිනට විවිධ සේවා සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 5,777.8 ක් වූ අතර, මෙම ශේෂය අතරින්, රු. මිලියන 5,770.6 ක් ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළදී බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. එම රු. මිලියන 5,770.6 ක ශේෂයෙන්, 2017 සිට 2023 දක්වා කාලය සඳහා ශුද්ධ ගිණුම්කරණ සහ ශුද්ධ ප්ලස් ක්‍රම භාවිතා කරමින් බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා ලංවිම වෙතින් ලැබිය යුතු ලෙස ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයෙන් ලද ශේෂ තහවුරු කිරීම අනුව, සමාගමට ගෙවිය යුතු ශේෂයක් නොමැති බව මණ්ඩලය තහවුරු කර තිබුණි. තවද, ශුද්ධ ගිණුම්කරණ සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් විදුලිය මිලදී ගැනීම සඳහා පාර්ශව දෙක අතර විධිමත් ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගත නොහැකි වූ අතර, ඉහත ලැබිය යුතු ශේෂය සඳහා සමාගම රු. මිලියන 5,300.9 ක හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.**
ඉහත 1.2.2 (v) හි සඳහන් පිළිතුර බලන්න.

(iii) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන වගන්තියට අනුව, වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට කාණ්ඩ 04 කට අදාළව රු. මිලියන 11,114.4 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම්, ප්‍රමිතිවලට අනුව අවශ්‍ය පරිදි සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.**
මෙම වත්කම් බස්නාහිර සහ දකුණු පළාත්වල වෙරළබඩ තීරය දිගේ විශාල භූගෝලීය ප්‍රදේශයක් පුරා පැතිරී ඇති නිසා සමස්ත වත්කම් පන්තියක ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීම කළ නොහැක. එකම වත්කම් කාණ්ඩය තුළ විවිධ ප්‍රයෝජනවත් ආයු කාලයන් සහිත විවිධ වර්ගයේ වත්කම්, සෑම වත්කම් පන්තියකම ඇතුළත් විය හැකිය. සම්පත් සීමාවන් සහ අදාළ වත්කම්වල විවිධ ස්වභාවය හේතුවෙන්, වත්කම් කාණ්ඩ 4 ක වාර්ෂික සමාලෝචනයට වැඩි කාලයක් ගතවේ. කෙසේ වෙතත්, ඉදිරියෙදී, වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන බවත් ඇස්තමේන්තුවල සිදුවන ඕනෑම වෙනසක් එල්.කේ.ඒ.එස් 8 ට අනුකූලව හඳුනා ගන්නා බවත් අප විසින් සහතික කරනු ඇත.

(iv) **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ඇන්ටි ලෙකෝ මිටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හා ලෙකෝ ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) සමාගමේ හි මූල්‍ය ප්‍රකාශන අතර ආදායම්, විකුණුම් පිරිවැය, වෙළඳාම හා වෙනත් ගෙවිය යුතු මුදල් ආදි ශේෂයන් සම්බන්ධයෙන් පිළිවෙළින් රු. මිලියන 398.7 ක සහ රු. මිලියන 50 ක වෙනස්කම් නිරීක්ෂණය විය.**
මෙම කරුණ 2024 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරනු ඇත.

1.3 **මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**
තොරතුරු සහිතයි.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
තොරතුරු සහිතයි.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**
තොරතුරු සහිතයි.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

තොරතුරු සහිතයි.

2.1 **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.**

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සමඟ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුසාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

තොරතුරු සහිතයි.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	පිළිතුර
(අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිය	නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 2,957.3 ක් වූ ගිගාවෝට් 27.31 ක බලශක්ති මිලදී ගෙන තිබුණි.	වාරිමාර්ග අවශ්‍යතා සඳහා සමනලවැව ජලාශයෙන් ජලය මුදා හැරීම හේතුවෙන්, 2023 අගෝස්තු 15 වන දින වන විට දකුණු කලාපයේ පවතින විදුලි බලාගාරවලින් අවශ්‍ය අතිරේක විදුලිය මිලදී ගැනීමෙන් (දින 08ක් ඇතුළත ක්‍රියාත්මක කිරීමට) දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා 2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (අමාත්‍යාංශ කිහිපයක සාමාජිකයින් ඇතුළුව) විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මෙම ප්‍රසම්පාදනය සඳහා ඇගයීම සහ සාකච්ඡා සිදු කර ඇත. 2023 අගෝස්තු 18 වන දින වන විට අතිරේක විදුලිය මෙගාවොට් 100 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා 2023 අගෝස්තු 17 දිනැති PUC/LIC/2023/CEB/11 ලිපිය හරහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ (PUCSL) අනුමැතිය ලැබී ඇත. ලංවිම වාර්තාවලට අනුව, රටේ දකුණු කලාපයට අඛණ්ඩ විදුලි සැපයුමක් පවත්වා ගැනීම සඳහා අතිරේක විදුලිය ලබා ගැනීම සඳහා සුදුසු මූලාශ්‍ර ලෙස විදුලි ජනන බලාගාර හතරක් (දැනටමත් නිශ්චිත ග්‍රිඩ් අන්තර් සම්බන්ධතා ස්ථාන ඇති) හඳුනාගෙන ඇත. ඒ අනුව, TEC විසින් සකස් කර SCAPC විසින් අනුමත කරන ලද යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ලේඛන යෝජකයින් හතර දෙනෙකුට නිකුත් කරන ලද අතර යෝජකයින් දෙදෙනෙකු (ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්.) සමාගම සහ ඒස් පවර් ඇඕලිපිටිය (පුද්.) සමාගම) ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කර තිබුණි. තාක්ෂණික ඇගයීම් මත පදනම්ව SCAPC, TEC සමඟ එක්ව යෝජකයින් සමඟ 2023 අගෝස්තු 11 වන දින සාකච්ඡා ආරම්භ කර ඇත.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	පිළිතුර
		ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම සඳහා සාකච්ඡා කළ මිල අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. සියයට 92 ක බලාගාර සාධකයකින් (එනම් මෙගාවොට් 21.88 ක ඵලදායී බලාගාර ධාරිතාව) මෙගාවොට් 23.75 ක් සමඟ අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) කිලෝවොට් පැය 94,500,000 ක් සඳහා ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම සමඟ විදුලිය මිළදී ගැනීමේ ගිවිසුමකට (PPA) එළඹීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. තවද, ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සඳහා සාකච්ඡා කළ මිල අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. සියයට 81 ක බලාගාර සාධකයකින් (එනම් මෙගාවොට් 75.43 ක ඵලදායී බලාගාර ධාරිතාව) මෙගාවොට් 93 ක් සමඟ MGEA කිලෝවොට් පැය 325,872,000 ක් සඳහා ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ PPA වෙත එළඹීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය මාස 06 ක කාලයක් සඳහා MGEA කිලෝවොට් පැය 94,500,000 ක් සඳහා ඒස් පවර් ජේනරේෂන් මාතර (පුද්.) සමාගම සමඟ සහ MGEA කිලෝවොට් පැය 325,872,000 ක් සඳහා ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹුණි. ඉහත බලාගාර දෙකෙහිම ඵලදායී ධාරිතාව මෙගාවොට් 97.31 ක් විය. ඉහත ප්‍රසම්පාදනය කලින් කල් ඉකුත් වූ PPA සඳහා දීර්ඝ කිරීමක් නොවේ. රට තුළ ප්‍රකාශිත හදිසි අවස්ථාවකදී දිවයින පුරා අඛණ්ඩ විදුලි සැපයුමක් සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුකූල වීම සඳහා සම්පූර්ණ ප්‍රසම්පාදනය ටෙන්ඩරයක් ලෙස සිදු කර ඇත.
(i) 3.5 වගන්තිය (ආ) 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත	2020 සිට 2023 දක්වා රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 288.66 ක් මණ්ඩලයට ප්‍රතිපූරණය කළ යුතුය. ඊට අමතරව, 2014 සිට 2023 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද ශ්‍රී ලංකා එනර්ජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස රාජකාරී කරන නිලධාරියෙකුගේ වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් රු. මිලියන 24 ක මුදලක් දරා තිබුණි.	ලංවිමට රේඛීය අමාත්‍යාංශය විසින් සිය සේවකයන් අමාත්‍යාංශය වෙත මුදාහරින ලෙස කරන ලද ඉල්ලීම් නොසලකා හැරීමට හැකියාවක් නොමැති අතර මේ සම්බන්ධයෙන් දරන වියදම් ලංවිම පාලනය කළ නොහැක. කෙසේ වෙතත්, අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලංවිම විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලමින් ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇත. ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්) සමාගමේ සාමාන්‍යාධිකාරීවරයාගේ වැටුප සඳහා ප්‍රතිපූරණය වීම සමාගම විසින් පියවයි.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	පිළිතුර
(ii) 7.7 වගන්තිය	අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2024 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.	විදුලිබල ක්ෂේත්‍රයේ යෝජිත ආයතනික ප්‍රතිසංස්කරණවලට අනුව, ලංවිම කොටස් කිරීම ආරම්භ වනු ඇති බවත් ලංවිම ව්‍යාපාර භාර ගැනීම සඳහා සමාගම් පනත යටතේ නව ස්වාධීන සමාගම් ස්ථාපිත වනු ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කර ඇත. යෝජිත ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගැනීමෙන් පසු විදුලිබල ක්ෂේත්‍රයේ සියලු අංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව විදුලි පනතක් සම්පාදනය වනු ඇත. එබැවින්, සාකච්ඡාවෙන් පසුව, ලංවිම ආයතනික පරිවර්තනයක ක්‍රියාවලියක යෙදී සිටින බැවින් ඉහත (i) ඡේදයේ සඳහන් පරිදි පරිපාලිත ප්‍රතිපත්තියක් සැකසීම මෙම අවස්ථාවේදී අවශ්‍ය නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.
(ඇ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනතේ V වන කොටසෙහි 17 වගන්තිය	2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ සිට 2023 අගෝස්තු දක්වා ලංකා විදුලි සමාගමට විදුලිය සැපයීමේදී අය කරන ලද රු. මිලියන 1,224.1 ක සමාජ ආරක්ෂණ දායක බදු (SSCL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2024 මැයි මාසය අවසන් වන විටත් ගෙවා නොතිබුණි.	මෙම ගැටළුව දැන් විසඳා ඇති අතර 2024 ජූලි මාසයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම පියවා ඇත.
(ඈ) 2023 පෙබරවාරි 07 දිනැති අංක 23/0199/601/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ගරු නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අංක 198/2024 සහ 254/2024 දරන අධිකරණ නඩු දෙකක් සඳහා බාහිර නීතිඥයෙකුගේ සේවය ලබාගෙන තිබුණි. පසුව, සේවා කාලය සඳහා රු. මිලියන 7.6 ක ඉන්වොයිසි මණ්ඩලය වෙත යොමු කර තිබුණි. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් මාසය තුළදී නීතිමය ගාස්තු ලෙස ඉන්වොයිස් කරන ලද රු. මිලියන 7.6 ක මුදල අමාත්‍ය මණ්ඩලයේ තීරණයේ සඳහන් පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	ගරු නීතිපතිවරයා 2024.10.30 දින SC/FR/198/2024 සහ 254/2024 දරන නඩු රඳවා ගන්නා ලද අතර මෙම නඩු 2024 නොවැම්බර් 26 වන දින නිෂ්ප්‍රභ කර ඇත. කෙසේ වෙතත්, මෙම නඩුවලදී නීතිමය ගාස්තු ලෙස රු. මිලියන 7.6 ක මුදලක් දරා නොමැත. එබැවින්, මෙම මුදල අයකර ගැනීමට පියවර ගැනීමට අවශ්‍ය නොවේ.

2.2.2 **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

(අ) **"ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම" යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.**

(i) **වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2008 අප්‍රේල් 09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ දීමනා වර්ග 11 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මුල් මාස 09 තුළදී රු. 507.47 ක් ගෙවා තිබුණි.**
මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.

(ii) **වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 10 තුළදී නිලධාරීන් 517 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 99.85 ක් ගෙවා තිබුණි.**
මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන ලද අතර ඔවුන්ගේ වාර්තාව සුදුසු ක්‍රියාමාර්ග සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.

(iii) **සිදු කරන ලද අහඹු පරීක්ෂණයට අනුව, තනතුරකට පත් කරන ලද නිලධාරීන්ට එම තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා දීමනා ද ගෙවනු ලබන බව නිරීක්ෂණය විය.**
අධ්‍යක්ෂ මණ්ඩලයේදී ගත් තීරණයට අනුව, 2022 අගෝස්තු 12 දිනැති ලංවිම සේවකයින්ට දීමනා අනුමත කිරීම සහ ගෙවීම පිළිබඳ උපදෙස්, යන මැයෙන් යුත් අංක 2022/GM/38/පිරිස් දරන සාමාන්‍යාධිකාරීගේ චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, එම දීමනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත්නම් සහ මූලික වැටුපෙන් සියයට 65 ක සීමාවකට යටත්ව පමණක් දීමනා ගෙවන ලෙස උපදෙස් දී ඇත. තවද, පොදු ව්‍යාපාර කමිටුවේ (COPE) උපදෙස් පරිදි 2008 වර්ෂයෙන් පසුව ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලෙස සාමාන්‍යාධිකාරී විසින් 2024.06.24 දිනැති ඔහුගේ ලිපිය මගින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත.

(iv) **එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුන්වා දී නොතිබුණි.**
වාර්ෂිකව පවත්වනු ලබන පුළුල් කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලියක් මත පදනම්ව, නිශ්චිත දිනට පසුව බඳවා ගන්නා ලද සේවකයින් ඇතුළුව සියලුම සේවකයින්ට වැටුප් වර්ධක නිර්දේශ කරයි.

(ආ) **මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සහනාධාර නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් ලබාගෙන ඇති දේපල ණය සඳහා අය කරන ලද පොලියෙන් 2/3 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. 2013 සිට 2023 දක්වා ප්‍රතිපූරණය කරන ලද පොලී මුදල රු. මිලියන 16,789.5 ක් විය.**
1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ අංක 12(), (k), (m) සහ (n) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ, 1983 වර්ෂයේදී නිවාස ණය ලබා ගත් ලංවිම සේවකයින්ට සහන ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත. සංවිධානයේ සහ රටේ අභිවෘද්ධිය සඳහා වැඩ කිරීමට ඔවුන් පෙළඹවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මේ දක්වා සේවකයින්ට මෙම ප්‍රතිලාභය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.

(ඇ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2018 – 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018 සිට 2021 යන වර්ෂයන් තුළදී මෙගාවොට් 2,032 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. 2022 – 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීම ඇතුළත් කර තිබුණු නමුත් මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් එම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව, 2023–2042 සඳහා අනුමත කරන ලද අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ 2023 දී මෙගාවොට් 607 ක මුළු ධාරිතාවකින් යුත් බලාගාර ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට මෙගාවොට් 185.6 ක බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව උත්පාදනය බලාගාර ක්‍රියාත්මක කිරීම ඉලක්කයට වඩා සැලකිය යුතු ලෙස අඩු වූ අතර අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීමේ අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී එකකයක සාමාන්‍ය පිරිවැය රු. 108.29 ක් වූ රු. මිලියන 2,957.3 ක් වටිනා ගිගාවොට් පැය 27.31 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි. සාපේක්ෂව, එකකයක සමස්ත සාමාන්‍ය පිරිවැය සහ වෙස්ට් කෝස්ට් බලාගාරයෙන් මිලදී ගත් විදුලිය සඳහා සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු. 40.92 ක් සහ රු. 68.29 ක් විය.

වගු අංක 01 : 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම

වර්ෂය	බලාගාරය	මෙගාවොට්	ප්‍රමාද වීමට හේතු
2018	මෙගාවොට් 320 ක මධ්‍ය කාලීන විදුලි බලාගාරය (මෙගාවොට් 100, 70, 150 දැවි තෙල් බලාගාර)	320	2020-11-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පදනම්ව 2020 දී ප්‍රසම්පාදනය නවතා ඇත.
	එකතුව	320	
2019	උමා ඔය ජල විදුලි බලාගාරය	120	ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානයට පනවා ඇති සම්බාධක සහ මහජන විරෝධය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. 2024 අප්‍රේල් මාසයේදී ක්‍රියාත්මක කර ඇත.
	මෙගාවොට් 2 x 35 ගෑස් ටර්බයින (පසුව 2020 දී ක්‍රියාත්මක කිරීමට නියමිත මෙගාවොට් 1 x 35 MW ගෑස් ටර්බයිනය සමඟ ඒකාබද්ධ කර මෙගාවොට් 130 ගෑස් ටර්බයිනය ලෙස හඳුනා ගැනේ)	70	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. රටේ සහ ලංවිමෙහි දැඩි මූල්‍ය අර්බුද තත්ත්වය හේතුවෙන් ආයෝජකයින්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි විය. නැවත ටෙන්ඩර් කිරීම සිදුකරමින් පවතී.
	මෙගාවොට් 1 x 300 ස්වභාවික වායු මඟින් ක්‍රියාත්මක වන ඒකාබද්ධ චක්‍රීය බලාගාර (Natural Gas fired Combined Cycle Power Plant) බස්නාහිර කලාපය	300	ප්‍රසම්පාදනය 2016 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ නමුත් නීතිමය ආරවුල් හේතුවෙන් ප්‍රමාද විය. ඉදිකිරීම් දැන් සිදුකරමින් පවතින අතර එය අවසන් අදියරේ පවතී.
	එකතුව	490	
2020	බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය	35	මහජන විරෝධය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. ව්‍යාපෘතිය 2022 දී ආරම්භ කර ඇත.
	තල්පිටිගල ජල විදුලි බලාගාරය	15	මූල්‍ය පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපෘතිය නවතා ඇත. ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතී.
	මෙගාවොට් 1x35 ගෑස් ටර්බයින (පසුව 2019 දී ක්‍රියාත්මක කිරීමට නියමිත මෙගාවොට් 2 x 35 MW ගෑස් ටර්බයිනය සමඟ ඒකාබද්ධ කර මෙගාවොට් 130 ගෑස් ටර්බයිනය ලෙස හඳුනා ගැනේ)	35	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. රටේ සහ ලංවිමෙහි දැඩි මූල්‍ය අර්බුද තත්ත්වය හේතුවෙන් ආයෝජකයින්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි විය. නැවත ටෙන්ඩර් කිරීම සිදුකරමින් පවතී.
	එකතුව	85	
2021	මෙගාවොට් 1 x 300 ස්වභාවික වායු මඟින් ක්‍රියාත්මක වන ඒකාබද්ධ චක්‍රීය බලාගාර - බස්නාහිර කලාපය	300	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමේ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. ප්‍රසම්පාදන කටයුතු අවසන් කරමින් පවතී.
	එකතුව	300	
එකතුව		**1,195**	

වගු අංක 02 ශ්‍රී 2022 – 2041 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම

වර්ෂය	බලාගාරය	මෙගාවොට්	ප්‍රමාද වීමට හේතු
2022	උමා ඔය ජල විදුලි බලාගාරය	120	Explained in Table 1.
	බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය	35	
	එකතුව	355	

වගු අංක 03 ශ්‍රී 2023 – 2042 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම

වර්ෂය	බලාගාරය	මෙගාවොට්	ප්‍රමාද වීමට හේතු
2023	සෝබාධනවි ස්වභාවික වායු ඒකාබද්ධ චක්‍රීය බලාගාරයේ ගෑස් ටර්බයිනය - කෙරවලපිටිය	235	වගුව 1 හි පැහැදිලි කර ඇත. (මෙගාවොට් 1 x 300 ස්වභාවික වායුව මත ක්‍රියාත්මක වන ඒකාබද්ධ චක්‍රීය බලාගාරය - 2019 දී බස්නාහිර කලාපය)
	එකතුව	**235**	

(ඇ) කෙටි කාලීන පදනම මත මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදනය කිරීම.

(i) **2023 අගෝස්තු 07 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සමනලවැව ජලාශයෙන් වාරිමාර්ග සඳහා ජලය මුදා හැරීම සඳහා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර තිබූ අතර මාස 4 සිට 6 දක්වා කාලය සඳහා මෙගාවොට් 100 ක අතිරේක විදුලිය ප්‍රසම්පාදන කිරීමට අනුමත කර තිබුණි. මෙය අනුගමනය කරමින්, මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් (PUCSL) 2023 අගෝස්තු 18 වන දින සිට අතිරේක මෙගාවොට් 100 ක ධාරිතාවක් ප්‍රසම්පාදනය කිරීමට අවසර ලබා දී තිබුණි. මණ්ඩලය විසින් ඒස් පවර් මාතර (මෙගාවොට් 23.75) සහ ඒස් පවර් ඇඹිලිපිටිය (මෙගාවොට් 93) සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙගාවොට් 116.75 ක් වූ මුළු ප්‍රසම්පාදනය මුලින් අනුමත කළ සීමාව ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.**

(ii) **ප්‍රසම්පාදනය කරන ලද ජනන ධාරිතාව, අනුමත ජනන ධාරිතාව ඉක්මවා යාම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 09 දිනැති අංක PUC/LIC/2023/TL/21 දරන ලිපිය) සහ සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(5) වගන්තියට අනුව PUCSL අනුමැතිය සඳහා කෙටුම්පත් විදුලි මිලදී ගැනීමේ ගිවිසුම ඉදිරිපත් කිරීම වෙනුවට මණ්ඩලය සහ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගම අතර අත්සන් කරන ලද විදුලි මිලදී ගැනීමේ ගිවිසුම PUCSL වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් (PUCSL අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2023 ඔක්තෝබර් 02 දිනැති අංක PUC/LIC/2023/TL/17 දරන ලිපිය) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(7) වගන්තිය යටතේ ඉහත අතිරේක විදුලි මිලදී ගැනීම් සඳහා PUCSL හි අනුමැතිය ලබා දී නොතිබුණි. ඒ අනුව, සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ විදුලිය ජනනය කිරීම සඳහා වූ බලපත්‍රය ඒස් පවර් මාතර බලාගාරයට සහ ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට PUCSL විසින් නිකුත් කර නොතිබුණි.**

අතිරේක විදුලිය ප්‍රසම්පාදනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රසම්පාදනය සඳහා දින 08 ක් පමණක් ලබා දී තිබුණි. (2023 අගෝස්තු 07 සිට 2023 අගෝස්තු 15 දක්වා). තවද, 2023 අගෝස්තු 18 වන දින සිට බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා PUCSL විසින් 2023 අගෝස්තු 17 වන දින ඔවුන්ගේ අනුමැතිය ලබා දී ඇත.

අතිරේක විදුලි බලය මිලදී ගැනීමේදී හදිසි අවශ්‍යතාවයක් පැවති බැවින් සහ ඒස් පවර් ජනන මාතර (පුද්.) සමාගම විසින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ කොන්දේසි අධ්‍යයනය කිරීම සඳහා වැඩි කාලයක් ඉල්ලා සිටි බැවින්, ''කෙටි කාලීන පදනමින් මෙගාවොට් 100 අතිරේක විදුලි බලයක් සැපයීම - 2023'' යන ටෙන්ඩරයට අනුව යෝජනා සඳහා වන ඉල්ලීමේ නියමයන් සහ කොන්දේසි යටතේ ක්ෂණික පදනමක් මත මාස 6 ක කාලයක් සඳහා අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය වූ කිලෝවොට් පැය 94,500,000 ක් යටතේ විදුලිය මිලදී ගැනීම සඳහා 2023 අගෝස්තු 18 වන දින ලංවිම මණ්ඩලය විසින් ඒස් පවර් ජනන මාතර (පුද්.) සමාගම වෙත ප්‍රදානය කිරීමේ ලිපියක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත. (අධ්‍යක්ෂ මණ්ඩල තීරණය, දැනටමත් ලංවිම කෙටුම්පත් විගණන වාර්තාවට පිළිතුරු සහිතව අතිරේක ඇමුණුමක් ලෙස රජයේ විගණන ශාඛාවට ඉදිරිපත් කර ඇත). ප්‍රදානය කිරීමේ ලිපිය 2023 අගෝස්තු 19 වන දින නිකුත් කරන ලද අතර ඒස් පවර් ජනන මාතර (පුද්.) සමාගමේ බලාගාරය 2023 අගෝස්තු 22 වන දින එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇත.

කෙටි කාලීන පදනමින් මෙගාවොට් 100 අතිරේක විදුලි බලයක් සැපයීම - 2023' යන ටෙන්ඩරයට අනුව යෝජනා සඳහා වන ඉල්ලීමේ නියමයන් සහ කොන්දේසි යටතේ ක්ෂණික පදනමක් මත, ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ මාස 6 ක කාලයක් සඳහා අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය වූ කිලෝවොට් 325,872,000

ක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කිරීමට 2023 අගෝස්තු 29 වන දින පැවති රැස්වීමේදී, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. (2023 අගෝස්තු 28 වන දින ලද නීතිපතිවරයාගේ එකඟතාවය ඇතුළත්ව). අධ්‍යක්ෂ මණ්ඩල තීරණය, දැනටමත් ලංවිම කෙටුම්පත් විගණන වාර්තාවට පිළිතුරු සහිතව අතිරේක ඇමුණුමක් ලෙස රජයේ විගණන ශාඛාවට ඉදිරිපත් කර ඇත.

2023 අගෝස්තු 18 වන දින වන විට බලාගාර ක්‍රියාත්මක කිරීමට PUCSL නියෝග කර තිබූ අතර එය ඒවනවිටත් දින 11 ක් ප්‍රමාද වී තිබූ බැවින්, තවදුරටත් ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ලංවිම 2023 අගෝස්තු 29 වන දින ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක් (2023 අගෝස්තු 28 වන දින නීතිපතිවරයා විසින් ලබා දුන් අදහස් ඇතුළත්ව) අත්සන් කර ඇත. සංසෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(5) වගන්තියට අනුව ලංවිම එම දිනයේම (2023 අගෝස්තු 29) PUCSL වෙත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම යවා ඇත.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

(අ) මණ්ඩලයේ මූලස්ථානය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව මුලින් 2012 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන්, එය 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 කට නැවත ප්‍රදානය කරන ලද අතර, නිම කිරීමේ දිනය 2023 අගෝස්තු 15 ලෙස නියම කර තිබුණි. කෙසේ වෙතත්, 2023 අගෝස්තු 29 වන දින, විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබුණි. 2024 ජූලි 31 වන දින වන විට, කොන්ත්‍රාත්කරු 2023 අගෝස්තු මාසයේදී වැඩ අත්හිටුවා තිබුණද, කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. 2023 අගෝස්තු 29 වන දින අඩු කරන ලද වැඩ විෂය පථයක් සඳහා ප්‍රමාණවත් නිම කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.9 ක පමණක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද රු. මිලියන 1,484.9 ක් නිෂ්ක්‍රීය විය.

පයිලින් වැඩ කොන්ත්‍රාත්තුව සහ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වෙන වෙනම ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, අත්තිවාරම සඳහා පයිලින් වැඩ කොන්ත්‍රාත්තුව 2012 පෙබරවාරි 23 දින ප්‍රදානය කරන ලද අතර වැඩ ආරම්භ කළ දිනය 2012 මාර්තු 12 විය. කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය, ඉදිකිරීම් අතරතුර උපදේශකයා විසින් පයිලින් අත්තිවාරම නැවත සැලසුම් කිරීම සහ අමතර පයිලින් හඳුන්වා දීම, භාරදීම ප්‍රමාද වීම, කොන්ත්‍රාත්කරුගේ අවසාන ගෙවීම් සහතික කිරීමේ ප්‍රමාදය, ගොඩනැගිලි ව්‍යුහය සඳහා කෙටුම්පත් ලංසු ලේඛනය ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය යනාදිය හේතුවෙන් පයිලින් වැඩ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම ප්‍රමාද විය.

2021 ජූලි මාසයේදී ලබා දුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව, මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 වන දින රු. මිලියන 4,774.6 ක කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර ඇත. ආරම්භ කළ දිනය 2021 අගෝස්තු 16 වන දින වූ අතර නිම කිරීමට නියමිත දිනය 2023 අගෝස්තු 15 විය. ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතරතුර, කොවිඩ්-19 වසංගතයේ බලපෑම, ශ්‍රම හා ද්‍රව්‍ය හිඟය, දේශීය හා ආනයනික ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම, ඉන්ධන හිඟය යනාදිය හේතුවෙන් කොන්ත්‍රාත්කරු දුෂ්කරතා රැසකට මුහුණ දී ඇත. ඒ අනුව, කොන්ත්‍රාත්කරු තමාගේම තීරණය අනුව වැඩවල ප්‍රගති අනුපාතය අඩු කර ඇත. තවද, පවතින වෙළඳපල මිල ගණන් හේතුවෙන් අමතර මුදලක් සඳහා වන කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම, වැඩ කටයුතු කරගෙන යාම සඳහා අමතර අත්තිකාරම් ගෙවීම, ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලංවිමෙන් මූල්‍ය ආධාර ඉල්ලා සිටීම කොන්ත්‍රාත් විධිවිධාන ඉක්මවා යාමකි. මේ අතර, අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ගොඩනැගිල්ලේ සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු සුදුසු පරිදි නැවැත්වීමට 2022 දෙසැම්බර් 07 වන දින ගරු විදුලිබල අමාත්‍යතුමා සමඟ පැවති රැස්වීමකදී උපදෙස් ලබා දී ඇත.

සිදුකරමින් පවතින ඉදිකිරීම් කටයුතු හදිසියේම නතර කළ නොහැකි බව ලංවිම නිරීක්ෂණය කර ඇත. එම අවස්ථාවේදී, බිම් මහලේ සහ පළමු මහලේ වැඩවල ප්‍රගතිය පිළිවෙලින් සියයට 80 ක් සහ 25 ක් විය. ඉතිරි වැඩ සහ නිරාවරණය වූ වැර ගැන්නුම (exposed reinforcement) දීර්ඝ කාලයක් පැවති ආකාරයටම තබා ගත නොහැක. එබැවින්, අවශ්‍ය ආරක්ෂක කටයුතු සමඟ අපේක්ෂිත මට්ටමින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම අවශ්‍ය විය. ඒ අනුව, 2023 පෙබරවාරි 14 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී අවශ්‍ය ආරක්ෂක කටයුතු අවසන් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු නතර කිරීමට සහ ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කොන්ත්‍රාත් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව, සේවායෝජකයාගේ තීරණය පිළිබඳව කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. ව්‍යාපෘති උපදේශක විසින් අඩු කරන ලද විෂය පථය නිකුත් කරන ලද අතර එය කොන්ත්‍රාත්කරු විසින් 2023 අගෝස්තු 15 වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. ජල Sump හැර ව්‍යාපෘතිය 2023 අගෝස්තු 15* වන විට සැලකිය යුතු ලෙස අවසන් කර ඇති බව ව්‍යාපෘති උපදේශක පිළිගෙන ඇත. තවද, ඉදිකිරීම් කාලය තුළ හඳුනාගත් ඉදිකිරීම් දෝෂ සාර්ථකව නිම කිරීමෙන් පසුව පමණක් පවරා ගැනීමේ සහතිකය නිකුත් කරන බව කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. මුල් විෂය පථයට අනුව ප්‍රගතිය සියයට 13.2 ක් පමණ විය.

නිවැරදි කිරීමේ ක්‍රම කිහිපයක් අනුගමනය කළද, උපදේශකයා සෑහීමකට පත්වන පරිදි ඉදිකිරීම් දෝෂ සාර්ථකව නිම කිරීමට කොන්ත්‍රාත්කරු මෙතෙක් අපොහොසත් වී ඇත. නිවැරදි කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2025 පෙබරවාරි 08 වන දින වන විට සියලුම නිවැරදි කිරීම් සම්පූර්ණ කර ව්‍යාපෘතිය භාර දෙන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. මේ අතර, විෂය පථය අඩු කිරීම හේතුවෙන්, කොන්ත්‍රාත්කරු හිමිකම් කිහිපයක් මතු කරන ලද අතර ඒවා ආරවුල් විනිශ්චය මණ්ඩලයේ ඇගයීමට ලක්වෙමින් පවතී.

ගෙවීම්	
පයිලින් වැඩ කොන්ත්‍රාත්තුව	= රු. 276,776,388.61
උපදේශන සේවා	= රු. 31,218,750.00
එකතුව	= රු. 307,995,138.61
ගොඩනැගිලි කොන්ත්‍රාත්තුව	= රු. 753,853,575.79
උපදේශන සේවා	= රු. 20,945,544.36
එකතුව	= රු. 774,799,120.05

මෙම කොන්ත්‍රාත්තුව යටතේ අත්තිකාරම් ගෙවීම සම්පූර්ණයෙන්ම අයකර ගෙන ඇත. රඳවා ගැනීමේ මුදල රු. මිලියන 82.7 ක් සහ අඩුපාඩු සඳහා රඳවා ගත් මුදල වන රු. මිලියන 25 ක් සම්පූර්ණ කිරීමෙන් පසු නිදහස් කිරීමට නියමිතය.

(ආ) 1988 දී මණ්ඩලයේ ප්‍රධාන ජනන සැලැස්මේ හඳුනාගත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. මුලින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරන ලද අතර, මූලික වියදම් සඳහා රු. මිලියන 1.3 ක් වැය කිරීමෙන් පසුව එය මණ්ඩලයට මාරු කර තිබුණි. 2021 සැප්තැම්බර් 30 වන විට, මණ්ඩලය මූලික කටයුතු සඳහා රු. මිලියන 301.19 ක් වියදම් කර තිබුණද, අවසානයේ ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 7 ක කුඩා ජල විදුලි බලාගාර දෙකක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නැවත පැවරීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ වියදම් අනාර්ථික වීමට මෙම තීරණය හේතු වූ අතර, මෙම වියදම් අයකර ගැනීමට හෝ ඒවා නිසි ලෙස ගිණුම්ගත කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.

අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමට නියමිතය.

(ඇ) 2000 වර්ෂයේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක පිරිවැයට ඉඩම් 18 ක් මිලදී ගෙන තිබුණු අතර 2023 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. එම ඉඩම් අතරින් රු. මිලියන 36.48 ක් වටිනා ඉඩම් 4 ක් බෙදාහැරීමේ අංශය 01, 02 සහ 04 හි ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, නියදි විගණන පරීක්ෂණයට අනුව, අදාළ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කර වර්ෂ 6 ක් ඉක්මවී තිබුණද, ඉඩම් දහයක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

අංශය	මුදල	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	1,600,000.00 2,500,000.00	2024 ජනවාරි 23 වන දින විගණන විමසුම අංක: PWR/A/CEB/2023/AQ/06 සඳහා පිළිතුරු දැනටමත් ඉදිරිපත් කර ඇත.
බෙදාහැරීමේ අංශය 02	3,825,000.00 229,000.00 12,000,000.00	2024 ජනවාරි 23 වන දින විගණන විමසුම අංක: PWR/A/CEB/2023/AQ/06 සඳහා පිළිතුරු දැනටමත් ඉදිරිපත් කර ඇත.
බෙදාහැරීමේ අංශය 03	14,750,000.00	ඉහත ශේෂයට බස්නාහිර පළාත 2 හි ප්‍රාදේශීය කාර්යාලයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 14 කට මිලදී ගත් ඉඩමක් ඇතුළත් වේ. ඉඩම බෙදාහැරීමේ අංශය 03 හි ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර ඇත. ඉදිකිරීම් සඳහා දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන ඇත. කෙසේ වෙතත්, 2022.08.08 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 හරහා සියලුම ඉදිකිරීම් අත්හිටුවීමත් සමඟ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට නොහැකි විය.
බෙදාහැරීමේ අංශය 04	6,750,000.00 3,000,000.00 23,750,000.00 917,475.00 33,825,000.00 7,400,000.00 1,750,000.00 1,650,000.00	දකුණ පළාත I දකුණ පළාත I ට අදාළ රු. මිලියන 36.9 ක ඉඩම් විගණන විමසුමේ ඇතුළත් ඇමුණුමේ සඳහන් කර ඇත. වර්තමාන මූල්‍ය තත්ත්වය හේතුවෙන් ඉඩම් මිලදී ගැනීම සහ ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ ප්‍රාග්ධන වියදම් වහාම නතර කරන ලෙස 2019.04.23 දිනැති අංක 2019/GM/18 දරන චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී ඇත. එබැවින් ඉදිකිරීම් ආරම්භ කර නොමැත. දකුණ පළාත 2 (1) කඹුරුපිටිය සඳහා යෝජිත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය - බලාත්මක චක්‍රලේඛවලට අනුව නව ඉදිකිරීම් සඳහා අවසර නොමැති බැවින් ඉදිකිරීම් නතර කර ඇත. (2) දික්වැල්ල සඳහා යෝජිත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය - බලාත්මක චක්‍රලේඛවලට අනුව නව ඉදිකිරීම් සඳහා අවසර නොමැති බැවින් ඉදිකිරීම් නතර කර ඇත. (3) තංගල්ල සඳහා යෝජිත ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය - බලාත්මක චක්‍රලේඛවලට අනුව නව ඉදිකිරීම් සඳහා අවසර නොමැති බැවින් ඉදිකිරීම් නතර කර ඇත. ඉඩම මිලදී ගෙන මාරු වවුචර හරහා පිරිවැය ආයතනික කාර්යාලයට මාරු කළ පසු ඉඩම ප්‍රාග්ධනිත කරයි.
ව්‍යාපෘති	15,500,000.00 6,700,000.00 26,236,093.00	මෙම ඉඩම් 18 අතරින් ව්‍යාපෘති අංශයට ඉඩම් 3 ක් පමණක් අයත් වේ. මෙම ඉඩම් තුන ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් වන අතර ඒ පිළිබඳව විගණකට දන්වා ඇත, ඒවා අදාළ අරමුණ සඳහා යොදා නොගැනීමට හේතුව පහත පරිදි වේ.

අංකය	අංශය	ඉඩමේ ලිපිනය	ඉඩම් මිලදී ගැනීමේ අපේක්ෂිත අරමුණු	අදහස් දැක්වීම
2	ව්‍යාපෘති අංශය - සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව	සෙම්බුකුලන් වත්ත, මුන්දලම	යෝජිත කිරියන්කල්ලිය කොටුමා උපපොළ	අනුමත 2018 - 2027 දීර්ඝකාලීන සම්ප්‍රේෂණ පුළුල් කිරීමේ සැලැස්මට අනුව, පද්ධති අවශ්‍යතාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රදේශයේ අපේක්ෂිත පැටවුම් වර්ධනය (load growth) සපුරාලීම අපේක්ෂා කරමින් කිරියන්කල්ලිය නව 132kV කොටුමා උපපොළක් ඉදිකිරීමට තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය පිවිතුරු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය - 2022 යටතේ ක්‍රියාත්මක වන අතර 2021 මාර්තු 19 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංක CE/TP/T19 ට අනුව ඒජන්සි ෆ්‍රැන්සිස් ඩී ඩිවලොප්මන්ට් (AFD) විසින් අරමුදල් සපයනු ලබයි. ණය ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම, සියලු මූලික විමර්ශන සිදු කිරීම වැනි පූර්ව සංවර්ධන කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. AFD හි කොන්දේසියට අනුව, කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා අරමුදල් සැපයීම සඳහා ඉඩම් ලබා ගැනීමේ හැකියාව එහි අවශ්‍යතාවයක් විය. මණ්ඩලයේ අනුමැතිය ඇතිව (2021 අගෝස්තු 18 දිනැති CEB/DGM (Tr.Pr.)/PMU/008/CEATP) ඉඩම 2021 දී අත්පත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, රටේ අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන්, දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්මට අනුව, කිරියන්කල්ලිය කොටුමා උපපොළ සඳහා අවශ්‍යතාවය 2028 න් පසු මතුවනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කිරියන්කල්ලිය කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා අත්පත් කරගත් ඉඩම අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1) භාවිතය සඳහා තාවකාලිකව පැවරීමට යෝජනාවක් ඉදිරිපත් කර 2024.02.16 දින භාර දී ඇත.
16	PD-PSRSP	ලූකස් ගොඩ, පල්ලිය ගොඩ	යෝජිත තිස්සමහාරාමය කොටුමා උපපොළ	පසුගිය වසර කිහිපය තුළ රට තුළ පැවති මූල්‍යමය බාධාවන් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා අප විසින් දැනට ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ සාකච්ඡා කරමින් සිටී.

අංකය	අංශය	ඉඩමේ ලිපිනය	ඉඩම් මිලදී ගැනීමේ අපේක්ෂිත අරමුණු	අදහස් දැක්වීම
17	PD - සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව	මඩවියවෙල, පහළගම.	යෝජිත කොටදෙණියාව කොටුමා උපපොළ	අනුමත 2015 - 2024 දීර්ඝකාලීන සම්ප්‍රේෂණ පුළුල් කිරීමේ සැලැස්මට අනුව, පද්ධති අවශ්‍යතාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රදේශයේ අපේක්ෂිත පැටවුම් වර්ධනය සපුරාලීම අපේක්ෂාවෙන් කොටදෙණියාවේ නව 220kV කොටුමා උපපොළක් ඉදිකිරීමට තීරණය කර ඇත. මෙම උපපොළ ඉදිකිරීම ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මූල්‍යකරණය හරහා බලශක්ති පද්ධති විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSRSP) මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. ADB අරමුදල්වල I වන අදියරේදී, එය සමාලෝචනය කරන ලද අතර 2020 දී ඉඩමක් නොමැති වීම හේතුවෙන් එය සලකා බලා නොතිබුණි. ADB හි කොන්දේසියට අනුව, කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා අරමුදල් සැපයීම සඳහා ඉඩම් ලබා ගැනීමේ හැකියාව එහි අවශ්‍යතාවයක් විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, 2021 දී ඉඩම අත්පත් කර ගෙන ඇත. පසුව, ADB මූල්‍යකරණයේ ඊළඟ අදියරට ඇතුළත් කිරීමට ADB එකඟ විය. කෙසේ වෙතත්, රටේ අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන්, හදිසි අවශ්‍යතාවය පරීක්ෂා කරන ලද අතර, මෙම DD2 උපපොළ සඳහා වන අවශ්‍යතාවය 2023-2032 සඳහා ලංවම හි දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සැලැස්මෙන් ප්‍රමාද කර ඇත. ඉඩම නිෂ්ක්‍රිය වීම වළක්වා ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත උතුර) භාවිතයට ඉඩම භාර දීමට ලංවම තීරණය කර ඇත.

(ඇ) 2022 අංක 16 දරන විදුලිබල (සංශෝධන) පනතට අනුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා විදුලිය නිපදවීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත නව ජනන බලාගාරයක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින ජනන බලාගාරයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද දැන්වීමක් මත ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අදාළ නොවේ. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළදී SLSEA වෙතින් මණ්ඩලයට ලද එකතුව මෙගාවොට් 598 ක ධාරිතාවයකින් යුතු ව්‍යාපෘති අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 4 ක ධාරිතාවයක් සහිත බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

තාක්ෂණය අනුව ධාරිතාව සහ අත්සන් කරන ලද ප්‍රමිතිගත විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම්වල (SPPA) ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

තාක්ෂණය	ධාරිතාව (මෙගාවොට්)	ප්‍රතිශත අගය (තාක්ෂණය අනුව)	2023 දෙසැම්බර් 31 දක්වා අත්සන් කරන ලද SPPA හි ධාරිතාව (මෙගාවොට්)	ප්‍රතිශත අගය (අත්සන් කරන ලද SPPA හි ධාරිතාව)
සුළු ජලවිදුලි බලාගාර	194	33%	19	10%
සූර්ය	266	45%	39	15%
සුළං	70	12%	10	15%
BMP-Dendro	52	7%	15	29%
BMP-AW	16	3%	6	37%
	598	**100.00%**	**89**	**15%**

විදුලිබල පනත සංශෝධනය කිරීමෙන් පසු 2022-2023 කාලය තුළ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට හේතු කිහිපයක් බලපා ඇත.

- **Feed-In Tariff (FIT) ක්‍රියාවලිය අත්හිටුවීම**: 2017 වර්ෂය පමණ වන විට, Feed-In Tariff ක්‍රියාවලිය අත්හිටුවා ඇති අතර, එමඟින් SLSEA ව්‍යාපෘති ගොඩගැසී ඇත. SPPA අත්සන් කරන තෙක් ලංවිම විසින් NCRE ව්‍යාපෘති ක්‍රියාවට නංවා නොතිබුණද, මෙම කාලපරිච්ඡේදය තුළ SLSEA විසින් බලශක්ති බලපත්‍ර (EP) සහ PAs නිකුත් කිරීම දිගටම සිදු කර ඇත. එකතුව මෙගාවොට් 598 ක් වූ මෙම ගොඩගැසී ඇති ව්‍යාපෘති බොහොමයක් වසර තුන හතරකට පෙර ආරම්භ කරන ලද අතර, සංවර්ධකයින් ඒවා සමඟ ඉදිරියට යාමට එතරම් උනන්දුවක් දක්වා නොමැත. SPPAS අත්සන් කරන තෙක් මුළු ධාරිතාවෙන් සියයට 15 ක පමණ ප්‍රගතියක් ලබා ඇත.

- **ආර්ථික ගැටළු**: මූල්‍ය අවිනිශ්චිතතාවයන්, ඉහළ පොලී අනුපාත, උද්ධමන අනුපාත සියයට 60 කට ආසන්න වීම, විදේශ විනිමය සංචිත නොමැතිකම සහ ණයවර ලිපි විවෘත කිරීම හා භාණ්ඩ ආනයනය සීමා කිරීම වැනි සීමාවන් හේතුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළ ඇති වූ ආර්ථික අර්බුදය බොහෝ සංවර්ධකයින් නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පසුබට වීමට හේතු විය.

- **සුළු ජලවිදුලි බලාගාර සඳහා උනන්දුවක් නොමැතිකම** : මුළු ධාරිතාවෙන් සියයට 33 ක් සුළු ජලවිදුලි බලාගාරවලින් සමන්විත වන නමුත් සියයට 10 ක පමණක් SPPA අත්සන් කර ඇත. සුළු ජලවිදුලි බලාගාර සඳහා ආයෝජනය කිරීමට සංවර්ධකයින්ගෙන් උනන්දුවක් නොමැති බව මෙයින් පෙන්නුම් කරයි. ඊට අමතරව, කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීමට කාලය ගතවන අතර විවිධ තෙවන පාර්ශවයන්ගෙන් බොහෝ පාරිසරික ගැටළු සහ විරෝධතා වලට මුහුණ දෙයි.

- **සූර්ය PV ව්‍යාපෘති** : මුළු ධාරිතාවෙන් සියයට 45 ක් සූර්ය PV ව්‍යාපෘතිවලින් සමන්විත වන නමුත් 2023 දෙසැම්බර් 31 වන විට සියයට 15 ක් පමණක් SPPA අත්සන් කර තිබුණි. මෙගාවොට් 266 අතරින් මෙගාවොට් 210 ක් හම්බන්තොට පිහිටා ඇති අතර, පවතින ජාලයට (Network) ලබා ගත හැකි ග්‍රිඩ් ධාරිතාවක් නොතිබුණි. මෙම බලාගාර අනුකලනය (integrate) කිරීම සඳහා, 220 kV සම්ප්‍රේෂණ මාර්ගයක් සහ 4 x 90MVA, 220/33 kV ට්‍රාන්ස්ෆෝමර් ඉදිකිරීම අවශ්‍ය වන නව ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කරන ඇත. සංවර්ධකයින් SPPA ගාස්තුව තුළම මුළු සම්ප්‍රේෂණ පහසුකම් පිරිවැය ද දැරිය යුතුය.

- **සුළං ව්‍යාපෘති**: ඒ හා සමානව, මෙගාවොට් 70 ක සුළං ව්‍යාපෘති අතරින් මෙගාවොට් 60 ක් කල්පිටිය ප්‍රදේශයේ පිහිටා ඇති අතර, එම ප්‍රදේශයේ ග්‍රිඩ් ධාරිතාවක් ද නොමැත. මෙම සුළං බලාගාර අනුකලනය කිරීම සඳහා, නොරොච්චෝලේ කොටුමා උපපොළහි 220/33kV, 75 MVA දෙවන ට්‍රාන්ස්ෆෝමරයක් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇත. SPPA ගාස්තුව තුළ සංවර්ධකයින් විසින් මුළු සම්ප්‍රේෂණ පහසුකමේ පිරිවැය තමන් විසින්ම දැරිය යුතුය.

  එබැවින්, දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට (LTGEP) අනුව NCRE ජනනය පද්ධතියට අනුකලනය කිරීම සඳහා, NCRE ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. ජාලය සංවර්ධනය කිරීම ද ඉතා වැදගත් වේ. ජාලය ශක්තිමත් කිරීමෙන් තොරව, NCRE ජනනය අවශෝෂණය කර ගුණාත්මක විදුලි බලයක් ලබා දීමේ හැකියාව අවදානමට ලක් විය හැකිය.

(ඉ) හදිසි විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා සිටින විට දකුණු පළාතේ විදුලිබල පද්ධතියේ පවතින විදුලිබල ජනනයේ සීමාවන් සහ සම්ප්‍රේෂණ ජාලයේ සීමාවන් මණ්ඩලය විසින් 2016 වසරේ සිට ඉස්මතු කර තිබුණි. කෙසේවෙතත්, වසර 02 ක සහ මාස 07 ක ප්‍රමාදයක් සහිතව දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත පොල්පිටිය – හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය 2023 අගෝස්තු 22 වන දින ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. එමෙන්ම, දකුණු පළාතේ විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා යෝජිත 2022 අප්‍රේල් 20 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ හොරණ – පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය සහ 2021 අප්‍රේල් 01 දින නිම කිරීමට අපේක්ෂා කර තිබූ කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ – නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 51.15 ක් සහ සියයට 59 ක් විය. තවද, කොත්මලේ – නව පොල්පිටිය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.

01. පොල්පිටිය – හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම

ශ්‍රී ලංකාවේ දිගම සම්ප්‍රේෂණ මාර්ගය වන මෙම සම්ප්‍රේෂණ මාර්ගය කිලෝමීටර 150 ක් දිග වන අතර ආරක්ෂාව සහ විදුලි නිෂ්කාශනය සඳහා මීටර් 35 ක පළලකින් යුත් මංවර (wayleave) කොරිඩෝවක් ඇත. ඒ අනුව, වන්දි ගෙවීම සඳහා සිද්ධි 2,000 කට වැඩි ප්‍රමාණයක් ව්‍යාපෘති කළමනාකරණ එකකය විසින් හසුරුවන ලද අතර, එයින් පැවති එකම ගැටළුව වූ රත්නපුර සිරිපාගම කාර්නි වතුයායේ ඉඩම් ගැටළුව ක්‍රියාමාර්ග මාලාවක් ගැනීමෙන් පසු 2023 අගෝස්තු 11 වන දින PUCSL විසින් අවසන් කර ඇත.

තවද, මෙම ගැටළුව ආසියානු සංවර්ධන බැංකුවට (ADB) වාර්තා කරන ලද අතර ඔවුන් අරමුදල් සපයන ආයතනය ලෙස ඔවුන්ගේ මහජන ආරක්ෂණ ප්‍රතිපත්ති න්‍යාසය යටතේ ක්‍රියාවලියට මැදිහත් විය. එබැවින්, ලංවිම රටේ රෙගුලාසි සහ ADB මහජන ආරක්ෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ දෙකම ඉටු කිරීමට සිදු විය. ADB මහජන ආරක්ෂණ ප්‍රතිපත්ති න්‍යාසයට අනුව, සම්ප්‍රේෂණ මාර්ගය හේතුවෙන් හානියක් සිදුවුවහොත් ප්‍රතිස්ථාපන පිරිවැය බලපෑමට ලක් වූ පාර්ශවයට ගෙවිය යුතුය. හානිය සඳහා රජයේ තක්සේරුව බලපෑමට ලක් වූ පාර්ශ්වයන් විසින් ඉල්ලා සිටි ප්‍රතිස්ථාපන පිරිවැයට වඩා අඩු විය. මෙම සීමාවන් සමඟ, PUCSL විසින් මෙම කාරණය විසඳන තෙක් එනම් 2023 අගෝස්තු 11 වන දින දක්වා නොවිසඳවී තිබුණි. ව්‍යාපෘතිය 2023 මාර්තු 18 වන දින වන විට අවසන් කරන ලද අතර, සම්ප්‍රේෂණ මාර්ගය ශක්තිමත් කරන (energize) කර 2023 අගෝස්තු 22 වන විට ක්‍රියාත්මක කර ඇත.

තවද, පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය සහ එම කාලය තුළදී රටේ පැවති සෘණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි.

02. හොරණ – පාදුක්ක කි.වෝ 132 ක ධාරිතාවක් සහිත කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම

ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය ඉතා මන්දගාමී බවක් පෙනෙන්නට තිබුණි. පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෙම කාලය තුළ රටේ පැවති සෘණ ආර්ථික තත්ත්වය ව්‍යාපෘතියේ ප්‍රගතියට බරපතල ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කටයුතුවල සියයට 75 ක ප්‍රගතියක් පවතී. ඒ අනුව, කොන්ත්‍රාත්තුවෙන් සිවිල් වැඩ සහ ස්ථාපන කටයුතු කොටසක් ඉවත් කරමින්, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් සහිතව ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කර ඇත. නව විෂය පථය යටතේ, ව්‍යාපෘතිය 2024 ජනවාරි 19 වන දින වන විට නිම කර ඇත. ව්‍යාපෘතියේ ඉතිරි වැඩ ලංවිම විසින් සිදු කරනු ඇත.

03. කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කොත්මලේ – නව පොල්පිටිය සම්ප්‍රේෂණ මාර්ගය

2022 ආරම්භයේදී, ශ්‍රී ලංකා රජය ආර්ථික හා මූල්‍ය අභියෝගවලට මුහුණ දුන් අතර, බාහිර කම්පන මගින් උග්‍ර වූ ගැටළු ද ඇති විය. ප්‍රධාන සාධක සහ ප්‍රතිවිපාක පහත දැක්වේ :

- ණය බර: ශ්‍රී ලංකාව වසර ගණනාවක් තිස්සේ අධික ණය බරකින් මිරිකී සිටි අතර, එහි ආදායමෙන් සැලකිය යුතු කොටසක් සංවර්ධන ව්‍යාපෘතිවලට වඩා ණය සේවාකරණය සඳහා වෙන් කර ඇත. මෙම ණය බර බොහෝ දුරට විදේශ මූලාශ්‍රවලින් ලබාගත් ණය හරහා මූල්‍යකරණය කරන ලද පසුගිය යටිතල පහසුකම් ව්‍යාපෘතිවල ප්‍රතිඵලයකි.
- වෙළඳ හිඟය : ශ්‍රී ලංකාව අඛණ්ඩ වෙළඳ හිඟයකට මුහුණ දෙමින් සිටි අතර, ආනයන වටිනාකම අපනයන වටිනාකම ඉක්මවා ගිය බව එයින් අදහස් වේ. මෙම අසමතුලිතතාවය රටේ විදේශ විනිමය සංචිත මත පීඩනයක් ඇති කර ඇත.
- දේශපාලන අස්ථාවරත්වය : දේශපාලන අස්ථාවරත්වය සහ රජයේ නායකත්වයේ නිතර සිදුවන වෙනස්කම් අස්ථාවර ආර්ථික ප්‍රතිපත්තිවලට දායක වී ඇති අතර දිගුකාලීන සැලසුම් කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට බාධා වී ඇත.
- වසංගත බලපෑම: බොහෝ රටවල් මෙන්, ශ්‍රී ලංකාව ද කොවිඩ්-19 වසංගතය මගින් උග්‍ර කරන ලද ආර්ථික අභියෝගවලට මුහුණ දී ඇත. අගුලු දැමීම් සහ සීමා කිරීම් ආර්ථික ක්‍රියාකාරකම්වලට බාධා වී තිබුණු අතර විශේෂයෙන් රටේ දළ දේශීය නිෂ්පාදිතයට සැලකිය යුතු දායකත්වයක් සපයන සංචාරක ව්‍යාපාරය වැනි අංශවලට බාධා ඇති විය.

අර්බුදයේ ප්‍රධාන සිදුවීම් පහත පරිදි විස්තර කළ හැකිය.

1. විදේශ විනිමය සංචිත අඩු වීම: 2022 වන විට, ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ඉතා පහළ මට්ටමකට පහත වැටී තිබුණි. අපනයන සහ ප්‍රේෂණ අඩුවීම විශේෂයෙන් ඉන්ධන සහ ආහාර වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ආනයන පිරිවැය වැඩිවීමත් සමඟ අපනයන සහ ප්‍රේෂණ අඩුවීම මේ සඳහා අර්ධ වශයෙන් හේතු විය.

2. මුදල් අවප්‍රමාණය: විදේශ විනිමය සංචිත අඩු වීම හේතුවෙන් ප්‍රධාන ජාත්‍යන්තර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල වේගයෙන් අවප්‍රමාණය විය. මෙම අවප්‍රමාණය වීම උද්ධමනකාරී පීඩනයන් තවදුරටත් ඉහළ නැංවූ අතර, ආනයනික භාණ්ඩ වඩාත් මිල අධික වී දේශීය ජනගහනයේ මිලදී ගැනීමේ හැකියාව අඩු විය.

3. ඉන්ධන සහ බලශක්ති අර්බුදය: ශ්‍රී ලංකාව තියුණු ඉන්ධන සහ විදුලිය හිඟයකට මුහුණ දුන් අතර, එමඟින් පුළුල් ලෙස විදුලිය බිඳවැටීම් සහ ප්‍රවාහන හා කාර්මික නිෂ්පාදනයට බාධා ඇති විය. විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ආනයනික ඉන්ධන සඳහා ගෙවීමට රටට නොහැකි වීම නිසා මෙම හිඟයන් උග්‍ර විය.

4. කප්පාදු පියවරයන්: අර්බුදයට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා රජය රාජ්‍ය වියදම් අඩු කිරීම සහ ආදායම වැඩි කිරීම අරමුණු කරගත් සහනාධාර කප්පාදු සහ බදු වැඩි කිරීම් ඇතුළු කප්පාදු පියවරයන් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, මෙම පියවරයන් ජනප්‍රිය නොවූ අතර මහජන විරෝධයට ලක් වූ අතර සමාජ හා දේශපාලන ආතතීන් තවදුරටත් උග්‍ර කර තිබුණි.

පැකේජ් 03 හි සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කින්ඩන් කෝපරේෂන් හි බද්ධ ව්‍යාපාරයක් මගින් සිදු කරන ලද අතර කල්පතාරු පවර් ට්‍රාන්ස්මිෂන් ලිමිටඩ් විසින් එය 2022 ජුනි මාසය වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වසර ආරම්භයේ සිට, එම කාලය තුළදී ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන හිඟය, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය සහ මිල ඉහළ යාම නිසා ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය විශාල ලෙස පහත වැටී ඇත.

ඉහත කරුණුවලට අමතරව, පහත සඳහන් සාධක ඉන් පසු වැඩ ප්‍රගතියට බලපා ඇත.

අරමුදල් වීජන්සිය වන JICA විසින් 2022 අප්‍රේල් මාසයේ සිට කොන්ත්‍රාත්කරුවන් සඳහා මුදල් ගෙවීම නවතා දැමූ අතර, 2022 පෙබරවාරි මාසයේ සිට සිදු කරන ලද වැඩ සඳහා වන අපේක්ෂිත රු. මිලියන 685 ක් NTDND&EIP පැකේජය 03 හි කොන්ත්‍රාත්කරුට වී වන විට ගෙවා නොතිබුණි.

පසුව, ණයවර ලිපි ද කල් ඉකුත් වූ අතර JICA අරමුදල් නොමැතිකම හේතුවෙන් වීවා දීර්ඝ කර නොතිබුණි. එබැවින්, එම අවස්ථාවේ දී කොන්ත්‍රාත්කරුට විදේශ මුදල් ගෙවීම් සිදු කිරීමට නොහැකි විය.

මෙම පසුබිම තුළ, ඉහත කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු, කින්ඩන් කෝපරේෂන් සහ කල්පතාරු පවර් ට්‍රාන්ස්මිෂන් ලිමිටඩ් හි බද්ධ ව්‍යාපාරය විසින් 2022 මැයි 17 දිනැති ඔහුගේ ලිපි අංක KKJV/NTDND&EIP/SITE/W0353/864 මගින්, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල උප වගන්ති අංක 16.1 ට අනුකූලව, 2022 මැයි 17 දින සිට බලපැවැත්වෙන පරිදි, වැඩ අත්හිටුවීම පිළිබඳ දැන්වීමක් නිකුත් කර ඇත. එසේම, කොන්ත්‍රාත්කරු 2022 මැයි 23 දිනැති ඔහුගේ ලිපි අංක KKJV/NTDND&EIP/SITE/W0353/866 මගින් Force Majeure සඳහා වන දැන්වීමක් ලබා දී ඇත.

මුදල් ආපසු ගෙවීම නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් JICA වෙතින් කිසිදු ධනාත්මක ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 16.2(c) උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු 2023 පෙබරවාරි 02 දිනැති ඔහුගේ අංක KKJV/NTDND&EIP/HO/W0353/895 දරන ලිපිය මගින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා කටයුතු කර ඇත.

රටේ ණය පැහැර හැරීමේ තත්ත්වයට හේතු වූ ඉහත සියලු සාධක සැලකිල්ලට ගනිමින්, 2022 අප්‍රේල් මාසයේ සිට ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට JICA විසින් අරමුදල් ලබා දීම අත්හිටුවීමට හේතු විය.

JICA අරමුදල් නැවැත්වීම නිසා දැනටමත් ඉදිරිපත් කර ඇති ඉන්වොයිසි සමඟ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු සියලුම ගෙවීම් (අතුරු ගෙවීම් සහතික, බදු ගෙවීම්, තීරුබදු ප්‍රතිපූරණ) ප්‍රමාද වීමට හේතු විය. ලංවිම හි මූල්‍ය අස්ථාවරත්වය හේතුවෙන් ඉහත සඳහන් කළ පරිදි සැලකිය යුතු කාලයක් තුළ වරින් වර ඉදිරිපත් කරන ලද සහ ප්‍රමාද වූ අතුරු ගෙවීම් සහතික රාශියක් තිබුණි. 2022 අවසානයේ සහ 2023 ආරම්භයේදී ලංවිම විසින් මූල්‍ය ස්ථාවරත්වයක් ලබා ගත් විගසම මෙම අතුරු ගෙවීම් සහතික වරින් වර කොන්ත්‍රාත්කරුට පියවා ඇත.

(ඇ) **නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදුලිය මිලදී ගැනීම් සහ ඉන්ධන මිලදී ගැනීම් (ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව) සඳහා ප්‍රමාද පොළිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු. මිලියන 16,320 ක් සහ රු. මිලියන 5,620.6 ක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ණය වාරික ආපසු ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළදී පැහැර හැරීමේ පොළිය ලෙස රු. මිලියන 10.33 කට සමාන මුදලක් ද දරා තිබුණි.**
තාප බලාගාර සඳහා මිලදී ගත් ඉන්ධන වෙනුවෙන් ප්‍රමාද වූ පොළිය ලෙස 2023.04.30 දින භාණ්ඩාගාරය විසින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත රු. බිලියන 14.23 ක් (2022 ජනවාරි සිට 2023 අප්‍රේල් දක්වා) පියවා ඇත. 2023 පෙබරවාරි සිට ලංවිම මුදල් පදනම මත ඉන්ධන මිලදී ගෙන ඇති බැවින් ගිණුම් පොත්වල 2023.04.30 දිනෙන් පසු ප්‍රමාද වූ පොළී ශේෂයක් නොමැත.

එම කාල සීමාව තුළදී මූල්‍ය ප්‍රකාශන හරහා, විදුලි ගාස්තුව එහි පිරිවැයට වඩා බෙහෙවින් අඩු වීම හේතුවෙන් රටට අඛණ්ඩ විදුලිය පවත්වා ගැනීම සඳහා බලශක්ති සැපයුම්කරුවන්ට මූල්‍යකරණය කිරීම වෙනුවට කාරක ප්‍රාග්ධන ණය තොගය සැලකිය යුතු ලෙස වැඩි කර ඇති බව ගණනය කෙරේ.

මෙම තත්ත්වය තුළ, මූල්‍ය පිරිවැය වැඩිවීම පැහැදිලි වන අතර, පාර්ශවකරුවන් විසින් විදුලිය සඳහා සාධාරණ මිලක් නියම කිරීමට බල කළහොත් එය සිදු නොවනු ඇත.

(ඇ) **අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මි ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව හදිසි විදුලි මිලදී ගැනීම්, 2016 දී මණ්ඩලයේ ස්ථිර සේවකයින් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීම, මණ්ඩලයේ සේවකයින්ට අනවසර ප්‍රතිලාභ ගෙවා තිබීම හෝ ගෙවීම් කිරීම වැනි කරුණු හේතුවෙන් තෙල්, ගල් අඟුරු සහ අමතර කොටස් මිලදී ගැනීම, විදුලිබල මිලදී ගැනීම් සඳහා ගෙවීම සහ මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා කෙටි කාලීන ණය සහ දිගු කාලීන ණය ලබා ගැනීමට මණ්ඩලයට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළදී පොලී වියදම් ලෙස මණ්ඩලයට රු. මිලියන 36,873.4 ක් දැරීමට සිදු විය.**

බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ දීර්ඝ කාලීන ණය ඇතුළු විවිධ ආකාරයේ ණය ගැනීම් සඳහා ලංවිම සැලකිය යුතු පොලී වියදම් දරා ඇත. සංවිධානයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා මෙම ණය ගැනීම් අත්‍යවශ්‍ය විය.

මෙම ණය ගැනීම් පිටුපස ඇති ප්‍රධාන සාධක අතරට තෙල්, ගල් අඟුරු සහ අමතර කොටස් මිලදී ගැනීම මෙන්ම බලශක්ති මිලදී ගැනීම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ගෙවීම් ඇතුළත් වේ. ඍණ මෙහෙයුම් මුදල් ප්‍රවාහවල අභියෝග මධ්‍යයේ වුවද, අඛණ්ඩ විදුලි සැපයුම සහ යටිතල පහසුකම් සංවර්ධනය පවත්වා ගැනීම සඳහා මෙම වියදම් අවශ්‍ය විය.

ගෝලීය වශයෙන් තෙල් සහ ගල් අඟුරු මිල ඉහළ යාම ප්‍රසම්පාදන වියදම් මත දැවැන්ත පීඩනයක් ඇති කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ඉහළ යන වියදම් පියවා ගැනීම සඳහා ලංවිම අමතර මූල්‍යකරණයක් ලබා ගැනීමට සිදු වූ අතර එමඟින් පොලී පිරිවැය වැඩි වී තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්තිය සහ පුළුල් ආර්ථික අභියෝග හේතුවෙන් කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ණය අනුපාත සමඟ අයිරා පොලී අනුපාත වැඩි වී තිබුණි. මෙය ලංවිම මත මූල්‍ය බර තවදුරටත් සංකීර්ණ කර තිබුණි.

ඉන්ධන සහ ගල් අඟුරු වැනි අත්‍යවශ්‍ය යෙදවුම් ලබා ගැනීම සඳහා ණය ගැනීම ඉතා වැදගත් වූ අතර, එසේ නොමැතිව ලංවිමට විදුලිය ජනනය කිරීමට නොහැකි වනු ඇත. අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම ජාතික ප්‍රමුඛතාවයක් වන අතර, මෙම අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහා මූල්‍යකරණය ලබා ගැනීම නොවැළැක්විය හැකිය.

වැඩිවන බලශක්ති ඉල්ලුම සපුරාලීමට සහ විදුලිබල ජාලයේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමට බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවීම් සහ ප්‍රාග්ධන යටිතල පහසුකම් සඳහා ආයෝජන ද අත්‍යවශ්‍ය විය. මෙම ගෙවීම් හෝ ආයෝජන ප්‍රමාද කිරීමෙන් විදුලිය බිඳවැටීම් සහ යටිතල පහසුකම් අසාර්ථක වීමේ අවදානමක් තිබූ අතර එය ආර්ථිකයට සහ සමාජයට දුරදිග යන ප්‍රතිවිපාක ඇති කිරීමට ඉඩ තිබුණි.

2022 අගෝස්තු දක්වා පිරිවැය පිළිබිඹු නොකරන ගාස්තු, ලංවිම මුහුණ දුන් මුදල් ප්‍රවාහ ගැටළු සඳහා ප්‍රධාන හේතුව වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එදිනෙදා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය කිරීමට ණය ගැනීම් අත්‍යවශ්‍ය විය.

(ඈ) **සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණු අතර මෙම ධාරිතාවය අතරින් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 102 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.**

2021 දෙසැම්බර් 31 වන දින දක්වා ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීම යටතේ මෙගා වොට් 400 ක සමස්ත ධාරිතාවක් සහිත NCRE ප්‍රසම්පාදන 07 ක් ආරම්භ කර ඇත. (විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව). 2020 අගෝස්තු 25 වන දින මෙගා වොට් 190 ක මුළු ධාරිතාවකට ලංසු ආරම්භ කිරීම සඳහා (ව්‍යාපෘති කමිටුව සහ CANC පත් කිරීමෙන්) ලංවිම විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා සිටියද, 2021.12.31 දක්වා ලංසු ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණි.

මෙම ටෙන්ඩර් කරන ලද ව්‍යාපෘති අතරින්, මෙගාවොට් 103 ක සමස්ත ධාරිතාවක් සහිත බලාගාර 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර ඇත. පහත වගුවේ එම ප්‍රසම්පාදනයන්හි විස්තර දැක්වේ.

අංකය	ව්‍යාපෘතිය	2021 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කරන ලද	ප්‍රදානය කරන ලද ව්‍යාපෘති		2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද	සටහන
		මුළු ධාරිතාව (මෙගා වොට්)	බලාගාර ගණන	මුළු ධාරිතාව (මෙගා වොට්)	මුළු ධාරිතාව (මෙගා වොට්)	
1	60X මෙගා වොට් 1 සූර්ය PV බලාගාර ටෙන්ඩරය (2017/02/20 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2017/06/14)	60	35	35	35	ව්‍යාපෘතිය නිම කර ඇත.
2	90X මෙගා වොට් 1 සූර්ය PV බලාගාර ටෙන්ඩරය (2018/01/25 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2018/04/06)	90	68	68	41	ක්‍රියාත්මක කරන ලද බලාගාර 41 කි. අවලංගු කරන ලද බලාගාර 18 කි. වැඩ සිදු කරමින් ඇති බලාගාර 9 කි. (බලාගාර 9 ක් අතරින් බලාගාර 4 ක් 2024 ජූනි 18-19 දිනවල ක්‍රියාත්මක කරන ලද අතර බලාගාර 5 ක් force majeure තත්ත්වය යටතේ පවතී)
3	මෙගා වොට් 10 ක වව්නතිවි සූර්ය බලාගාර ටෙන්ඩරය (2017/07/04 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2017/09/13)	10	1	10	10	ක්‍රියාත්මක කර ඇත. (2022.09.28)
4	පොළොන්නරුව මෙගා වොට් 10 ක සූර්ය PV බලාගාර ටෙන්ඩරය (2017/07/04 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2018/02/14)	10	1	10	-	වැඩ සිදු කරමින් පවතින අතර 2024 සැප්තැම්බර් 22 වන දින ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. (නිම කිරීමේ දිනය දීර්ඝ කර ඇත)
5	මෙගා වොට් 60 ක සුළං බලාගාර (මෙගා වොට් 1-10) ටෙන්ඩරය (2019/11/28 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2020/03/12)	60	3	25	15	ක්‍රියාත්මක කරන ලද බලාගාර 02 කි. (මෙගා වොට් 10 ක සහ 5 ක බලාගාර) අවලංගු කරන ලද බලාගාර 03කි.
	මෙගා වොට් 10 (නැවත ටෙන්ඩර් කිරීම) (2020/11/18 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2021/02/16)		2	10	-	

අංකය	ව්‍යාපෘතිය	2021 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කරන ලද	ප්‍රදානය කරන ලද ව්‍යාපෘති		2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද	ස්ථාන
		මුළු ධාරිතාව (මෙගා වොට්)	බලාගාර ගණන	මුළු ධාරිතාව (මෙගා වොට්)	මුළු ධාරිතාව (මෙගා වොට්)	
6	කෘෂිකර්මාන්තය/ ගොවිතැන් සහිත EET) සූර්ය PV බලාගාර ටෙන්ඩරය (2019/01/30 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2019/05/15)	10	1	10	-	ව්‍යාපෘතිය අවලංගු කර ඇත.
7	මෙගා වොට් 150 ක සූර්ය PV බලාගාර (මෙගා වොට් 1-10) ටෙන්ඩරය (2020/03/06 දින ප්‍රචාරය කර ඇත, අවසන් වන දිනය 2020/07/22)	150	23	147	2	ක්‍රියාත්මක කරන ලද බලාගාර 01 කි. අවලංගු කරන ලද බලාගාර 22 කි.
	ගරු නීතිපතිවරයා විසින් නිර්දේශ කරන ලද මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති ප්‍රමිතිගත ගාස්තු ප්‍රවේශය යටතේ 2021 වසර සඳහා භූමියේ සවි කරන ලද සූර්ය PV බලාගාර ව්‍යාපෘති.	10	1	10	-	ව්‍යාපෘතිය අවලංගු කර ඇත.
එකතුව		**400**	**135**	**325**	**103**	

සාමාන්‍යයෙන්, ඉහත සියලු ව්‍යාපෘතිවල ප්‍රගතිය කොවිඩ් -19 සංචාරක සීමාවන් සහ 2022 වසරේ සිට රට තුළ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් අඩාල විය. 2022 මාර්තු 08 වන දින විදේශ විනිමය අනුපාතයේ හදිසි වැඩිවීමක් හේතුවෙන් බැංකු ණය අනුපාත ඉහළ යාම, දේශීය උද්ධමනය, ඉන්ධන හිඟය යනාදිය වියට හේතු විය. තවද, බැංකුවල ඒ.ජ.ඩෝ. වල ද්‍රවශීලතාවයේ හිඟය ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයන්ට හේතු වූ අතර ආනයන සීමා කිරීම් හේතුවෙන් බලාගාර ද්‍රව්‍ය ආනයනය ප්‍රමාද විය. එබැවින්, මෙම ටෙන්ඩර්වල ලංසු තැබීමේ අදියරේදී ඉදිරිපත් කරන ලද ගාස්තු අනුපාත මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති සමාගම් දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතර විසඳුමක් ඉල්ලා ඇත.

පසුව, විදුලිය මිළදී ගැනීමේ ගිවිසුම් (PPA) අත්සන් කළ ව්‍යාපෘති සමාගම් විසින් මතු කරන ලද වම සීමාවන් ඇගයීම සඳහා ලංවිම, SLSEA සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සාමාජිකයින්ගෙන් සමන්විත දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවන ලද අතර අවසාන නිර්දේශය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව, මෙම කාරණය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලද අතර, කිසිදු ප්‍රගතියක් නොමැති ව්‍යාපෘති අවලංගු කිරීමට සහ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළ ව්‍යාපෘතිවල නිම කිරීමේ කාලසීමාවන් දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී තිබුණි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල තීරණ සහ PPA හි නියමයන් සහ කොන්දේසි සැලකිල්ලට ගනිමින්, ඉහත වගුවේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති අවලංගු කිරීමට සහ දීර්ඝ කිරීමට ලංවිම පියවර ගෙන ඇත.

(ඒ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා 2000 වර්ෂයට පෙර වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. 2007 ට පෙර අනුමත කර ඇති NCRE ව්‍යාපෘති සඳහා පමණක් වර්තමානයේදී මෙම ගාස්තු අදාළ වන අතර දැනට NCRE ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක වේ. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලිබලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. 2020 ජනවාරි 16 දිනැති අංක ඩීපීඑම්/එස්වයිසී/ටීසීඑච්/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව නව බලාගාරද ඇතුළුව ජල විදුලි බලාගාරයක තථ්‍ය එකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2023 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 25.09 ක් සහ වියළි කාලය සඳහා රු. 28.46 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ජලවිදුලි එකකයක සාමාන්‍ය පිරිවැය රු.3.52 ක් විය. 2022 අගෝස්තු 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් තිබියදීත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වළකාලන ලද පිරිවැය ක්‍රමය මත පදනම් වූ කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීමට කටයුතු කර නොතිබුණි.

වළකාලන ලද පිරිවැය ගාස්තු සම්බන්ධයෙන් 2022 අගෝස්තු 16 වන දින ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, සමාන්‍යාධිකාරී විසින් කමිටුවක් පත් කර ඇත. කමිටුව 2024 ජනවාරි 16 වන දින ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කළ අතර 2024.02.07 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, බලශක්ති මිලදී ගැනීම් ශාඛාව තවමත් වළකාලන ලද පිරිවැය කාණ්ඩය යටතේ සිටින සියලුම සංවර්ධකයින්ට පිරිවැය පිළිබිඹු කරන, තාක්ෂණයට විශේෂිත වූ තිත්ව-ස්ථර ගාස්තු (TTT) මත පදනම්ව නව SPPA වලට එළඹ වෙමින් TTT වෙත මාරු වන ලෙස දැනුම් දී ඇත.

කෙසේ වෙතත්, වළකාලන ලද පිරිවැය ගාස්තුවෙන් තිත්ව-ස්ථර ගාස්තුවකට මාරුවීම සඳහා ලංවිම කළ ඉල්ලීම් ප්‍රතික්ෂේප වීමත් සමඟ මෙම සංවර්ධකයින් කිසිවෙකු යෝජිත TTT වෙත මාරුවීම සඳහා මූලික ගිවිසුමට අත්සන් කර නොමැති බව නිරීක්ෂණය වේ.

වළකාලන ලද පිරිවැය මූලධර්මයේ සිට පිරිවැය පිළිබිඹු කරන, තාක්ෂණයට විශේෂිත තිත්ව ස්ථර ගාස්තු ව්‍යුහයකට මාරුවීමේ යෝජනාව සම්බන්ධයෙන්, කමිටු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.06.28 දින කමිටුවක් පත් කර ඇත.

2024-09-10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක: BM/2024/12/32 මත පදනම් වූ වළකාලන ලද පිරිවැය ගාස්තුව විමර්ශනය කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍ය ලේකම් විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් නිශ්චිත නිර්දේශ අනුමත කර ඇත.

i. පිරිවැය පිළිබිඹු කරන ගාස්තු කාණ්ඩයට අයත් සංවර්ධකයින් සඳහා වළකාලන ලද පිරිවැය ගාස්තු, ඔවුන්ගේ මූලික සේවා කාලය වන වසර 15 සම්පූර්ණ වන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යාමට.
ii. ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2023 වර්ෂයේ තෙත් සහ වියළි කාල පරිච්ඡේද සඳහා වන වළකාලන ලද පිරිවැය ගාස්තු අනුපාත (තෙත් කාලය සඳහා රු. කි.වො.පැයකට රු. 25.09 ක් සහ වියළි කාලය සඳහා කි.වො.පැයකට 28.46 ක්) මත 2024 වර්ෂය සඳහා, සංවර්ධකයින් 17 දෙනෙකුට ගෙවීම් කිරීමට.
iii. ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2023 වර්ෂය සඳහා වූ වළකාලන ලද පිරිවැය ගාස්තුව උපරිම ගාස්තුව වශයෙන් සලකා, ඒ ඒ ව්‍යාපෘතියේ වසර 15 ක කාලය අවසන් වන තෙක්, ඉතිරි සංවර්ධකයින් සඳහා 2025 ජනවාරි සිට වළකාලන ලද පිරිවැය ගාස්තු ගෙවීමට.

(ඓ) එකතුව රු. මිලියන 32,719.06 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන්, සැලසුම් කළ නිම කිරීමේ දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 26 සිට 70 දක්වා පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් පළමු දිරිඝ කිරීම තුළදී එම ව්‍යාපෘති නිම කර නොතිබුණු බවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට භෞතික ප්‍රගතිය සියයට 60 සිට සියයට 99.7 දක්වා පරාසයක පැවති බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

<u>හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය දියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය, ණය වාරික 1 හි පළවන කොටස (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය) ප්‍රමාද වීමට හේතු</u>

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) පත් කිරීමේ ප්‍රමාදය, CACPC තීරණය අනුව උපදේශන ප්‍රසම්පාදනය ප්‍රමාද වීම, MASL විසින් වේලි ප්‍රතිනිර්මාණය සහ පාරිසරික බලපෑම් තක්සේරුකරණ (EIA) අනුමැතිය ප්‍රමාද කිරීම, ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය ආදිය සැපයීමේදී කොවිඩ්-19 වසංගතයේ බලපෑම, ඉන්දියාවෙන් පුපුරණ ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය, වැඩබිම් සේවකයින් සහ කාර්ය මණ්ඩලය අතර කොවිඩ්-19 පැතිරීම, ඉන්ධන, සිමෙන්ති හිඟය ආදිය හේතුවෙන් වැඩ අත්හිටුවීම්.

කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ගැටළු, චීනයේ කොවිඩ්-19 සීමා කිරීම් හේතුවෙන් යන්ත්‍ර කොටස් ආනයනය ප්‍රමාද වීම, කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ සඳහා ලංවිම සේවකයින්ගේ අනුමැතිය ප්‍රමාද වීම.

හබරණ – වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු

පල්ලිවලට වීල්ල වූ ප්‍රහාර හේතුවෙන් පකිස්ථානයෙන් stringing gangs ගෙන්වා ගැනීම ප්‍රමාද කිරීම හෝ අවලංගු කිරීම, ප්‍රහාරවලින් පසු පුපුරණ ද්‍රව්‍ය සීමා කිරීම නිසා අත්තිවාරම් සඳහා ගල් පිපිරීම ප්‍රමාද වීම, කොවිඩ් හේතුවෙන් ගමන් සීමා කිරීම, ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ සිමෙන්ති වැනි ද්‍රව්‍ය හිඟය, පිරිවැය උද්ධමනය, විශේෂඥයින්ගේ සංක්‍රමණය. දඹුල්ල සිට නව හබරණ දක්වා අවසන් කිලෝමීටර 20 ජාතික සම්ප්‍රේෂණය මගින් අවසන් වන තුරු, සම්බන්ධතාවය කළ නොහැක. 2024 අප්‍රේල් 30 දින වන විට සම්පූර්ණ විෂය පථය සම්පූර්ණ කර ඇති අතර දෝෂ නිවැරදි කිරීම සිදු කරමින් පවතී.

SESRIP ප්‍රමාද වීමට හේතු (පැකේජය 4)

1. කොවිඩ්-19 වසංගතය
   2019 අග සිට 2022 වර්ෂය දක්වා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ ප්‍රමාදයන් පහත දැක්වේ.

   ජාත්‍යන්තරව
   - ජාත්‍යන්තර සංචාරක තහනම හේතුවෙන් චීන ඉංජිනේරුවන්ට ව්‍යාපෘති කටයුතු සඳහා සම්බන්ධ වීමට නොහැකි වීම නිසා ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ ප්‍රමාදයන්.
   - ලොව පුරා කර්මාන්තශාලා වසා තිබීම නිසා, සැලසුම් කළ කාලය තුළ භාණ්ඩ හා උපාංග සැපයීමට නොහැකි විය.
   - ජාත්‍යන්තර ගුවන් සේවා සීමා කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉංජිනේරුවන් සහ අනෙකුත් සේවකයින්ගේ පැමිණීම සීමා වීම.
   - සන්නිවේදන කටයුතු මාර්ගගත පද්ධතිය හරහා පමණක් සිදු කිරීමට සිදු වූ බැවින් සැලසුම් කටයුතු ප්‍රමාද විය.

   දේශීයව
   - දිවයින පුරා ගමනාගමනය සීමා කිරීම හේතුවෙන් ප්‍රවාහන පහසුකම් සීමා කිරීම.
   - සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා රජය විසින් පනවන ලද නීති රීතිවලට අනුකූලව සේවයේ යෙදවිය හැකි සේවකයින් සංඛ්‍යාව සීමා කිරීම.
   - සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා පනවන ලද නීති රීති වලට අනුකූල වීමත් සමඟ සීමිත සේවකයින් සංඛ්‍යාවකගේ කාර්යක්ෂමතාව අඩු වීම.
   - කුළුණු පාදම (tower bases) ඉදිකිරීම සඳහා බාහිර වැඩ කණ්ඩායම් යොමු කිරීමේදී වැඩබිම් ස්ථාන අවට ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ විරෝධතා සහ ඔවුන්ට නවාතැන් සොයා ගැනීමේ දුෂ්කරතා.

2. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය
   2022 වර්ෂයේදී රටේ ආර්ථික අස්ථාවරත්වයත් සමඟ, අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය මෙම ව්‍යාපෘතියේ කටයුතුවලට සෘජුවම බලපා ඇත.

   අ) හදිසි අවස්ථා (contingency) ගෙවීම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

   ලංකා විදුලිබල මණ්ඩලය සහ Qingdeo Huijintong Power Equipment Co.Ltd අතර අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ, මිල වැඩි කිරීම සඳහා සූත්‍රයක් ඇතුළත් විය. කෙසේ වෙතත්, හදිසි අවස්ථා ගෙවීම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොමැත. එබැවින්, මිල ඉහළ යාම හේතුවෙන් හදිසි අවස්ථා ගෙවීම් ලබා දීමට නොහැකි විය. මෙම ගෙවීම් ප්‍රමාදයන් සමඟ කොන්ත්‍රාත්කරුට මූල්‍ය ගැටළු ඇති වූ අතර එය ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපායි. ඒ අනුව, 2023-08-23 දිනැති අංක 42/2023/PE දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට සහ 2023 සැප්තැම්බර් 26 දිනැති එහි තීරණයට අනුව, මෙම ව්‍යාපෘතියේ හදිසි අවස්ථා විධිවිධාන අනුමත කර ඇත.

   1. හෙලිකල් තාක්ෂණය හඳුන්වාදීම
      හෙලිකල් නැංගුරම් දැමීමේ (Helical Anchoring) නව තාක්ෂණය හේතුවෙන්, හෙලිකල් අත්තිවාරම් සහිත කුළුණු මාර්ග (Tower Lines) ඉදිකිරීමේදී දුෂ්කරතා අත්විඳ ඇත. මෙම තාක්ෂණය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුට අනපේක්ෂිත බාධක කිහිපයකට මුහුණ දීමට සිදු විය. හබල් පවර් සිස්ටම්ස් වෙතින් සැලසුම් අනුමැතිය සහ ද්‍රව්‍ය නැව්ගත කිරීම, ලබා ගැනීමට අපේක්ෂා කළ කාලයට වඩා අමතර කාලයක් ගත විය. හෙලිකල් ස්ථාපන කටයුතු සිදු කරන අතරතුර, සමහර ස්ථානවල තද පස්/පාෂාණ ස්ථර නිරීක්ෂණය විය. එවැනි ස්ථානවල හෙලිකල් නැංගුරම් ස්ථාපනය කිරීමේ දුෂ්කරතාවය සැලකිල්ලට ගනිමින්, එම අත්තිවාරම් pad & chimney බවට පරිවර්තනය කිරීමට තීරණය කර ඇත. එබැවින්, මේ දක්වා ස්ථානවලින් සියයට 40 කට ආසන්න ප්‍රමාණයක්

pad & chimney වර්ගය ලෙස පරිවර්තනය කර ඇත. මෙම වෙනසත් සමඟ, හෙලිකල් මාර්ගවල අත්තිවාරම් සම්පූර්ණ කිරීමට අමතර කාලයක් ගත විය. තවද, මෙම වෙනස් කරන ලද අත්තිවාරම් වර්ගය සඳහා PMU හට ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරීමට සිදු විය.

1. <u>කුළුණු මාර්ග ඉදිකිරීම සඳහා තෙවන පාර්ශවයකින් විරෝධතා</u>
මූලික අවසරය ලබාගෙන ඇතත්, කුළුණු මාර්ග ඉදිකිරීම සඳහා ලද තෙවන පාර්ශවීය විරෝධතා සම්බන්ධයෙන් තවමත් ලංවිම කටයුතු කළ යුතුව ඇත. එවැනි විරෝධතා හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවිය.

2. <u>ගැන්ට්‍රි ඉඩම්වල ගැටළු</u>
නොවැළැක්විය හැකි හේතූන් මත පහත සඳහන් ගැන්ට්‍රි ඉඩම්වල ස්ථාන වෙනස් කිරීමට සිදු විය.
   - වැල්ලවාය - වන්දි ගැටළු හේතුවෙන් පෞද්ගලික ඉඩමෙන් රජයට අයත් ඉඩමකට පිහිටීම වෙනස් කිරීමට සිදු විය.
   - මස්කෙළිය - අවශ්‍ය භූමි ප්‍රමිතීන් සපුරා ගැනීමට නොහැකි වූ බැවින්, ගැන්ට්‍රි ඉඩමේ පිහිටීම (එකම වතුයාය තුළ) වෙනස් කිරීමට සිදු විය. නව ඉඩම අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.

3. <u>Stringing වැඩ සඳහා අතුරු බිඳීම් (interruptions) ලබා ගැනීමට ගතවන කාලය</u>
SESRIP පැකේජය 4 හි විෂය පථය යටතේ කිලෝමීටර් 286 ක කුළුණු මාර්ග සහ ගැන්ට්‍රි 9 ක් රටේ දිස්ත්‍රික්ක නවයක් පුරා ව්‍යාප්ත කර ඇති අතර, ලංවිම අනෙකුත් ශාඛාවල සම්බන්ධීකරණයත් සමඟ අතුරු බිඳීම් සකස් කළ යුතුය. එබැවින්, අතුරු බිඳීම් සකස් කිරීමට ගතවන කාලය අපේක්ෂා කළ කාලයට වඩා දීර්ඝ කාලයක් වේ.

4. <u>මිල වැඩි කිරීම පිළිබඳ කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම</u>
CIDA සූත්‍රය ක්‍රියාත්මක කිරීම - මෑත කාලීන ආර්ථික අර්බුදය හේතුවෙන් මිල වැඩි කිරීම පිළිබඳව කොන්ත්‍රාත්කරු විසින් අඛණ්ඩව දුක්ගැනවිලි ඉදිරිපත් කර ඇත. එබැවින්, ඉදිකිරීම් සම්බන්ධ දේශීය පිරිවැය ඉහළ යාමෙන් වැඩි ප්‍රමාණයක් පුළුල් ලෙස ආවරණය වන පරිදි මෙම කොන්ත්‍රාත්තුව සඳහා CIDA සූත්‍රය යෙදීම සමාලෝචනය කිරීම සඳහා තාක්ෂණික ඇඟයීම් කමිටුවක් පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. මෙම ගැටළුව විසඳීම කටයුතු කරමින් පවතී.

   අනෙකුත් ගැටළු - මූලික ලංසු තැබීමේ අදියරේදී තොරතුරු නොමැතිකම සහ නිසි මායිම් ලකුණු කිරීම් නොමැතිකම හේතුවෙන් PMU දැනට වෙනත් ගැටළු කිහිපයක් හසුරුවයි.

   ඉහත කරුණු දෙක නිසා, මුදල් ප්‍රවාහ ගැටළුව සැලකිල්ලට ගනිමින්, කොන්ත්‍රාත්කරු විසින් වැඩබිමේ ක්‍රියාත්මක කිරීමේ කටයුතු මන්දගාමී කර ඇත.

(ඔ) ඉදිකිරීම, අයිතිය සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 ක සූර්ය උද්‍යාන පහසුකම සංවර්ධනය කිරීම සහ ටර්නකී පදනම මත කිලෝවොට් 132 ධාරිතාවයක් සහිත සම්ප්‍රේෂණ පහසුකම ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2023 අගෝස්තු 16 වන දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) මෙම සමූහයේ එක් සමූහ හවුල්කරුවකු (තොරාගත් ලංසුකරු) මූල්‍ය ශක්‍යතාවය (යෝජනා සඳහා වන ඉල්ලීම් (RFP) ලේඛනවල පළවන වෙළුමේ අංක 4.2.1, 4.2.2, 4.2.3 (i) සහ (ii) වගන්ති) යටතේ ඇති සියලුම නිර්ණායකයන්ට අනුකූල වී නොමැති බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘති කමිටුව (PC) එම සමූහ හවුල්කරුගේ මූල්‍ය හැකියාවන්හි නිරීක්ෂණය වූ අනුකූල නොවීම් බැහැර වීමක් ලෙස සටහන් කර තිබුණි.
ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තාවලට අනුව නිවැරදි වේ.

(ii) සමූහයෙන් ඉල්ලා සිටි පැහැදිලි කිරීම් සඳහා ලද ප්‍රතිචාරය සලකා බැලීමෙන් පසු, සමූහය RFP හි පළවන වෙළුමේ 4.2 වගන්තියේ දක්වා ඇති මූල්‍ය ශක්‍යතා අවශ්‍යතා සපුරා නොමැති බවත් එය බැහැර වීමක් බවත් ව්‍යාපෘති කමිටුවේ අදහස විය. කෙසේ වෙතත්, 2023 මාර්තු 22 දිනැති ව්‍යාපෘති කමිටුවේ වාර්තාව මගින් ඉහත සඳහන් කළ මූල්‍ය ශක්‍යතා බැහැර වීම් ධනාත්මකව සලකා බලා, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩොලර් ශත 7.61 ක ගාස්තුවක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩොලර් මිලියන 1.25 ක අර්ධ වාර්ෂික ගෙවීමක් උපරිම පිළිගත හැකි අගයන් ලෙස එකඟ කර ගැනීම සඳහා සමූහය සමඟ සාකච්ඡා කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි. එසේ නොමැති නම්, දැනට ක්‍රියාත්මක RFP ක්‍රියාවලිය අවසන් කර මෙම ව්‍යාපෘතියට නව RFP ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ව්‍යාපෘති කමිටුව නිර්දේශ කර තිබුණි.
ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තාවලට අනුව නිවැරදි වේ.

(iii) සමූහය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම පිළිවෙලින් කිලෝවොට් පැයකට USD ශත 12.2 ක් සහ USD මිලියන 1.67 ක් (යෝජිත සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 25.58 ක් විය.) විය. සූර්ය උද්‍යාන පහසුකමට ඇතුළත් කර තිබූ සම්ප්‍රේෂණ පහසුකම් පිරිවැය ඉවත් කරමින් සමූහය විසින් 2023 මැයි 03 වන දින වෙනම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. සංශෝධිත යෝජනාවට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට USD ශත 8.15 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන අර්ධ වාර්ෂික ගෙවීම එ.ජ.ඩො මිලියන 3.31 ක් විය. ඒ අනුව, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 50.81 ක් පමණ විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 27.3 ට වඩා අඩු විය යුතුය.) සියයට 86 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තා අනුව නිවැරදි වේ. වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී ඒ.ජ.ඩො මිලියන 3.31 ක අර්ධ වාර්ෂික ගෙවීම් සියයට 3.8 ක අනුපාතයකින් වට්ටම් කර ඇති බව වටහාගෙන ඇත. කෙසේ වෙතත්, ලංසු ඇගයීමෙදී / සාකච්ඡා කරන අවස්ථාවේ ප්‍රාග්ධන පිරිවැයේ වෙළඳපල අනුපාත (USD) මෙම අගයට වඩා බෙහෙවින් වැඩි විය. එබැවින් වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එම කාලයේ රටේ පැවති ආර්ථික තත්ත්වයට ගැලපෙන වට්ටම් කිරීම සඳහා සාධාරණ අනුපාතයක් භාවිතා කිරීමට යෝජනා කරනු ලබයි.

(iv) 2023 මැයි 17 දිනැති ලිපියට අනුව, සූර්ය උද්‍යාන පහසුකම සඳහා ගාස්තුව කිලෝවොට් පැයකට එ.ජ.ඩො ශත 8.00 ක් ලෙස සහ සම්ප්‍රේෂණ පහසුකමේ විෂය පථයේ යම් වෙනස්කම් සහිතව සම්ප්‍රේෂණ පහසුකම සඳහා අර්ධ වාර්ෂික ගෙවීම එ.ජ.ඩො මිලියන 2.29 ක් ලෙස සංශෝධනය කිරීමට සමූහය අවසන් වශයෙන් එකඟ වී තිබුණි. එබැවින්, සංශෝධනය කරන ලද සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 35.13 ක් විය.) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 29 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී ඒ.ජ.ඩො මිලියන 2.29 ක අර්ධ වාර්ෂික ගෙවීම් සියයට 3.8 ක අනුපාතයකින් වට්ටම් කර ඇති බව වටහාගෙන ඇත. කෙසේ වෙතත්, ලංසු ඇගයීමෙදී / සාකච්ඡා කරන අවස්ථාවේ ප්‍රාග්ධන පිරිවැයේ වෙළඳපල අනුපාත (ඒ.ජ.ඩො) මෙම අගයට වඩා බෙහෙවින් වැඩි විය. එබැවින් වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී එම කාලයේ රටේ පැවති ආර්ථික තත්ත්වයට ගැලපෙන වට්ටම් කිරීම සඳහා සාධාරණ අනුපාතයක් භාවිතා කිරීමට යෝජනා කරනු ලබයි.

(v) ආනයන බදු නිදහස් කිරීම හෝ ප්‍රතිපූරණය කිරීම පිළිබඳව RFP හි සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනිමින් එය තීරණය කළ යුතු බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබියදී සහ එවැනි කොන්දේසි RFP හි සඳහන් කර නොමැති විටදී සම්ප්‍රේෂණ පහසුකම සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 8.1.3 (iv) (b) වගන්තියට අනුව, ව්‍යාපෘති සමාගම විසින් යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ද්‍රව්‍ය ආනයනය සඳහා ව්‍යාපෘති සමාගම විසින් ගෙවිය යුතු රේගු හා අනෙකුත් ආනයන බදු, තීරුබදු, අය බදු සහ ගාස්තුවලින් (වැට් සහ SSCL ඇතුළුව) නිදහස් කිරීම් ලබා දී නොමැති නම්, අංක 5.3.4 වගන්තියට අනුව ප්‍රතිපූරණ ඉන්වොයිසියක් ඉදිරිපත් කිරීම මගින් බදු, තීරුබදු, අය බදු සහ ගාස්තු (SSCL ඇතුළුව) ප්‍රතිපූරණය කර ගැනීමට ව්‍යාපෘති සමාගමට අයිතියක් ඇත. තවද, එ.ජ.ඩො මිලියන 3.27 ක් වූ රේගු නිශ්කාශනය (CUSDEC) මත ඇස්තමේන්තුගත රේගු බදු සහ අනෙකුත් අය බදු සැලකිල්ලට ගැනීමෙන් පසු සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම (සම්ප්‍රේෂණ පහසුකම සඳහා වන සියලුම ගෙවීම්වල වර්තමාන වටිනාකම එ.ජ.ඩො මිලියන 39.96 ක් විය) RFP හි පනවා ඇති උපරිම වටිනාකමට වඩා සියයට 46 කින් තවදුරටත් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

අවසාන අර්ධ වාර්ෂික වටිනාකමට පැමිණීම සඳහා ලංසුකරු සමඟ සිදු කරන ලද සාකච්ඡා අතරතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව විසින් තීරණය කරන ලද පරිදි, RFP හි එය විශේෂයෙන් සඳහන් කර නොතිබුණද, සම්ප්‍රේෂණ පහසුකම සංවර්ධනයට අදාළ බදු සහ අය බදු නිදහස් කිරීමට හෝ ලංවිම විසින් ප්‍රතිපූරණය කිරීමට නියමිත විය.

සම්ප්‍රේෂණ පහසුකම් ගිවිසුමේ, බදු සහ අය බදුවලින් නිදහස් කිරීම් ලබා ගැනීමට හෝ එසේ නොමැති නම්, ව්‍යාපෘති සමාගමට ලංවිම විසින් ප්‍රතිපූරණය කිරීමට විධිවිධාන ඇතුළත් කර ඇත.

සම්ප්‍රේෂණ ගිවිසුම අත්සන් කිරීමට පෙර අදාළ බදු නිදහස් කිරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලංවිම වෙත නොලද නිසා මෙය ඇතුළත් කර ඇත.

CANC විසින් අවසානයේ සාකච්ඡා කර තීරණය කරන ලද අර්ධ වාර්ෂික ගෙවීම බදු සහ අය බදු රහිත බැවින්, බදු සහ අය බදු සංවර්ධකයාට නිදහස් කළ යුතු හෝ ලංවිම විසින් ප්‍රතිපූරණය කළ යුතු බවට අංක 8.1.3 දරන වගන්තියෙන් විධිවිධාන සලසා ඇත.

ව්‍යාපෘති කමිටුවේ ඇගයීම් වාර්තා අනුව නිවැරදියි. බදු සහ අය බදු සඳහා ඒ.ජ.ඩො මිලියන 3.27 ක වටිනාකම, ඒ කාලයේ පැවති විනිමය අනුපාත සහ බදු අනුපාත අනුව ලංසුකරු විසින් ඇස්තමේන්තුගත කරන ලද වටිනාකමක් පමණි.

සම්ප්‍රේෂණ පහසුකම, සංවර්ධකයා විසින් ටර්න්කී ව්‍යාපෘතියක් ලෙස ඉදිකර භාරදීමේ පදනම මත සංවර්ධනය කරනු ලබයි.සාමාන්‍යයෙන්, ලංවිම හි සියලුම ටර්න්කී පදනම මත වන සම්ප්‍රේෂණ ව්‍යාපෘතිවලදී, ව්‍යාපෘතියට අදාළ බදු සහ අය බදු නිදහස් කිරීම හෝ ලංවිම විසින් කොන්ත්‍රාත්කරුට ප්‍රතිපූරණය කිරීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, අධීක්ෂණයක් හේතුවෙන්, නිකුත් කරන ලද RFP ලේඛනයේ එය විශේෂයෙන් සඳහන් කර නොමැත. (අලුතින් සංවර්ධනය කරන ලද ක්‍රමවේදය සහ RFP භාවිතා කළ පළමු ව්‍යාපෘතිය මෙම ව්‍යාපෘතිය විය).

තවද, ලංවිම විසින් ඇස්තමේන්තු කරන ලද සම්ප්‍රේෂණ පහසුකමේ උපරිම වටිනාකම (ඒ.ජ.ඩො මිලියන 27.3 ක) ද බදු සහ අය බදුවලින් තොර විය, එනම් එය කලින් නිම කරන ලද ටර්න්කී පදනම මත වන ව්‍යාපෘතිවල අනුපාත මත පදනම්ව ඇස්තමේන්තු කර ඇති බැවිනි (බදු සහ අය බදු ටර්න්කී පදනම මත වන කොන්ත්‍රාත් මිලෙහි කොටසක් නොවන විට).

(vi) **2023 මැයි 15 වන දින පැවති රැස්වීමේදී, සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 8.00 ක් සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩො මිලියන 2.29 ක අර්ධ වාර්ෂික ගෙවීමක් යටතේ කොන්ත්‍රාත්තුව සමූහයට ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) තීරණය කර තිබුණි. 2023 ජූලි 17 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමූහයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව විසින් CANC වෙත කිසිදු නිර්දේශයක් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, සූර්ය උද්‍යාන පහසුකම සඳහා පිළිගත් ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා පිළිගත් අර්ධ වාර්ෂික ගෙවීම, 2023 අප්‍රේල් 27 දිනැති වාර්තාව මගින් ව්‍යාපෘති කමිටුව විසින් නිර්දේශ කරන ලද සූර්ය උද්‍යාන පහසුකම සඳහා කිලෝවොට් පැයකට ඒ.ජ.ඩො ශත 7.62 ක උපරිම පිළිගත හැකි ගාස්තුව සහ සම්ප්‍රේෂණ පහසුකම සඳහා ඒ.ජ.ඩො මිලියන 1.994 ක උපරිම පිළිගත හැකි අර්ධ වාර්ෂික ගෙවීම ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.**
ව්‍යාපෘති කමිටුව විසින් සපයන ලද ඇගයීම් දත්ත මත පදනම්ව, ලංසුකරු සමඟ අවසන් සාකච්ඡා CANC විසින් පවත්වන ලද අතර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ තීරණය CANC වෙත පවරා ඇති අතර එය අවසානයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

(vii) **මෙවැනි ප්‍රසම්පාදනයක් සඳහා RFP දෙකක් ඉදිරිපත් වීම සහ තාක්ෂණික ඇගයීම සහ මූල්‍ය ඇගයීම සඳහා RFP එකක් පමණක් සලකා බැලීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් අපේක්ෂා කළ පරිදි තරඟකාරිත්වයක් නිර්මාණය වී නොතිබුණි. එබැවින්, සූර්ය උද්‍යාන පහසුකම සහ සම්ප්‍රේෂණ පහසුකම යන දෙකටම වඩාත් වාසිදායක මිලක් ලබා ගැනීමේ අවස්ථාව මණ්ඩලයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. තවද, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 7.12.1 වගන්තියට අනුව ඵලදායී තරඟකාරිත්වයක් නොමැතිකම පැහැදිලිව පෙනෙන විට ලද සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණය කළ හැකි බව නිරීක්ෂණය විය.**
ව්‍යාපෘතියේ සංකීර්ණ ස්වභාවය (සූර්ය උද්‍යාන පහසුකම සහ සම්ප්‍රේෂණ පහසුකම එකට සම්බන්ධ කර තිබීම) පහසුකම් දෙකෙහිම සුදුසුකම් ඇගයීමේ අවශ්‍යතා, නැවත ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය, ඒ අවස්ථාවේදී රටේ වැඩිවන විදුලි ඉල්ලුම සහ ආර්ථික තත්ත්වය සපුරාලීම සඳහා ජනන බලාගාරය කාලීන ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව.වැනි කරුණු සැලකිල්ලට ගනිමින් CANC සිය අවසාන තීරණය ගෙන ඇති බව ලංවිම හි අදහස වේ.
CANC සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව, පිරිනමන ලද ගාස්තු අවම පිරිවැය මූලධර්මයට අනුකූල වන බවට අනුමත කරමින් ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(7) වගන්තියට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් ද යෝජිත ගාස්තුව අනුමත කර ඇත.

(ඕ) **2023 මාර්තු 07 වන දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ ඒකකය ස්ථාපිත කර තිබූ අතර, එහි මෙහෙයුම්වලින් මාස 8 කට පසු, 2023 ඔක්තෝබර් 31 දින ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එහි ක්‍රියාකාරකම් අත්හිටුවීමට තීරණය කර තිබුණි. මෙම කෙටි කාලය තුළ, විදුලි පරිභෝජනය අඩු කිරීමේ සහ ඉල්ලුම කළමනාකරණය කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියම කර ඇති පරිදි නිසි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර බාහිර සංවිධාන 03 ක් හරහා රු. මිලියන 14.33 ක් වැය කරමින් වීඩියෝ 18 ක් සකස් කර තිබුණි. තවද, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව, මෙම වීඩියෝ සජීවිව පටිගත කිරීමෙන් තොරව පරිගණක සජීවිකරණය මගින් නිෂ්පාදනය කර තිබුණි. එබැවින්, ඉහත කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන් විසින් දක්වා ඇති පරිදි ඇත්ත වශයෙන්ම සිදු නොකළ ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය රු. මිලියන 6.4 ක් ගෙවා තිබුණි.**
මෙම ගැටළුව සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.10.31 දින අංක 23.14430F දරන රැස්වීම් වාර්තාවෙන් තීරණයක් ලබා දී ඇත. මෙම සිද්ධිය මූලික පරීක්ෂණ සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත මාරු කර ඇත.
ඒ අනුව, එක් එක් ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම්වලට අදාළ සියලුම ගෙවීම් වවුචර් දැනටමත් ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත ලබා දී ඇත.
ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ විශේෂ විමර්ශන වාර්තාවට අනුව, කළමනාකාරිත්වය දැනටමත් ප්‍රචාරක කළමනාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය) සේවය අත්හිටුවා ඇත. එසේම, මේ සඳහා වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

(ක) 2021 දී ක්‍රියාත්මක කරන ලද මන්නාරම සුළං විදුලි ජනන ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 15.2 ක් වැය කර තිබූ අතර එය අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

ඒ සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව MWPP හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් රු. 1,345,914.44 ක ගෙවීම සිදු කර ඇත.

තවද, රු. 9,674,887.86 ක උත්සව වියදම් අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) අංශය සහ අතිරේක සාමාන්‍යාධිකාරී (CS) අංශයේ BOS ශාඛාව විසින් හසුරුවන ලද අතර අදාළ පිරිවැය ව්‍යාපෘතියට මාරු කර ඇත. කෙසේ වෙතත්, රු. 4,261,000.00 ක මුදල අතිරේක සාමාන්‍යාධිකාරී (CS) අංශයේ BOS ශාඛාව විසින් සිදු කරන ලද අතර පිරිවැය ව්‍යාපෘති අංශයට මාරු කර ඇති නිසා අනෙකුත් ගෙවීම් පිළිබඳව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දී නොමැත.

2.3 වෙනත් කරුණු

(අ) 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු. මිලියන 70,019.1 ක් විය. ඒ අතරින්, 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,181 ක් මාස 06 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. තවද, රු. මිලියන 2,252.2 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් වෙළඳ ණයගැතියන් සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනය රු. මිලියන 4,625.9 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) ඉහත මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 2,773.3 ක් අවසන් කරන ලද ණයගැති ශේෂයක් (අක්‍රීය ණය ගැතියන්) ලෙස වර්ගීකරණය කර මාරු කර තිබූ අතර එයින් රු. මිලියන 1,106.6 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය.

අංශය	වටිනාකම	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	1,106,562,037.11	අවසන් කරන ලද ණයගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, නිශ්චිත ගනුදෙනුකරුවන් වෙත චන්තර වාසියවා ක්‍රියා පටිපාටියට අනුව පසු විපරම් කිරීමට පියවර ගෙන ඇත.
බෙදාහැරීමේ අංශය 02	906,257,535.17	අවසන් කරන ලද මුළු ණයගැතියන් අතරින්, 2024 වර්ෂයෙන් අවසන් වූ මාස 05 ක කාලය තුළදී රු. මිලියන 940 කට ආසන්න මුදලක් අයකරගෙන ඇත. රු. මිලියන 221 ක් ''වාලව්චේන කඩදාසි සංස්ථාවේ සහ කන්තලේ සීනි සංස්ථාව'' වෙතින් අයවිය යුතු හිඟ මුදල් පිළිවෙලින් රු. මිලියන 122 ක් සහ රු. මිලියන 76 ක් නියෝජනය කරයි. වාලව්චේන කඩදාසි සංස්ථාව විසින් රු. මිලියන 122 ක් වූ මුළු හිඟ මුදල් 2023 සිට 2026 දක්වා එකඟ වූ මුදලක් මත පදනම්ව මාසිකව පියවීමට ලංවිම සමඟ මූලිකව එකඟ වූ බැවින්. 2023 දී රු. මිලියන 12 ක් සහ 2024 දී රු. මිලියන 03 ක් අයකර ගෙන ඇති අතර ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මත පදනම්ව ඉතිරි මුදල් ගෙවීම තවත් මාස 06 කින් වැඩි කර ඇත. තවද, කන්තලේ සීනි සංස්ථාවෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන්, රු. මිලියන 31.5 ක් පියවීමට යටත්ව, රු. මිලියන 44.8 ක් කපා හැරීමට ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත. කෙසේ වෙතත්, සංස්ථාව විසින් රු. මිලියන 31.5 ක් පියවා නොමැත.
බෙදාහැරීමේ අංශය 03	481,943,898	අවසන් කරන ලද ණයගැති ශේෂයන් නිරවුල් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. ■ සාමාන්‍ය සහ තොග ණය ගැතියන් යන දෙපිරිසෙහිම ආරක්ෂක තැන්පතුවලින් අවසන් කරන ලද ගිණුම්වල ශේෂයන් අයකර ගැනීම. ■ වසර දෙකකට අඩු දීර්ඝ කාලීන හිඟ ශේෂයන් සහ අවසන් කරන ලද ගිණුම් සඳහා සිහි කැඳවීම් යැවීම. ■ පැහැර හරින ලද අවසන් කළ පාරිභෝගිකයාගේ ක්‍රියාකාරී ගිණුම් හඳුනාගෙන ශේෂයන් ක්‍රියාකාරී ගිණුම් වෙත මාරු කිරීම.
බෙදාහැරීමේ අංශය 04	278,512,977	චක්‍රලේඛ උපදෙස් අනුව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.
එකතුව	2,773,276,447	

(ii) බෙදාහැරීමේ අංශවල අවසන් කරන ලද ණයගැතියන් අතරින්, වසර 3 කට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 1,983.3 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 927.8 ක් බෙදාහැරීමේ අංශ 01 හි අවසන් කරන ලද ණයගැතියන් නියෝජනය කරයි.

බෙදාහැරීමේ අංශය - 01

2024-05-31 දිනට බෙදාහැරීමේ අංශය 01 හි අවසන් කරන ලද ණයගැති ශේෂයන් (වසර 3 කට වැඩි) පහත පරිදි වේ.

පළාත	සාමාන්‍ය සැපයුම	තොග සැපයුම	එකතුව රු. මිලියන
කොළඹ නගරය	231.13	29.40	260.53
වයඹ පළාත 01	204.54	2.87	207.40
වයඹ පළාත 02	94.40	0.33	204.87
උතුරු මැද පළාත	186.34	16.76	203.10
උතුරු පළාත	187.05	38.04	225.09

බෙදාහැරීමේ අංශය 01 හි අතිරේක සාමාන්‍යාධිකාරීගේ උපදෙස් පරිදි, දීර්ඝ කාලීනව හිඟ අවසන් කරන ලද ණයගැතියන්ගේ ශේෂයන් අයකර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලබයි.

අංක DCC/COM/03/2009 දරන චක්‍රලේඛයට අනුව, සමථ මණ්ඩලයක්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ තැන්පතුවලින් අයකර ගැනීම මගින් අවසන් කරන ලද ගිණුමේ හිඟ ශේෂය අයකර ගැනීමට,

1. පළාත් ආදායම් කමිටු පත් කිරීම.
2. හිඟ ශේෂයන් පියවන ලෙස ඉල්ලා පාරිභෝගිකයින්ට සිහි කැඳවීමේ ලිපි යවා ඇත.
3. බෙදාහැරීමේ අංශය 01 හි අවසන් කරන ලද ගිණුම් ලෙස වර්ගීකරණය නොකර හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා විසන්ධි කිරීමේ වැඩසටහන්, පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කරමින් ඇත.

බෙදාහැරීමේ අංශය - 02

2023.12.31 දිනට අවසන් කරන ලද මුළු තොග සැපයුම් ණයගැතියන්ගෙන්, 2024 වර්ෂයෙන් අවසන් වූ මාස 05 ක කාලය තුළදී රු. මිලියන 940 කට ආසන්න මුදලක් අයකර ගෙන ඇත.

බෙදාහැරීමේ අංශය - 03

ඉහත ශේෂය අතරින්, රු. මිලියන 336 ක් පමණක් බෙදාහැරීමේ අංශය 03 අදාළ වේ. ශේෂයන් නිරවුල් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- වසර දෙකකට අඩු අවසන් කරන ලද ගිණුම් සඳහා සිහි කැඳවීම් යැවීම.
- පැහැර හරින ලද අවසන් කළ පාරිභෝගිකයින්ගේ ක්‍රියාකාරී ගිණුම් හඳුනාගෙන ශේෂයන් ක්‍රියාකාරී ගිණුම් වෙත මාරු කිරීම.

(iii) **සම්බන්ධතා 41,441 ක් සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත 02) හි රු. මිලියන 104.39 ක් වූ අවසන් කරන ලද සාමාන්‍ය සැපයුම් ණයගැතියන් අතරින්, වසරකට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 33.65 ක් අයවිය යුතුව පැවතුණි. තවද, ඉහත සම්බන්ධතා අතරින් රු. මිලියන 10.98 ක් සම්බන්ධතා 13,549 කට අදාළව බැර ශේෂ ලෙස පැවතුන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ DCC/COM/03/2009 දරන චක්‍රලේඛය අනුව එවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව, පෙර හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව අවසන් කරන ලද ගනුදෙනුකරුවන්ට නව සම්බන්ධතා ලබා දී ඇති බව නිරීක්ෂණය විය.**

DCC/COM/03/2009 ට අනුව දකුණු පළාත 02 විසින් බැර ශේෂ නිරවුල් කිරීම සම්පූර්ණ කර ඇති අතර අසාමාන්‍ය බැර ශේෂ ඉවත් කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් අනුමත කරන ලද ලේඛන තොරතුරු තාක්ෂණ ඒකකයට යොමු කර ඇත. මෙය ක්ෂේත්‍ර තුනටම සිදු කෙරේ.

දකුණු පළාත 02 ට අදාළව තොග සැපයුම් අවසන් කරන ලද ණයගැති ශේෂය රු. මිලියන 1.75 ක් දක්වා අඩු වී ඇති අතර සාමාන්‍ය සැපයුම් අවසන් කරන ලද ණයගැතියන් සඳහා, DCC/COM/03/2009 අනුව අප නිර්දේශ කර ඇති ක්‍රියාමාර්ග තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සිදු කළ පසු ශේෂය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(iv) **2023 ඔක්තෝබර් 31 දිනට නැගෙනහිර, උතුර සහ සබරගමුව පළාත්වල හිඟ ණයගැතියන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියදි විගණන පරීක්ෂණයට අනුව, බිල්පත් වටිනාකම රු. 50,000 ඉක්මවූ සහ වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින ගනුදෙනුකරුවන් 357 දෙනෙකුගෙන් රු. මිලියන 39.65 ක හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.**

(v)

(i)	ගිණුම් ගණන	රු. 50,000 ට වැඩි සහ වසරකට වැඩි කාලයක් තිස්සේ පවතින බිල්පත්
නැගෙනහිර පළාත		
අම්පාර	11	1,518,180
මඩකලපුව	34	2,764,159
ත්‍රිකුණාමලය	30	2,955,146
වාලච්චේනේ	12	1,301,805
කල්මුනේ	13	1,157,098
උප එකතුව	**100**	**9,696,388**
උතුරු පළාත		
යාපනය-නැගෙනහිර	2	1,476,372
යාපනය	70	9,196,043
කිලිනොච්චිය	100	10,601,129
වවුනියා	37	3,321,649
උප එකතුව	**209**	**24,595,193**
සබරගමුව පළාත		
ඇහැලියගොඩ	8	774,972
ඇඹිලිපිටිය	25	3,708,345
කහවත්ත	3	328,105
රුවන්වැල්ල	12	1,093,452
උප එකතුව	**48**	**5,904,874**
මුලු එකතුව	**357**	**40,196,455**

බෙදාහැරීමේ අංශය 01

බෙදාහැරීමේ අංශය 01 හි පළාත්වල ලැබිය යුතු මුදල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 01) විසින් 2024 ජනවාරි 26 දිනැති ඔහුගේ අංක DD1/AGM/54 දරන ලිපිය මගින් කමිටුවක් පත් කර ඇත.

ඒ අනුව, උතුරු පළාතේ දිර්ඝ කාලීන හිඟ මුදල් අයකර ගැනීමට සහ ලැබිය යුතු මුදල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය ඉංජිනේරුවන් වෙත රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර ඉලක්ක ලබා දී ඇත.

බෙදාහැරීමේ අංශය 02

නැගෙනහිර පළාත

2024 අප්‍රේල් 09 වන දින PWR/A/CEB/2024/AQ/02 යන විගණන විමසුම සඳහා විස්තරාත්මක පිළිතුරු දැනටමත් ඉදිරිපත් කර ඇත.

බෙදාහැරීමේ අංශය 03
සබරගමුව
පාරිභෝගික ගිණුම් 48 ක් අතරින්, පාරිභෝගිකයින් 19 ක් දැනටමත් ගෙවිය යුතු මුදල් (රු. මිලියන 3.2 ක්) ගෙවා ඇත. ඉතිරි ගිණුම් 29 දැනටමත් විසන්ධි කර ඇත.

(vi) **නියදි විගණන පරීක්ෂණයට අනුව, දීර්ඝ කාලයක් තිස්සේ රු. මිලියන 12.21 ක හිඟ විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 46 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අවසන් කරන ලද (අක්‍රිය) ණය ගැතියන් ලෙස වර්ගීකරණය කර තිබුණි. අයකර ගැනීමෙන් තොරව එයින් රු. මිලියන 11.66 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර රු. මිලියන 5.29 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි.**

බෙදාහැරීමේ අංශය 01
පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව ඉතිරිව ඇති හිඟ ශේෂයන් පවතින බවට එකඟ වේ. කෙසේ වෙතත්, අතිරේක සාමාන්‍යාධිකාරී සහ කොළඹ නගර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සමීප අධීක්ෂණය සහ උපදෙස් මත, වත්මන් පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් රු. මිලියන 12.01 ක ශේෂයන් අයකර ගැනීමට ලංවීමට හැකි වූ අතර අඛණ්ඩ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. එයට පහත සඳහන් දෑ ඇතුළත් වේ

1. පුද්ගල විස්තර ලැයිස්තුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශයෙන් ලබා ගෙන ඇත.
2. පාරිභෝගික ලිපිගොනු පරීක්ෂා කිරීම/ සත්‍යාපනය කිරීම සහ පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ සෑම නිල නිවසක වත්මන් සහ පෙර පදිංචි විස්තර හඳුනා ගැනීම.
3. දීර්ඝ කාලීන හිඟ වෙළඳ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා ආදායම් කමිටු පත් කිරීම.
4. හිඟ මුදල් පියවන ලෙස ඉල්ලා පාරිභෝගිකයින්ට සිහි කැඳවීම් ලිපි යැවීම.

බෙදාහැරීමේ අංශය 04
පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ ශේෂයන් අයකර ගැනීම සඳහා වෙළඳ ණයගැති ශේෂ අයකර ගැනීමේ ක්‍රමවේදය යොදා ගැනේ. දකුණ පළාත 02 හි එක් සැලකිය යුතු ශේෂයක් පමණක් පවතී.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ අනෙකුත් ණයගැතියන්ගේ ශේෂය රු. මිලියන 24,327.1 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) **සමාලෝචිත වර්ෂය අවසානයේදී විදුලි සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 256.91 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 70.14 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි. තවද, බෙදාහැරීමේ අංශය 01 ට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පූජනීය ස්ථානවලින් රු. මිලියන 42.5 ක් අයවිය යුතුව පැවතුණි. තවද, හම්බන්තොට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සම්බන්ධයෙන්, තාවකාලික සම්බන්ධතා සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් 2010 අප්‍රේල් 26 වන දින අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 04) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට පටහැනිව ආරක්ෂක තැන්පතුවක් හෝ ඇස්තමේන්තුගත ගාස්තුවක් ලබා ගැනීමෙන් තොරව සමහර තාවකාලික සම්බන්ධතා ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.**

බෙදාහැරීමේ අංශය – 01
බෙදාහැරීමේ අංශය 01 හි පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල් රු. මිලියන 79.81 ක් වන අතර ඒ අතරින්, රු. මිලියන 34.07 ක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතී.

මේ සම්බන්ධයෙන්, ඉහත ලැබිය යුතු මුදල් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම කාරණය විගණන කමිටුවට එහි නිර්දේශ සඳහා යොමු කර තිබුණි. ලංවීම විගණන සහ කළමනාකරණ කමිටුව මේ සම්බන්ධයෙන් බෙදාහැරීමේ අංශවලින් අමතර තොරතුරු ඉල්ලා සිටි අතර දැනට එවැනි තොරතුරු සැපයීමට කටයුතු කරමින් සිටී.

පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

අංකය	ස්ථානය	2023.12.31 දිනට ශේෂය රු. මිලියන
1	ශ්‍රී මහා බෝධි ආවාස	13.87
2	අභයගිරි දාගැබ	5.87
3	සඳවස බෝමළුව පුස්තකාලය - ශ්‍රී මහා බෝධිය	0.01
4	ජේතවනාරාමය	0.27
5	ලෝවාමහාපාය	0.01
6	අභයගිරි විහාරය	0.09
7	අභයගිරිය ස්ථූප	0.25
8	අභයගිරි විහාරය	0.71
9	ලංකාරාම විහාරය	0.31
10	ලංකාරාම විහාරය	1.21
11	මිරිසවැටිය කාර්යාලය	2.63
12	මිරිසවැටිය සංඝාරාමය	1.68
13	ථූපාරාම ස්ථූප	1.79
14	ථූපාරාමය විහාරය	0.61
15	සිංහ කණුව, ශ්‍රී මහා බෝධි RD	2.13
16	රුවන්වැලිසෑය (වීදි ලාම්පුව)	10.06
17	උඩමළුව විහාරය (පරිත්ත චතුරශ්‍රය)	0.18
18	රුවන්වැලිසෑය විහාරය	0.04
19	මිහින්තලේ විහාරය	11.83
20	ඉසුරුමුණි රජ මහා විහාරය	0.01
21	ඉසුරුමුණි මහා විහාරය	1.34
22	ඉසුරුමුණි විහාර සංඝාරාමය	0.07
23	දිඹුලාගල විහාරය	7.43
24	ජේතවන ව්‍යාපෘතිය	17.40
	එකතුව	**79.81**

බෙදාහැරීමේ අංශය – 02

පූජනීය ස්ථානවල ශේෂයන් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා එය ලංවිම විගණන කමිටුවට යොමු කරන ලද අතර විගණන කමිටු විමසීම්වලට අනුව, පැහැදිලි කිරීම් නැවත ඉදිරිපත් කර ඇත.

බෙදාහැරීමේ අංශය – 03

පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල් අතරට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත පදනම්ව ලංවිම විසින් පියවන ලද විදුලි පරිභෝජන පිරිවැය ඇතුළත් වේ. මෙම ශේෂය රජයෙන් ලැබිය යුතු යැයි සැලකේ. අරමුදල් මෙතෙක් ලැබී නොමැති බැවින්, මෙම ශේෂය කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව විගණන කමිටුවට යොමු කර ඇති අතර විගණන කමිටුව විසින් ඉල්ලා සිටින පැහැදිලි කිරීමක් යවා ඇත. විගණන කමිටුවෙන් ප්‍රතිචාර ලද පසු, ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.

බෙදාහැරීමේ අංශය – 04

2012 දී පැවති සර්වඥ ධාතු ප්‍රදර්ශනයක් සඳහා බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් රු. මිලියන 8.3 ක් ලැබිය යුතුය. මෙම අවස්ථාවට රජය පූර්ණ අනුග්‍රහය දැක්වූ අතර, අපි විසින් බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට වෙන වෙනම අරමුදල් ඉල්ලා ලියා ඇත. කෙසේ වෙතත්, අමාත්‍යාංශ දෙකෙන්ම අපට කිසිදු ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී නොමැත. එබැවින්, මෙම මුදල අයකර ගත නොහැකි බව කළමනාකාරිත්වය තීරණය කර ඇත. ඒ අනුව, ආගමික ස්ථානවලින් අය විය යුතු හිඟ මුදල් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ඇත.

(ii) 2023 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණයගැතියන් තුළ ඇතුළත් කර ඇති විවිධ ණයගැතියන්ගෙන් රු. මිලියන 3,261.9 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 677.59 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ සහ රු. මිලියන 329.38 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. වසර පහකට වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු ශේෂයන් අතරින්, රු. මිලියන 14.34 ක්, රු. මිලියන 155.61 ක් සහ රු. මිලියන 2.66 ක් පිළිවෙලින් පාරිභෝගික බල්බ ණය, ආයතන සඳහා තාවකාලික විදුලි සැපයීම සහ 2013 වර්ෂයේදී කොළඹ නගර ආදායම් කවුන්ටරයේ සිදු වූ මුදල් හිඟයෙන් ලැබිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එවා අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

අංශය	විවිධ ණයගැති වටිනාකම	පිළිතුර
බෙදාහැරීමේ අංශය 01	312,003,562.08	බෙදාහැරීමේ අංශය 01 හි පාරිභෝගික බල්බ ණයවල හිඟ ශේෂය වූ රු. 1,427,423 අතරින් රු. 1,348,454 ක් උතුරු පළාතට අදාළ වේ. මෙම මුදල පාරිභෝගික බිල්පත හරහා අයකර ගනු ලබන අතර විදුලි බිල්පත නොගෙවීම හේතුවෙන් සමහර පාරිභෝගික ගිණුම් අවසන් කර ඇත. එම නිසා, ණය අයකර ගැනීම ප්‍රමාද වන අතර පාරිභෝගිකයින්ගෙන් ණය මුදල් අයකර ගැනීමට අබණ්ඩව කටයුතු කරමින් සිටී.
බෙදාහැරීමේ අංශය 02	64,975,662	රු. මිලියන 64.97 ක් වූ විවිධ ණයගැතියන් අතරින්, රු. මිලියන 12.7 ක් 2023.12.31 දිනට වසර 5 කට වැඩි කාලයක් තිස්සේ හිඟව පවතින ශේෂයක් නියෝජනය කරයි. 2024 වර්ෂයේ මාස 5 ක කාලය තුළදී රු. මිලියන 1.57 ක් අයකර ගෙන ඇති අතර, රු. මිලියන 1.1 ක් වූ මහින්ද චින්තනය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර තීරණය තවමත් ලැබීමට නියමිතය.
බෙදාහැරීමේ අංශය 03	1,199,043,838	හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
බෙදාහැරීමේ අංශය 04	63,370,028	හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
සම්ප්‍රේෂණ	1,105,030,264	හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
මූලස්ථානය	33,858,354	පාර්ලිමේන්තු නියෝජිතයින් සඳහා වන ආරක්ෂක ලාම්පු වෙනුවෙන් රු. මිලියන 11.38 ක මුදලක් අයවිය යුතුව ඇත. මෙම මුදල අයකර ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතී. ඉතිරි ශේෂය නියමිත වේලාවට අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයෙන් කපා හරිනු ඇත. මහජන බැංකුවේ කවුන්ටර (POS) පිහිටුවීම සඳහා POS කවුන්ටර තැන්පතු සහ උපකරණ ලෙස හඳුනාගත් රු. මිලියන 20.5 ක මුදලක් ගෙවා ඇත. ඉතිරි මුදල අදාළ අංශ වෙත මාරු කිරීම සඳහා මූලස්ථානය අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. අනෙකුත් සියලුම විවිධ ශේෂයන් අයකර ගනු ඇති අතර ඉතිරි ඕනෑම මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවයෙන් ගිණුම් පොත්වලින් කපා හරිනු ඇත.
ජනන	44,744,480	වසර 5 කට වැඩි ලැබිය යුතු මුළු ශේෂය රු. මිලියන 34.43 ක් විය. මෙම ශේෂය අනන්‍ය ශේෂ දෙකකින් සමන්විත වේ. **■ ජනන මූලස්ථානය – බන්දුල රංජිත් රු.187,449/-** මෙම සේවකයා 2006 වර්ෂයේදී සේවයෙන් පහ කර ඇත. කෙසේ වෙතත්, ඔහුගේ ණය ශේෂය අය කර ගැනීමට ඔහුගේ PF ශේෂය ප්‍රමාණවත් නොවූ අතර, රු. 187,449 ක් පියවා නොතිබුණි. **■ ලක්විජය බලාගාරය – තොග ගැලපුම් මුදල – රු. 34,153,686.61** 2021 ට පෙර වර්ෂවල තොග අතිරික්තයන් සහ හිඟයන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු, 2024 වර්ෂයේදී තොග ගැලපුම් ගිණුමෙන් නිරවුල් කරනු ඇත.
ව්‍යාපෘති	427,668,520	විවිධ ණයගැති ගිණුම්වල ව්‍යාපෘති අංශයේ ශේෂය වූ රු. මිලියන 427.68 ක් නිවැරදි කර ඇත.
වත්කම් කළමණාකරන	10,952,338	හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

(iii) **සියලුම බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ වත්කම් කළමනාකරණ අංශයට අදාළව එකතුව රු. මිලියන 65.81 ක් වූ තොග හිඟයක් වසරකට වැඩි කාලයක් තිස්සේ විවිධ ණයගැතියන් තුළ පැවතුණු අතර, එම තොග හිඟය අතරින් රු. මිලියන 34.15 ක් ජනන අංශයේ ලක්විජය බලාගාරයට අදාළව වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. තවද, ඉහත තොග හිඟය අතරින්, රු. මිලියන 31.66 ක් වගකිවයුතු නිලධාරීන් සමඟ හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 2.8 ක තොග අලාභ සඳහා පමණක් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන තිබුණි.**

ගබඩා භාරකරු

නඩුව ගොනු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ලැයිස්තුව එවන ලෙස ප්‍රධාන නීති නිලධාරී (ලංවිම) වෙත සිහි කැඳවීමක් යවා ඇත.

ගබඩා භාරකරු

2024-05-30 දින පැවති විගණන කමිටු රැස්වීමට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා 2024-09-30 දිනට එම පුද්ගලයා වෙනුවෙන් මණ්ඩලය විසින් ගෙවිය යුතු මුළු හිඟ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික මුදල් එවන ලෙස ගණකාධිකාරී (විශ්‍රාම වැටුප් අරමුදල) වෙත ලිපියක් යවා ඇත.

ලක්විජය විදුලි බලාගාරය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2024 වර්ෂයේදී රු. මිලියන 34.15 ක තොග ගැලපුම් ශේෂය නිරවුල් කරනු ඇත.

අංශය	වටිනාකම	පිළිතුරු
බෙදාහැරීමේ අංශය 01	රු. මිලියන 13	

බෙදාහැරීමේ අංශය 01	වටිනාකම රු.	පළාත	ක්‍රියාමාර්ගය
ගබඩා භාරකරු	8,294,535	NP	ලංවිම නීති අංශය පියවර ගත යුතුය.
ගබඩා භාරකරු	1,967,080	NCP	මාසිකව වැටුපෙන් අඩු කරයි.
ගබඩා භාරකරු	30,123	NP	සේවකයාගේ වැඩ තහනම් කර ඇත.
ගබඩා භාරකරු	34,300	NP	ජනවාරි මාසයේ සම්පූර්ණයෙන්ම පියවා ඇත.
විදුලි අධිකාරී	224,245	NWP 1	සේවකයා මිය ගොස් ඇත. අයකර ගැනීමට ශේෂය ප්‍රමාණවත් නොවීය.
ගබඩා භාරකරු	839,943	NP	මාසිකව වැටුපෙන් අඩු කරයි.
ගබඩා භාරකරු	1,595,450	NWP 1	නඩුව විභාග වෙමින් පවතී.
එකතුව	13,085,676		

බෙදාහැරීමේ අංශය 02	රු. මිලියන 5	මූලික විමර්ශනය සිදු කර ඇති අතර, නැගෙනහිර පළාත විසින් අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 02) වෙත වාර්තාව ඉදිරිපත් කර ඇත, එය ලංවිම අභ්‍යන්තර විගණක වෙත යොමු කර ඇත. ලෙජරයේ අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට තීරණය අපේක්ෂාවෙන් සිටී.
බෙදාහැරීමේ අංශය 03	රු. මිලියන 7	සබරගමුව පළාත තොග හිඟයන් සඳහා දැනට සිටින සේවකයින්ගෙන් අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, දීර්ඝ කාලීන හිඟ අයකර ගත නොහැකි මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.
බෙදාහැරීමේ අංශය 04	රු. මිලියන 3	දකුණ පළාත 1 දීර්ඝ කාලීනව නොවිසඳී තිබූ කරුණු පිළිබඳව අදාළ ඒකක ප්‍රධානීන්ට දැනුම් දී ඇත. අදාළ තොරතුරු ලැබීමෙන් පසු, පියවර ගනු ඇත.

(iv) **2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසම්කරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 99 කින් රු. මිලියන 435.52 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. මිලියන 153.03 ක් සහ රු. මිලියන 83.41 ක් අයකර ගැනීමෙන් තොරව පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී හානිකරණ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 110.5 ක් පමණක් වෙන් කර තිබුණි.** විදුලි සෝපාන, වායු සම්කරණ සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රජයේ ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත.

(v) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සහ ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වසර හයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව තිඟව පැවතුණි.

මෙම ශේෂයට ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමට අදාළව රු. 478,179,795.00 ක් සහ ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් සම්බන්ධව රු. 236,785,639.43 ක් ඇතුළත් වේ. ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමේ හිඟ මුදල් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කරන ලද අතර, අවසන් වාර්තාව වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයාට සමථයකට පත් කිරීම සඳහා භාර දී ඇත. ලිබර්ටි කොමොඩිටිස් සම්බන්ධයෙන්, ලංකා ගල් අඟුරු සමාගම (LCC) බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලිබර්ටි කොමොඩිටිස් ලිමිටඩ් සමාගමට එරෙහිව LCC විසින් ගනු ලැබූ බේරුම්කරණ ක්‍රියාවලියේ තීරණය මත පදනම්ව මෙය නිරවුල් කරනු ඇත.

LCC සහ ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම අතර ගනුදෙනුව සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 2024.06.19 දින විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තවත් කමිටුවක් පත් කර ඇත.

ලංවිම හි උපදෙස්වලට අනුකූල නොවීම, සහ LCC සහ ගල් අඟුරු සැපයුම්කරුවන් අතර ගිවිසුමේ සූත්‍රවල වැරදි හේතුවෙන් ඇති වූ මූල්‍ය පාඩුව ආපසු ගෙවීමට LCC සම්පූර්ණයෙන්ම කැපවී සිටින බැවින් ලංවිම ගිණුම් පොත්වල ලැබිය යුතු මෙම දිර්ඝ කාලීන හිඟ ශේෂය පියවන ලෙස ඉල්ලා ලංවිම සාමාන්‍යාධිකාරී විසින් 2024.05.10 දිනැති ලිපියක් LCC හි සභාපතිවරයා වෙත ද නිකුත් කර ඇත.

(vi) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 241.72 ක් අයවිය යුතුව පැවතුණි. එයින්, කොළඹ නගර පළාත විසින් රජයේ ආයතනවලට ලබා දුන් තාවකාලික විදුලි සම්බන්ධතාවලින් රු. මිලියන 189.67 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි.

රජයේ ස්ථාපන (Government Installation - GI) ඒකකය, පහත සඳහන් විවිධ රජයේ ස්ථාපනයන් සඳහා සේවා සැපයීම සඳහා වගකිව යුතු දෙපාර්තමේන්තුවකි.

- ජනාධිපති මන්දිරය
- අරලියගහ මන්දිරය (අග්‍රාමාත්‍ය නිල නිවස)
- අගමැති කාර්යාලය
- රජයේ රෝහල්
- මුදල් අමාත්‍යාංශය

GI ඒකකය විසින් සපයා ඇති සැලකිය යුතු වටිනාකමක් (2024 මේ දක්වා සපයන ලද සේවාවන් සඳහා රු. මිලියන 176 ක්) තිබියදීත්, ගෙවීම් ලැබීමට පෙර හදිසි ඉල්ලීම්වලට ප්‍රමුඛත්වය දීමේ නිතර නිතර ඇති වන අවශ්‍යතාවය ප්‍රධාන අභියෝගයකි. කාර්යයේ හදිසිභාවය නිසා මෙම පෙර ගෙවීම් සේවාව අවශ්‍ය වේ.

ජාතික රෝහල, භාණ්ඩාගාරය සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු සමහර රජයේ ආයතන ඔවුන්ගේ හිඟ මුදල් ප්‍රශංසනීය ලෙස ගෙවා ඇති අතර තවත් ආයතන කිහිපයක් හිඟ මුදල් පවතී. රැස්වීම් සහ සිහිකැඳවීම් ලිපි ඇතුළු ගෙවීම් එකතු කිරීමට නැවත නැවතත් උත්සාහ කළද, පහත සඳහන් රජයේ ආයතන තවමත් ඔවුන්ගේ හිඟ මුදල් පියවීමට කටයුතු යොදා නොමැත.

රාජ්‍ය ආයතන	අයවිය යුතු මුදල	ගෙවීම් අපේක්ෂාවෙන් සිටි කාලය
ජනාධිපති ලේකම් කාර්යාලය	ශ්‍රී.ල.රු. මිලියන 333	2012 සිට 2014 සහ 2018 සිට 2022
අගමැති කාර්යාලය	ශ්‍රී.ල.රු. මිලියන 60	2018 සිට 2022
සෞඛ්‍ය අමාත්‍ය (LRH, කාසල් රෝහල)	ශ්‍රී.ල.රු. මිලියන 18	2018 සිට 2022
ගංගාරාම විහාරස්ථානය	ශ්‍රී.ල.රු. මිලියන 19	2011 සිට 2016

බෙදාහැරීමේ අංශය – 04

2012 දී පැවති සර්වඥ ධාතු ප්‍රදර්ශනයක් සඳහා බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් රු. මිලියන 8.3 ක් ලැබිය යුතුය. මෙම අවස්ථාවට රජය පූර්ණ අනුග්‍රහය දැක්වූ අතර, මේ සඳහා අරමුදල් ඉල්ලා බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට වෙන වෙනම ලියා ඇත. කෙසේ වෙතත්, අමාත්‍යාංශ දෙකෙන්ම ධනාත්මක ප්‍රතිචාර ලැබී නොමැත.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් 2013/14 තක්සේරු වර්ෂය සඳහා වන උද්දේශිත ලාභාංශ (deemed dividend) බදුවලට අදාළව රු. මිලියන 1,270.8 ක දේශීය අදායම් දෙපාර්තුමේන්තුවට පියවා නොතිබුණි.

මෙම ගැටළුව 2024 දී විසඳා ඇත. ගිණුම්කරණ ලාභය භාවිතා කරමින් 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂය සඳහා උද්දේශිත ලාභාංශ බද්ද නැවත ගණනය කිරීම සඳහා ලංවිම කළ ඉල්ලීම පිළිගනිමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) අවසානයේ මෙම ගැටළුව විසඳීමට එකඟ වූ අතර උද්දේශිත ලාභාංශ බද්ද නැවත තක්සේරු කර ඇත. අවසාන ගෙවිය යුතු මුදල සාකච්ඡා කිරීම සඳහා IRD නිලධාරීන්ගේ සහ ලංවිම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් IRD හි legacy ඒකකයේදී රැස්වීම් පවත්වන ලද අතර, 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂය සඳහා උද්දේශිත ලාභාංශ බද්ද ගණනය කිරීම සඳහා ගිණුම්කරණ ලාභ පදනම යෙදීමෙන් පසු 2007/2008 තක්සේරු වර්ෂයේ සිට 2013/2014 තක්සේරු වර්ෂය දක්වා වූ අවසාන ගෙවිය යුතු ආයතනික ආදායම් බදු ශේෂයෙන් බදු බැර අඩු කිරීමට එකඟ විය. අවසාන ගෙවිය යුතු මුදල සඳහා තක්සේරු IRD විසින් නිකුත් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු, ලංවිම විසින් මෙම මුදල (රු. 124,031,790.00) 2024 සැප්තැම්බර් මාසයේදී IRD වෙත පියවා ඇත.

(ඈ) මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාවට අනුව, 2022 වර්ෂයෙදී ගත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් විදුලිය ජනනය නොකර රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවල ජලය මුදා හැරීම හේතුවෙන් අතිරේක පෞද්ගලික විදුලිය මිලදී ගැනීම සඳහා මණ්ඩලයට ආසන්න වශයෙන් රු. මිලියන 262.6 ක පාඩුවක් දැරීමට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2022 ජූලි 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති බවත්, වාර්තාව 2022 නොවැම්බර් 16 සහ 2022 දෙසැම්බර් 08 දින ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය එම වාර්තාව ප්‍රතික්ෂේප කර 2023 පෙබරවාරි 22 දින නව කමිටුවක් පත් කර තිබුණි. කමිටුව 2023 නොවැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට තම වාර්තාව ඉදිරිපත් කර තිබුණද, කමිටුව විසින් කරන ලද නිර්දේශ 2024 මැයි මස අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉහත කමිටු දෙකෙහි සාමාජිකයින් සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 1.23 ක මුදලක් ගෙවා තිබුණි.
කමිටුවේ නිර්දේශ සුදුසු පරිදි ක්‍රියාත්මක කරන ලෙස සාමාන්‍යාධිකාරිවරයා විසින් සියලුම අංශ ප්‍රධානීන්ට සහ ප්‍රධාන නීති නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දැනුම් දී ඇත.

(ඉ) කෙටුම්පත් සාමූහික ගිවිසුමේ විධිවිධානවලට අනුව, 2021 මැයි 10 දිනැති 21/0786/318/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2021 ජූනි 15 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව, මණ්ඩලය 2021 වර්ෂයේදී සේවක වැටුප් සියයට 25 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, 2020 ට සාපේක්ෂව 2021 දී කාර්ය මණ්ඩල වියදම් රු. මිලියන 9,629.9 කින්, 2022 දී රු. මිලියන 6,725.9 කින් සහ 2023 දී රු. මිලියන 8,354.7 කින් පමණ වැඩි වී තිබුණි.
2021.05.10 දිනැති අමප/21/0786/318/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2021 ජූනි 15 වන දින පැවති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2021 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි 2021-2023 කාලය සඳහා ලංවිම සේවකයින්ගේ වැටුප් සියයට 25 කින් වැඩි කිරීමට අනුමැතිය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. තවද, මේ සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලංවිම සාමාන්‍යාධිකාරී වෙත උපදෙස් දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත පදනම්ව, ලංවිම සාමාන්‍යාධිකාරී විසින් අදාළ චක්‍රලේඛය නිකුත් කර ඇත.

(ඊ) රු. මිලියන 3,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත බහාලුම්ගත ජංගම ඩීසල් ජනක යන්ත්‍ර මිලදී ගැනීම සහ කොන්ත්‍රාත් වටිනාකම වන රු. මිලියන 2,373.32 න් සියයට 10 ක අත්තිකාරමක් ද ඇතුළුව 2023 අගෝස්තු 31 වන දිනට මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදල පිළිබඳ කාර්ය සාධන විගණන වාර්තාවේ පහත නිරීක්ෂණ ඇතුළත් වේ. වාර්තාව 2023 ඔක්තෝබර් 13 වන දින පාර්ලිමේන්තුවට සභාගත කරන ලදි.

(i) ඉහත ජනක යන්ත්‍ර මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව (TEC) හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් අනුමත කල ලංසු ලේඛණ ලංසුකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගෙන අවස්ථා දෙකකදී අතිරේක වෙනස් කිරීම් සිදු කර තිබුණි. ලංසු ලේඛණවල පැවති යන්ත්‍රවල ගුණාත්මකභාවය ආරක්ෂා කරන කොන්දේසි ලංසුකරුවන් කල ඉල්ලීම් පරිදි වෙනස් නොකරන ලෙස තාක්ෂණික කමිටුව ප්‍රසම්පාදන කමිටුව වෙත දන්වා තිබුණි.
මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ.

(ii) තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ තිබියදීත්, සාරානුකූල ප්‍රතිචාර දක්වන ලංසුකරු නොවන ලංසු ලේඛනවල විශේෂ කොන්දේසිවල 23(b) සහ 23(d) වගන්තිවල අවශ්‍යතා සපුරා නොමැති සහ ජනක යන්ත්‍රවලට යොදන ඉන්ධනවල තිබිය යුතු සල්ෆර් ප්‍රතිශතයට අනුකූල නොවන ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.
මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ.

(iii) **ජනක යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී, සැලසුම් සහගත නොවන බිඳවැටීම් (Forced Outage), ඉන්ධන සහ ලිහිසි තෙල් නොමැතිකම සහ තාක්ෂණික දෝෂ ආදිය හේතුවෙන් ජනක යන්ත්‍ර සැලකිය යුතු පැය ගණනක් ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය. තාක්ෂණික දෝෂ හේතුවෙන්, 2019, 2021, 2022 සහ 2023 වසර තුළදී පිළිවෙළින් පැය 52,452 ක්, පැය 36,120 ක්, පැය 57,320 ක් සහ පැය 35,345 ක් ජනක යන්ත්‍ර ක්‍රියාත්මක වී නොතිබුණි. තවද, 2020 සිට 2023 දක්වා කාලය තුළදී දරන ලද මුළු අලුත්වැඩියා පිරිවැය සහ අමතර කොටස්වල පිරිවැය පිළිවෙලින් රු. මිලියන 245.71 ක් සහ රු. මිලියන 591.88 ක් විය.**
ලිහිසි තෙල් නිසා කිසිදු බිඳවැටීමක් සිදු නොවීය.

(iv) **තාක්ෂණික දෝෂ හේතුවෙන් යන්ත්‍ර වරින් වර බිඳවැටීම්වලට ලක් වූ අතර සමහර ජනක යන්ත්‍ර දිගු කාලයක් අක්‍රියව පැවතුණි. 2023 නොවැම්බර් 13 වන දින සිදු කරන ලද පරීක්ෂාවට සහ විගණනයට ලද තොරතුරුවලට අනුව, මතුගම වැඩබිමේ 2022 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී, කොළොන්නාව වැඩබිමේ 2022 ජූනි මාසයේදී සහ මතුගම සහ හම්බන්තොට වැඩබිමේ 2023 අගෝස්තු මාසයේදී එම යන්ත්‍රවල බලාගාර ලබා ගැනීමේ සාධකය (**plant availability factor**) සියයට 80 කට වඩා අඩුවෙන් පැවති බව නිරීක්ෂණය විය.**
වරින් වර බිඳවැටීම් සිදුවී ඇත. රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන නොමැතිකම බලාගාර ලබා ගැනීමේ සාධකයට සැලකිය යුතු ලෙස බලපා ඇත.

(c) එල්.ටී.එල් හෝල්ඩිංග්ස් සමාගමේ විගණනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) **19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ, රාජ්‍ය සමාගම්වල විගණනය විගණකාධිපතිවරයාගේ විෂය පථයට ඇතුළත් වූ අතර, එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සහ එහි පරිපාලිත සමාගම්වල විගණනයට අදාළව, එල්.ටී.එල් ට්‍රාන්ස්ෆෝමර්ස් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි සේවක සංගමය, වෙනත් පුද්ගලයින් දෙදෙනෙක් සමඟ ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද අධිකරණ නඩුවක් මගින් සහ H.D. චමින්ද සහ තවත් 15 දෙනෙකු විසින් ගරු අභියාචනාධිකරණයේ ගොනු කරන ලද තවත් අධිකරණ නඩුවක් මගින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි ව්‍යවස්ථාපිත විගණනයට එරෙහිව 2020 ජූලි 10 වන දින අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. එසේ තිබියදීත්, 2022 ඔක්තෝබර් 10 දිනැති අධිකරණ නියෝගයෙන් එම බාධාව ඉවත් කරන ලද අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයාට පවරා ඇති විධිවිධානවලට අනුකූලව මාගේ මඟ පෙන්වීම යටතේ එම සමාගමේ විගණනය සිදු කළ හැකිව තිබුණි. කෙසේ වෙතත්, ඒ අවස්ථාවේදී, එම සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී පත් කරන ලද විගණකවරුන් ඉවත් කිරීම සඳහා පැවැත්වීමට යෝජනා කරන ලද විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට එරෙහිව වාණිජ මහාධිකරණයෙන් ලබාගත් අතුරු නියෝගය උපුටා දක්වමින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි විගණනය සිදු කිරීමට මාගේ කාර්ය මණ්ඩලයට බාධා කර තිබුණි. ඉහත කරුණු හේතුවෙන්, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එම සමාගමේ විගණනය මාගේ මඟ පෙන්වීම යටතේ සිදු කිරීමට නොහැකි විය.**
මෙම කරුණ බලශක්ති අමාත්‍යාංශය වෙත යොමු කිරීමට ලංවීම විසින් කටයුතු කර ඇත.

(ii) **2024 ජනවාරි 01 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2024 පෙබරවාරි 01 වන දින පැවති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත හිඟ මුදල්වලින් කොටසක් පියවීම සඳහා එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි සියයට 63 ක කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 28 ක් විදුලිබල මණ්ඩලය විසින් පැවරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, 2024 පෙබරවාරි 07 වන දින එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් විසින් රු. බිලියන 26.08 ක ප්‍රතිඵලයකට කොටස් 919,517,200 ක් වෙස්ට් කෝස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 72 වන වගන්තියට අනුව ප්‍රතිලෝම කොටස් දැරීම් (crossholding) සම්බන්ධයෙන් ගරු. නීතිපතිවරයාගෙන් නීතිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. තවද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණවල උපදෙස් පරිදි මණ්ඩලය විසින් එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සහ එහි පරිපාලිත සමාගම් වෙත ඇති සියලුම වගකීම් පියවා නොතිබුණි.**
2007 අංක 07 දරන සමාගම් පනතේ 72 (1) වගන්තියට අනුව ප්‍රතිලෝම කොටස් දැරීම් පහත පරිදි අර්ථ දක්වා ඇත.

වෙනත් සමාගමක පරිපාලිත සමාගමක් වන්නා වූ සමාගමක් විසින් පාලක සමාගමේ කොටස් අත්කර ගනු නොලැබිය යුතු අතර ඒ පරිපාලිත සමාගම විසින්, එය පාලක සමාගමේ පරිපාලිත සමාගමක් වීමට පෙර අත්කර ගන්නා ලද, පාලක සමාගමේ කොටස් කිසිවක් දිගටම දැරිය හැකි නමුත්, ඒ කොටස් හා සම්බන්ධව ඡන්දය දීමේ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කළ නොහැකිය.

ඉහත අර්ථ දැක්වීමට අනුව, WPCL කිසිදු සමාගමක පාලිත සමාගමක් නොවීය.
අදාළ සමාගම ඔවුන්ගේ ආයතනික නීතිඥයින්ගෙන් ලබාගත් නීතිමය මතය ඔබගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. එල්.ටී.එල් සහ එහි පරිපාලිත සමාගම් ලංවීම සමඟ අඛණ්ඩ පදනමක් මත විවිධ ව්‍යාපාරික

ගනුදෙනුවල නියැලී සිටී. එල්.ටී.එල් යනු ලංවිම හි එකම ට්‍රාන්ස්මෝමර් සහ ගැල්වනයිසින් සැපයුම්කරු වේ. තවද, එල්.ටී.එල් සතුව ලංවිමට අඛණ්ඩව විදුලිය අලෙවි කරන බලාගාර ඇති පරිපාලිත සමාගම් කිහිපයක් ඇත. මෙම ගනුදෙනුවලදී ලංවිම එකඟ වූ ණය කාල සීමාවක් භුක්ති විඳින අතර දී ඇති ඕනෑම අවස්ථාවක ඒවා ජංගම වගකීම්වල, දිගු කාලීන වගකීම්වල, මූල්‍ය කල්බදුවල, අසම්භාව්‍ය වගකීම්වල සහ මාර්ගස්ථ තොග ගිණුම්වල හෙළිදරව් කරනු ලබයි. මෙම වගකීම් ලංවිම විසින් අඛණ්ඩ පදනමක් මත පියවනු ලබයි. එබැවින්, කොටස් හුවමාරුවට පෙර සියලුම වගකීම් පියවීමට නොහැකි ය.

විමසුමේ දක්වා ඇති ශේෂය, එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් සහ එහි පරිපාලිත සමාගම් සඳහා ලංවිම හි සමස්ත ගිවිසුම්ගත සහ අනෙකුත් බැඳීම්වල සමහර කොටස් පමණක් නියෝජනය කරයි. මෙම වගකීම් ලංවිම විසින් අඛණ්ඩ පදනමක් මත පියවනු ලබයි. එබැවින්, කොටස් හුවමාරුවට පෙර සියලුම වගකීම් පියවීමට නොහැකි ය.

(iii) **අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි කොටස් හුවමාරු ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ කොටස් උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති සම්පූර්ණ අනුමැතිය භාණ්ඩාගාරයට දැනුම් දී නොතිබුණි.**

WPCL හි බහුතරය භාණ්ඩාගාරය සතු වන අතර WCPL සහ ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දෙකෙහිම භාණ්ඩාගාර නියෝජිතයින් සහභාගී වේ. ලංවිම සහ WPCL අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ අනුමැතීන් ලබා දීමට පෙර කොටස් හුවමාරුව පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 2024 මාර්තු 11 දිනැති ලංවිම ලිපිය මගින් භාණ්ඩාගාරයට දැනුම් දී ඇත. පසුව, කොටස් ගනුදෙනු ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇඟයීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්, ලංවිම සභාපති සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ සමඟ රැස්වීමක් පවත්වා ඇත.

(iv) **තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ශේෂයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා සවිස්තරාත්මක වැඩ පත්‍රිකා සහිත මූල්‍ය ප්‍රකාශනවල මෘදු අනුවාදය විගණනය සඳහා ලබා දී නොතිබුණි.**

2023 වර්ෂය සඳහා සමූහ විගණනය සිදු කිරීම සඳහා, 2023 දෙසැම්බර් 31 දිනට එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශනවල මෘදු පිටපත, අදාළ සබැඳි සමඟ, හැකි ඉක්මනින් ලබා දෙන ලෙස ලංවිම සමාන්‍යාධිකාරී විසින් (ලිපි යොමු අංකය CEB/FM/AFM(Corp)/Acct (con)/GA-2023, දිනය: 2024 නොවැම්බර් 07) එල්.ටී.එල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් හි සභාපති වෙත දැනුම් දී ඇත.

R.A.B.J.Ranasinghe
Finance Manager
Ceylon Electricity Board

Eng. K.G.R.F Comester
General Manager
Ceylon Electricity Board


Eng. (Dr).D.J.T.Siyambalapitiya
Chairman
Ceylon Electricity Board

කෙටි යෙදුම්

AC	- වායු සමීකරණ
ADB	- ආසියානු සංවර්ධන බැංකුව
AFM	- අතිරේක මුදල් කළමනාකරු
AGM	- අතිරේක සාමාන්‍යාධිකාරී
AIIB	- ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
AVR	- ස්වයංක්‍රීය වෝල්ටීයතා නියාමන
AWPLR	- බර තැබූ සාමාන්‍ය ණය දීමේ අනුපාතය
B&OS	- ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය
BOC	- ලංකා බැංකුව
BOO	- ඉදිකර-හිමිකර-මෙහෙයවන
BOQ	- ප්‍රමාණ බිල්පත්
BSC	- කැඩුම් ස්විච ධාරිත්‍රකය
BSTA	- තොග සැපයුම් ගනුදෙනු බැංකු ගිණුම
CA	- ආයතනික ක්‍රමෝපාය
C&C	- වාණිජ හා ආයතනික
CE	- ප්‍රධාන ඉංජිනේරු
CEB	- ලංකා විදුලිබල මණ්ඩලය
CEMS	- අඛණ්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධති
CERT	- පරිගණක හදිසි අවස්ථා සූදානම්කාරිත්ව කණ්ඩායමේ
CIMA	- කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනය
CMDS	- චක්‍රලේඛ, අත්පොත් හා ලේඛන පද්ධතිය
COPE	- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
CP	- මධ්‍යම පළාත
CPC	- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
CPD	- අඛන්ඩ වෘත්තීය සංවර්ධනය
CS	- ආයතනික ක්‍රමෝපාය
CS&RA	- ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු
CSC	- පාරිභෝගික සේවා මධ්‍යස්ථානය
CSR	- ආයතනික සමාජ වගකීම
CVT	- ධාරිත්‍රක වෝල්ටීයතා තරාපැවිය
DBB	- ද්විත්ව බස්බාර්
DD1	- බෙදාහැරීමේ අංශය 1
DD2	- බෙදාහැරීමේ අංශය 2
DD3	- බෙදාහැරීමේ අංශය 3
DD4	- බෙදාහැරීමේ අංශය 4
DGM	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
DGM(P)	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)
DGEU	- රජයේ විදුලිබල පවරාගැනීමේ දෙපාර්තමේන්තුව
DJPS	- දකුණු ජනනී විදුලි බලාගාරය
DOAS	- අවකල දෘශ්‍ය අවශෝෂණ වර්ණාවලීක්ෂය
DS	- ඩිස්ත්‍රික් ලේකම් කාර්යාලය
EGC	- සේවක දුක්ගැනවිලි කමිටුව
EIAR	- පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයන වාර්තාව
EMU	- පරිසර නිරීක්ෂණ ඒකකය
FD	- ස්ථිර තැම්පත්
FS&PD	- ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන
FSUR	- පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය
GC	- ජාලගත
GEF	- ගෝලීය පරිසර පහසුකම්
GE T&D	- General Electric Transmission & Distribution
GIS	- වායු පිරිවෘත වහරුපන්න
GOSL	- ශ්‍රී ලංකා රජය
GPDEEIIP	- හරිත විදුලිබල සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය
GS	- කොටුමා උපපොළ
GSM	- ජංගම සන්නිවේදන ගෝලීය පද්ධතිය
GT	- වායු තලබමන
HES	- ප්‍රධාන-අන්ත පද්ධතිය
HR	- මානව සම්පත්
HRM	- මානව සම්පත් කළමණාකරු
HVDC	- අධි වෝල්ටීයතා සෘජු ධාරා
IBC	- අන්තර්මධ්‍ය තොග බහාලුම්
IDR	- නිකුතු ශ්‍රේණිගතකරණ මට්ටම
IEEE	- විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවරුන්ගේ ආයතනය
IESL	- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
IPG	- අන්තර්ජාල ගෙවීම් ද්වාරය
IPO	- ආරම්භක ප්‍රසිද්ධ පිරිනැමුමක්
IPP	- ස්වාධීන විදුලිය නිෂ්පාදකයන්
IT	- තොරතුරු තාක්ෂණ
ITI	- කාර්මික තාක්ෂණායතනය
JICA	- ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය
KPI	- ප්‍රධාන කාර්ය සාධන දර්ශකය
KPS	- කැළණිතිස්ස විදුලි බලාගාරය
KCCPP	- කැළණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය
LC	- ණයවර ලිපිය
LECO	- ලංකා විදුලි (පෞද්ගලික) සමාගම
LKAS	- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය
LKR	- ශ්‍රී ලංකා රුපියල්
LOI	- අභිප්‍රාය ලිපිය
LNG	- ද්‍රව ස්වභාවික වායු
LTL	- ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ්

කෙටි යෙදුම් (ඉතිරි කොටස)

LTSH	- අඩු උෂ්ණත්ව සුපර් හීටර්
LV	- අඩු වෝල්ටීයතාව
LVPP	- ලක්විජය විදුලි බලාගාරය
MBA	- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
MEPA	- සාගර පරිසර ආරක්ෂණ අධිකාරිය
MIV	- ප්‍රධාන යෙදවුම් කපාටය
MLKR	- ශ්‍රී ලංකා රුපියල් මිලියන
MLTS	- මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩලය
MOI	- වාර්මාර්ග අමාත්‍යාංශය
MT	- මෙට්‍රික් ටොන්
MV	- මැදි වෝල්ටීයතා
MVA	- මෙගා වොට් ඇම්පියර්
MYPS	- මතුගම යටදොල විදුලි බලාගාරය
NARA	- ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය
NCP	- උතුරු මැද පළාත
NCRE	- සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය
NGO	- රාජ්‍ය නොවන සංවිධානය
NSB	- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
NSCC	- ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය
NVQ	- ජාතික වෘත්තීය සුදුසුකම
NWP	- වයඹ පළාත
OEM	- මුල් උපකරණ නිෂ්පාදක
PCB	- පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල්
PD	- ව්‍යාපෘති අධ්‍යක්ෂ
PEA	- පළාත් පරිසර අධිකාරිය
PMU	- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
POP	- ස්ථායී කාබනික දූෂක
PPA	- විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම
PP	- බලාගාරය
PS	- විදුලි බලාගාරය
PUCSL	- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
PV	- ප්‍රකාශ වෝල්ටීයතාවය
QR	- ඉක්මන් ප්‍රතිචාර
R&D	- පර්යේෂණ හා සංවර්ධන
RCL	- ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය
RE	- ග්‍රාමීය විදුලියනය
RT	- වහල මත
SAIDI	- පද්ධති සාමාන්‍ය බිඳවැටුම් කාල සීමා දර්ශකය
SAIFI	- පද්ධති සාමාන්‍ය බිඳවැටුම් සංඛ්‍යාත දර්ශකය
SCADA	- අධීක්ෂණ පාලන සහ දත්ත උකහා ගැනුම්
SESRIP	- විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබාදීමේ ව්‍යාපෘතිය
SLAS	- ශ්‍රී ලංකා පරිපාලන සේවය
SLFRS	- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති
SLIDA	- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
SLTB	- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
SMS	- කෙටි පණිවිඩ සේවය
SP	- දකුණු පළාත
SPPA	- ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්
ST	- වාෂ්ප තලබමන
SVS	- ස්ථිතික වාර පද්ධතිය
TL	- සම්ප්‍රේෂණ මාර්ගය
UK	- එක්සත් රාජධානිය
UNT	- ඒකක උපකාරක තරාපැවිය
UNIDO	- එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය
UOMDP	- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
URL	- ඒකීය සම්පත් නිශ්චායකය
USA	- ඇමරිකා එක්සත් ජනපදය
USD	- එක්සත් ජනපද ඩොලර්
VAT	- එකතු කළ අගය මත බද්ද
WPN	- බස්නාහිර පළාත උතුර
WPS	- බස්නාහිර පළාත දකුණ
WRB	- ජල සම්පත් මණ්ඩලය
WTG	- සුළං තලබමන ජනක යන්ත්‍රය



ලංකා විදුලිබල මණ්ඩලය
කොළඹ 00200, ශ්‍රී ලංකාව
www.ceb.lk

Designed by BC Advertising